# ඒකාධිපති
# හිට්ලර්



**රිචඩ් විජයසිරි**

Scanned with CamScanner

# ඒකාධිපති හිට්ලර්

රිචඩ් විජයසිරි

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

Scanned with CamScanner

# පෙරවදන

''ඒකාධිපති හිට්ලර්'' දෙවෙනි ලෝක මහා සංග්‍රාමයේ ඉතිහාසය ඔස්සේ ගලා යන ඇඩොල්ෆ් හිට්ලර්ගේ ජීවන චරිතයයි. දෙවෙනි ලෝක යුද්ධය පිළිබඳව හෝ හිට්ලර් පිළිබඳව හෝ සිංහලෙන් ලියැවී ඇති පත පොත ඉතා විරල බැවින් ඒ අඩුව පිරිමසාලීමටය, මේ පොත ලියන ලද්දේ.

පොත ලිවීමට කරුණු රැස් කෙරුණේ අමෙරිකානුන් ඉංග්‍රීසීන්, ප්‍රංශයන්, රුසියානුන් හා ජර්මානුන් විසින් ලියන ලද කෘතීන් විශාල සංඛ්‍යාවක් ඇසුරිණි. ඉනුත් මුල් තැන ගන්නේ වසර ගණනාවක් පර්යේෂණය කොට ලියන ලද විශිෂ්ට ඓතිහාසික ග්‍රන්ථ දෙකක් වන විලියම් ශිරර්ගේ The Rise and Fall of The Third Reich සහ ඇලන් බූලොක්ගේ Hitler - A Study In Tyranny ය.

මේ පොත මුද්‍රණය කිරීම 1977 දී ඇරඹුණ මුත් එය මුද්‍රණ ද්වාරයෙන් නිකුත් වීම මෙතෙක් පමා වූයේ රජය හා රහස් පොලිසිය (සී. අයි. ඩී.) කළ හපන් කමක් නිසාය. 1978 මාර්තු මස කොළඹ පොලිස් මූලස්ථානයේ සිට පැමිණ මධ්‍යම රාත්‍රියේ කුරුණෑගල සරසවි මුද්‍රණාලයට කඩා පැන්න රහස් පොලිස් කණ්ඩායමක් පොතේ මුද්‍රිත පිටු, අත් පිටපත්, හා ඡායාරූප අත් අඩංගුවට ගෙන පොත මුද්‍රණය කිරීම තහනම් කොට මුද්‍රණාලයට සීල් තැබූහ. කර්තෘට, මුද්‍රණකරුට හා ප්‍රකාශකට කොළඹ පොලිස් මූලස්ථානයේ සුප්‍රකට හතර වෙනි තට්ටුවට පැමිණෙන ලෙසද ''ඇරියුම්'' ලැබුණි. පැය ගණනාවක් ප්‍රශ්න කොට අපගේ කට උත්තර ලියා ගැනීමෙන් පසු අප නිදහස් කෙරුණේ කාලාන්තරයක් ඇවෑමෙනි.

මේ පොතට බීජය වූයේ හිට්ලර් හා දෙවෙනි ලෝක යුද්ධය අළලා ''හිට්ලර්ගේ මාරක දස දවස'' යන මැයෙන් 1975 - 76 දී ''ශ්‍රී ලංකාදීප'' පත්‍රයට ම විසින් ලියන ලද ලිපි පෙළකි. ඒ ලිපි සහමුලින් හෝ කොටස් වශයෙන් හෝ මේ පොතට ඇතුළත් කිරීමට අවසර දීම ගැන ''ලංකාදීප'' පත්‍ර සමූහයේ කර්තෘ වූ ගුණදාස ලියනගේ මහතාට හා ''ශ්‍රී ලංකාදීප'' පත්‍රයේ කර්තෘ ජෝර්ජ් ලෙස්ලි රණසිංහ මහතාට අපගේ කෘතඥතාව හිමිවේ.

**රිචඩ් විජයසිරි**

සී 2/4,
ඇන්ඩර්සන් තට්ටු නිවාස
කොළඹ - 05
(නාරාහේන්පිට)

Scanned with CamScanner

# පටුන


| | පිටුව |
|---|---|
| 1. අනාථ කොල්ලෙක් දඬාවතේ යයි | 09 - 17 |
| 2. ලේලිගේ ඇකයෙන් මහ පදවියේ එළිපත්තට | 18 - 24 |
| 3. කුමන්ත්‍රණ මධ්‍යයේ හිට්ලර් අගමැති වෙයි! | 25 - 36 |
| 4. මැතිසබය ගිනි තබා විපක්ෂය වනසති! | 37 - 46 |
| 5. 'මගේ මනාලිය ජර්මනියයි!' | 47 - 55 |
| 6. දෙවන ලෝක යුද්ධය ඇරඹේ! | 56 - 68 |
| 7. යුදෙව් සංහාරය උග්‍ර වෙයි | 69 - 77 |
| 8. හිට්ලර් බර්ලිනය තුළ කොටුවේ! | 78 - 89 |
| 9. රතු මුහුද ගොඩ ගලයි | 90 - 97 |
| 10. මාරයාට කලින් අනංගයා ළඟා වේ | 98 - 104 |
| 11. රුසියානුවෝ බර්ලිනය දෙවනත් කරති | 105 - 110 |
| 12. පුංචි බූදලය මහා ජනයාට පූජා වේ | 111 - 118 |
| 13. හිට්ලර් දිවි නසා ගනී | 119 - 125 |
| 14. සතුරු සේනාවෝ බිම්ගෙට කඩා වදිති | 126 - 135 |
| 15. මාරක නාටකයේ තිරය වැටේ | 136 - 143 |
| 16. හිට්ලර් චින්තනය | 144 - 152 |


Scanned with CamScanner

# 1

## අනාථ කොල්ලෙක් දඩාවතේ යයි!

එදා සැඳෑ අඳුර වැටුණු මොහොතේ පටන් මහ රෑ යාමය වන තුරු දස දහස් ගණන් නාසි පාක්ෂිකයෝ සහ නාසි ''භටයෝ'' දුවැන්ත පෙළපාලි පවත්වමින් කුණාටුවකට හසු වූ කලෙක මෙන් අගනුවර දෙවනත් කරන්නට වූහ.

ඔවුන්ගේ බෑන්ඩ් කණ්ඩායම් වලින් පැරණි රණ ගී වැයුණි. ඔවුන්ගේ බෙර හඬින් මුළු නගරය ගිගුම් දුණි. ඔවුන් ගේ පාවහන් බිම ගැටෙන විට දෙරණ දෙදරන්නා සේ හැඟුණි. ඔවුන් ගෙන ගිය පන්දම්වලින් මඟ දෙපස ආලෝකවත් වී, ඔල්වර හඬ නගමින් හුන් ලක්ෂ සංඛ්‍යාත මහජනයාගේ මුහුණු බැබලිණි.

මේ මහා ජන සාගරය අග්‍රාමාත්‍ය කාර්යාලය පසුකර ගලා යද්දී එහි කවුළුවක් ළඟට වී හුන්නේ අකීකරු කොණ්ඩය දකුණු පැත්තෙන් බෙදා වෙන් කර එය නළලේ උඩු කොටස වැසෙන සේ වමට පීරා ගත්, නාසයේ පළලට සීමා වූ බුරුසුවක් බඳු රැවුලකින් හෙබි, දෘඪතම අධිෂ්ටානය රළුපරුෂ මුහුණින් පළ කළ, අභිනන්දනයට පත්ව හුන් අභිමානවත් පුද්ගලයෙකි. නොසිඳී ගලාගිය මහාජන සන්නිපාතයෙන් නොකඩවා නැඟුණු ජය ඝෝෂාත්මක ආචාරය පිළි ගනිමින් හේ සුරත ළය කෙළින් ඉදිරියට ගස්සා නාසි ක්‍රමයට ප්‍රතිආචාර දක්වී.

**දිනය 1933 ජනවාරි 30 දාය.**

**ස්ථානය ජර්මනියේ අගනුවර වූ බර්ලිනයය!**

**පුද්ගලයා ඇඩොල්ෆ් හිට්ලර්ය!** (ADOLF HITLER)

Scanned with CamScanner

තව අවුරුදු හයකින් (1939) දී හේ දෙවන ලෝක මහා යුද්ධය පටන් ගන්නේය. මෙතෙක් ලොව සිදු වූ ලොකුම විනාශය වන ඒ යුද්ධයට රටවල් හැට එකක් (61 ක්) පැටලෙන්නේය. ඉන් ජීවිත පන් කෝටියක් (5,00,00,000) වැනසෙන්නේය. මහා කවි ගයතේ සහ ශීලර්, කාර්ල් මාක්ස් සහ ඉමැනුවෙල් කැන්ට්, බීතෝවන් සහ අයින්ස්ටයින් වැනියවුන් ලොවට බිහි කළ ශ්‍රේෂ්ඨ ජර්මන් ජාතියේ ජන රංජන අධිපතියා බවට පත් වී අන්තිමේ ජර්මන් රණකාමීත්වයෙන් මුළු ලොව හෙල්ලූ හිට්ලර් උපතින් ජර්මන් රට වැසියෙක් නොවීය. ඔහු ඔස්ට්‍රියාවේ උපන් ජර්මන් ජාතික කතෝලිකයෙකි.

හිට්ලර්ගේ පියා සුළු නිලධරයකු වශයෙන් ඔස්ට්‍රියානු රේගු සේවයේ රාජකාරි කළ කෙනෙකි. අවජාතකයකු වූ හිට්ලර්ගේ පියා ජීවිතයේ මුල් වසර තිහ තුළම භාවිත කළේ මව් පෙළපතේ නම වන ''ශික්ල්ග්‍රෑබර්'' (SCHICKLGRUBER) ය. එහෙත් මොකක්දෝ ගුප්ත හේතුවක් උඩ අනාගත ජර්මන් ආඥාදායකයාගේ සීයා ස්වකීය පීතෘත්වය නීත්‍යානුකූලව පිළිගත්තෙන් ලියකියවිලි වල නම වෙනස් කරන ලදී. හිට්ලර්ගේ පියා ශික්ල්ග්‍රෑබර් වෙනුවට හිට්ලර් කෙනෙකු වූයේ මේ අයුරිනි. මෙසේ නොවන්නට ඇඩොල්ෆ් හිට්ලර් හැඳින්වෙන්නේද ඇඩොල්ෆ් ශික්ල්ග්‍රෑබර් ලෙසිනි.

නමක ඇති විශේෂයක් නැතැයි කෙනකු කියන්නට පුළුවන. එහෙත් හිට්ලර්ගේ රූපයක් දුටු පමණින් වුවද ''හේල් හිට්ලර්!'' (හිට්ලර් දිනේවා!) යයි ඔල්වර හඬ නැගූ ජර්මානුන්ට ''හේල් ශික්ල්ග්‍රෑබර්'' යයි මොර ගාන්නට සිදු වී නම් තත්ත්වය කෙසේ වන්නට තිබුණිද?

හිට්ලර් - හිට්ලර්ම නොවී ශික්ල්ග්‍රෑබර් වී නම් ඔහු කිසිදාක හයසිය අසූ ලක්ෂයක් ජර්මානුන්ගේ අනුපමේය අධිපතියා වන්නේ නැතැයි සමහරු කියති.

1889 අප්‍රියෙල් 20 දා සවස 6.30 ට හිට්ලර් ලොවට බිහි කළ ඔහුගේ මව ඉන් වසර විස්සකට පමණ පසු හදිසියේ මිය ගියාය. එවකට හිට්ලර්ට වයස අවුරුදු 19 කි.

''මා තාත්තාට ගරු කළා. අම්මාට ආදරය කළා. අම්මාගේ මරණය නිසා මගේ හිතේ තිබුණු බලාපොරොත්තු සියල්ල සුනුවිසුනු වී ගියා. ඉන්පසු මට කෙසේ හෝ ජීවනෝපායක් සොයා ගැනීමට සිද්ද වුණා''යි හිට්ලර් පසු කලෙක සඳහන් කළේය.

Scanned with CamScanner

ඥාතීන්ට ආයුබෝවන් කියූ තරුණ හිට්ලර් උපන් ගම වන ලින්ස් හැර පියා ඔස්ට්‍රියානු අගනුවර වූ වියානාවට ගියේය. එසේ ගියේ කවදා හෝ "මිනිසෙක්" වී මිස ආපසු ගමට නොඑමි'යි ඉටා ගෙනය.

අවුරුදු හතරක් ගතවන තුරුම තරුණ හිට්ලර්ට ගෙවන්නට සිදුවූයේ ඉතා දුෂ්කර ජීවිතයකි. ඔහු එදා වේල හම්බ කරගත්තේ අතන මෙතන කුලී වැඩ කිරීමෙනි. බඩගින්න නිවාගනු සඳහා දන්සැල්වල පිහිට සෙවීමටද ඇතැම් විට සිදුවිය.

කෙතරම් පාදඩ ජීවිතයක් ගතකරන්නට සිදු වුවද එබඳු සෙසු තරුණයන් මෙන් ඉහේ වනවර කම්වලට හෝ නරක පුරුදුවලට ඇබ්බැහි නුවූයේය. ඔහු දුම් බීවේ නැත. මත්පැන් තොල ගෑවේ නැත. නොහිසි ස්ත්‍රී සේවනය සෙව්වේ නැත.

ඔහු ශරීරය වෙහෙසා කළ යුතු වැඩ තිපල් කසායක් සේ පිළිකුල් කළේය. මොළය වෙහෙසා කරන වැඩ අමා බඳුනක් සේ අගය කළේය. අතට අසුවූ සෑම පතක් පොතක් ඔහු කියැවූයේ මහත් අභිරුචියකිනි.

තරුණ හිට්ලර් චිත්‍ර කලාවට හා ගෘහ නිර්මාණ ශිල්පයට තද ලොල් බවක් දක් වූ මුත් චිත්‍ර කලාව හෝ ගෘහ නිර්මාණ ශිල්පය ස්ථිර ජීවනෝපාය කර ගැනීමට තරම් ඔහු වාසනාවන්ත (හෝ අවාසනාවන්ත?) නොවීය.

මේ වනතුරු ඔහු දේශපාලනයෙහි පැටලුණේ නැති මුත් දේශපාලන පක්ෂ හා ව්‍යාපාර ගැන උනන්දුවක් දක්වීමට පටන් ගත්තේය.

යුදෙව් විරෝධී හැඟීම් මුල් වරට ඔහු තුළ මුල් බැසගත්තේ වියානාහිදීය. ඔහු යුදෙව්වන් හැඳින්වූයේ "ක්‍රිස්තියානි කෙල්ලන් දූෂණය කරන කකුල් බකල අවජාතකයන්" ලෙසිනි.

හිට්ලර් 1913 වසන්ත සමයේ වියානාව හැර දමා ජර්මනියට ගියේය. කවදත් ඔහුගේ හදවත තිබුණේ එහිය - ජර්මනියේය.

ඔස්ට්‍රියාවේ වියානා නගරයේදී මෙන්ම ජර්මනියේ මියුනිච් නගරයේදීද ඔහු අත තම දොයිතුවක් තිබුණේ නැත. ඔහුට ඥාතියෙක්, මිත්‍රයෙක් සිටියේ නැත. ස්ථිර රැකියාවක් තිබුණේ නැත.

ලෝකයේ අවාසනාවටත්, හිට්ලර්ගේ වාසනාවටත් ඉන් වසරකට පසු 1914 - 18 ප්‍රථම ලෝක යුද්ධය පටන් ගත්තේය. 1914 අගෝස්තු

Scanned with CamScanner

3 දා හේ සිය කැමැත්තෙන්ම ජර්මානු රෙජිමේන්තුවකට බැඳුණි.

"ජීවිතය යනු යුද්ධය" යි වරෙක පවසා ඇති මේ පුද්ගලයාට ඉන් පෑදුණේ කෙතරම් අනගි අවස්ථාවක්ද? හිට්ලර් නිර්භීත සෙබළෙක් විය. දෙවරක් හේ තුවාල ලැබීය. දෙවරක් හේ යුද බිමේ දක්වූ අභීතියට සම්මාන ලැබීය.

1918 නොවැම්බර් 11 දා හිට්ලර්ගේ ජීවිතයේ තීරණාත්මක දිනයක් විය. ප්‍රථම ලෝක යුද්ධය කෙළවර වූයේ එදිනය. පරාජය පිළිගනිමින් තිහීන සාම ගිවිසුමක් අත්සන් කිරීමට ප්‍රෞඪ ජර්මන් දේශයට සිදුවූයේ එදිනය. හිට්ලර්ට දේශපාලනයට බැසීමට සිත්වූයේත් එදිනය.

ඇඩොල්ෆ් හිට්ලර් මෙන්ම මුළු මහත් ජර්මන් ජනතාව හුන්නේ යුද්ධයෙන් පරාජය වීම ගැන කෝපයෙන් පුපුරු ගසමිනි. ඔවුනට සාම ගිවිසුම අත්සන් කළ දේශපාලනඥයන් වහ කදුරු මෙන් තිත්ත විය. එළි ජර්මනියේ බලය හා ගෞරවය නංවාලිය හැකි ඕනෑම පියවරක් ගැනීමට ජර්මන්නු කැමැත්තෙන් සිටියහ. ඒ අසරණ අබල දුබල මොහොතේ ඔවුන් ප්‍රාර්ථනා කළේ "ගැලවුම් කරුවකු" පහළ වේවා කියාය. ජර්මනිය රජකළ දෙවෙනි විල්හෙල්ම් (WILHELM) යුද්ධය පරාජය වීමත් සමඟ සිහසුන පමණක් නොව රටද හැර දමා පළා ගොස් තිබුණි.

එවකට තිස් හැවිරිදියෙක්ව සිටි ඇඩොල්ෆ් හිට්ලර් දේශපාලන කරළියට මංගල පියවර තැබුවේ ජර්මනිය තුළ ඔබඳු වාතාවරණයක් පවතිද්දීය.

XXXXXX

මියුනිච් නගරයේ පහත් පෙළේ බීර තැබෑරුමක ඉඳ හිට රැස්වීම් පැවැත් වූ ඉතා කුඩා දේශපාලන පක්ෂයක් විය. ජර්මන කම්කරු පක්ෂය නමින් හැඳින්වුණු මේ සංවිධානයේ කාරක සභාවේ හත් වෙනි සාමාජිකයා ලෙසින් හිට්ලර් බඳවා ගනු ලැබීය.

ඉතිරි පක්ෂ නායකයන් හය දෙනා "හරිම බඩු හයක්" සේ නම් කළ හැකිය. පක්ෂයේ ආරම්භකයා වූයේ ඇන්ටන් ඩ්රෙක්ස්ලර් (ANTON DREXLER) නමැති කම්මල් කාරයෙකි. ඉතිරි පස් දෙනාගෙන් එකෙක් බේබදු කවියෙකි. අනෙකා අර්ථ ශාස්ත්‍රය

පිළිබඳ විකාර අදහස් දරුවෙකි. තවෙකෙක් අස්වාභාවික ලිංගික ආශාවන්ගෙන් පෙළුණු යුද්ධ නිලධරයෙකි.

හිට්ලර් ජර්මන් කම්කරු පක්ෂයට බැඳෙන විට එහි සාමාජික සංඛ්‍යාව යම්තම් විසිපහක් පමණ විය. පක්ෂ අරමුදලේ තිබුණේ ජර්මන් මුදලින් මාර්ක් හතකුත් පෙනිං පණසකි.

එතැන් පටන් පක්ෂයේ ජීවනාලිය වූයේ තරුණ හිට්ලර්ය. ඔහු මේ අලුත් පක්ෂය සඳහා සමාජයේ සියලු කොටස් සනසන අන්දමේ විසිපස් විධ වැඩ සටහනක් සකස් කළේය.

1920 ගිම්හානය වන විට පක්ෂ සාමාජික සංඛ්‍යාව සැහෙන ප්‍රමාණයකින් ඉහළ නැංවීමට හිට්ලර් සමත් විය. පක්ෂයේ ආරක්ෂක කටයුතු සඳහා හිට්ලර් විසින් විශේෂ බලකායක් ගොඩනඟන ලද්දේ මේ වකවානුවේය. පසු කලෙක ''ඇස්. ඒ.'' (SA - STURM ABTEILUNG) නමින් හැඳින්වුණේ හිටපු යුධ සෙබළුන්ගෙන් සැදුම්ලත් මේ චංඩි රංචුවය. පක්ෂයේ රැස්වීම් වලදී සාමය රකින ලද්දේද, විරුද්ධ වාදී රැස්වීම් කඩාකප්පල් කරන ලද්දේද දුඹුරු කමිසවලින් සැරසුණු ''ඇස්. ඒ.'' භටයන් විසිනි. ටික කලකට පසු ''ඇස්. ඇස්. (SCHUTZ STAFFEIN) නමින් තවත් මෙබඳු නාසි බලකායක් ගොඩනගන ලදී. ඔවුන් ඇන්දේ කළු කමිසයන්ය.

වරක් විරුද්ධවාදීන්ගේ රැස්වීමක් කඩාකප්පල් කරනු සඳහා ''ඇස් - ඒ'' භට කණ්ඩායමක් හිට්ලර් විසින්ම මෙහෙය වන ලදී. මේ වරදට ඔහු තෙමසක සිර දඬුවමක් ලද්දේය.

හිට්ලර් පුල පුලා සිටි දේ ඉටුවිය. සිර මැදිරියට ඇතුළු වන විට අප්‍රකට නිකමකු වූ හිට්ලර් තෙමසකට පස් ඉන් එළියට ආයේ සුප්‍රකට වීරයකු ලෙසිනි.

ඒ ගිම්හානයේදීම හිට්ලර්ට තව දීප්තිමත් අදහසක් පහළ විය. පක්ෂය සඳහා සංකේතයක් අවශ්‍ය බව ඒත්තුගත් හිට්ලර් ධජයක් නිර්මාණය කළේය. රතු පසු බිම මැද වූ සුදු කවයක කළු පැහැයෙන් ලකුණු වූ ස්වස්තිකයක් සහිත ධජයක් එතැන් පටන් පක්ෂයේ සංකේතය විය.

ස්වස්තිකය කුරුසයේ හතර කෙළවරට ඉති හතරක් යොදා හදාගත් ලාංඡනයකි.

ජර්මන් කම්කරු පක්ෂයේ දර්ශනය වූයේ ජාතික සමාජවාදයයි.

Scanned with CamScanner

මෙය උග්‍ර කොමියුනිස්ට් විරෝධී හා ජාතිවාදී දර්ශනයක් විය. පසු කලෙක පක්ෂය හැඳින්වුණු "නාසි" (NAZI) යන පදය "ජාතික සමාජවාදය" යන අදහස පළ කළ ජර්මන් පද යුගලේ කෙටි ස්වරූපයකි.

1921 වන විට නාසි පක්ෂයේ අසහාය නායකත්වය හිට්ලර්ට හිමිවිය. එතැන් පටන් නාසි පක්ෂය මේ තනි පුද්ගලයා වටා භ්‍රමණය වන්නට පටන් ගත් අතර ඔහු හැඳින්වුණේ 'නායක තුමා' (FUEHRER) යනුවෙනි. පසු කලෙක හිට්ලර්ගේ ප්‍රධාන සගයන් වූ පුද්ගලයන් කීප දෙනෙක් නාසි පක්ෂයට බැඳී ක්‍රියා කිරීමට පටන් ගත්තේ මේ වකවානුවේය.

අර්න්ස්ට් රොයෙම් (ERNST ROEHM) රුඩොල්ප් හෙස් (RUDOLF HESS) ඇල්ප්‍රඩ් රොසන් බර්ග් (ALFRED ROSEN BERG) හා හර්මන් ගෝරින් (HERMANN GOERING) හිට්ලර්ට සම්බන්ධ වූවන්ගෙන් සමහරෙකි.

1914 - 18 ලෝක යුද්ධය ජර්මනියේ පරාජයෙන් කෙළවර වීමත් සමඟ ජර්මන් රජු (විල්හෙල්ම්) රට හැර යාමෙන් පසු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වයෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් පිහිටුවන ලදී. අවාසනාවකට මෙන් ජර්මන් යුද පරාජයේ හා ජර්මනියට අවාසිදායක යුද සමාදාන ගිවිසුමේ සියලු වස් දොස් ගියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර පිටිනි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රජයට අන්ත වාමාංශයෙන් මෙන්ම අන්ත දක්ෂිණාංශයෙන් ද එල්ල වූයේ බලගතු තර්ජනයකි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ ආණ්ඩුව බ්‍රිතාන්‍යය, ප්‍රංශය ආදී මිත්‍ර ජාතීන් සමඟ අත්සන් කළ වාසේයි සාම ගිවිසුමට විරුද්ධව සෑම ජර්මන් හදවතක්ම කැකෑරෙමින් තිබුණි. මේ ගිවිසුම මගින් ජර්මනිය පාවා දී ඇතැයි නිගමනය කළ ජර්මන් ජනතාව ඒ හේතුවෙන්ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රජයට දැඩි විරෝධයක් දැක්වූහ. එවකට ජර්මානුන් සිටියේ සාම ගිවිසුමට පටහැනි ඕනෑම කෙනෙකුට - යකාට හෝ යකාගේ ආච්චිට වුවද - සහයෝගය දීමට සූදානමිනි.

හිට්ලර්ට ඉතා වාසිදායක සිද්ධි දෙකක් මේ වකවානුවේදී ඉටුවිය. ජර්මන් මුදල අන්තයටම බාල්දු විය. ජර්මනියේ යකඩ කර්මාන්තයේ මධ්‍යස්ථානය වන රූර් පෙදෙස ප්‍රංශය විසින් ආක්‍රමණය කරන ලදී.

ජර්මන් ආර්ථිකයේ බොටුව තව තවත් හිර විය. රත් පවුමක් මිලදී ගනු සඳහා ජර්මන් මාක් කෝටි එකසිය හැටකට වඩා අවශ්‍ය විය. (සාමාන්‍යයෙන් එකල පවුමක් මාර්ක් දහසයකට සමානය)

ෂයිලොක් මස් රාත්තල ඉල්ලා සිටියා සේ ජයග්‍රාහී මිත්‍ර ජාතීහු පරාජිත ජර්මනියෙන් යුද වන්දි වශයෙන් පවුම් කෝටි අට සියයක් ඉල්ලා සිටියහ. ප්‍රංශය රූර් පෙදෙස අල්ලා ගත්තේ යුද වන්දි ගෙවීම පමා වූ නිසාය. ශතයක්වත් යුද වන්දි ගෙවීමට තමන් සූදානම් නැතැයි ජර්මන් ජනතාව එක හඬින් කියා සිටියහ. යුද වන්දි ගෙවීමට සූදානම් වූ දේශපාලනඥයෝ දේශද්‍රෝහීන් ලෙසින් සලකනු ලැබූහ. රට පුරා මහා කැළඹීම් ඇතිවිය. දේශපාලන ජීවිත ඝාතන පැතිරෙන්නට විය.

යුද වන්දි ගෙවීම එකහෙළා ප්‍රතික්ෂේප කළා වූද, වාසේයි සාම ගිවිසුම ජර්මන් ජනතාව නොපිළි ගනිතියි කියා සිටියා වූද, හිට්ලර්ගේ නාසි පක්ෂය වටා මුලදී දහස් ගණනින්ද අනතුරුව දසදහස් ගණනින්ද ඊළඟට ලක්ෂ ගණනින්ද අනුගාමිකයෝ රොක්වන්නට වූහ. ස්වස්තික ධජයේ සෙවන පතා වැඩියෙන්ම ඇදී ආයේ පහළ මධ්‍යම පංතියේ හා නිර්ධන පන්තියේ ඇතැම් කොටස්ය. යුද්ධයෙන් ජර්මනිය පරාජය වූ බව පිළිගැනීම ප්‍රතික්ෂේප කළ යුධ හමුදාවේ විශාල කොටසක සහයෝගයද හිට්ලර්ට ලැබෙන්නට විය. නාසි පක්ෂයේ සම්භාවනීයත්වය බොහෝ සෙයින් ඉහළ නැඟීමට ඉවහල් වූයේ අලුත් පක්ෂයට සෙන්පති ලූඩන් ඩෝර්ෆ් (LUDENDORFF) දුන් සහයෝගයයි. ලෝක යුද්ධයේදී ඉතා දක්ෂ ලෙස හා නිර්භීත ලෙස ජර්මන් සේනාංක මෙහෙය වූ ලූඩන් ඩෝර්ෆ් මුළු ජර්මන් ජනතාව විසින් ජාතික වීරයකු සේ පුදනු ලැබීය.

ආණ්ඩු විරෝධී නොසන්සුන්කම් බහුලව පැවැතියේ ප්‍රාදේශීය ආණ්ඩුවකින් පාලනය වූ බැවේරියානු ප්‍රාන්තයේය. හිට්ලර්ගේ දේශපාලන උද්ඝෝෂණයට තෝතැන්න වූයේත් බැවේරියාව හා එහි අගනුවර වන මියුනිච්ය. ජනතාවගේ සිත් සතන් ඇද ගන්නා මොකක් හෝ පෙරළියක් කළ යුතු බැව් හිට්ලර්ට කල්පනා විය.

ඒ තීරණාත්මක අවස්ථාව එළඹුණි.

1923 නොවැම්බර් 8 දා මියුනිච් නුවර විශාල බීර හලක රැස්වීමක් පැවැත්වුණි. බැවේරියා ප්‍රාන්තීය ආණ්ඩුවේ අගමැති හමුදාපති හා පොලිස්පති මේ රැස්වීම ඇමතීමට පැමිණියහ. නාසි

පක්ෂයේ "භටයන්" පිරිසක් සමඟ වේදිකාවට කඩා පැන්න හිට්ලර් පිස්තෝලයකින් උඩට වෙඩිල්ලක් තබා "**ජාතික විප්ලවය දැන් පටන් ගත්තා!**" යි හඬ ගාමින් රැස්වීම අමතන්නට විය. හිට්ලර් බලාපොරොත්තු වූයේ රාජ්‍ය නායකයන් තිදෙනා බියවද්දා ඔවුන්ට සිය තිල තල වලින් අස්වීමට බලකර බැවේරියා රාජ්‍යයේ බලතල සියතට ගැනීමටය. එහෙත් එ තැත ව්‍යර්ථ විය.

හිට්ලර්ගේ නාසි "භටයන්" සහ රජයේ හමුදා භටයන් අතර ගැටුම් හට ගත්තේය. එහෙත් හිට්ලර්ට උවමනා කළේ හමුදාවට විරුද්ධව සටන් කිරීමට නොව හමුදාව සමඟ එක්වී සටන් කිරීමටය.

පසුදා පෙරවරුයේ හිට්ලර් හා සෙන්පති ලූඩන්ඩෝර්ෆ් පෙරටු කරගත් තුන්දාහක (3000) නාසි "භටයන්" පිරිසක් හමුදා අමාත්‍යංශය කරා පෙළපාලියකින් ගමන් ගත්හ. මෙහිදී පොලිසිය හා නාසි පාක්ෂිකයන් අතර ගැටුමක් ඇති විය. දෙපිරිස අතර වෙඩි හුවමාරු වුණි.

ගෝරිං වෙඩි වැදී බිම වැටුණි. හිට්ලර් පදිකාව මත දිගා වී පණ බේරා ගෙන පළා ගියේය. නාසි භටයෝ දහසයක් හා පොලිස් භටයෝ තිදෙනෙක් මිය ගියහ. බොහෝ දෙනෙක් තුවාල ලැබූහ. එහෙත් එක මිනිහෙක් පමණක් නොබියව තිරුපද්‍රිතව පොලිස් තුවක්කු මැදින් ඉදිරියට ගියේය. ඒ ලූඩන්ඩෝර්ෆ්ය. එකද නාසි පාක්ෂිකයෙක්වත් ඔහු පසුපස ගියේ නැත.

දින කීපයක් තුළදී සියලු කැරැලිකරුවන් අත් අඩංගුවට ගන්නා ලදී. ගැලවීමට සමත් වූයේ ගෝරිං හා හෙස් පමණි. නාසි පක්ෂය තහනම් කෙරුණි. ජාතික සමාජවාදය තිඹිරි ගෙයිදීම අකල් මරණයකට ගොදුරු වූවා සේ පෙනුණි.

එහෙත් ශූර බුද්ධියකින් යුත් හිට්ලර් පරාජයද ජයග්‍රහණයකට පෙරළා ගත්තේය. තමන්ට හා තමන් විසින් නාසි ව්‍යාපාරයට ඇදා ගන්නා ලද වීර ලූඩන්ඩෝර්ෆ්ට විරුද්ධව පැවැත්වෙන නඩු විභාගය දෙස මුළු මහත් ජර්මනියේ සහ ලෝකයේ ඇස් යොමුවන බව දත් හිට්ලර් උසාවිය දේශපාලන වේදිකාවක් කර ගත්තේය.

**අන්තිමේදී ලූඩන්ඩෝර්ෆ් නිදහස් කෙරිණ. හිට්ලර් සහ තව කීපදෙනෙක් වරද කරුවෝ වූහ. හිට්ලර්ට පස් අවුරුදු සිර දඬුවමක් නියම විය. එහෙත් නම මසකදී ඔහු නිදහස් කරන ලදී.**

Scanned with CamScanner

හිට්ලර් සිර ගෙදරින් එළියට ආයේ මුළු ජර්මනිය පුරා කිතු රැස් පතුරුවන ජාතික නායකයකු ලෙසිනි.

පසු කලෙක නාසි වාදයේ ''බයිබලය'' බවට පත් වූ ''මෙයින් කාම්ප්'' (MEIN KAMPF මගේ සටන) නමැති ග්‍රන්ථය හිට්ලර් විසින් ලියන ලද්දේ සිර බත් කමින් සිටියදීය. ඔහු මුලදී පොතට තැබූ නම ''අසත්‍යයට තකතිරු කමට හා බියගුළු කමට විරුද්ධව වසර හතර හමාරක් ගෙන ගිය අරගලය'' යනුයි. එහෙත් නාසි ප්‍රචාරක අංශයේ කළමනාකරු එය වෙනස් කොට ''මගේ සටන'' යන සරල සිත්කලු කෙටි නම තැබීය.

ලෑන්ඩ්ස්බර්ග් බන්ධනාගාරයෙන් එළියට ආ හිට්ලර් ජාතික සමාජවාදී ජර්මන් කම්කරු පක්ෂය ප්‍රතිසංවිධානය කිරීමටත් එය අයෝමය විනයකින් යුත් ප්‍රබල ව්‍යාපාරයක් සේ ගොඩ නැඟීමටත් දිවා රෑ වෙහෙසුණේය.

ඇසූ ඇසූ අය මෝහනයට පත් කිරීමට සමත් වාග් චාතුර්යයක්ද, දුටු දුටුවන් දමනය කරගැනීමට සමත් අද්විතීය පෞරුෂත්වයක්ද හිට්ලර්ට තිබුණි.

හිට්ලර්ගේ සංවිධාන ශක්තිය කෙතරම්ද කිවහොත් 1925 දී සාමාජිකයෝ විසිහත්දාහක් (27,000) නාසි පක්ෂයට බැඳී සිටියහ. මේ සංඛ්‍යාව එන්ට එන්ටම ඉහළ නැංගේය. 1926 දී හතළිස් දාහක් (40,000) විය. 1927 දී හැත්තෑ දෙදාහකි. (72,000) 1929 වන විට එක්ලක්ෂ හැත්තෑ අටදාහක (1,78000) සාමාජිකත්වයකින් පක්ෂය සන්නද්ධ වී තිබුණි.

බලහත්කාරයෙන් ආණ්ඩු බලය ඇල්ලීමේ අදහස ඉවත ලූ හේ මැතිවරණය මගින්ම බලයට එන්නට ඉටා ගත්තේය. උණ්ඩයට වඩා චන්දය කෙටි පාරකැයි ඒ වනවිට ඔහු සිතන්නට විය.

Scanned with CamScanner

# 2

## ලේලිගේ ඇකයෙන් මහ පදවියේ එළිපත්තට

"අහා! ලෝකයේ කොච්චර ලස්සණ ගෑනු ඉන්නවාද" යි වරෙක හිට්ලර්ගේ මුවින් පිටවිය. හතළිස් හැවිරිදි ඔහු නොමියෙන ආදරයක් දක්වූයේ විසි හැවිරිදි බොළඳ ළමිස්සියකටය. ඇය ඔහුගේ ලේලියකි.

1928 ගිම්හාන සමයේ බර්චස්ගාඩන් පෙදෙසේ ගෙයක් කුලියට ගත් හිට්ලර් ඇන්ජලිකා (ANGELICA) නමැති මේ ලේලිය එහි රඳවා ගත්තේය. ඇය සමඟ ඇගේ මව හා අනෙක් සොයුරිය ද හිට්ලර්ගේ නිවසෙහි පදිංචි වූහ. පවුලේ අය ඇය හැඳින්වූයේ ගෙලී (GELI) යන සුරතල් නමිනි.

හිට්ලර්ගේ ප්‍රේමයට බඳුන් වූ නාඹර ගෙලී දුඹුරුවන් කෙස් කළඹකින් හෙබියාය. ඇගේ කටහඬෙහි මිහිරියාවක් ගැබ්වී තිබුණි. ඇය පියකරු අඟ පසඟින් සහ ප්‍රීතිමත් ගති පැවැතුමින් යුක්ත වූවාය.

මාමා ලේලිය කෙරෙහි දක් වූ දැඩි සෙනෙහස පිළිබඳව කට කතා පැතිර ගියේය. මේ නිසා හිට්ලර්ගේ නමට කැලලක් සිදුවේයයි නාසි පාක්ෂිකයෝ බිය වූහ. ලේලිට පෙම් කිරීම රහසේ කළ නොහැකි නම් ඇය සමඟ විවාහ වන්නැයි ඔවුහු තම නායකයාට අවවාද කළහ. එහෙත් හිට්ලර් මේ උපදෙස් තුට්ටුවකට ගණන් ගත්තේ නැත.

කෙසේ හෝ වේවා අන්තිමේදී මාමා සහ ලේලිය අතර මතභේද ඇති විය. ප්‍රේමාග්නිය නිවී යන්නට පටන් ගත්තේය.

ගෙලීට හිට්ලර් එපා වූයේ ඔහුගේ ආත්ම වධකාරී හැසිරීම

Scanned with CamScanner

නිසා යයි සමහරු කියති. දේශපාලනය අතින් මෘග ඒකාධිපතියකු වූ මේ පුද්ගලයා තමන් ආලය කළ ගැහැනුන්ගේ වහලකු වීමට යටි සිතින් පැතිලූ.

වියානාවට ගොස් සංගීතය හැදෑරීමට ගෙලී තදින් ආශා කළාය. එහෙත් ඊට ඉඩ ලැබුණේ හිට්ලර්ගෙන් නොවේ.

1931 සැප්තැම්බර් 30 දා ගෙලී හා හිට්ලර් අතර බහින් බස්වීමක් ඇති විය.

''එහෙනම් මාමා මට වියානාවට යන්න දෙන්නේ නැද්ද?''යි ගෙලී තදින් ප්‍රශ්න කළාය.

''නෑ'' යනු මාමාගෙන් ලැබුණු තනි වචනයේ කටුක පිළිතුරය.

පසුදා පාන්දර ගෙලී වෙඩි වැදී මිය ගොස් තිබුණි. එය සිය දිවි නසා ගැනීමක් බව අධිකරණ දෙපාර්තමේන්තුවේ තීරණය විය. ඇතැමුන් කීවේ එය හිට්ලර්ගේ සහචරයෙකු විසින්ම කරන ලද මිනීමැරුමක් බවය.

හිට්ලර් ගෙලීගේ වියෝවින් අසීමිත ලෙස දුක් විය. ඒ සමයෙහි ඔහු සිය දිවි නසා ගන්නා තරමට කම්පා වී සිටියේ යැයි කියනු ලැබේ.

මිනිස් ජීවිත ලක්ෂ ගණන් විනාශ කර දැමීමට කිසිම පැකිලීමක් නොදැක් වූ මේ බිහිසුණු පුරුෂයාගේ හද ගැබ තුළ යොවුන් කෙල්ලක් කෙරෙහි මෙතරම් දැඩි ආදරයක් පිළිසිඳ ගැනීම කෙතරම් අරුමයක්ද?

XXXXXX

1929 - 1930 සමයේ මහා ආර්ථික පරිහානියකට ලෝකය ගොදුරු විය. එහි ප්‍රති විපාක වලට මුහුණ පෑමට ජර්මනියට ද සිදුවුණි.

විදේශීය ආධාර ඇණ හිටියේය. කම්හල් වසා දැමුණි. භාණ්ඩ නිෂ්පාදනය අඩකින් පහළ වැටුණි. ලක්ෂ ගණනාවකට රක්ෂා අහිමි විය. සුළු වෙළෙඳ ව්‍යාපාර හා කර්මාන්ත සුනු විසුනු වී ගියේය. බැංකු බංකොලොත් ලැබීය.

මේ තත්ත්වය හිට්ලර්ට හා නාසි පක්ෂයට දෙවියන් එවූ තිළිණයක් බඳු විය.

Scanned with CamScanner

1930 සැප්තැම්බර් 14 දා අලුත් මැතිවරණය පැවැත්වුණි. මේ වනවිට ජාතික සමාජවාදී ජර්මන් කම්කරු පක්ෂය යනුවෙන් නම වෙනස් කර තිබුණු හිට්ලර්ගේ පක්ෂය ජර්මනිය දෙවතාත් වන අන්දමේ මැතිවරණ ව්‍යාපාරයක් ගෙන ගියේය. යළි ප්‍රබල හා දියුණු ජර්මනියක් ගොඩ නැඟීමට හේ පොරොන්දු විය. වාසේයි සාම ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමට හා යුද වන්දි නොගෙවා සිටීමට හේ පිළිණ දුණි. සෑම ජර්මානුවෙකුටම රැකියාවක් සැපයීමට හේ දිවුළේය. සෑම පවුලක ම ආහාර ප්‍රශ්නය විසඳීමට හේ ප්‍රතිඥා දුන්නේය.

ඡන්ද ප්‍රතිඵල ගණන් කර බලන විට හිට්ලර් පවා පුදුමයට පත් විය. ඊට පෙර මැතිවරණ පොරයේදී ඡන්ද අට ලක්ෂ දහ දාහකට (8,10,000) වඩා නොගත් නාසි පක්ෂය මෙවර ඡන්ද හයකෝටි හතළිස් ලක්ෂ නවදාස් හයසීයක් (6,40,9,6000) ලබමින් දෙවෙනි බලගතුම පක්ෂය ලෙසින් ඉස්මතු වී තිබුණි.

මේ මැතිවරණයෙන් පසු ජර්මනියේ දේශපාලන තත්ත්වය තව තවත් අවුල් වී ගියේය. එකිනෙකා සමග පොර කෑ දේශපාලන පක්ෂ ගණනාවක් විය. පිහිටුවන ලද සෑම ඇමැති මණ්ඩලයක්ම බිඳ වැටෙන්නට වන. පළමුවෙනි ලෝක යුද්ධය අවසානයේ පිහිටුවන ලද ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය කොයි මොහොතේ හෝ විනාශ වී යන තැනට වැඩ සැලසී තිබුණි.

1932 ජූලි 31 දා මහා මැතිවරණය පස් මසක් තුළ පැවැත්වුණු තුන් වෙනි මැතිවරණයයි. මහජනයාට ආණ්ඩුවත්, ප්‍රජාතන්ත්‍රයත්, දේශපාලන පක්ෂත්, මැතිවරණයත් අන්තයටම තිත්ත වී තිබුණි.

මේ මැතිවරණයේදී අන් හැම පක්ෂයක් අභිභවමින් පෙරට ආයේ හිට්ලර්ගේ නාසි පක්ෂයයි. ඔවුනට ඡන්ද එක්කෝටි තිස් හත් ලක්ෂ හතලිස් පන්දාහක් (1,37,45,000) සහ ආසන 230 ක් හිමි විය. 1928 මැතිවරණයෙන් පසු ගෙවී ගිය වසර හතරක කෙටි කාලය තුළ නාසි පක්ෂයේ ඡන්ද සංඛ්‍යාව එක්කෝටි තිස් ලක්ෂයකින් (1,30,00000) ඉහළ නැඟ තිබුණි.

එවකට ජර්මනියෙහි රක්ෂා විරහිත තරුණයන් හැට ලක්ෂයක් සිටි අතර ඔවුන්ගෙන් බහුතර සංඛ්‍යාව සහයෝගය දැක්වූයේ හිට්ලර්ගේ පක්ෂයටය.

එහෙත් ජනාධිපති තරඟයෙන් ජය ගත්තේ හිටපු ජනාධිපති හින්ඩන්බර්ග් (HINDENBURG) මය. ඔහු පැරදවීමට හිට්ලර් සමත් වූයේ නැත. නාසි පක්ෂයේ නායකයා වශයෙන් හිට්ලර්ට අගමැති

Scanned with CamScanner

පදවිය පිරිනැමිය යුතු යයි කෙරුණු ඉල්ලීම ජනාධිපති විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එසේ වුවද වෙනත් දක්ෂිණාංශික පක්ෂවල සහයෝගය ඇතිව මැති සබයේ සභාපති පදවිය හිමිකර ගැනීමට නාසි පක්ෂය සමත් විය. සභාපති පදවියට පත්වූයේ හර්මන් ගෝරිංය.

සැප්තැම්බර් 12 දා මැති සබයට ඉදිරිපත් කෙරුණු විශ්වාස භංග යෝජනාවකින් අගමැති පොන් පැපන් (VON PAPEN) ගේ ආණ්ඩුව බිඳ වැටුණි. ඒ නිසා යළිදු ඒ අවුරුද්දේම නොවැම්බර් මස තව මහා මැතිවරණයක් පැවැත්වීමට සිදු විය.

මේ මැතිවරණයේදී බලාපොරොත්තු රහිත අන්දමින් නාසි පක්ෂයේ ඡන්ද සංඛ්‍යාව එක්කෝටි දහහත් ලක්ෂය (1,17,00000) දක්වා පහත වැටුණි. ආසන 608 කින් සමන්විත වූ ජර්මන් මැතිසබයෙහි කලින් ආසන 230 ක් දිනාගෙන සිටි ඔවුනට මෙවර දිනාගත හැකි වූයේ ආසන 196 ක් පමණි.

වෙන වචන වලින් කියතහොත් ජූලි මැතිවරණයේදී නාසි පක්ෂයට ඡන්දය දුන් එක්කෝටි තිස්හත් ලක්ෂයකට අධික ජර්මන් ජනතාවෙන් විසි ලක්ෂයක් දෙනා නොවැම්බරයේදී හිට්ලර් වෙතින් පළා ගොස්ය. මොවුන්ගෙන් විශාල වැඩි සංඛ්‍යාවකගේ සහයෝගය එවර ලැබුණේ ජාතිවාදී පක්ෂයට හා අර්නස්ට් තේල්මාන් (ERNST THALEMANN) ගේ නායකත්වයෙන් යුක්ත වූ කොමියුනිස්ට් පක්ෂයටය.

ජාතිවාදී පක්ෂයේ ආසන සංඛ්‍යාව 37 සිට 52 දක්වා වැඩි වූ අතර කොමියුනිස්ට්වරු ආසන සියයක් දිනා ගැනීමට පොහොසත් වූහ. ඒ කෙසේ වුවද තවමත් මැති සබයෙහි වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකර ගෙන හුන් තනි පක්ෂය හිට්ලර්ගේ පක්ෂය විය.

සීග්‍රයෙන් ඉහළ ගිය හිට්ලර්ගේ හා නාසි පක්ෂයේ ජනප්‍රියත්වය ඒ සා සීග්‍රයෙන්ම පල්ලම් බැසීමේ පෙර නිමිත්තක් වූ මේ මැතිවරණයෙන් පසු බියට පත් කර්මාන්ත හිමියෝ සහ හමුදා සෙන්පතියෝ හිට්ලර්ට සම්පූර්ණ සහයෝගය දීමට පටන් ගත්හ. මොවුන් අතරින් වැඩි දෙනා ජාතිවාදී පක්ෂයේ අනුගාමිකයන් වුවද ජර්මනිය වමට ඇදී යාම වළකාලිය හැකි එකම පක්ෂය නාසි පක්ෂය යයි ඔවුහු තීරණය කළහ.

Scanned with CamScanner

නොවැම්බර් මැතිවරණයෙන් පසු අගමැති ධූරයට පත් වූ පරණ පැපන් ම එම ධූරයෙහි තවදුරටත් රැඳී සිටියහොත් ජර්මනිය සමාජවාදය වැළඳ ගැනීමට එකඟවීම වැළැක්විය නොහැකි බව කර්මාන්ත හිමියන්ගේ සහ ඉඩම් හිමියන්ගේ නිගමනය විය.

XXXXXX

මේ අතරතුරේ තවත් පුද්ගලයෙක් ඔහුගේ සර්ප හිස ඔසවන්නට පටන් ගත්තේය. ඒ ආරක්ෂක ඇමැති කුර්ට් පොනැශ්ලෙයිචර් (KURT VON SCHLEICHER) ය.

කලක් සේනාධිනායකයකු ලෙසින් ක්‍රියා කළ ජනාධිපති හින්ඩන්බර්ග් යටතෙහි වූ හමුදාංකයක සෙන්පතියකු වශයෙන් ඔහු සේවය කර තිබුණි.

ඉතා ශූර හා කපටි දේශපාලනඥයකු වූ ශ්ලෙයිචර්ට උවමනා කළේ අගමැති අසුනින් පැපන් නෙරපා දැමීමටත් හිට්ලර්ට ඊමත වාඩි වීමට ඇති ඉඩ කඩ අසුරාලීමටත්ය. අගමැති පදවිය තමන්ටම හිමිකර ගැනීම මේ බලකාමී සෙන්පතියාගේ අභිප්‍රාය විය.

මේ අරමුණු ඉටුකර ගනු සඳහා ශ්ලෙයිචර් ක්‍රියාත්මක කළ යටි කුට්ටු වැඩපිළිවෙල නිසා ඔහුගේ පැරණි "ලොක්කා" වූ ජනාධිපති හින්ඩන්බර්ග් නොවැම්බර් 17 දා පැපන් අගමැති ධූරයෙන් පහ කළේය.

එහෙත් හිස් වූ අගමැති අසුනට කුමක් කළ යුතු දැයි සාකච්ඡා කරනු සඳහා ජනාධිපතිවරයා විසින් කැඳවන ලද්දේ හිට්ලර් මිස ශ්ලෙයිචර් නොවේ.

ජනාධිපති මන්දිරයේදී හිට්ලර් හමුවෙහි යෝජනා දෙකක් තැබිණ. මැති සබයේ බහුතර සහයෝගය ලද හැකිනම් අගමැති පදවිය කෙලින්ම හිට්ලර්ට පැවරෙනු ඇත. නොඑසේ නම් පැපන් උප අගමැති වශයෙන් පත් පත් කිරීමට හිට්ලර් එකඟ විය යුතුය. යෝජනා දෙකින් එකක්වත් ක්‍රියාත්මක නොවූයෙන් ජර්මනියේ අධිපතිකම අල්ලා ගැනීමට තවමත් තමන්ගේ අත දිග මදි බව නාසි නායකයාට ඒත්තු ගියේය.

පැපන්ගේ නායකත්වයෙන් යුත් රජයක කොටස්කරුවන් වීමට නාසි පක්ෂය අකමැති වූ හෙයින් තමන්ගේම නායකත්වයෙන් යුත් රජයකට එම පක්ෂය ඇඳා ගත නොහැකිදැයි ශ්ලෙයිචර් සොයා බලන්නට විය. ඇඩොල්ෆ් හිට්ලර් එබඳු යෝජනාවකට කිසිසේත්

Scanned with CamScanner

එකඟ නොවන හෙයින් ශ්ලෙයිචර් ග්‍රෙගෝර් ස්ට්‍රාසර් (GREGOR STRASSER) පසු පස ඉව අල්ලන්නට පටන් ගත්තේය.

එවකට නාසි පක්ෂයේ දෙවැනි ප්‍රබලතම නායකයා වූ ස්ට්‍රාසර් හිට්ලර්ට වඩා වසර තුනකින් වයසින් බාල කෙනෙකි. ප්‍රථම ලෝක යුද්ධයේදී ජර්මන් හමුදාවට බැඳී නිර්භීතව සටන් කළ භේවායෙක් වූ ඔහු 1920 දී නාසි පක්ෂයට එක් වී සීග්‍රයෙන් ඉහළ නැංගේය. හිට්ලර් හා සදිසි චතුර කථිකයෙකු වූ ස්ට්‍රාසර් සංවිධාන ශක්තිය අතින් ද විශිෂ්ඨ දක්ෂකම් පෑවෙකි.

නාසි පක්ෂයේ වාමාංශයේ නායකයා වූයේ ස්ට්‍රාසර්ය. ඔහු ජර්මනිය තුළ සමාජවාදය ගොඩ නැඟිය යුතු යයි මුලු හදවතින්ම විශ්වාස කළේය. ඔහු හිට්ලර් මෙන් සමාජවාදය පිළිබඳ සංකල්පය බලයට රිංගීමේ මන්ත්‍රයක් ලෙසින් පමණක් සැළකු කෙනෙක් නොවේ. මේ වාමාංශික නාසි නායකයාට සහයෝගය දක්වන මන්ත්‍රීවරුන් ඇතුළු විශාල පිරිසක් එම පක්ෂය තුළ සිටි අතර "නායකතුමා" අන්ධයකු මෙන් අනුගමනය කිරීමට ඔහු සූදානමින් සිටියේ නැත.

ස්ට්‍රාසර් මිතුරු කරගත් ශ්ලෙයිචර් තමන්ගේ නායකත්වයෙන් යුත් රජයකට නාසි පක්ෂයේ අනුග්‍රහය ලබා දෙන ලෙස ඉල්ලීය. මේ උභතෝකෝටික ප්‍රශ්නය සම්බන්ධයෙන් වෙයිමාර් නුවරට ර ස් වූ නාසි නායකයෝ බොහෝ වේලා සාකච්ඡා කළහ. ශ්ලෙයිචර්ගේ නායකත්වයෙන් යුත් රජයකට නාසි පක්ෂය සහයෝගය දිය යුතු යයි ස්ට්‍රාසර් සහ විල්හෙල්ම් ෆ්‍රික් (WILHELM FRICK) තර්ක කළ අතර ගෝරිං සහ ජෝසප් ගොබල්ස් (JOSEF GOEBBELS) ඊට තරයේ විරුද්ධ වූහ. හිට්ලර්ද, ගෝරිං - ගොබල්ස් මතය අනුමත කළෙන් ශ්ලෙයිචර් සමග සභාග රජයක් පිහිටුවීමේ යෝජනාව ප්‍රතික්ෂේප කරන ලදී.

හිස්ව තිබෙන අගමැති අසුන ඉක්මනින් පිරවිය යුතු වූ හෙයින් ජනාධිපතිවරයා පැපන් හා ශ්ලෙයිචර් යන දෙදෙනාම දෙසැම්බර් 01 දා තමන් වෙත කැඳවූයේය.

පැන නැඟී ඇති දේශපාලන අර්බුදය විසඳා ජර්මනිය බේරා ගැනීමට නම් තමන්ට අගමැති වශයෙන් පූර්ණ බලතල දිය යුතු බවත්, ආණ්ඩු ක්‍රම පනත සහ මැති සබයේ අනුමැතිය ගැන ටික කලකට අමතක කළ යුතු බවත් පැපන් කියා සිටියේය.

අනෙක් අතින් තමාට අගමැතිකම පවරන ලෙසත් එසේ කළහොත් ස්ට්‍රාසර් ප්‍රමුඛ නාසි පාක්ෂික මන්ත්‍රීන් හැට දෙනකුගේ

Scanned with CamScanner

පමණද, මධ්‍යම පංතික පක්ෂවල සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ මන්ත්‍රී වරුන්ගේද සහයෝගය තමාට ලබා ගත හැකි බවත් ශ්ලෙයිචර් අවධාරණයෙන් කියා පෑවේය. ශ්ලෙයිචර්ගේ යෝජනාවට හිනෙකින්වත් එකඟ වීමට අකමැති වූ ජනාධිපතිවරයා වහාම අගමැති පදවිය බාරගෙන නව රජයක් පිහිටුවන්නැයි පැපන්ට නියෝග කළේය.

පැපන්ගේ පශ්චාත් ප්‍රදේශයෙන් අගමැති අසුන රත්වීමට පටන් ගැනීමටත් කලින් භයානක ආරංචියකින් ඔහුගේ පපුව රත් වී ගියේය.

විදේශීය ආක්‍රමණයකට මුහුණ දීමටවත්, නාසි වරුන් හෝ කොමියුනිස්ට් වරුන් ඇති කරන අභ්‍යන්තරික කැළඹීමක් මැඩලීමටවත් ජර්මන් හමුදාව ශක්ති සම්පන්න නොවන හෙයින් පැපන් බලාපොරොත්තු වූ පරිදි රට තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශ නොකළ යුතුයැයි හමුදා මූලස්ථානයෙන් ලැබුණු ඒ අනතුරුදායක ආරංචියයි. මෙයද ශ්ලෙයිචර් විසින් පැපන් බිය ගැන්වීමට යොදන ලද සූක්ෂ්ම උපක්‍රමයක් විය. කෝපයට පත් අගමැති වරයා වහාම හින්ඩන්බර්ග් වෙත දුවගොස් ශ්ලෙයිචර් ආරක්ෂක ඇමැති පදවියෙන් පහ කරන ලෙස අයැද සිටියේය.

ඊට එකඟ නොවූ ජනාධිපතිවරයා පැපන් අමතා කීයේ අගමැති පුටුවෙහි රැඳී සිටීමට තමන්ට බැරි නම් ශ්ලෙයිචර්ට සිය වාසනාව උරගා බලන්නට ඉඩ හරින ලෙසය.

දෙසැම්බර් 2 දා කුර්ට් පොන් ශ්ලෙයිචර් අගමැති ධුරයට පත් කෙරිණ. බොහෝ කාලයක් සටප්‍රයෝග හා කුමන්ත්‍රණ කිරීමෙන් පසු සෙන්පති ශ්ලෙයිචර් උද්දාමයෙන් වාඩි ගත්තේ ගිනි කන්දක් මත බව ඔහු හැර අන් හැම දෙනකුටම වැටහී ගියේය.

ජර්මනිය ආර්ථික පාරිහානියේ මරු කටේ හොස්ස ළඟටම ලිස්සා තිබුණි. කයිසර් පරපුරේ රාජාණ්ඩුව බිඳ හෙළා ගොඩ නඟා ගත් ජර්මන් ජනරජය අවසන් හුස්ම හෙළමින් තිබුණි. කොමියුනිස්ට් විප්ලවයක හෝ නාසි කැරැල්ලක කළු වළාකුළු ජර්මනියේ හිස මත කිටි කිටියේ කැටි වෙමින් තිබුණි.

දෙසැම්බර් 2 දා ගොබල්ස් සිය දින පොතෙහි මෙසේ සඳහන් කළේය.

'ශ්ලෙයිචර් අගමැති විය. ඔහු වැඩි කලක් දරා සිටින්නේ නැත.'

බොහෝ විට ජ්‍යොතිෂඥයන්ගේ අනාවැකිවලට වඩා දේශපාලන දෛවඥයන්ගේ අනාවැකි නිවැරදිය.

# 3

## කුමන්ත්‍රණ මධ්‍යයේ හිට්ලර් අගමැති වෙයි!

කුර්ට් පොන් ශ්ලෙයිචර් අගමැති පදවියේ වැඩ බාරගත් මොහොතේ පටන් ජර්මනිය - විශේෂයෙන් එහි අගනුවර වූ බර්ලිනය - දේශපාලන කුමන්ත්‍රණවලින් පිරී ගියේය.

පැපන් ශ්ලෙයිචර්ට උගුල් ඇටවූ අතර ශ්ලෙයිචර්, පැපන් හා හිට්ලර් යන දෙදෙනාගේම පියාපත් කැපීමට තැත් කළේය. ජනාධිපතිගේ පුතා වූ ඔස්කාර් (OSKAR) සහ රාජ්‍ය ලේකම් මෙයිසනර් (MEISSNER) ජනාධිපති මැඳුර එක් කුමන්ත්‍රණ ගුහාවක් කරගෙන සිටි අතර හිට්ලර්ගේ සහ ඔහුගේ සගයන්ගේ කසු කුසු කුටිය වූයේ බර්ලිනයේ කයිසරොප් හෝටලයයි.

1933 වර්ෂය ආරම්භ වන විට කුමන්ත්‍රණ හා ප්‍රති කුමන්ත්‍රණ කෙතරම් පැතිර තිබුණේද කිවහොත් කවුරුන් කාගේ බෙල්ල කපත්ද්දයි කුමන්ත්‍රණ කරුවෝම නොදත්හ.

ප්‍රබල නාසි පක්ෂයේ සහයෝගය කෙසේ හෝ ලබා ගැනීමට ඉටා ගත් ශ්ලෙයිචර් එම පක්ෂය හෝ ඉන් කොටසක් රජයට ඈඳා ගැනීමට ස්ට්‍රාසර් සමත් වන්නේ නම් ඔහුට උප අගමැති පදවිය පිරිනැමීමට පොරොන්දු විය.

මේ තීරණාත්මක මොහොතේ රජයට සම්බන්ධ වීම ඉතාම ඥානවන්ත දේශපාලන පියවර වන බව හිට්ලර්ට සහ වෙනත් නාසි නායකයනට ඒත්තු ගැන්වීමට ස්ට්‍රාසර් අපමණ තැතක් දැරූ මුත් ඉන් කිසි පලක් වූයේ නැත.

Scanned with CamScanner

රජයට සහභාගි වීමේ ප්‍රශ්නය උඩ ස්ට්‍රාසර් සහ හිට්ලර් අතර හටගත් අර්බුදය කෙතරම් උග්‍ර වීද කිවහොත් අන්තිමේ ස්ට්‍රාසර් පක්‍ෂයේ සියලු තිල - තල වලින් ඉල්ලා අස්විය.

මේ අතරතුරේ පැපන් හෙමින් සීරුවේ හිට්ලර්ට කිට්ටු කළේය. දෙදෙනා අතර කොලොං නගරයේදී රහස් සාකච්ඡාවක් පැවැත්වුණු අතර ශ්රෝදර් (SCHROEDER) නමැති බැංකු හිමි කෝටිපතියාද මේ කසු කුසුවට සහභාගි විය. මේ පුද්ගලයන් තිදෙනා කවර නිගමනයකට එළඹියේද යනු රහසක් වූ මුත් එතැන් පටන් නාසි පක්‍ෂයේ අරමුදල පුදුමාකාර වේගයකින් තරවීමට පටන් ගත් බව නම් රහසක් නොවේ.

දේශපාලන නායකයන්ගේ සහයෝගය නොලැබෙන විට පොදු ජනතාව දෙසට හැරුණු ශ්ලෙයිචර් ගොවීනට හා කම්කරුවනට සෙත සලසන පියවර කීපයක් ගැනීමට තැත් කළේය. මේ හේතුවෙන් විශාල ඉඩම් හිමියන්ගේ සහ කර්මාන්ත හිමියන්ගේ වෛරයත්, විරෝධයත් ඔහුගේ රජයට විරුද්ධව නැඟී ආයේය.

නාසි පක්‍ෂයෙන් අස්වූ එහි දෙවැනි ප්‍රබලතම පුද්ගලයා වන ස්ට්‍රාසර් තම කැබිනට් මණ්ඩලයට ඇතුල්කර ගැනීමට අගමැති ශ්ලෙයිචර් තව ප්‍රයත්නයක් දැරුවේය.

ජාතිවාදී පක්‍ෂයේ නායකයා වූ හියුගන්බර්ග් (HUGENBERG) සම්බන්ධයෙන්ද ඔහු මෙවැනිම ප්‍රයත්නයක යෙදුණේය. අවසානයේදී දෙදෙනාම ශ්ලෙයිචර්ගේ ඇම ගිලීම ප්‍රතික්ෂේප කළහ.

ජනවාරි 15 දා ලිප් නමැති කුඩා ජර්මන් ප්‍රාන්තයෙහි මැතිවරණයක් පැවැත්වුණු අතර එහිදී තරමක ජයග්‍රහණයක් ලැබීමට නාසි පක්ෂය සමත් විය. ස්වකීය පක්ෂයේ ජනප්‍රියත්වය පහත බසිමින් තිබුණු මෙබඳු වකවානුවක එබඳු පුංචි මැතිවරණයකදී ලත් සුළු ජයග්‍රහණයක් වුවද විශිෂ්ට විජයග්‍රහණයක් ලෙසින් හුවා දැක්වීම වාසිදායක බව දත් නාසි නායකයෝ ඒ පම්පෝරිය සඳහා සියලු ප්‍රචාරක මාධ්‍යයන් සීමාන්තයට යෙදවූහ.

ගොබල්ස් විසින් මෙහෙයවන ලද මේ ''ජය'' ඝෝෂාවෙන් ජනාධිපතිවරයාගේද ඔහුගේ පුත් ඔස්කාර්ගේද රාජ්‍ය ලේකම් මෙයිස්නර්ගේද, තව බොහෝ ප්‍රතිගාමීන්ගේද සිත් සතන් කා වැදී ගියේය.

ජනවාරි 22 දා සවස එතෙක් අප්‍රකටව හුන් නාසි පාක්ෂිකයකු

Scanned with CamScanner

වන ජෝකිම් පොන් රිබන්ට්‍රොප් (JOACHIM VON RIBBENTROP) නමැත්තාගේ නිවසෙහි පිල් තුනකට අයත් කුමන්ත්‍රණකරුවෝ එකට එක් වී කතිකා කරන්නට වූහ. පැපන් එහි විය. ඔස්කාර් සහ මෙයිස්නර්ද එහි වූහ. හිට්ලර් ගෝරිං සහ ප්‍රික් ද ඔවුනට එක් වූහ.

ජනාධිපතිවරයාගේ පුතා රිබන්ට්‍රොප්ගේ නිවසින් නික්ම ගියේ අලුත් මිනිසකු ලෙසය. හිට්ලර්ගේ වසඟයට පත් වූ මිනිසකු ලෙසය. එහෙත් ජනාධිපති හින්ඩන්බර්ග් පුතාට වඩා සණකම හමක් තිබුණු පුද්ගලයෙකි. මේ වනවිට අවුරුදු අසූව ඉක්ම වූ මහල්ලෙකු වුවද ඔහුගේ අයෝමය හදවත පෙර සේම සුරැකී තිබුණි.

ශ්ලෙයිචර් කෙතරම් කපටියකු වුවද ස්වකීය ආණ්ඩුව ස්ථාවර කර ගැනීමට ඔහු තවම සමත් වූයේ නැත. නාසි පක්ෂය තමන් වෙත නමා ගැනීමට හෝ එය දෙකඩ කිරීමට ඔහුට නොහැකි විය. ජාතිවාදී පක්ෂයේ හෝ මැද පක්ෂවල හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හෝ සහයෝගය දිනා ගැනීමට ද ඔහු සමත් වූයේ නැත.

මැති සබයේ මන්ත්‍රීන් වැඩි පිරිසකගේ සහයෝගය ලබා ගැනීමට අසමත් වූ නිසා ශ්ලෙයිචර්ගේ අගමැති පුටුවට කණ කොකා හඬන්නට විය.

ජනවාරි 28 දා ජනාධිපතිවරයා හමු වූ ශ්ලෙයිචර් අගමැති ධුරයෙන් අස්වීමේ ලියවිලි බාර දුන්නේය. ඔහුට මෙසේ කරන්නට සිදු වූයේ තව දුරටත් බලයෙහි රැඳී සිටීමට ජනාධිපතිවරයාගෙන් අවසරයක් හෝ අනුබලයක් නොලැබුණු හෙයිනි.

"වළේ පයයි ගොඩ පයයි තිබෙන මේ වගේ වයසකදී මේ විධියේ පියවරක් ගැනීම ගැන මට දිව්‍ය ලෝකයේදී කණගාටු වන්නට සිදුවන එකක් නැහැ."යි ශ්ලෙයිචර්ගේ අස්වීමේ ලියවිලි බාර ගනිමින් හින්ඩන්බර්ග් කීවේය.

"මේ විධියේ විශ්වාසය කඩ කිරීමකින් පසු තමුන්නාන්සේ දිව්‍ය ලෝකෙට යාවිද කියන එක ගැන මට හරි සැකයි." යනු ශ්ලෙයිචර්ගේ අව කැපෙන පිළිතුර විය.

හින්ඩන්බර්ග් පසු කලෙක මිය ගිය විට කොහි යන්නට ඇද්දැයි කිසිවෙක් නොදනිති. එහෙත් හැමෝටම වළ කැපූ ශ්ලෙයිචර් එදා ජනාධිපති මන්දිරයේ සිට ආපසු ගියේ ඔහුගේ දේශපාලන මිනීවළ තුළටය.

ශ්ලෙයිචර් බලයෙන් පහවීමත් සමග ජර්මනියේ ආණ්ඩු අර්බුදය

Scanned with CamScanner

කෙතරම් උග්‍ර තත්ත්වයට පත්වීද කිවහොත් මුළු ජාතිය මුහුණ පෑවේ ''ගෙදර ගියොත් අඹු නසී - මඟ හිටියොත් තෝ නසී'' වැනි තත්ත්වයකටය. තර්ජන හා ගර්ජනවලින් ද උගුල් ඇටවීම් හා කඹ ඇදීම් වලින්ද, පාවාදීම් හා ද්‍රෝහිකම් වලින්ද, කුමන්ත්‍රණවලින් හා ප්‍රති කුමන්ත්‍රණවලින්ද දේශපාලන වේදිකාව මෙන්ම දේශපාලන පාතාල ලෝකය ද ඉතිරී පැතිරී ගියේය.

මීළඟට කුමක් සිදුවේදැයි නිශ්චය කර ගැනීමට නොහැකිව මුළු රට සැකයෙන් හා විචිකිච්චාවෙන් වෙලී ගිය අතර දේශපාලන මර්මස්ථානය වූ බර්ලින් අගනුවර සතරතින් එල්ල වූ විවිධ අන්තරායන් හෝ අන්ත්‍රායන් පිළිබඳ දූෂමාණ ආරංචි හේතුකොට ගෙන බියෙන් ඇළලී ගියේය.

හිටපු අගමැති ශ්ලෙයිචර් යුද හමුදාවේ සහය ඇතිව ඒකාධිපති ආණ්ඩුවක් පිහිටුවීමට සූදානම් වන බවට ආරංචි ලැබුණි. නාසි පාක්ෂිකයන් ක්ෂණික කුමන්ත්‍රණයක් මගින් බලය ඩැහැ ගැනීමට සූදානම් වෙතැයි කට කතා පැතුරුණි. සංවිධානය වූ කම්කරු පන්තිය කොමියුනිස්ට් පක්ෂයේ මෙහෙයැවීම යටතේ විප්ලවයකට අර අඳින බැව් සැළ වූ අතර, ජනවාරි 29 වැනි ඉරිදා ලක්ෂයක් පමණ කම්කරුවෝ අගනුවරට රොක් වී හිට්ලර් විරෝධී පෙළපාලි පැවැත්වූහ.

මේ අතර ඉකුත් දින කිහිය තුළ තිරයට පිටුපසින් හිඳගෙන හමුදා නායකයන් හා ප්‍රතිගාමී දේශපාලනඥයන් සමග බලය ඇල්ලීමේ නූල් සූත්තරය මෙහෙයැ වූ නාසි නායකයෝ නියමිත මොහොත එළඹෙන තුරු අගමැති කාර්යාලයට නුදුරින් පිහිටි කයිසරොප් හෝටලය තුළ කමින් බොමින් කසු-කුසු ගාමින් සිටියහ.

කීප වරක් ඇඟිලි අතරින් ලිස්සා ගිය ජර්මනියේ රාජ්‍ය බලය මෙවර නම් නිසැක වශයෙන් ස්වකීය ග්‍රහණයට හසු වන බව නාසි නායකයන්ගේ පරම විශ්වාසය විය.

අන්තිම මොහොතේ ඔවුන් නොවරදින තුරුම්පුවක් ගසා තිබුණි. ඒ තමා දක්ෂිණාංශික පක්ෂ සමග එක් වී ජනාධිපතිවරයාට රුචි අන්දමේ සභාග ආණ්ඩුවක් පිහිටුවීමට කැමැත්ත පළ කර සිටීම.

ජනවාරි 30 දා මධ්‍යාහ්නය එළැඹීමට ටික වේලාවකට කලින් කයිසරොප් හෝටලයට ජනාධිපති මන්දිරයෙන් හදිසි පණිවුඩයක් ලැබුණි. මෝටර් රියකට නැගුණු නාසි නායකයා ජනාධිපතිවරයා බැහැදකිනු සඳහා වේගයෙන් ගමන් කළේය.

Scanned with CamScanner

ජෝසප් ගොබල්ස්, අර්න්ස්ට් රොයෙම් ආදී සෙසු නාසි නායකයෝ කයිසරොෆ් හෝටලයේම රැඳී ඇඟිලි ගනිමින් සිටියහ.

නොසන්සුන් මිනිත්තු කිහිපයක් ගෙවී ගියේය. ඒ මිනිත්තු කිහිපය ඔවුනට දැනෙන්නට ඇත්තේ ශත වර්ෂයක් සේය.

තව මොහොතකින් ඔවුන් දුටුවේ මෙතෙක් කල් පුල පුලා හුන් ප්‍රාතිහාර්යය ඇස් පනාපිට ඉෂ්ට වන අයුරුය.

සොම්නස් හසරැල්ලකින් ගොරෝසු මුහුණ සරසාගෙන අගමැති කාර්යාලයෙන් මේ එළියට එන්නේ, මොහොතකට කලින් ජනාධිපතිවරයා ඉදිරියේ ජර්මනියේ අගමැති වශයෙන් දිවුරුම් දුන් 43 හැවිරිදි ඇඩොල්ෆ් හිට්ලර්ය.

අවජාතක පියකුගේ පාදඩ පුතකු හයසිය අසූ ලක්ෂයක් ජර්මන් ජනතාවගේ අසහාය අධිපතියා වෙමින් සකල ලෝකය හොල්ලා රටවල් හැට එකක පන් කෝටියක් මිනිස් ජීවිත වනසා, තව තුන්කෝටි පනස් ලක්ෂයක් සදාකලික අංග විකල අනාථයන් බවට පත් කොට, නගර ගම් නියම් ගම් අලු ධූලි බවට පත්කර අන්තිමේ තමනුත් දැවී අළු වී ධූලියට එක්වන ඓතිහාසික ඛේදවාචකයට මුල පිරූ අයුරුය ඒ.

එදා රාත්‍රී දහස් ගණන් නාසිවාදී ජර්මන් ජාතිකයන් හදවත උතුරා ගිය ප්‍රීතිය දරාගත නොහී අලුත් අගමැති ඇඩොල්ෆ් හිට්ලර් ඉදිරියේ නටමින්, ගයමින්, දුවමින්, පනිමින්, වැල නොකැඩී පෙළපාලි ගියේ ඔවුන් මෙතෙක් යදිමින් හා පතමින් සිටි ජර්මනියේ ගැලවුම්කාරයා පහළ වී ඇතැයි සිතාගෙනය.

මාළිගා තුළ, වලව් තුළ, බංගලා තුළ සහ මහා හෝටල්වල නිදන කාමර තුළ හිට්ලර්ට සව්දිය පෙරූ ඉඩම් හිමියන්, හා කර්මාන්ත හිමියන්ද, ප්‍රභූවරුන් හා ප්‍රතිගාමී දේශපාලනඥයන්ද ආගමික නායකයන් හා හමුදා නිලධරයන්ද සිතා හුන්නේ "රතු උවදුරින්" තමන් මුදාගත් "ගැලවුම්කාරයා" හිට්ලර් බවත්, ස්වකීය දේශපාලන හා ආර්ථික උවමනාවන් ඉටුකර ගනු සඳහා මේ සාමාන්‍ය පන්තියෙන් ආ අසාමාන්‍ය පුද්ගලයා ඉත්තකු ලෙසින් පාවිච්චි කළ හැකි බවත්ය.

තමන් නැඟ ගත්තේ කොටියකු පිට බව හිට්ලර් සමග සවාරි ඇරඹූ ඒ කිසිවකු නොදත්හ. අන්තිමේදී ඔවුනට අත්වූයේ කොටි නාම්බකු පිට නැඟී විනෝද සවාරියක් ගැසූ රීගාවේ තරුණියට අත් වූ ඉරණමය.

''රිගා පළාතේ - විසූ එක් ලලනාවක්
කොටියකු පිට නැඟී - පාමින් ලොකු සිනාවක්
ගසා පොඩි රවුමක් - ආපසු පැමිණියා මුත්
ඇය දක්නට නොමැත - කොටියා නම් සිනාසෙයි.''

*There was a young lady of Riga*
*Who smiled as she rode on a tiger*
*They returned from the ride*
*With the lady inside*
*And a smile on the face of the tiger*

1933 ජනවාරි 30 දා පහළ වූ ඇඩොල්ෆ් හිට්ලර් නමැති ''ගැලවුම්කාරයා'' ගෙන් ගැලවෙන්නට වැඩිකල් නොගොස් බොහෝ ජර්මානුවන්ට වුවමනා විය. එහෙත් ඒ සඳහා ඔවුනට දෙළොස් වසරයි, මාස හතරයි, දවස් අටක් ඉවසා සිටීමට සිදුවුණි. ඒ වනවිට ජර්මනිය ජාතියක් වශයෙන් ආත්ම විනාශය ළඟා කර ගන්නා මරු වැල පාගා හමාරය.

XXXXXX

ඉන් පෙර ෆෙඩ්රික් රජු සහ බිස්මාර්ක් වැනි සම්භාවනීය මහා පුරුෂයන් විසින් මෙහෙයවන ලද ජර්මනිය නමැති නෞකාවේ සුක්කානම 1933 ජනවාරි 30 දා අතට ගත් ඔස්ට්‍රියාවෙන් පැමිණි දුප්පත් රස්තියාදු කාරයා එතැන් පටන් හැසිරුණේ එක් අතකින් වසවර්ති මාරයා මිහිමත පහළ වූවා සේය. අනෙක් අතින් විශ්ම කර්මයා ජර්මනියේ අභිවෘද්ධිය සියතට ගත්තා සේය.

එකිනෙකා සමග ඇණ කොටා ගත්තා කුඩා රාජ්‍යයන් කීපයකට බෙදී සිටි ජර්මන් ජාතිය, තනි ප්‍රබල රාජ්‍යයක් තුළ එක් සේසත් කොට ජර්මන් අධිරාජ්‍යය ගොඩ නඟන ලද්දේ අගමැති ඔටෝ ෆොන් බිස්මාර්ක් (OTTO VON BISMARCK) විසිනි. ''රටක් ජාතියක් නඟාලිය හැක්කේ යකඩයෙන් හා ලෙයින් පමණි''යි වරෙක පැවසූ මේ අයෝමය පුරුෂයාගේ පුනරාවතාරය වූයේ ඇඩොල්ෆ් හිට්ලර්ය.

දෙදෙනාගේම අභිප්‍රාය වී තිබුණේ ජර්මනිය මුලින් යුරෝපයේ සහ අනතුරුව සමස්ථ ලෝකයේ බලගතුම රාජ්‍යය බවට පත්

Scanned with CamScanner

කිරීමය. දෙදෙනාම පාර්ලිමේන්තු ක්‍රමය අකාර්යක්ෂම විකාරයක් ලෙසින් සැලකූ අතර රටකට ඔබින ඉස්තරම්ම ආණ්ඩු ක්‍රමය ඒකාධිපති පාලන ක්‍රමයකැයි කල්පනා කළහ. දෙදෙනාම ඒකාකාරව සමාජවාදය පිළිකුල් කළහ.

එසේ වුවද දෙදෙනාම විපර්යාසකාරී සමාජ ප්‍රතිසංස්කරණයන් දියත් කිරීමට පසුබට නොවූහ. දෙදෙනාම සාමය බියගුල්ලන්ගේ ක්ෂේම භූමියක් ලෙසිනුත්, යුද්ධය මනුෂ්‍යත්වයේ උත්තරීතරභාවය ඔප මට්ටම් කරන හා පන්නරය තබන ශුද්ධ වූ හෝමාග්නියක් ලෙසිනුත් සැලකූහ.

කොටින් කියතහොත් ඇඩොල්ෆ් හිට්ලර්ගේ නාසිවාදය හෙවත් "ජාතික සමාජවාදය" බිස්මාර්ක්වාදයේ ඓතිහාසික ප්‍රතිරාවයක් පමණි.

නාසි දර්ශනය ආභාෂය ලද්දේ ශ්‍රේෂ්ඨ ජර්මන් චින්තකයන් දෙදෙනෙකු වූ ඔස්වල්ඩ් ස්පෙන්ග්ලර් (OSWALD SPENGLER) ගේ සහ ෆෙඩ්රික් නීශේ (FRIEDRICH NIETZSCHE) ගේ සිතුම් පැතුම්වලිනි. 'ශක්තිය යුක්තිය වේ' යනු ඒ දෙදෙනාගේ චින්තනයේ හරයයි.

1918 දී පළමුවන ලෝක යුද්ධය හමාර වීමත් සමගම ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ ජර්මනියේ පැවැති රාජාණ්ඩුව වෙනුවට පිහිටුවන ලද වෙයිමාර් සමූහාණ්ඩුව (WEIMAR REPUBLIC) නම් වූ ජන රජයේ ආධිපත්‍යය දැරූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රගතිශීලී ගමන් මග නොරිස්සූ ප්‍රතිගාමීහු එම පක්ෂය හා ජන රජය අහෝසි කර දැමීමට නොයෙකුත් කුමන්ත්‍රණ කළහ. අනෙක් අතට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අකාර්යක්ෂමතාවය හා දියාරු ප්‍රතිපත්ති කෙරෙහි කලකිරුණු ලක්ෂ ගණන් ජනයා ජර්මන් කොමියුනිස්ට් පක්ෂයට සහයෝගය දැක්වීමට පටන්ගත් හෙයින් කොයි මොහොතේ හෝ එරට කොමියුනිස්ට් වේය යන බියක් ප්‍රතිගාමීන් තුළ තිබුණි.

කාර්ල් මාක්ස්ගේ නිජබිම වූ ජර්මනිය ශීඝ්‍රයෙන් කොමියුනිස්ට් පාලනයක් කරා ඇදී යාමේ තර්ජනයෙන් බියට පත් ඉඩම් හිමියෝද,....... වාසේයි සාම ගිවිසුමින් ජර්මනිය නිරායුධ කරන ලද නිසා නිලතලවලට අස්වාමික වූ හමුදා නිලධරයෝද, 1929 දී ඇති වුණු ලෝක ආර්ථික පරිහානියෙන් ඉමහත් පීඩනයට පත් පහළ මධ්‍යම පන්තිකයෝද, හිට්ලර්ගේ ජාතික සමාජවාදී ආණ්ඩුවට ඉත සිතින් ආධාර කරන්නට පටන් ගත්හ.

Scanned with CamScanner

සමාජවාදී ලේබලය ගසාගෙන සිටි මුත් බොහෝ නාසි නායකයනට වුවමනා කළ සමාජවාදයක් නොමැත. හැබැයි, අවංකවම සමාජවාදය අපේක්ෂා කළ ප්‍රබල නායකයන් පිරිසක් සහ අනුගාමිකයන් රාශියක් නාසි පක්ෂය තුළ නොසිටියේ නොවේ. මෙසේ වමට බරව සිටි නායකයන් අතුරෙන් ප්‍රමුඛත්වය ගත්තේ ස්ට්‍රාසර් සහ රොයෙම්ය. එහෙත් පසු කලෙක (1934 ජූනි මස) මේ දෙදෙනා ඇතුළු වාමාංශික නාසි වාදියෝ රැසක් හිට්ලර්ගේ පිළ විසින් අමු අමුවේ මරා දමන ලදහ.

නාසි වාදීන්ගේ කොමියුනිස්ට් විරෝධී ක්‍රියා මාර්ගයෙන් තෘප්තියට පත් ඉඩම් හිමි - කර්මාන්ත හිමි - බැංකු හිමි ධනපතියන් එක් අතෙකින් හිට්ලර්ගේ රජයට අනුබලය සපයද්දී, අනෙක් අතින් ඔවුන්ගේ ධනපති විරෝධී සටන් පාඨවලින් මංමුලා වූ මධ්‍යම පන්තිය එළු සට්ටමට ඔට්ටු වූ නරියා මෙන් හිට්ලර් මත සියලු බලාපොරොත්තු රඳවාගෙන උන්හ.

එතෙක් යුරෝපා මහාද්වීපයේ අද්විතීය බලවතා වූ ප්‍රංශයෙන් ඒ නායකත්වය ඩැහැගැනීමටත්, එතෙක් ලෝකයේ උපරිම බලවතා වූ බ්‍රිතාන්‍යයෙන් ඒ ආධිපත්‍යය උදුරා ගැනීමටත්, එසේ කොට සර්ව බලධාරී ජර්මනියක් ගොඩ නැඟීමටත්, සුබ නැකත එළඹෙන තුරු පුල පුලා සිටි උග්‍ර ජාතිවාදීන්ගේ සහායද හිට්ලර්ට නොඅඩුව, නොමසුරුව ලැබුණි.

හය කෝටි අසූ ලක්ෂයක් වූ ජර්මන් ජාතියට ජර්මනියේ බිම් ප්‍රමාණය කිසිසේත් නොසෑහෙන නිසා අඩු ජනගහණයකින් යුත් අසල්වැසි රටවලින් බිම් පෙදෙස් ඇදා ගතයුතු බව හා අසල් රටවල ජර්මානුන් බහුලව පදිංචි ප්‍රදේශයන් යාකරගෙන මහා ජර්මන් රාජ්‍යයක් ගොඩ නැඟිය යුතු බව නාසීන්ගේ තර්කයක් විය. ජර්මනියේ හා ජර්මානුන් වෙසෙන වෙනත් රටවල පදිංචි වී සිටින 'අපිරිසුදු' යුදෙව්වන්ගෙන් හා ස්ලැව් ජාතිකයන්ගෙන් පිරිසුදු 'ආර්ය' ජාතියක් වන ජර්මානුන්ගේ ලේ මිශ්‍රවීම කවරාකාරයකින් හෝ වළකාලිය යුතු බවත් එමඟින් ජර්මානුන්ගේ සහජ කුසලතාවයන් හා අනූපමේය විශිෂ්ඨතාවයන් රැකගත යුතු බවත් නාසි වාදීන් දැරූ තව ආකල්පයකි.

1933 දී ඇඩොල්ෆ් හිට්ලර් සහ ඔහුගේ නාසි පක්ෂය ජර්මනියේ සර්වබලධාරී අධිපතියන් බවට පත්වූයේ මෙබඳු දර්ශනයක ජංගම තරංග මත්තෙහි පීනා යමිනි, මෙබඳු මහේශාක්‍ය ජර්මන්

Scanned with CamScanner

අනාගතයක ස්වප්නධාරා වලින් ජාතියක් තාවකාලිකව උමතු කරවමිනි.

XXXXXX

සෑම සිල්කම් ඇත්තකු ළඟ වල්කම් කීපයක් තිබිය හැක්කා සේම වල්කම් ඇත්තකු ළඟ සිල්කම් කීපයකුත් තිබෙන්නට බැරි නැත.

ඇඩොල්ෆ් හිට්ලර් ගැන අපට වැඩිපුර කියවන්නට ලැබෙන්නේ එංගලන්තයෙන්, රුසියාවෙන්, අමෙරිකාවෙන් හෝ ප්‍රංශයෙන් නිකුත් වූ පොත පතිනි. මේ රටවල පරම පවිටු සතුරා වූ හිට්ලර් ගැන ඔවුන්ගෙන් අපක්ෂපාත විවරණයක් නොලැබීම පුදුමයක් නොවේ.

ඇත්ත වශයෙන් එකී රටවල නායකයන් හිට්ලර්ට විරුද්ධව නගන චෝදනාවල සඳහන් සෑම අපරාධයක්ම ඒ රටවල් විසින්ද, වරින් වර තැනින් තැන කර තිබේ. දැනුදු එසේ නොකරන්නේ නොවේ.

බ්‍රිතාන්‍ය පාලන සමයේදී කැප්පෙටිපොලගේ නායකත්වයෙන් ශ්‍රී ලංකාවේ ඌව - වෙල්ලස්ස පෙදෙසේ අධිරාජ්‍ය විරෝධී කැරැල්ල හට ගත් විට ඒ පළාතේ සියලු නිවාස හා දේපල ගිනිබත් කරන ලෙසත්, අවුරුදු දහසයෙන් ඉහළ සෑම පිරිමියකු මරා දමන ලෙසත් අණ කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා හිට්ලර්ට වඩා සුදනකු විය හැක්කේ කවර හේතුවකින්ද?

කළු හම ඇති මිනිසුන්ට බල්ලන්ට මෙන් සලකන, අමෙරිකාවේ මුල් පදිංචිකාර රතු ඉන්දියානුන් සමූලඝාතනය කළ, අහිංසක වියට්නාම ජනතාව අමු අමුවේ ලක්ෂ ගණනින් මරා දැමූ, පරමාණු බෝම්බයෙන් ජනාකීර්ණ ජපන් නගර දෙකක් නිමේෂයකින් දවා ලූ අමෙරිකාවේ 'ප්‍රජාතන්ත්‍රවාදීන්' හිට්ලර්ට වඩා යහපත් මිනිසුන් වන්නේ කෙසේද?

ඇල්ජීරියාවේ සහ වෙනත් යටත් විජිතවල විමුක්තිකාමී ජනතාවට වසර ගණනාවක් දස වධ දුන් ප්‍රංශ අධිරාජ්‍යවාදීන් නාසි වාදීන්ට වඩා මුදු මොළොක් මිනිසුන් වන්නේ කෙලෙසද?

කලක් ස්ටාලින්ගේ දහසක් බිහිසුණු අපරාධ ඉවසා දරා සිටි, අදත් තනි පක්ෂයක ඒකාධිපතිත්වයක්, වධ කඳවුරු මාලාවක් හා

Scanned with CamScanner

දරුණු රහස් පොලිසියක් නොමැතිව සමාජවාදය දොර දන්දිය නොහැකිව සිටින රුසියානුන් හිට්ලර්ට වඩා මානව ප්‍රේමීන් වනුයේ කවර හෙයින්ද?

දැන් සියලු වස් දොස් හිට්ලර් පිටින් ඇරිය හැකි වී තිබෙන්නේ ඔහු යුද්ධයෙන් පරාජය වූ නිසාය. පරාජය වන මිනිහා දුෂ්ඨයකු කිරීමත් ජයග්‍රාහිකයා වීරයකු වීමත් ඉතා පහසු කාර්යයකි.

දෙවන ලෝක යුද්ධය ඇරඹුණු පසු හිට්ලර් සහ ඔහුගේ නාසි ජර්මනිය හෙලා දුටු රටවල් සියල්ලම පාහේ ඉන් පෙර ඔහුටත්, ඔහුගේ ආඥාදායක පාලන ක්‍රමයටත් ආ වැඩූ බව හා රැකුල් දුන් බව අප විසින් අමතක නොකළ යුත්තේය.

1914 - 1918 ප්‍රථම ලෝක සංග්‍රාමය සමයේ බ්‍රිතාන්‍ය අගමැතිව සිටියාවූද, ජර්මනියේ විල්හෙල්ම් රජු එල්ලා මරා දැමිය යුතුයයි කියා පැවාවූද, ලොයිඩ් ජෝර්ජ් (LLOYD GEORGE) 1936 දී හිට්ලර් බැහැ දැකීමට ගොස් ආපසු පැමිණ කීයේ, ඔහු 'උදාර මිනිසකු' බවය.

එයින් පසු බ්‍රිතාන්‍ය අගමැති දූරයට පත් වූ නෙවිල් චේම්බර්ලේන් (NEVILLE CHAMBERLAIN) ගේ ආණ්ඩුව සහ එවකට පැවැති ප්‍රංශ ආණ්ඩුව ස්වකීය මිත්‍ර රටක් වූ චෙකොස්ලැවැකියාව නාසි මාර දූතයන්ට පාවා දෙමින් 1938 දී හිට්ලර් සමඟ කුප්‍රකට මියුනිච් ගිවිසුම අත්සන් කළහ.

ජර්මනියේ පැවැති ප්‍රබල කොමියුනිස්ට් පක්ෂය ඒකාධිපති ආඥාවක් මගින් තහනම් කොට එම පක්ෂයේ නායකයන් සමූල ඝාතනය කර දැමීමට හිට්ලර් නොපසුබට වූ මුත් රුසියන් ආඥාදායක ජෝසප් ස්ටාලින් (JOSEF STALIN) ඔහු සමඟ පෝලන්තය බෙදා වෙන්කර ගැනීමට හා අනාක්‍රමණික ගිවිසුම් අත්සන් කිරීමට පසුබට වූයේ නැත.

පෝලන්තයද, හිට්ලර්ට සහාය වනු පිණිස ටෙස්චෙන් ප්‍රශ්නයේදී චෙකොස්ලැවැකියාවට ද්‍රෝහීව කටයුතු කළේය.

එපමණක් නොව, සර්වබලධාරී දෙවියන් වහන්සේගේ පෘථිවිගත සර්ව නිර්දෝෂී නියෝජිතයා යයි කියනු ලබන පාප් වහන්සේ පවා 1932 ජූලි 23 දා හිට්ලර් සමඟ මිත්‍ර ගිවිසුමකට එළඹී සේක. (කතෝලික සභාවේ කේන්ද්‍රස්ථානය වූ පාප් වහන්සේගේ ක්ෂුද්‍ර වතිකානු රාජ්‍යය හිට්ලර්ගේ සමකාලීනයා හා සහචරයා වූ ඉතාලියේ ආඥාදායක බෙනිටෝ මුසෝලිනී (BENITO MUSSOLINI) සමඟද

මෙබඳු සුහද ගිවිසුමක් ඇති කර ගත් බව අමතක නොකළ යුතුය.)

එවකට පැවැති අමෙරිකානු ජනාධිපති රූස්වෙල්ට් (ROOSEVELT) ගේ ආණ්ඩුවට ද හිට්ලර්ට මුක්කු ගැසීමේ චෝදනාවෙන් මිදෙනු බැරිය.

**මේ කොයි කවුරුත් හිට්ලර් ජර්මනියේ අසහාය නායකයා වී සිටිය සමය තුළ ඔහුට පූජෝපහාර පැවැත්වූ බව අනුල්ලංඝණීය ලෙසින් ජගත් ඉතිහාසයේ පිටු මත සටහන් වී හමාරය.**

මේ තර්කයෙන් අප අදහස් කරනුයේ ඉතිහාසය තක්සේරු කිරීම අපක්ෂපාතව කළ යුතු බවක් විනා හිට්ලර්ගේ තාර පැල්ලම් මැකීමට සුදු හුණු ගෑ යුතු බවක් නොවේ. යකාට වුවද උගට හිමි පිදේනියෙන් සංග්‍රහ කළ යුතු නොවැ?

හිට්ලර් වූ කලී පපුවේ කිසිදු තෙතමනයක් නොතිබුණු දයා විරහිත මෘග ඒකාධිපතියෙකි. හේ ලක්ෂ සංඛ්‍යාත මිනිස් ජීවිත පහන් සිළු මෙන් එක හුස්මෙන් නිවාලූ අධම නරුමයෙකි. එහෙත් මේ නරුමයා තුළ පවා යහපත් ගුණ කීපයක් ශේෂ වී තිබීම කෙතරම් අරුමයෙක්ද?

හේ කිසිදාක මස් මාංශ කෑවේ නැත. දුම් බීවේ නැත. මත්පැන් කට ගෑවේ නැත. තමන් සතු රාජ්‍ය බලය ඉනාවක් කරගෙන ස්ත්‍රීන් හිතුමනාපේ කෙළෙසුවේ නැත.

ඔහු මුළු ජීවිත කාලය අවිවාහකව ගෙවීමට සමත් විය. අවසාන සමයේ ඔහුට හුත් පෙම්වතිය සමඟ මිය යන්නට මොහොතකට පෙර නීත්‍යානුකූලව විවාහ වී ඇගේ හොඳ නම රැකීමට තරම් හිට්ලර් තුළ මහත්මාකම තිබුණි.

හිට්ලර් කලාලෝලයකු වීමට තරම් ඔහුගේ හදවතේ එක් කොණක මිනිස්කම රැඳී තිබුණි. හේ සංගීතයට හා චිත්‍ර කලාවට තදින් ඇලුම් කළේය.

'ඔව්, මට හරි තනි කමක් දැනෙන බව හැබෑව. ඒ වුනත් සංගීතයෙනුයි පොඩි දරුවන්ගෙනුයි මට ලැබෙන තෘප්තිය හොඳටම ප්‍රමාණවත්'යයි හිට්ලර් දූලේ දමා ගැනීමට ආ එක් කාන්තාවකට ඔහුගෙන් ලැබුණ පිළිතුරය.

සිතු - සිතු, පැතු - පැතු රූබර ලියන්ගෙන් අන්තඃපුරයක් තනාගෙන සුල්තාන් ජීවිතයක් ගත කිරීමට හැකියාව හිට්ලර්ට තිබුණ නමුත් මිය යන තුරුම ඔහු තනිකඩ ජීවිතයක් ගෙවූයේ

තමන් හොඳ යයි ඇදහූ දර්ශනය ක්‍රියාවෙහි යෙදීමට අඹු දරු කරදර බාධාවක් වේ යයි ඒත්තු ගත් හෙයිනි.

මේ ඒකාධිපතියා ස්වභාව ධර්මයේ සුන්දරත්වය අගය කළේය. තිරිසන් සතුන්ට ඇලුම් කළේය. නිතරම ඔහු ළඟ සුරතලට හදන බල්ලෙක් දෙන්නෙක් වූහ. මිය යන විටද ඇල්සේෂන් බල්ලෙක් ඔහු වෙත සිටියේය.

මහ බලගතු ජර්මන් අධිරාජ්‍යයේ සර්වබලධාරී අධිපතියා වූ මුත් පහළ සමාජයෙන් ආ හිට්ලර් තම බලය අනිසි ලෙස පාවිච්චි කොට ඉහළ පන්නයේ ජීවිතයක් ගත කිරීමට කිසිසේත් උත්සාහ ගත්තේ නැත. ඔහුගේ පෞද්ගලික ගති පැවතුම් හා වුවමනා එපාකම් ඉතා සරල විය. ඔහුගේ නිවහන හා කාර්යාලය ඉතා චාම් විය.

හිට්ලර් පිරිසිදුකම අගය කළේය. එහෙත් පෞද්ගලික සුඛවිහරණය පිළිකුල් කළේය. ඔහුගේ ආහාර වේල පවා ඉතා සාමාන්‍ය එකක් විය.

ඔහු කිසිදාක තනියම ආහාර ගත්තේ නැත. හැමදාම කීප දෙනෙකු මේසයට කැඳවා ගත්තේය.

1933 ජනවාරි 30 දා හිට්ලර් ජර්මනියේ අගමැති වූ මොහොතේ පටන් පුරා දින තුනක් නිදි වරාගෙන වැඩ කළේය. ඉන් පසු පවා ඔහු දිනකට නිදාගත්තේ ටික වේලාවකි. ඔහු සාමාන්‍යයෙන් නින්දට ගියේ රෑ දෙකට පමණය. එහෙත් නො වැරදී අලුයම අවදි විය.

ඉඳහිට ඔහු 'ඔපෙරා' නෘත්‍ය නැරඹීමට ගියේය. ඔහු නිතර බැලීමට ප්‍රිය කළ චිත්‍රපටයකි, 'ගෝන් විත් ද වින්ඩ්' නම් ඉංග්‍රීසි චිත්‍රපටය.

හිට්ලර් අගමැති වී ඔස්ට්‍රියාවට ගිය පළමු අවස්ථාවේ මුලින්ම කළේ දෙමාපියන්ගේ මිනී වළවල් කරා ගොස් ගෞරව දැක්වීමය.

ඉන් පසු ඔහුගේ ඉතිහාස ගුරුවරයා වූ ආචාර්ය ලියෝ පොයෙෂ් බැහැ දැකීමට ගියේය. සිසුවකු වශයෙන් ඔහු වැඩයෙන්ම ප්‍රිය කළ විෂය ඉතිහාසයයි.

**වැඩිවිය පැමිණි පසු මානව ඉතිහාසයේ ගමන් මග වෙනස් කිරීමට ඔහු අමතක නොකළේ එනිසාද?**

Scanned with CamScanner

# 4

## මැතිසබය ගිනිතබා විපක්ෂය වනසති!

ඉදිරියෙහි හමුවූ සියලු බාධා කම්කටොලු සුනුවිසුනු කරගෙන අනවරතයෙන් පෙරට ගමන් ගත් හිට්ලර්ගේ ඒකාධිපති ජගන්නාථ රථයට හසු වී මුලින්ම පොඩිපට්ටම් වී ගියේ කොමියුනිස්ට් පක්ෂය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සහ වෘත්තීය සංගම් ව්‍යාපාරයයි.

වැඩිකල් නොගොස් ප්‍රජාතන්ත්‍ර ගරුක ප්‍රතිගාමී පක්ෂවලටද මේ ශෝචනීය ඉරණම අත්විය.

හිට්ලර් සහ ඔහුගේ නාසි පක්ෂය විසින් ජර්මනිය තුළ ආඥාදායක පාලනයක් පිහිටුවනු සඳහාත්, එම ආඥාදායකත්වයට 'නීත්‍යානුකූල' භාවයක් අරූඪ කරනු සඳහාත්, උපක්‍රම මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

1933 ජනවාරි 30 දා හිට්ලර් අගමැති වශයෙන් දිවුරුම් දුන් පසු පිහිටුවන ලද්දේ සහාග ආණ්ඩුවක් බව අමතක නොකළ යුතුය. එම ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයෙහි ඇමැතිධුර දෙකක් හැර අන් සියල්ල හිමිව තිබුණේ ජාතිවාදීන්ට හා ස්වාධීනයන්ටය. නාසි නායකයන් දෙදෙනෙකු වූ ගෝරිංට හා ප්‍රික් ට ලැබුණු ඇමැති පදවි දෙක වැදගැම්මකට නැති පදවි දෙකකි.

තවද, නීතිය අනුව බලන විට අගමැති හිට්ලර්ගේ රජයට බලයෙහි රැඳී සිටිය හැකි වූයේ මැතිසබයේ බහුතර සහයෝගය ඊට හිමිකර ගත හැකි වී නම් පමණි. එහෙත් මන්ත්‍රීන් 583 ක් සිටි ජර්මන් මැතිසබයෙහි සහාග රජයට අයත් පක්ෂ දෙක වූ නාසි පක්ෂය හා ජාතිවාදී පක්ෂය සතුව පැවතියේ ආසන 247කි. කතෝලික

Scanned with CamScanner

මධ්‍යස්ථවාදී පක්ෂයේ මන්ත්‍රීන් 70 වේ සහයෝගය ලබාගෙන ආණ්ඩුව දිගටම ගෙන යෑමේ ඉඩකඩ සෑදී තිබුණු මුත් හිට්ලර් හිතා මතාම ඒ පිළියම මග හැරියේය. ඔහු විසින් එසේ කරන ලද්දේ අලුත් මැතිවරණයකට මග පාදා ගෙන නාසි පක්ෂයට අති විශාල ආසන සංඛ්‍යාවක් දිනා ගැනීමේ යටි අදහස ඇතිවය.

මධ්‍යස්ථවාදී පක්ෂය සභාග රජයට බඳවා ගනු සඳහා පැවැත්වුණු සාකච්ඡාව වුවමනාවෙන්ම කඩාකප්පල් කර දැමූ හිට්ලර්, මැතිසබය විසුරුවා අලුත් මැතිවරණයක් පවත්වන්නැයි ජනාධිපතිවරයාට උපදෙස් දුන්නේය.

නාසි පක්ෂය විසින් දික් කරන ලද මේ ඇම, බිලී කොක්කත් සමග ගිලගත් ජනාධිපතිවරයා හා ජාතිවාදී පක්ෂය අලුත් මැතිවරණයක් පැවැත්වීමට කැමැත්ත පළ කළහ.

1933 මාර්තු 5 දා මැතිවරණය පැවැත්වීමට තීරණය වූ අතර ස්වකීය ඉතිහාසයේ ප්‍රථම වරට විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගනු සඳහා රාජ්‍ය යාන්ත්‍රණයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට නාසි පක්ෂයට මෙවර ඉඩ සැලසී තිබුණි. පක්ෂයේ මැතිවරණ කටයුතු සඳහා ක්‍රෑප් (KRUPP) අයි.ජී. පාර්බන් (I. G. FARBEN) සහ යුනයිටඩ් ස්ටීල් වර්ක්ස් (UNITED STEEL WORKS) වැනි යෝධ කොම්පැණිවලින් මාර්ක් තිස් ලක්ෂයක "මැතිවරණ අරමුදලක්" ලබා ගැනීමට ද නාසි නායකයෝ සමත් වූහ.

මැතිවරණ ව්‍යාපාරය සමයේදී කොමියුනිස්ට් රැස්වීම් හා පුවත්පත් සම්පූර්ණයෙන්ම තහනම් කළ හිට්ලර් රජය සමාජවාදීන්ගේ (එනම් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ) රැස්වීම් එක්කෝ තහනම් කළේය. නැත්නම් "ඇස්. ඒ." හටයන් යොදවා කඩාකප්පල් කළේය.

මේ මැතිවරණය කෙතරම් දාමරිකකම් මධ්‍යයේ පැවැත්වුණිද කිවහොත් කෝලාහලවලින් මියගිය සංඛ්‍යාව පමණක් 69 දෙනෙකි.

මැතිවරණ ව්‍යාපාරය උණුසුම් වී ගෙන එද්දී - 1933 පෙබරවාරි 27 දා - ජර්මන් පාර්ලිමේන්තු (රයිෂ්ටාග්) ගොඩනැගිල්ල හදිසියේම ගිනි ගත්තේය. මැතිසබා මැඳුරට ගිනි ලූයේ කුමන්ත්‍රණයක් මගින් රාජ්‍ය බලය අල්ලන්නට මාන බලන කොමියුනිස්ට්වාදීන් විසිනැයි නාසි පක්ෂය චෝදනා කළේය. අද්භූත අග්නිජාලාව ආරම්භ කිරීමේ අපරාධය කොමියුනිස්ට් කුමන්ත්‍රණයකැයි නැගුණු චෝදනාව අභූත එකක් බව පසුව හෙළි විය.

ගින්න අරඹන ලද්දේ කොමියුනිස්ට්වාදීන් දඩයම් කිරීමට සහ විපක්ෂයේ මැතිවරණ ව්‍යාපාරය අඩපන කිරීමට මොකක් හෝ සමාවට කරුණක් සොයමින් හුන් නාසිවාදීන් විසින්මය.

පාර්ලිමේන්තුව ගිනිගත් දා රාත්‍රියේම "රතු දඩයම" ඇරඹුණි. කොමියුනිස්ට්වාදීන්, සමාජවාදීන් හා වෘත්තීය සමිති නායකයන් සිරභාරයට ගන්නා ලදී. කොමියුනිස්ට් පක්ෂයේ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිදහස් ක්‍රියාකාරීත්වයට සහමුලින්ම බාධා කරන ලදී.

මැතිසබය ගිනිගත් දාට පසුදා ජනාධිපතිවරයා හමු වූ අගමැති හිට්ලර් ජනතාව හා රාජ්‍යය ආරක්ෂා කිරීමේ ආඥාවක් නිකුත් කිරීමට ඔහු පොළඹවා ගත්තේය. මේ ආඥාවේ අනුසාරයෙන් හිට්ලර් රජයට ඒකාධිකාරී බලතල පැවරුණු අතර මුළු මහත් විපක්ෂය මර්දනය කිරීමට එය කදිම ආයුධයක් කර ගන්නා ලදී.

කොමියුනිස්ට් පක්ෂයේ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රබල සාමාජිකයන් පන් දහසකට අධික සංඛ්‍යාවක් සිර අඩස්සියට පත් කරන ලදහ. ඔවුනතර මන්ත්‍රීවරු ද වූහ.

මේ ආදී කවර උපක්‍රමයක් යෙදුවත් නාසි පක්ෂයට ඔවුන් බලාපොරොත්තු වූ අන්දමේ අති විශිෂ්ට මැතිවරණ ජයග්‍රහණයක් හිමිකර ගත නොහැකි විය. නාසි පක්ෂයට වැඩිම ආසන සංඛ්‍යාව (288) හිමි වූ බව සැබෑ මුත් මුළු ඡන්ද සංඛ්‍යාවෙන් ඔවුනට අත්කර ගත හැකි වූයේ සියයට 44 ක් පමණි. හිට්ලර්ගේ සහාග රජයේ අනෙක් පක්ෂය වූ ජාතිවාදී පක්ෂයට ලැබුණේ සියයට 8 ක ඡන්ද සංඛ්‍යාවකි.

නාසි පක්ෂයේ ආසන 288 සහ ජාතිවාදී පක්ෂයේ ආසන 52 එක්කළ විට වුවද මැතිසබය තුළ ඔවුනට තිබුණේ 16 ක වැඩි ඡන්දයක් පමණි.

මැති සබයේ අනුමැතිය සහිතව ඒකාධිපති පාලනයක් පිහිටුවනු සඳහා හිට්ලර් බලාපොරොත්තු වූ තුනෙන් දෙකක වැඩි ඡන්දය මෙවරද ඔහුගේ අතින් ලිස්සා ගොස් ඇති බව වැටහී ගියෙන් වෙනත් උපක්‍රමවල පිහිට සෙවීමට සිදු විය.

හිට්ලර් රජය අතට ඒකාධිපති බලතල පවරාගනු සඳහා මාර්තු 23 දා නව මැති සබය හමුවෙහි තබන ලද විශේෂ පනතට මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකකට වැඩි සංඛ්‍යාවකගේ සහයෝගය

Scanned with CamScanner

දිනා ගැනීමට නාසි පක්ෂය විසින් යොදන ලද්දේ සූක්ෂම උපායකි. පනතට ඡන්දය විමසීමට කලින් කොමියුනිස්ට් මන්ත්‍රීවරුන් 81 දෙනා සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සිර භාරයට ගනු ලැබූහ. ජාතිවාදී පක්ෂය සහ මධ්‍යස්ථවාදී පක්ෂය ආදී දක්ෂිණාංශික පක්ෂ පණතට ඡන්දය දෙන පරිදි රවටා ගන්නා ලදී. අන්තිමේදී පනත වෙනුවෙන් ඡන්දය විමසා බලන විට ඊට පක්ෂව ඡන්ද 441 ක් ද විපක්ෂව 84 ක්ද ලැබී තිබුණි. විපක්ෂව ඡන්දය දුන් සියලු දෙනා මැතිසබය තුළ ඉතිරි වී සිටි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මන්ත්‍රීවරුන්ය.

හිට්ලර් සහ ඔහුගේ නාසි පක්ෂය විසින් ජර්මනියේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තුවේදීම සම්මත කර ගන්නා ලද පනතක් මගින් නැති භංග කර දමන ලද්දේ ඔය ආකාරයෙනි.

''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව'' සම්මත කර ගන්නා ලද ඉහත කී විශේෂ පනතින් ඒකාධිකාරී බලතල අත්පත් කර ගත් අගමැති හිට්ලර්, වැඩිකල් නොගොස් නාසි පක්ෂය හැර අනෙකුත් සියලුම දේශපාලන පක්ෂ තහනම් කිරීමට සමර්ථ වූයේය. වෙනෙකක් තබා එතෙක් කල් නාසි පක්ෂය සමග සහාග රජයේ හුන් ජාතිවාදී පක්ෂය පවා දිය කර දමන ලදී.

නාසි පක්ෂය අතට පූර්ණ බලතල ලබා ගැනීමේ අටියෙන් 1933 නොවැම්බර් 12 දා නව මහ මැතිවරණයක් පැවැත්විණි. ඒ මැතිවරණයේදී ජර්මානුන්ට පාවිච්චි කිරීමට සිදුවූයේ නාසි පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද මන්ත්‍රීධූරාපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුවක්ය. වෙනත් කිසිම පක්ෂයට ඉදිරිපත් වීමට තහනම් වී තිබුණු හෙයින් එතැන් පටන් ඇරඹුණේ තනි පක්ෂයක - එනම් නාසි පක්ෂයේ - ඒකාධිකාරී පාලනයකි.

මහලු ජනාධිපති හින්ඩන්බර්ග් 1934 අගෝස්තු 02 දා මිය ගියේය. ඔහුගේ අභාවයෙන් පසු ජනාධිපති ධූරය හා අගමැති ධූරය ඒකාබද්ධ කෙරුණු අතර එදා සිට හිට්ලර් හැඳින්වූයේ ''පූරර් - චැන්සලර්'' හෙවත් ''අගමැති - නායකතුමා'' යනුවෙනි.

මෙසේ පූර්ණ බලැති ඒකාධිපති වූ හිට්ලර්ගේ බිහිසුණු ක්‍රියා මාර්ගයන් දියත් කිරීමට ගෙස්ටාපෝ (GESTAPO) නම් වූ ජර්මන් රහස් පොලිසියද නාසි පාක්ෂික ''ඇස්. ඒ.'' හා ''ඇස්.ඇස්.'' බලකායන් ද මහෝපකාරී විය.

Scanned with CamScanner

නාසි ව්‍යාපාරයට යන්තමින් හෝ විරෝධය පෑ සියලු දෙනා වධ කඳවුරු තුළ කොටු කරනු ලැබූහ. ඇතැම් අය මරණ ලදහ.

1935 මාර්තු වනවිට ජර්මන් කොමියුනිස්ට් පක්ෂයේ උසස් නිලධාරීන් 219 ක් සිරභාරයට ගෙන තිබුණි. ඉන් 24 දෙනෙක් මරා දමන ලදහ. මෙසේ මළවුන් අතර ලෝක ප්‍රකට ජර්මන් කොමියුනිස්ට් නායක ආර්න්ස්ට් තේල්මාන් ද විය. හින්ඩන්බර්ග් හා හිට්ලර් සමග ජනාධිපති ධූරයට තරඟ කළ අන්තිම අවස්ථාවේ තේල්මාන්ට තිස් ලක්ෂයකට අධික ඡන්ද සංඛ්‍යාවක් ලැබුණි.

නාසි පක්ෂයේ වැඩසටහනෙහි ඇතුළත්ව තිබුණු සමාජවාදී යෝජනා ස්වල්පය ක්‍රියාත්මක කළ යුතු යයි උද්ඝෝෂණයක් ගෙන ගිය පිරිසක් එම පක්ෂය තුළ වූවා සේම අනෙක් අතට නාසි පක්ෂයට මුදලින් හා වෙනත් අයුරින් උපකාර කළ කර්මාන්තශාලා හිමියන් හා සෙන්පතියන් කියා සිටියේ ප්‍රගතිශීලී පියවර සියල්ල සහමුලින් අත්හළ යුතු බවය.

හිට්ලර් සහ ඔහුගේ කිට්ටු සහචරයන් ගත්තේ ප්‍රතිගාමීන්ගේ පැත්තය.

1934 ජූනි 30 දා යකඩ කර්මාන්ත අධිරාජ්‍යයේ අයිතිකරු වූ ක්රෘප්ගේ නිවසෙහි පැවති සාකච්ඡාවකින් පසු සියලු ප්‍රගතිශීලී නායකයන් හා ඔවුන්ගේ අනුගාමිකයන් අල්ලාගෙන අමු අමුවේ මරා දමන ලදී.

එසේ මරා දමන ලද්දවුන් අතර හිට්ලර්ට බලයට එන්නට අනේක විධියෙන් ආධාර කළ ''ඇස්.ඒ.'' සංවිධානයේ අධිපති අර්න්ස්ට් රොයෙම් සහ නාසි පක්ෂයේ සමාජවාදී පිලේ නායකයා වූ ග්‍රෙගෝර් ස්ට්‍රාසර් ද වූහ. මේ සංහාරය කෙරෙද්දීම හිටපු අගමැති ශ්ලෙයිචර් මෙලොවින් තුරන් කිරීමටත් හිට්ලර් අමතක නොකළේය.

තවද යුදෙව් විරෝධී ව්‍යාපාරය දයා විරහිත ලැව් ගින්නක් සේ පැතිරෙන්නට විය. යුදෙව්වන් මර්දනය කෙරෙන නීති ගණනාවක් හිට්ලර් රජය විසින් පනවන ලදී. කම්කරුවන්ගේ පටන් වෛද්‍යවරුන් හා විශ්වවිද්‍යාල මහාචාර්යවරුන් දක්වා වූ ලොකු කුඩා සියලු යුදෙව්වන් ඔවුන්ගේ රැකියාවලින් පහ කෙරිණි. යුදෙව් වෙළෙඳ ව්‍යාපාර වර්ජනය කළ යුතු බැව් රජයේ නියෝගයකින් ප්‍රකාශ වුණි. යුදෙව් දරු පවුල් ඔවුන්ගේ නිවෙස්වලින් නෙරපා දමන ලදහ. ඔවුන්ගේ දේපොළ කොල්ල කන ලදී. ඉන්පසු ඔවුහු

Scanned with CamScanner

දැවැන්ත සිර කඳවුරු තුළ ගාල් කරනු ලැබූහ. රජය පැන වූ නව නීතියකින් සියලු යුදෙව්වන්ගේ රටවැසිකමද අවලංගු විය.

යුදෙව්වන්ට හා විරුද්ධ පාක්ෂිකයන්ට එරෙහිව දුඹුරු පැහැති නිල ඇඳුමින් සැරසුණු නාසි පාක්ෂිකයන් හා "ඇස්. ඒ." භටයන් ගෙනගිය ත්‍රස්ත ව්‍යාපාරය කෙතරම් උග්‍රවීද යත් "දුඹුරු උවදුරට" බියෙන් සමහරු රට හැර ගියහ. තව සමහරු මෙලොව හැර ගියහ.

කලින් ජර්මනිය ප්‍රාන්තීය රාජ්‍ය කිහිපයකින් සමන්විත පෙඩරල් රාජ්‍යයක් වූ නමුත් හිට්ලර් ඒ සැකැස්ම වෙනස් කොට සියලු පාලන බලතල මහ ආණ්ඩුව අතට ගත්තේය. මහ ආණ්ඩුව පැවතියේ තනිකර නාසි පක්ෂය අතෙහිය. ප්‍රාන්ත පාලනයට ගෝලෙයිටර් නමින් දිසා ඇමැතිවරුන් පත් කෙරිණි.

නාසි ආණ්ඩුව සංවිධානය වූ කම්කරු පන්තිය කෙරෙහි දැඩි බියක් දැක් වූ හෙයින් වෘත්තීය සංගම් ව්‍යාපාරය නටබුන් කර දැමීමට පටන් ගන්නා ලදී. ඉතාම දැඩි ලෙස සංවිධානය වූ කම්කරු පන්තියක් ජර්මනියේ පැවති බැවින් වෘත්තීය සංගම් ව්‍යාපාරයේ බොටුව හිර කරන ලද්දේ පියවරින් පියවරිනි.

මුලදී හිට්ලර් සහ වෙනත් නාසි නායකයෝ කම්කරු පන්තිය සහ වෘත්තීය සංගම් ව්‍යාපාරය මහ ඉහළින් වර්ණනා කරන්නටත් මැයි දිනය අති උත්කර්ෂවත් ලෙස පැවැත්වීමටත් අමතක නොකළහ. එහෙත් කම්කරු පන්තිය මර්දනය කෙරෙන හා වෘත්තීය සංගම් අහෝසි කෙරෙන අණ පනත් එන්නට වැඩිකල් ගියේ නැත.

අන්තිමේදී වැඩ වර්ජන තහනම් කොට වෘත්තීය සංගම් බලහත්කාරයෙන් විසුරුවා හැර ඒවායෙහි නායකයන් හිරකරන ලදී. ඉතිරි වූයේ එකම වෘත්තීය සමිතියකි. "ජර්මන් කම්කරු පෙරමුණ" නම් වූ ඒ වෘත්තීය සමිතිය තුළ සියලු කම්කරුවන් ඒකරාශී විය යුතු යයි බල කෙරිණි. මේ වෘත්තීය සංගමය කෙලින්ම නාසි පක්ෂය යටතේ පාලනය වූ සංවිධානයකි. එය විසින් වැඩියෙන් ආරක්ෂා කරන ලද්දේ හාම්පුතුන්ගේ අයිතිවාසිකම් විනා කම්කරුවන්ගේ අයිතිවාසිකම් නොවේ.

ඒකාධිපති බලය තහවුරු කර ගැනීම සඳහා නාසි රජය ගත් තව පියවරක් නම් සියලු ජනසන්නිවේදන මාධ්‍යයන් දැඩි ලෙස පාලනය කිරීමය. රජය යම්තමින් හෝ විවේචනය කෙරෙන කිසිදු

Scanned with CamScanner

පුවත්පතකට ඉඩ නුදුන් අතර ගුවන් විදුලි සේවය මුලුමනින්ම යොදවන ලද්දේ නාසි පාලනය හුවා දැක්වීමටය. නෘත්‍යය, සිනමාව, සාහිත්‍යය ආදී කලා ක්ෂේත්‍රයන් ද මේ ආකාරයෙන්ම පාලනය කෙරිණි.

නාසිකරණයේ ශාපයට හසු වූ තව අංශයක් නම් අධ්‍යාපනයයි. නාසි දර්ශනය ළඩ බාලවියේ පටන්ම ජර්මානුන්ගේ සිතිවිලි හැඩ ගැසිය යුතු යයි තීරණය කළ රජය පාසල් හා සරසවි අධ්‍යාපනය නාසි පාලනයට වාසි වන සේ සකස් කරන්නට සීඝ්‍ර පියවරක් ගත්තේය.

එතෙක් ජර්මනියේ භාවිත වූ පාසල් පොත් නාසිවාදයට හා ඒකාධිපති පාලනයට හිතකරවන පරිද්දෙන් සංශෝධනය කෙරිණි. ඉතිහාස පොත් පවා නාසීන්ට වාසි වන සේ විකෘති කරන ලදී. රටේ සියලුම ශිෂ්‍යයන්ට කුඩා කල පටන් පොවන ලද්දේ නාසි දර්ශනයෙන් ආටෝප කරන ලද අධ්‍යාපනයකි. පාසල් ශිෂ්‍යයන් හා තරුණයන් රජයට වුවමනා පරිදි හැඩ ගස්සනු සඳහා රජයේ අනුග්‍රහය ඇතිව ශිෂ්‍ය හා තරුණ සංවිධාන පිහිටුවන ලද අතර ඒවාට බැඳුණු අයට විශේෂ වරප්‍රසාද හිමි විය.

නාසි පක්ෂයේ දර්ශනයට එකඟව අධ්‍යාපනය සැපයීමට අකැමති වූ පාසල් ගුරුවරු සහ සරසවි ඇදුරෝ ඔවුන්ගේ රැකියාවලින් පහ කරන ලදහ. හිස් වූ ගුරු පදවි නාසි පාලනයේ වන්දිභට්ටයන්ගෙන් පුරවන ලදී.

නාසි පක්ෂය බලයට පත් වූ පසු රැකියාවලට අහිමි වූයේ ගුරුන් පමණක් නොවේ. ආණ්ඩුවේ වෘත්තීය සමිතිවලට බැඳීම් ප්‍රතික්ෂේප කළ කම්කරුවන්ගේ පටන් විනිශ්චයකාරයන් දක්වා වූ ඕනෑම කෙනෙකු ආණ්ඩුවේ සතුරෙකු ලෙසින් සලකන ලද අතර එබන්දෝ සියලු දෙනාම රැකියාවලින් නෙරපා දමන ලදහ.

නාසි ජර්මනියෙහි නීතිය හා අධිකරණ ක්‍රමය විහිළුවක් බවට පත් වී තිබුණි. නීතිය වූයේ හිට්ලර්ගේ සහ ගෙස්ටපෝ රහස් පොලිසියේ වචනයත් අභිමතයත්ය. ගෝරිංගේ නිර්මාණයක් වූ "ගෙස්ටපෝව" කෙතරම් බිහිසුණු සංවිධානයක් වීද කිවහොත් එහි නම ඇසෙන විට පවා ජර්මානුවෝ මරුබියෙන් වෙවුලූහ. ගෙස්ටපෝව කරන කියන දේ ගැන ප්‍රශ්න කිරීමට අධිකරණයට පවා බලයක් නොතිබුණු හෙයින් මේ රහස් පොලිසියට අයත් වූ

දඩ බල්ලෝ නාසි රජයේ විරුද්ධවාදීන් තමන් කැමති පරිදි මෘග ලෙස දඩයම් කරන්නට පටන් ගත්හ.

රජයේ රහස් ඔත්තු සේවය ''ගෙස්ටපෝ''ව හා සමාන තවත් පීඩාකාරී බිහිසුණු ආයතනයක් විය. ''ඇස්.ඩී.'' (S. D. SICHERHEITS DIENST) යනුවෙන් හැඳින්වුණු මේ ඔත්තු සේවය නිසා කිසිම ජර්මානු රටවැසියෙකුට බියෙන් තොරව නිදහසේ ජීවත් විය නොහැකි වුණි. වෙනෙතක් තබා ඇස්. ඩී. සංවිධානයේ ප්‍රධානියා වූ **රෙයින්හාර්ඩ් හෙයිඩ්රිච්** (REINHARD HEYDRICH) ලෝ පතළ වූයේ ''අලුගෝසු හෙයිඩ්රිච්'' යනුවෙනි.

රජයේ විරුද්ධවාදීන් මැඩලනු සඳහා කෲර මර්දන නීති රාශියක් පනවන ලද අතර ඒ නීති ක්‍රියාත්මක කිරීමට ''මහජන උසාවි'' සහ ''විශේෂ උසාවි'' නමින් අමුතුම උසාවි වර්ග දෙකක් පිහිටුවන ලදී.

දේශපාලන විරුද්ධවාදීන්ට විරුද්ධව පැවරුණු නඩු විභාග කරනු සඳහා මේ උසාවිවල මුළු කාලය වැය වූ අතර එහි ගෙනයන ලද කෙනෙකු ආපසු ගෙදර ගියේ කලාතුරකිනි. යම් හෙයකින් විත්තිකරුවකු අධිකරණය විසින් නිදහස් කරනු ලැබුවේ නම් ඔහුට නිසි දඬුවම් ලබාදීමට ගෙස්ටාපෝව වග බලා ගත්තේය.

ශ්‍රේෂ්ඨ ජර්මන් ජාතියේ නිජ භූමිය මත තිරශ්චීන ඒකාධිපති පාලනයක් බිහි වී තහවුරු වූයේ බලලෝභී දේශපාලන උන්මත්තකයන් පිරිසක් විසින් ගන්නා ලද මෙකී නොකී පියවර සිය දහස් ගණනාවක අනුසාරයෙනි.

XXXXXX

**ජීවිතයේ කිසිදු අගනා දෙයක් මිනිසාට නිකම් නොලැබේ. සෑම දෙයක් ලබාගත යුත්තේ අරගලයකින් පසුවය. ජාතියක නැගීම වුවද පහසුවෙන් හෝ ඉබේටම හෝ සිදු නොවන්නේ ඒ නිසාය. එයද මහන්සි වී දිනාගත යුතුය.**

හිට්ලර්! මෙසේ පවසා තිබේ.

ජර්මනිය ප්‍රපාතයෙන් ගොඩගනු සඳහා හිට්ලර් ඉල්ලා සිටියේ හතර අවුරුද්දක කෙටි කාලයකි. ඇත්ත වශයෙන් ඒ කෙටි කාලය තුළදී ජර්මනිය යුරෝපයේ ප්‍රබලතම රාජ්‍යය බවට පත් කිරීමට ඔහු සමත් විය.

Scanned with CamScanner

අධ්‍යාපනය, ඉඩම් අයිතිය, ගොවිතැන, කර්මාන්ත, ගමනා ගමනය, මංමාවත්, පණිවුඩ හුවමාරුව ආදී අංශයන්හි නොයෙකුත් වැඩදායක විපර්යාසයන් සිදු කරන ලදී. එමෙන්ම අමුතු පියවර කීපයක් ද ගැනිණ.

නාසි පාලනය යටතේ කාන්තාවන් රැකියාවල යෙදීම සීමා කරන ලදී. කාන්තාවට නිසි තැන ගෙදර බව නාසි දර්ශනය විය.

නිරෝගී දරුවන් හැකිතාක් ප්‍රසූත කිරීමට ඔවුන්ට දිරිදෙන ලද මුත් මානසික හා ශාරීරික ලෙඩුන් ''මාන්දම් කුක්කන්'' ලොවට බිහි කිරීම වළකන පියවර ගනු ලැබීය.

වෛශ්‍ය වෘත්තිය නීතියෙන් තහනම් කරන ලද අතර තරුණ නිකමුන්ට අනිවාර්ය රැකියා පුහුණුව සපයන වැඩ කඳවුරු පිහිටුවන ලදී.

හිට්ලර් ගෙනා නිවාස පනතක් මගින් මුඩුක්කු නැති කිරීමට පිළියම් යෙදුණි. අලුත් ගෙයක් තනා ගැනීමට වුවමනා ඕනෑම කෙනෙකුට ගෙට යන වියදමින් සියයට 40 ක් රජය විසින් ගෙවන ලදී.

ජර්මනියේ සියලුම ප්‍රධාන ගංගා හරස්කොට ජල බලය ගොවිතැනට හා කර්මාන්තවලට දඩමීමා කිරීමටද නාසි රජය සමත්විය.

සෑම ජර්මානුවකුටම ලාබෙට පුංචි කාරයක් සැපයීමේ සිහිනය සැබෑ කරගනු සඳහා නාසි රජය ''පෝක්ස්වැගන්'' කාරය නිපැදවීය. කාර්මික ඉංජිනේරු ශිල්පය අතින් ප්‍රාතිහාර්යයකියි කිව හැකි ''පෝක්ස්වැගන්'' රථයේ ඇතැම් කොටස් හිට්ලර්ගේම සැලසුම් අනුව සකස් කෙරුණු ඒවාය. 'මහජන රථය' යන අරුත් ඇති 'පෝක්ස්වැගන්' කාර් වර්ගයේ මුල් රථය පදවා පිරික්සන ලද්දේ හිට්ලර් විසින්මය.

ජර්මන් ඒකාධිපතියා තව පෙළහරක් පෑවේය. රක්ෂා රහිත ප්‍රශ්නය සහමුලින් විසඳීමට හේ සමත් විය. සෑම ජර්මන් ජාතිකයකුටම මොකක් හෝ ජීවනෝපායක් සලසා දෙන ලදී. රක්ෂා බහුල වීමට බොහෝ සෙයින් ආධාර වූයේ සීඝ්‍ර ලෙස වර්ධනය වූ යුද අවි නිෂ්පාදනයයි.

හිට්ලර් බලයට පත් වී අවුරුදු හතරක් ගෙවුණු පසු ජර්මනියේ

Scanned with CamScanner

සිදුවූ ආර්ථික පුනර්ජීවය කෙතරම් විශිෂ්ටද කිවහොත් භාණ්ඩ නිෂ්පාදනය සියයට 102 කින් ඉහළ නැංගේය. ඒ වකවානුව තුළ ජර්මනියට ගිය ඕනෑම කෙනෙකුට පෙනුණේ එරට මීවදයක් මෙන් කඩිසර ස්ථානයක් බවයි.

නාසි ජර්මනිය තුළ සීඝ්‍රගාමී හා විශ්මයජනක ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ විශේෂ ගෞරවය හිමිවිය යුත්තේ එවකට ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ධුරය දැරූ ආචාර්ය ශාච් (SCHACHT) ටය.

හිට්ලර්ට ආර්ථික කටයුතු පිළිබඳව මනා දැනීමක් තිබුණේ නැත. ඔහුගේ විශේෂ ක්ෂේත්‍රය වූයේ විදේශ කටයුතුය.

හිට්ලර් ආගම් සම්බන්ධයෙන් ද නිකම් සිටියේ නැත. විවිධ නිකාය ගණනාවකට භේදවී සිටි රෙපරමාදු ක්‍රිස්තියානි සභාව එක්සත් කෙරෙන නීතියක් ඔහු විසින් පණවන ලදී. උපතින් කතෝලිකයකු වූ හිට්ලර් කතෝලික සභාවේ අග්‍රනායක පාප් තුමා සමඟද ගිවිසුමක් ඇතිකර ගත්තේය. ඒ කතෝලික සභාවට නිදහසේ ක්‍රියාකිරීමට ඉඩ දීමටය.

එහෙත් පසු කලෙක මෙම ආගමික සංස්ථාවන් සහ නාසි රජය අතර මතභේද හට ගත්තෙන් ඔවුනට කරදර පැමිණෙන්නට විය.

සෑම ජර්මන් ජාතිකයකු තිඹිරිගෙයි පටන් මිනී වළ දක්වා නාසි දර්ශනය අනුව හැඩ ගැසීමට සියලු උත්සාහයක් දරන ලදී. මේ උමතු ප්‍රයත්නය නිසා ජර්මන් ජාතියට සිදු වූ යහපතට වඩා අයහපත අධිකය.

Scanned with CamScanner

# 5

## 'මගේ මනාලිය ජර්මනියයි!'

නියම වේලාවේදී මියයාම වැඩිකල් ජීවත් වනවාට වඩා බොහෝ විට ඥානවන්ත හා වාසනාවන්ත දෙයක් විය හැක.

ඇඩොල්ෆ් හිට්ලර් මිය යා යුතුව තිබුණේ 1937 දීය. බලයට පත් වීමේ හතර වැනි සංවත්සරය යෙදී තිබුණු ඒ වර්ෂයේදී මිය ගියේ නම් ඔහු ඉතිහාසයට ප්‍රවේශ වනුයේ 'ශ්‍රේෂ්ඨයකු' ලෙසිනි. අභාග්‍යයකට මෙන් හිට්ලර් ඊට වැඩි කලක් ජීවත් විය. දෙවෙනි ලෝක යුද්ධය සහ යුදෙව් සංහාරය ඇරඹුණි. එනිසා ඔහුට ඉතිහාසයෙහි හිමි වූයේ ඇටිලාට හා නිරෝට යාබද අසුනකි.

බිහිසුණු ඇටිලා ගමන්ගත් අශ්වයාගේ පයට පෑගුණු තන්හි තණ කොළ පවා මැරී ගියේල. කෲර නීරෝ රෝමය ගිනිගනිද්දී වීණා වැයීලු.

හිට්ලර් මරා දමනු සඳහා නානා කණ්ඩායම් විසින් දොළොස් වරක් පමණ උත්සාහ දරණ ලද මුත් ඒ හැම ඝාතන ප්‍රයත්නයකින්ම ඔහු බේරුණේය. අන්තිමේදී ඔහුට බේරෙන්නට බැරිවූයේ ඔහුගෙන්මය.

හිට්ලර්ගේ කෲරත්වය යුද කාමීත්වය හා අහංකාරෝන්මාදය ගැන මොහොතකට අමතක කරතහොත් රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් ශ්‍රේෂ්ඨත්වයට හිමිකම් කිව හැකි ගුණාංගයන් දස්කම් හා ජයග්‍රහණයන් රැසක් ඔහුගේ 'ධන තිරුවට' එකතු කළ නොහැක්කේ නොවේ.

හිට්ලර් ඥාති - මිත්‍ර සංග්‍රහය තරයේ පිළිකුල් කළේය. ජර්මනියේ

Scanned with CamScanner

හෝ නාසි ව්‍යාපාරයේ අභිවෘද්ධියට හරස් වූ සතුරන් සේම මිතුරන්ද, විරුද්ධ පාක්ෂිකයන් මෙන්ම ස්වපාක්ෂිකයන් ද එකසේ අතුගා දැමීමට ඔහු පසුබට වූයේ නැත.

ඔහු ජර්මනියේ අගමැති හා ජනාධිපති වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අකුරට පිළිපදිමිනි. ඔහු ඉස්සරහ දොර කඩා බිඳ ගෙන හෝ පස්ස දොරෙන් රිංගා ගෙන හෝ බලය ඩැහැගත්තේ නැත. ඔහු ඒකාධිපතියකු වූ බව සැබවි. එහෙත් ඒකාධිපතියකු වූයේ ද ව්‍යවස්ථාවට අනුකූලවය! ඔහු ප්‍රජාතන්ත්‍ර පාරාදීසයේ උපන් ආඥාදායක යම රජ්ජුරුවන්ය. විපක්ෂයේ මන්ත්‍රීන් සිරගත කොට හෝ මැති සබය තුළ 'තුනෙන් දෙකේ බහු ඡන්දය' ලබාගත් ව්‍යවස්ථානුකූල ඒකාධිපතියාය.

කර්මාන්ත ව්‍යාපාර නිසා පරිසරය දූෂණය වීම වළකාලීමේ වැදගත්කම මුලින්ම අවබෝධ කරගත් යුරෝපීය රාජ්‍ය නායකයා හිට්ලර්ය.

පරිසරය දූෂණය වීම සීමා කෙරෙන පියවර ගැනීමට ජර්මනියේ කම්හල්වලට නියෝග කළ ඔහු ස්වාභාවික ජල මාර්ග පිරිසිදුව තබා ගැනීමට උනන්දුවක් දැක්විය.

හිට්ලර් යුදෙව්වන් වඳකර දැමීම සඳහා උපදෙස් ගත්තේ ඇමෙරිකා එක්සත් ජනපද ඉතිහාසයෙනි. ආයුධ බලයෙන් සහ බඩගින්නේ තැබීමෙන් ඇමරිකාවේ මුල් පදිංචිකරුවන් වූ රතු ඉන්දියානුන් ජාතියක් වශයෙන් නටබුන් කර දැමීමට ඇමරිකානු ආණ්ඩුව ක්‍රියා කළ ආකාරය හිට්ලර්ගේ ප්‍රශංසාවට ලක්විය.

ඇඩොල්ෆ් හිට්ලර් අගය කරන ලද්දේ සාමාන්‍ය ජර්මන් ජාතිකයන් විසින් පමණක් නොවේ. ඔහු ජර්මනියේ මෙන්ම වෙනත් රටවලද ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ ප්‍රසාදයට ලක්වූ කෙනෙකි.

විසිවන සියවසෙහි ජර්මනියෙහි විසූ විශිෂ්ටතම නාට්‍ය රචකයා වූ ගර්හාර්ට් හෝප්ටමාන් (GERHART HAUPTMANN) සහ දක්ෂතම සංගීත රචකයා වූ රිචඩ් ස්ට්‍රාස් (RICHARD STRAUSS) හිට්ලර් සහ ඔහුගේ ක්‍රියාමාර්ගය අනුමත කළහ.

හිට්ලර්ට නොබෙල් සාම ත්‍යාගය පිරිනැමිය යුතු බව ගර්ට්රූඩ් ස්ටෙයින් (GERTRUDE STEIN) ගේ අවංක අදහස විය. ජෝර්ජ් බර්නාඩ් ෂෝ (GEORGE BERNARD SHAW) හිට්ලර් අගය කරමින් බ්‍රිතාන්‍ය පුවත් පත්වලට ලිපි සැපයුවේය. ස්වකීය සහෝදර රට වැසියන්ගේ සුබසෙත ගැන හිට්ලර් තුළ අවංක කැක්කුමක් ඇතැයි

Scanned with CamScanner

සුප්‍රකට ස්වීඩන් ජාතික දේශ ගවේශක ස්වෙන් හෙඩින් (SVEN HEDIN) පවසා තිබේ.

හිට්ලර් පිළිබඳව මෙතෙක් ලියැවී ඇති ඉතාම සත්‍ය ගරුක පර්යේෂණ ග්‍රන්ථ ස්වල්පයෙන් එකක් වන ජෝන් ටෝලන්ඩ් (JOHN TOLAND) ගේ 'ඇඩොල්ෆ් හිට්ලර්' නමැති ග්‍රන්ථයෙහි ජර්මන් ආඥාදායකයා ගැන රසවත් තොරතුරු කීපයක් හෙළිකර තිබේ.

ඉන් සමහරක් මෙසේය:

- හිට්ලර්ගේ එක් අණ්ඩ කෝෂයක් නියම ප්‍රමාණයට පහතට එන්නේ නැතිව ශරීරය අභ්‍යන්තරයෙහි හිර වී තිබිණැයි කීම බොරුවකි.
- හිට්ලර් යුදෙව්වනට ඔතරම් වෛර කිරීමට එක් හේතුවක් ඔහුගේ මවට වැළඳී තිබුණු පිළිකා රෝගයට යුදෙව් වෛද්‍යවරයකු විසින් අයිඩොෆෝර්ම් නමැති වැදගැම්මකට නැති බෙහෙතක් නියම කිරීම නිසා ඇය මරුමුවට පත්වීම විය හැක.
- හිට්ලර්ගේ පෙළපතේ යුදෙව් ජාතික සීයා කෙනෙකු සිටි බව පිළිගැනීමට පුළුවන.
- හිට්ලර් සම ලිංගික සේවනය ප්‍රිය කළායැයි කීම අමූලික බොරුවකි.
- හිට්ලර්ට ලෙනින්ට මෙන් පුදුමාකාර මතක තබා ගැනීමේ ශක්තියක් තිබුණි.
- ඉරුවාරුදාව, නිතර බඩ විරේචනයවීම, (කකුලේ) දද, විදුරු මස්වලින් ලේ ගැලීම, නිරන්තර උදරාබාධ ආදී රෝගවලින් හිට්ලර් විවිධ අවස්ථාවලදී පෙළෙන්නට විය.

XXXXXX

තරුණ සමයේ නැවතී සිටි එක් ගෙදරක මහලු අයිති කාරියට හිට්ලර් ඇමතුවේ සහ සැලකුවේ 'සුළුමව' ලෙසිනි. මියුනිච් නුවර අසළ කුඩා ගමක් වූ සොල්න්හි විසූ හොප්මාන් නමැති මේ මහලු කත බැහැ දැකීමට ඔහු වරින් වර ගියේය. ඇයට තෑගි බෝගද දුන්නේය.

බලයෙන් හිස උදුමවාගෙන පැරණි මිතුරන් හා දිළිඳු නෑයන් අමතක කිරීම ඔහුගේ සිරිත නොවීය.

අගමැති පදවියට පත්වීමට කලින් තමන් නැවතී සිටි ඕනෑම පෙදෙසක සංචාරයේ යෙදෙන විට අගමැති හිට්ලර් නොවරදවා කළ එක් දෙයක් නම් තමන්ට සෙවන දුන් ඒ ස්ථාන වලට යෑමත් තමන් ආහාර ගත් පහත් පෙළේ බොජුන්හල්වලට ගොඩ වැදී පරණ පුරුදු පන්නයේ ආහාර වේලකින් සප්පායම් වීමත්ය.

පුරා වසර විසි දෙකක් ජර්මන් ඒකාධිපතියා ළඟින් ඇසුරු කළ කාන්තාවක් වන දැනට 78 හැවිරිදි විනිප්‍රිඩා වැග්නර් (WINIFREDA WAGNER) 1975 දී පළ කළ පොතක සඳහන් වන අන්දමට හිට්ලර් ඔය කියන තරම් කෲර හෝ දුෂ්ඨ හෝ ආත්ම උන්මාදයෙන් පෙළුණු පුද්ගලයෙක් නොවේ. ඔහු තුළ යහපත් සහ මානුෂික ගතිගුණ පැවැති බව ඇය තරයේ කියා සිටී.

'අද වුනත් හිට්ලර් ආවොත් මම දොර අරිනවා' යයිද ඇය පවසයි.

හිට්ලර්ට 'අතිශය කාන්තිමත් ඇස් දෙකක්' තිබුණු බව පවසන ඇය ඔහු කන්කලු ලෙස පියානාව වාදනය කළ බවත් පොඩිත්තන්ට දැඩි සෙනෙහසක් දැක් වූ බවත් හෙළි කරයි.

හිට්ලර්ගේ අයෝමය හදවතේ සෙනෙහෙබර උණුසුම ලැබූ විනිප්‍රිඩා වැග්නර් ලෝක ප්‍රසිද්ධ ජර්මන් සංගීතඥ රිචඩ් වැග්නර්ගේ ලේලියක් වූවාය. ජර්මන් ඒකාධිපතියා විනිප්‍රිඩා කෙරෙහි දැක් වූ සෙනෙහස මෙතරම් දැඩි වූයේ ඔහු රිචඩ් වැග්නර්ගේ සංගීතය මහත් සේ අගය කළ හෙයිනි.

හිට්ලර්ගේ හදවත ඩැහැගත් තව කාන්තාවක් නම් එංගලන්තයේ උපන් යුනිටි මිට්ෆෝර්ඩ් (UNITY MITFORD) ය. ස්වාධීන ජීවිතයක් ගත කළ ධනවත් හා නැණවත් කාන්තාවක් වූ ඇය හිට්ලර් සහ ඔහුගේ පැසිස්ට්වාදී දේශපාලනය කෙරෙහි දැක්වූයේ අකලංක භක්තියකි. බ්‍රිතාන්‍ය පැසිස්ට්වාදී පක්ෂයේ නායකයා වූ සර් ඔස්වල්ඩ් මොස්ල (OSWALD MOSLEY) විවාහ වූයේ ඇගේ සෝයුරියක් සමඟය.

මේ පුදුම කාන්තාවගේ ප්‍රධාන අභිප්‍රාය වූයේ බ්‍රිතාන්‍යය හා ජර්මනිය අතර දැඩි මිත්‍රත්වයක් ගොඩනැගෙනු දැකීමය. එහෙත් දෙරට අතර දෙවන ලෝක යුද්ධය ඇවිලීමෙන් ඇගේ ඒ සුන්දර සිහින ලෝකය සුනු විසුනු වී ගියේය. මෙයින් ඇය කෙතරම් කම්පා වූවාද කිවහොත් හිසට වෙඩි තබාගෙන මිය යාමට තැත් කළාය. එහෙත් වහාම හිට්ලර් විසින් ඇය වෙත යවන ලද දක්ෂතම

වෛද්‍යවරුන්ගේ ප්‍රතිකර්මවල පිහිටෙන් ඇගේ ජීවිතය ගලවා ගත හැකි විය.

හිට්ලර් තුළ විනිප්‍රිඩා සහ යුනිටි කෙරෙහි තිබුණේ ප්‍රේමයකුත් නොව, මිත්‍රත්වයකුත් නොව ඒ දෙකට අතරින් හැඟීමකි.

හිට්ලර් නිසා ජීවිත පූජාවෙහි යෙදීමට තැත් කළ තව කතක් වූවාය. ඇය ගැන ලෝකයා එතරම් හොඳින් දන සිටියේ නැත. ඇය හිට්ලර්ට පණට පණ සේ ආදරය කළ මුත් හිට්ලර්ගේ හදවත ඒ අවාසනාවන්තිය කෙරෙහි ඇදී ගියේ නැත. මෙය ඉවසාගත නුහුණු ඇය හෝටල් කාමරයක් තුළ දී එල්ලී මැරෙන්නට තැත් කළාය. එහෙත් වාසනාවකට මෙන් ඇගේ මෝඩ ප්‍රයත්නය දුටු පිරිසක් විසින් එය ව්‍යර්ථ කරන ලදී. මේ සිද්ධිය වූයේ හිට්ලර් එතරම් නම ගිය පුද්ගලයකු නොවූ වර්ෂ 1921 දීය.

අවුරුදු ගණනාවකට පසු ඇය වෙනත් පුරුෂයකු සමඟ විවාහ වී සැපවත් ජීවිතයක් ගත කරද්දී හිට්ලර්, ඇය ඔහුගේ පෞද්ගලික ඡායාරූප ශිල්පියා වූ හෙයින්රිච් හොෆ්මාන් (HEINRICH HOFFMANN) වෙත ගෙන ගොස් ඇගේ ඡායා රූපයක් ගත්තේය.

හිට්ලර් අවසන් හුස්ම හෙලන තුරු ඔහුගේ අවිවාහක ප්‍රියම්බිකාව වශයෙන් ජීවත් වූ ඊවා බ්රෝන් (EVA BRAUN) නමැති රූමතිය මුණගැසුණේ හොප්මාන්ගේ ඡායාරූපාගාරයේදීය.

ගෙලීගෙන් පසු හිට්ලර්ගේ හදවත අන් කතක් කෙරෙහි ඉතා තදින් බැඳී තිබුණේ නම් ඒ කත ඊවා බ්රෝන්ය. අවසාන මොහොතේ - එනම් 1945 අප්‍රේල් 30 දා - බර්ලිනයේ බිම්ගෙයක් තුළ හිට්ලර් සමඟ දිවි නසාගත් ඇය එමඟින් ඉතිහාසයට එක් වූවාය.

ජර්මන් ඒකාධිපතියා වස ලැජ්ජාකාරයෙක් විය. එනිසා ඔහු ප්‍රකටව පෙම් කළේ නැත. ප්‍රශංසාත්මක වැකි දෙක තුනකට ඔහුගේ ප්‍රේමය සීමා විය. නිතර ඔහු ඊවාට තෑගි බෝග ගෙනැවිත් දුන් මුත් ඒවාද මල්, චොකලට් සහ බාල අබරණ වැනි චාම් දේවල් විය.

දෙදෙනා අතර සම්බන්ධය වඩාත් තහවුරු වූ පසු ඊවා වැඩි වශයෙන් ජීවත්වූයේ හිට්ලර්ගේ නිවසේමය. එහෙත් ඇය අමුත්තන් හමුවට පැමිණියේ කලාතුරකිනි. මුල් වකවානුවේදී හිට්ලර් සහ ඊවා අඹු සැමියන් වශයෙන් ජීවත් වූයේ නැත. එක වහල යට හිටියත් ඊට පෙළඹීමට තරම් හිට්ලර් කාමුක පුද්ගලයෙක් නොවීය. එහෙත් ජීවිතාවසානයට ටික කලකට පෙර පටන් ඔවුන් අඹු සැමියන් වශයෙන් හැසිරෙන්නට පටන් ගත් බව නොඅනුමානය.

Scanned with CamScanner

ඒවාද වරක් ප්‍රේමය නිසා දිවි නසා ගැනීමට තැත් කළාය. ඒ 1932 ගිම්හානයේදීය. පිස්තෝලයකින් පපුවට වෙඩි තබා ගත් මුත් ඇගේ දිවි ගැලවුණි. ඇය එසේ පපුවට වෙඩි තබා ගත්තේ (යම් හෙයකින් ජීවත් වුවහොත්) හිට්ලර් පෙරටත් වඩා තදින් ඇයට ආදරය කරාවිය යන චේතනාවෙනි. මේ කට්ට කෛරාටික කම්වලින් තොර අහිංසක හා නූගත් ජර්මන් තරුණිය තමාට වඩා අවුරුදු ගණනාවක් වැඩිමහල් පෙම්වතා වෙනුවෙන් ඔහුගේ නෙත් ඉදිරිපිටදීම ජීවිතය පූජා කිරීමෙන් පෑයේ කාන්තාවන් තුළ ඉතා දුර්ලභව දක්නා ලැබෙන අන්දමේ අද්විතීය ආත්ම පරිත්‍යාගයකි. ආශ්චර්යමත් වීරත්වයකි.

එදිනෙදා ජීවිතයෙහි හිට්ලර් සමඟ ඉතා කිට්ටුවෙන් ගැවසුණු පුද්ගලයකු වූද, ඔහුගේ අතිශය කුළුපග මිත්‍රයකු වූද (හිට්ලර්ගේ පෞද්ගලික ඡායාරූප ශිල්පී) හෙයින්රිච් හොප්මාන් පවසන අන්දමට කාන්තාවන් හිට්ලර් වෙත දැක්වූයේ පුදුමාකාර භක්තියක් හා ආදරයක්ය. වැඩි මහල් වයසේ ස්ත්‍රීහු පවා ඔහුට පෙම්පත් ලිවූහ. සුචරිතවත් විවාහක කාන්තාවෝ ඔහුගෙන් දරු සම්පත් පැතූහ. තරුණියන් ඔහුට ලියූ ලියුම් වලින් පෙනුණේ පැහැදිළි වශයෙන්ම ඔවුන්ගේ සිහි විකල් වී ඇති බවය.

බලයට පත් වන්නට පෙර මෙන්ම පසුවද හිට්ලර් වෙත කාන්දමකට මෙන් කාන්තාවන් ඇදී ආ මුත් ඔහු විවාහ ජීවිතයකට ඇතුළු නොවී සිටියේ ජර්මන් ජනතාව, ආර්ය වර්ගයා සහ මුළු මහත් ලෝකය වෙනුවෙන් තමාගෙන් ඉටුවිය යුතු ඓතිහාසික සේවාවට අඹු දරු කරදර බාධාවක් වෙතැයි ඔහු තරයේ විශ්වාස කළ නිසාය. ඔහු කාන්තාවන් එක්ක සමාගමය ප්‍රිය කළ මුත් සහවාසය ප්‍රිය නොකළේ ඒ නිසාය.

**'මගේ මනාලිය ජර්මනිය' යයි හිට්ලර්ගේ මුවින් නිතර පිට වූ වැකියකි.**

හිට්ලර්ට කාන්තාවන් මෙතරම් ඇලුම් කරද්දී ''විවාහ නොවන්නේ'' මන්දැයි ඔහුගේ පෞද්ගලික ඡායාරූප ශිල්පී හොප්මාන් වරෙක ප්‍රශ්නයක් නැඟීය.

'මා මල්වලට ආශා කළ පලියට උයන්පල්ලකු වන්න උවමනා නැත' යනු හිට්ලර් ගත් කටටම දුන් පිළිතුරය.

කෝමළ ලලනාවනට ඇලුම් කරන පුද්ගලයකු ලලිත කලාවනට ඇලුම් කිරීම පුදුමයක් නොවේ. හිට්ලර් සහජ කුසලතාවයකින්

Scanned with CamScanner

යුත් චිත්‍රඥයෙක් විය.

ඔහු අතින් ඇඳුණු චිත්‍ර - විශේෂයෙන් දිය සායමින් ඇඳි චිත්‍ර - කලාත්මක වශයෙන් ඉතා ඉහළ මට්ටමේ කෘතීන්ය. ඇත්ත වශයෙන් හිට්ලර් සිය ජීවිතය චිත්‍ර කලාව වෙනුවෙන් මිඩංගු කළේ නම් ඔහු සම්භාවනීය චිත්‍රඥයකු වීමටත් යුරෝපය මහා විනාශයකින් බේරීමටත් හොඳටම ඉඩ තිබිණි.

පෞද්ගලික ජීවිතයෙහි ඔහු නිරුවත නොරිස්සූ මුත් කලා කෘතිවල නිරුවත ඉවසා සිටියේය. (හේ සිය නිවස තුළ පවා අමුත්තන් ඉදිරියෙහි කොට කලිසමකින් හෝ උඩුකය නොවසා හෝ පෙනී සිටීමට ලජ්ජා වූවෙකි.)

වරක් 'ලීඩා සහ හංසයා' නමැති චිත්‍රයක් ජර්මනියේ චිත්‍ර ප්‍රදර්ශනයකට ඉදිරිපත් කරන ලදී. සුප්‍රකට චිත්‍රඥයකු වූ පී. ඇම්. පැඩුවා (P. M. PADUA) ගේ කෘතියක් වන මේ චිත්‍රයෙන් දක්වුණේ දණහිස් ළඟින් දෙකකුල් හා දෑත නිදහසේ පිටුපසට විහිදාගෙන නිරුවතින් වැතිරී සිටින තරුණියකත්, ඇගේ දණහිස් අතරට වී පියාපත් සලමින් සර්පයකු බඳු දිගු බෙල්ල අඹර අඹරා උඩු අතට දිගා කරගෙන සිටිමින් යම්කිසි ප්‍රමෝදයක උච්ච අවස්ථාවක මිහිර විඳින හංසයෙකුත්ය.

මේ චිත්‍රය ප්‍රදර්ශනයට තැබූ විගස නාසි පක්ෂය හා මුළු මහත් ජර්මනිය තුළ ආන්දෝලනයක් ඇති විය. වෙන මොන වැරදි තිබුණත් දැඩි සුචරිත වාදීන් වූ නාසි පාක්ෂිකයෝ මේ චිත්‍රය ඉවත් කළ යුතු යයි උද්ඝෝෂණය කළහ.

එහෙත් ඒ චිත්‍රය ප්‍රදර්ශනය කිරීම නුසුදුසු නැත. යනු හිට්ලර්ගේ තීරණය වූයෙන් එය දිගටම ප්‍රදර්ශනය කැරිණි.

තිරිසන් සතුන්ට අනුකම්පා කළ අයකු වශයෙන් හිට්ලර් විනෝද දඩයම් මහත් සේ පිළිකුල් කළේය. විනෝදයට සතුන් දඩයම් කරන අය පවා ඔහුගේ අප්‍රසාදයට පාත්‍ර විය.

හිට්ලර් ජ්‍යොතිෂය හා ආකාශ වස්තු විද්‍යාව ගැන ලොකු සැලකිල්ලක් දක්වූ කෙනෙකි. ග්‍රහ තාරකා ඒ ඒ අවස්ථාවල පිහිටා ඇති ආකාරය මනුෂ්‍ය වර්ගයා කෙරෙහි බලපාන බව හිට්ලර් විශ්වාස කළේය.

ඔහුගේ තව මතයක් වූයේ නොවැම්බර් මාසය විප්ලව හට ගන්නා මාසයක් බවත්, මැයි මාසය ඕනෑම කටයුත්තක් පටන් ගැනීම සඳහා සුබදායක බවත්ය. බොහෝ විට තමාට හෝ තමන්

ඇසුරු කරන්නකුට යම්කිසි ආපදාවක් සිදුවන්නට තිබුණේ නම් ඒ පිළිබඳ කල් තබා හිට්ලර්ට ඉඟියක් පහළ වූ බවත් මෙවැනි සිද්ධීන් ගණනාවක් ගැන තමන් දන්නා බවත් ඔහු ළඟින් ඇසුරු කළ හෙයින්රිච් හොෆ්මාන් පවසයි.

දෙවන ලෝක මහා යුද්ධය කෙසේ අවසන් වේද යන්න ගැනත් එබඳු ඉඟියක් හිට්ලර්ට මුලදීම දැනුණේ නම් ඔහුටත් ලෝක වාසීන්ටත් එය කෙතරම් භාග්‍යයක් වන්නට ඉඩ තිබුණේද?

XXXXXX

1977 නොවැම්බර් මස බටහිර ජර්මනියේ සිට ලැබුණු රොයිටර් ප්‍රවෘත්ති වාර්තාවක් පවසන අන්දමට ඇඩොල්ෆ් හිට්ලර්ට දාව ප්‍රංශ කතකට ලැබුණු දරුවෙක් තවම ජීවතුන් අතර සිටී. හිට්ලර්ගේ පුතකු යයි සැක කරනු ලබන 59 හැවිරිදි ජීන් ලොරේ ගැන රොයිටර් වාර්තාවෙන් මෙසේ පැවසිණි.

'ආඥාදායක ඇඩොල්ෆ් හිට්ලර්ගේ සහජාතක නොවන පුතකු තමාට හමුවී යයි බටහිර ජර්මානු ඉතිහාසඥයකු වන ආචාර්ය වර්නර් මාසර් පෙරේදා හෙළි කළේය.

'හිට්ලර්ගේ මේ 'පුතා' ජර්මානු දේශ සීමාව අසල උතුරු දිග ප්‍රංශයේ ජීවත් වූ අතර නම 'ජීන් ලොරේ' බවද ඔහු කීවේය.'

'කෙසේ වෙතත්, ස්වකීය ලිපිනය හෙළි නොකළ යුතු යයි ලොරේ කී බවද ආචාර්ය මාසර් පැවසීය.

ජර්මනියේ ''නාසි යුගය'' ගැන පර්යේෂණ රැසක් ආචාර්ය මාසර් විසින් පවත්වා ඇත. ඔහු පැවසූ අන්දමට හිට්ලර්ගේ මේ පුතාගේ වයස දැන් 59 කි. විවාහකයකු වන ඔහුට දරුවෝ නම දෙනෙක් සිටිති. හමුවී ඇත්තේ වසර දෙකකට පෙරය.'

'ලොරේගේ මවට හිට්ලර්ව හමු වී ඇත්තේ පළමුවන ලෝක යුද්ධයේදී හිට්ලර් හමුදා කෝප්‍රල් කෙනෙකු හැටියට සේවය කරද්දීය.'

'ඇය 1951 පැරිස් නුවර දී මිය ගොස් ඇති බවත්, ලොරේගේ 'තාත්තා' පිළිබඳ රහස ඔහුට හෙළි දරව් කර ඇත්තේ මරණ මංචකයේදී බවත් ආචාර්ය මාසර් පැවසුවේය.'

'ලොරේටද 'තාත්තා' පිළිබඳ රහස ලෝකයට හෙළිදරව් කරන්නට දැන් අවශ්‍යව ඇත. හේතුව, තමාද ඉක්මනින් මිය යාවි

යයි ඔහු කල්පනා කරන හෙයිනි. ඔහු දැනට පසුවන්නේ රෝගී තත්ත්වයේය.'

'ආචාර්ය මාසර් පැවසූ පරිදි ලොරේ ද ඔහුගේ තාත්තා වූ හිට්ලර් මෙන් ස්වකීය සෞඛ්‍ය තත්ත්වය ගැන කිසියම් බියකින් නිතර පසුවෙයි. තමා මැරෙන්න කිට්ටු වෙනවා යි දිනපතාම පාහේ කල්පනා කරන්නෙකි.'

'හිට්ලර්ගේ අතවැසියකු වන හෙයින්ස් ලින්නේ නාසි නායකයාද සමඟ පසු කලකදී 'මේ පුතාත් මවත්' ජීවත් වෙන නිවස සෙවීමට ගොස් ඇත. එහෙත් ඔවුන් ඉන්නා තැනක් සොයා ගැනීමට දෙදෙනාට බැරිවී තිබේ.' (රොයිටර්)

Scanned with CamScanner

# 6

## දෙවන ලෝක යුද්ධය ඇරැඹේ!

යකඩ අගමැති යන අපර නාමය සමඟ ඉතිහාසගත වී ඇති ඔටෝ පොන් බිස්මාර්ක්ගේ අඩිපාරේ යමින් මුලින් ජර්මනිය ආර්ථික අතින් හා යුද බලය අතින් අති බලසම්පන්න රාජ්‍යයක් බවට පත්කර ගත් ඇඩොල්ෆ් හිට්ලර් ඉන්පසු යුරෝපයේ අග්‍ර චක්‍රවර්ති වීමේ සිහිනය සැබෑ කරගන්නා අටියෙන් වට පිට බලන්නට පටන් ගත්තේය.

1935 මැයි මාසයේදී ප්‍රසිද්ධ ප්‍රකාශයක් කළ අගමැති හිට්ලර් වාසේයි ගිවිසුමේ නිරායුධ කොන්දේසියට තව දුරටත් යටත් වී සිටීමට ජර්මනිය සූදානම් නැතැයි හඬගා කීය.

එතැන් පටන් ජර්මනිය ශීඝ්‍රයෙන් සන්නාහ සන්නද්ධ වීමට පටන් ගත්තේය.

1938 මාර්තුවේදී හිට්ලර්ගේ හමුදාවෝ අසල්වැසි ඔස්ට්‍රියාවට කඩා පැන්නෝය. ජර්මානුන් විශාල සංඛ්‍යාවක් වෙසෙන එරට ජර්මනියට ඈඳා ගන්නා ලදී. (හිට්ලර්ගේ නිජ බිම වූයේ ද ඔස්ට්‍රියාවය.)

ඊළඟට හිට්ලර්ගේ ඇස ගියේ යාබද චෙකොස්ලොවැකියාවටය. එරට සුඩෙටන් ප්‍රාන්තය ජර්මානුන් පදිංචිව හුන් පෙදෙසකි. බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ජර්මන් ආක්‍රමණයකදී චෙකොස්ලොවැකියාවට ආධාර කිරීමට ගිවිස සිටි නමුදු ඒ දෙරට කුප්‍රකට මියුනිච් ගිවිසුමට අත්සන් කොට චෙක් රට ජර්මනියට පාවා දුන්හ. ජර්මනිය එරටින් කොටසක් කඩා ගත් අතර මේ

කලබලය මැද්දේ පෝලන්තය සහ හංගේරියාව ඉතිරි ටික ඩැහැ ගත්හ. චෙකොස්ලොවැකියාව ලෝක සිතියමෙන් අතුරුදහන් විය.

එයින් පසු හිට්ලර්ගේ උකුසු ඇස හැරුණේ පෝලන්තය වෙතය. පළමු ලෝක යුද්ධය අවසානයේ දී බ්‍රිතාන්‍යය, ප්‍රංශය ප්‍රමුඛ මිත්‍ර ජාතීහු කලින් ජර්මනිය සතුව පැවැති ඩැන්සිග් වරාය සහ ඒ වරායට යාබද පෙදෙස පෝලන්තයට තෑගි කළහ. හිට්ලර් ඩැන්සිග් වරාය හා ඊට යාබද පෙදෙස ජර්මනියට ඉල්ලා සිටියේය.

එහෙත් පුංචි පෝලන්තය මහ බලගතු ජර්මන් තර්ජනයට බිය වූයේ නැත. බ්‍රිතාන්‍යය හා ප්‍රංශයද තව දුරටත් කරබාගෙන සිටීමට සූදානම් නැති බව පෙන්වූහ. චෙක් රට හෝ ඔස්ට්‍රියාව ජර්මනියට ඈඳා ගැනීමෙන් බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට අනතුරක් නොවුවත් ඩැන්සිග් වරාය ආපසු ජර්මනිය අතට පත්වීම ගැන ඒ දෙරට බිය වූහ.

බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය නාසි ජර්මනියට මුලදී රුකුල් දෙමින් අනතුරුව බුරුල් දෙමින්ද ක්‍රියා කරන්නට වූයේ නාසි රජයේ උග්‍ර සෝවියට් විරෝධී ගිනිදළුල්වලට පවන් සැලීමේ යටි අදහස ඇතිවය. නාසි ජර්මනිය ලවා කොමියුනිස්ට් රුසියාව පොඩිපට්ටම් කර දැමීම ඒ දෙරටේ අභිප්‍රාය විය.

එසේ වුවද ජර්මනියේ හිට්ලර්, බ්‍රිතාන්‍යයේ චෙම්බර්ලේන්ට හෝ ප්‍රංශ අගමැති ඩැලඩියර් (DALADIER) ට වඩා කපටියෙකි. ජර්මනිය 1939 අගෝස්තු මස රුසියාව සමඟ අනාක්‍රමණ ගිවිසුමක් අත්සන් කළේය. එසේ කොට රුසියාව මධ්‍යස්ථ කර තැබුවේය.

හිට්ලර් යළි යළිදු ඩැන්සිග් වරාය ඉල්ලා පෝලන්තයට බල කරන්නට විය. හිට්ලර්ගේ ගර්ජනාවට නැමුණේ පෝලන්තය නොවේ.

ඩැන්සිග් ප්‍රශ්නය ගැන හිට්ලර් සහ බ්‍රිතාන්‍ය තානාපති අතර සාකච්ඡාවක් ඇති විය. යුද්ධයක් හට ගතහොත් බ්‍රිතාන්‍යය නියත වශයෙන්ම පෝලන්තයේ පැත්ත ගන්නා බව තානාපති වරයා හිට්ලර්ට සැළ කළේය.

'මට දැන් වයස අවුරුදු පණහයි. පණස් පහේදී හෝ හැටේදී යුද්ධ කරනවාට වඩා දැන්මම යුද්ධ කරන්න මා කැමතියි.' යනු හිට්ලර්ගෙන් ඔහු ලද පිළිතුරය.

1939 සැප්තැම්බර් 1 දා හිට්ලර්ගේ මාර සේනාව පෝලන්තයට

Scanned with CamScanner

කඩා පැන ඩැන්සිග් පෙදෙස පමණක් නොව එරට ඉතිරි කොටසද අල්ලා ගත්හ. ඊට දින දෙකකට පසු එනම් සැප්තැම්බර් 3 දා බ්‍රිතාන්‍යය හා ප්‍රංශය, පෝලන්තයේ ආධාරයට එමින් ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළහ.

දෙවන ලෝක මහා යුද්ධය ඇරඹුණේ මෙතැන් පටන්ය.

දෙවන ලෝක මහා යුද්ධයට මුල් වූයේ පළමුවෙනි ලෝක මහා යුද්ධයෙන් පැන නැගුණු අලුත් ප්‍රශ්න හා අර්බුදයන්ය.

'පරණ ප්‍රශ්න විසඳනු සඳහා අලුත් ප්‍රශ්න නැගීම හැර කළ හැකි අන් දෙයක් ඉතිහාසයට නැතැ'යි කාල් මාක්ස් වරෙක පැවසුයේ මේ නිසා විය යුතුය.'

XXXXXX

දේව කෝපයකින් ලෝදිය සාගරයක් ගොඩ ගැලූ කලෙක සේ ජර්මන් හමුදා රැල්ලට නැගෙනහිර යුරෝපය යට වෙමින් තිබියදී බටහිර පෙරමුණේ යුද්ධය මුලදී බෙහෙවින් සීමා වූයේ නාවික සටන් වලටය.

ඉන්පසු නාසි හමුදාවේ ඉලක්කය වූයේ ස්කැන්ඩිනේවියානු රටවල්ය. ඩෙන්මාර්කය ක්ෂණයෙන් යටත් විය. එහෙත් නෝර්වේය සැහෙන ප්‍රතිප්‍රහාරයක යෙදුණේය. එසේ වුවද පෝලන්තයේ, චෙකොස්ලොවැකියාවේ හා ඔස්ට්‍රියාවේ සිදුවූවා සේ නෝර්වේ රටේ ද මේ වනවිට නාසිවාදී පක්ෂ පිහිටුවා තිබුණු අතර එම නාසි පාක්ෂිකයන් ගෙන ගිය කඩාකප්පල් කිරීම් හා පාවාදීම් නිසා ජර්මනියට පහසුවෙන් ජය අත්වුණි.

ප්‍රංශයේ හා බ්‍රිතාන්‍යයේ යල් පිනූ යුද ශිල්පයට ඊළඟට හෙනහුරු දසාව ලැබුවේ 1940 මැයි 10 දාය. එදා ජර්මන් හමුදා විසින් ඕලන්දය, බෙල්ජියම හා ලක්සන්බර්ගය යන රටවල් තුනම එකවර ආක්‍රමණය කරන ලදී. බ්‍රිතාන්‍යයට හා ප්‍රංශයට පක්ෂපාත මේ රටවල් ධෛර්යමත් ප්‍රති ප්‍රහාරයක යෙදුණු මුත් නාසි පාක්ෂික දේශ ද්‍රෝහීන්ගේ ක්‍රියා කලාපය සහ ජර්මන් පැරවුට් භටයන්ගේ දස්කම් නිසා ඉක්මනින් යටත් වීමට ඔවුනට සිදුවිය.

එයින් පසු ජර්මන් යුද යාන්ත්‍රයේ අනවරත ඉදිරි ගමන යොමුවූයේ ප්‍රංශය වෙතටය. සියලු ප්‍රති ප්‍රහාරයන් මැඩගෙන නොනැවතී ඉදිරියට

Scanned with CamScanner

ගිය ජර්මන් හමුදාවෝ ඉංගිරිසි ඕඩය නමින් හැඳින්වෙන ප්‍රංශය හා එංගලන්තය වෙන් කරන කෙටි මුහුදු තීරය කරා ළඟා වූහ. මේ ප්‍රහාරය නිසා උතුරු දෙසින් වූ ඉතා විශාල බ්‍රිතාන්‍ය, ප්‍රංශ, බෙල්ජියානු හමුදාවක් ජර්මානුන්ට කොටුවිය. මේ හමුදාව ජර්මන් මකර කටට වැටෙන්නට ඔන්න මෙන්න සේ තිබියදී මනුෂ්‍යෝත්තරීය පරිශ්‍රමයක් යොදා ජර්මන් හමුදා වළල්ල සිඳුරු කොට ඩන්කර්ක් වෙත පසු බැස ගත්හ. මේ ලක්ෂ සංඛ්‍යාත භට සංඛ්‍යාව එතැන් සිට එංගලන්තයට පළා ගොස් පණ බේරා ගත්හ. මෙය පසුබැසීමක් වුවද එදා පැවති තත්ත්වය යටතේ ජර්මානුන්ට කොටු නොවී පළා යා ගත හැකි වීම එක්තරා විධියක ශ්‍රේෂ්ඨ ජයග්‍රහණයක් විය.

''පණ බේරාගෙන පළා යන්නා නැවත සටන් කිරීමට ජීවත් වේය.'' යන කියමන සනාථ කරමින් මේ දැවැන්ත හමුදාව පසු දිනක (1944 ජූනි 6 දා) ආපසු ප්‍රංශයට ගොඩ බැස ජර්මානුන්ට විරුද්ධව මාරක හා සාර්ථක ප්‍රති ප්‍රහාර එල්ල කරනු ඇත.

නාසි ජර්මනියට අපලදායක වන අන්දමේ පදවි පෙරලියක් මේ වකවානුවේ එංගලන්තයේ සිදුවිය. එරට කැබිනට් අර්බුදයක් හටගෙන චෙම්බර්ලේන් අගමැති පුටුවෙන් විසි වූ අතර වින්ස්ටන් චර්චිල් (WINSTON CHURCHILL) 1940 මැයි 10 දා නව අගමැති ධූරයේ වැඩ බාර ගත්තේය.

නොපසුබස්නා අධිෂ්ඨාන ශක්තියකින් හා රෝමෝද්ගමනය කරවන චතුර කථිකත්වයකින් යුක්ත වූ චර්චිල් බ්‍රිතාන්‍යයේ ඉරණම සියතට ගැනීමෙන් පසු එරට ආරක්ෂක සැලැස්මෙහි මෙන්ම, යුද පෙරමුණෙහිද, හිට්ලර්ට අවාසිදායක වන අන්දමේ බලගතු වෙනස්කම් හා ජයග්‍රහණයන් රාශියක් සිදුවන්නට පටන් ගත්තේය.

මේ දක්වා නාසි ජර්මනිය අත් කර ගත් තාවකාලික ජයග්‍රහණවලදී දිස්නයෙන් ඇස් අන්ධ කරගත් ඉතාලියේ පැසිස්ට් (FASCIST) පාලකයා වූ බෙනිටෝ මුසෝලිනි දැන් තමන්ගේ වාරය එළඹ ඇතැයි කල්පනා කළේය. ඉතාලි සමාජවාදී පක්ෂයට බැඳී විප්ලවවාදී වාමාංශිකයකු ලෙසින් දේශපාලන ජීවිතය ආරම්භ කළ මුසෝලිනි හිට්ලර්ටත් කලින් ඒකාධිපති සිතුම් පැතුම් පළකළ කෙනෙකි. සමාජවාදී පක්ෂයෙන් බිඳුණු ඔහු කොමියුනිස්ට් විරෝධී හා ප්‍රජාතන්ත්‍ර විරෝධී වූද, අන්ත ජාතිවාදී වූද, ඉතාලි පැසිස්ට් පක්ෂය පිහිටුවා ගත්තේය. තිල ඇඳුම වශයෙන් කළු කමිස ඇඳගත් මුසෝලිනිගේ පැසිස්ට් පාක්ෂික ''භටයෝ'' 1922 දී ඉතාලියේ

Scanned with CamScanner

රාජ්‍ය යන්ත්‍රය බලහත්කාරයෙන්ම අල්ලා ගත්හ. ඒකාධිපතිවාදය විසිවන සියවසට හඳුන්වා දුන් පුද්ගලයා මුසෝලිනිය.

දේශපාලන වශයෙන් ඇවැස්ස මස්සිනාලා දෙදෙනෙකු වූ හිට්ලර් හා මුසෝලිනී අත්වැල් බැඳ ගැනීමට තීරණය කළහ. මුසෝලිනිගේ ඉතාලි හමුදා ජර්මන් හමුදාවල සහායට ගියෝය.

පවුරු පදනම් බිඳගෙන ඉදිරියට ගලන ජර්මානු යුද ගංවතුරට බලගතු ප්‍රංශ රාජ්‍යය යටවෙමින් තිබියදී, ප්‍රංශ පාලකයෝ දෑත් එසවූහ. ඉන්පසු නාසි සේනාවන් කළේ විනෝද චාරිකාවක යෙදෙන්නා සේ ප්‍රංශය හරහා ඇවිදගෙන යෑම පමණි.

1914-1918 ප්‍රථම ලෝක සංග්‍රාමයේදී ජර්මානුන් සමග යුද වැදී පුරා හතර වසරක් අපරාජිතව හුන් ප්‍රංශයට මෙවර ජර්මන් ප්‍රහාරය හමුවේ සති හයකට වඩා ඔරොත්තු දී ගත නොහැකි විය.

1940 ජූනි 22 දා සවස 6.50 ට ප්‍රංශ ආණ්ඩුව ජර්මනිය සමග යුද සමාදාන ගිවිසුම අත්සන් කළේය. අගමැති හිට්ලර් ද, ප්‍රංශ ආණ්ඩුවේ යටත් වීම බාරගනු පිණිස ප්‍රංශයට ගිය අතර ප්‍රථම ලෝක යුද්ධයේදී ප්‍රංශය අතින් ජර්මනිය පරාජය වූ විට යුද සමාදාන ගිවිසුම අත්සන් කරන ලද ස්ථානයේදීම, ඒ ගිවිසුම අත්සන් කරනු සඳහා කාර්යාලයක් වශයෙන් පාවිච්චි කරන ලද දුම්රිය මැදිරිය තුළදීම, මෙවර ප්‍රංශය ජර්මනියට යටත්වීමේ ගිවිසුම අත්සන් කිරීමට ඔහු වග බලා ගත්තේය.

1918 දී ජර්මනිය ලත් පරාජය සම්බන්ධයෙන් ප්‍රංශයෙන් පළිගනු සඳහා මෙබඳු උපායක් යෙදීමට හිට්ලර්ට හැකිවූයේ ප්‍රංශය විසින්ම කරන ලද මෝඩකමක් නිසාය. පැරණි ජයග්‍රහණයේ සිහිවටනයක් ලෙසින් ප්‍රංශය ඒ ඓතිහාසික දුම්රිය මැදිරිය එතැනම තැනූ විශේෂ කෞතුකාගාරයක් තුළ පරෙස්සම් කර තිබුණි.

අලාභ හානිය මදිවාට, අවමානයටද පාත්‍ර වීමට ප්‍රංශයට සිදුවූයේ මෙසේ පරෙස්සම ඇලියාවට ගිය හෙයිනි.

මුළු ප්‍රංශය යටත් කර ගැනීමට හිට්ලර්ට හැකියාව තිබුණ මුත් භෞමික වශයෙන් යටත් කර ගන්නා ලද්දේ ඔහුට අත්‍යවශ්‍ය වූ අගනුවර වන පැරීසිය ඇතුලු එරට උතුරු භාගය සහ අත්ලාන්තික් සාගරයට මුහුණ ලා තිබෙන බටහිර කොටස පමණි.

රටේ ඉතිරි කොටසෙහි ජර්මනියට හිතවත් ප්‍රංශ ආණ්ඩුවක් පවත්වාගෙන යාමට ඉඩ දෙන ලදී.

Scanned with CamScanner

එසේ වුවද නාසි විරෝධී විශාල ප්‍රංශ හමුදාවක් ප්‍රංශ සෙන්පති චාර්ල්ස් ඩිගෝල් (CHARLES DE GAULLE)ගේ නායකත්වය යටතේ බ්‍රිතාන්‍යයෙහි ප්‍රතිසංවිධානය වීමට පටන් ගත්තේය. ඩිගෝල්ගේ හමුදා නඩත්තු කිරීමේ හා සන්නද්ධ කිරීමේ මහ බර පැටවුණේ ආණ්ඩුවේ භාණ්ඩාගාරය මතය.

පොදු අරමුණක් සඳහා එකට එක් වී සිටි ජනනායකයන් දෙදෙනෙකු වුවද චර්චිල් සහ ඩිගෝල් අතර සුළු අමනාපයක් නොතිබුණේ නොවේ. බ්‍රිතාන්‍යයේ ආගන්තුක සත්කාර ලබමින් සිටියේ වී නමුත් ඩිගෝල් අගමැති චර්චිල් කියන සෑම වචනයක් පාසා එහෙයි කීමට සූදානම්ව සිටි පුද්ගලයෙකු නොවීම ඊට හේතුවයි.

කෝපය මුසු හාස්‍යයකින් යුත් ප්‍රකාශයක් කරමින් එක් අවස්ථාවක චර්චිල් ඔහු ගැන මෙසේ පැවසීය.

සෑම මිනිසෙකුටම කුරුසයක බර ඉසිලීමට සිදුවී තිබේ. මට සිදු වී තිබෙන්නේ ලෝරානයේ කුරුසය උසුලා ගෙන යාමටය.

(ලෝරානයේ කුරුසය (CROSS OF LORRAINE) යනුවෙන් හැඳින්වෙන්නේ ප්‍රංශයේ ජාතික සංකේතය වන හරස් පොලු එකක් වෙනුවට දෙකක් යොදා ඇති කුරුසයයි.)

මේ අතරතුරේ මුසෝලිනිගේ හමුදාවෝ, ඇල්බේනියාව, ඇබිසීනියාව (වර්තමානයේ ඉතියෝපියාව) හා උතුරු අප්‍රිකාව යටපත් කර ගත්හ. එහෙත් ස්වකීය පොදුරාජ්‍ය මණ්ඩලයේ හා යටත් විජිතවල සේනාවන් සමග එක් වී බ්‍රිතාන්‍යයේ හමුදා එල්ල කළ ප්‍රති ප්‍රහාරය නිසා ඉතාලි හමුදා පසුබසින්නට වූහ. අනෙක් අතින් රුමේනියාව, යුගෝස්ලාවියාව, ග්‍රීසිය හා උතුරු අප්‍රිකාව ජර්මන් සේනා විසින් ආක්‍රමණය කරන ලදී.

XXXXXX

ඉතා විශිෂ්ට අමුත්තෙක් 1941 මැයි 10 දා රාත්‍රියෙහි මහා බ්‍රිතාන්‍යයේ ස්කොට්ලන්ත ප්‍රදේශයට අහසින් පාත්විය. අඟහරු ලොවින් මෙලොවට ජීවියකු ළඟා වුවද එතරම් විශාල ජාත්‍යන්තර ආන්දෝලනයක් ඇති නොවනු සිකුරුය. මේ අමුත්තාගේ හදිසි සම්ප්‍රාප්තිය නිසා නාසි රජය පමණක් නොව බ්‍රිතාන්‍ය රජය සහ රුසියන් රජය ද අති මහත් කලබලයකට පත් විය.

Scanned with CamScanner

අමුත්තා රුඩොල්ෆ් හෙස්ය. නාසි රජයේ ඇමැතිවරයෙක් වූ හෙස් හිට්ලර් ළඟට හුන් දෙවැනි ජර්මන් රාජ්‍ය නායකයාය. (පළමුවැනියා වූයේ ගෝරිංය.) නාසි පක්ෂයේ නියෝජ්‍ය නායකයා වූ හෙස්, හිට්ලර්ගේ එවකට හුන් ඉතාම කුළුපග මිතුරාද විය.

හිට්ලර්ට හොරෙන් හෙස් බ්‍රිතාන්‍යයට පළායෑමේ සිද්ධිය සුරංගනා කථාවක් මෙන් අද්භූත ජනකය.

අති දක්ෂ ගුවන් නියමුවෙක් වූ හෙස් ජර්මනියේ ඔග්ස්බර්ග් ගුවන් තොටුපලෙන් අහස් යානයක් ඩැහැගෙන එය පදවාගෙන ගොස් ස්කොට්ලන්තය උඩින් පියාසර කොට පැරෂුටයක මාර්ගයෙන් බිමට සේන්දු විය.

ඔහුට මුලින්ම උවමනා කළේ පැරණි මිතුරකු වූ හැමිල්ටන් ආදිපාදවරයා (DUKE OF HAMILTON) මුණ ගැසීමටය. මේ ආදිපාද වරයාගේ වලව්ව පිහිටියේ ස්කොට්ලන්තයේය. හෙස්ගේ නියමු දක්කම කෙතරම්ද කිවහොත් ඒ වන විට රාත්‍රි 10 පසුවී තිබුණු මුත් හැමිල්ටන්ගේ නිවසට සැතපුම් 12 ක් තරම් සමීපස්ථානයකදී බිමට සේන්දු වීමට ඔහු සමත් විය. හෙස් ගමන්ගත් යානය (ඔහු ඉන් එළියට පැනගත් පසු) ගිනි ගෙන ඇද වැටුණි.

පැරෂුටය මගින් බිමට බැසගත් හෙස් තමා 'ඇල්ප්‍රඩ් හෝර්න්' (ALFRED HORN) නමැත්තකු බවත්, හැමිල්ටන් ආදිපාදවරයා හමුවීමට තමාට අවශ්‍ය බවත් එහිදී මුණගැසුණු ගොවියකුට සැළකර තිබේ.

හෙස්ට හැමිල්ටන් ආදිපාදවරයා පළමුවරට මුණගැසී තිබුණේ 1936 දී බර්ලිනයෙහි පැවැත්වුණු ඔලිම්පික් ක්‍රීඩා උලෙළේදීය.

බ්‍රිතාන්‍ය රජය සමඟ පැවැත්වීමට තමා බලාපොරොත්තු වූ සාකච්ඡාවට පාර පිළියෙළ කර දෙනු සඳහා හැමිල්ටන් ආදිපාදවරයා හොඳම පුද්ගලයා බව හෙස්ගේ තීරණය විය.

බ්‍රිතාන්‍යය යුද්ධයෙන් පරාජය කිරීමට හිට්ලර්ට උවමනාවක් නැති බවත් බ්‍රිතාන්‍යය සමඟ සාමදානයක් ඇතිකර ගැනීමට ජර්මනිය සූදානම් බවත් හෙස් කියා සිටියේය.

හෙස්ගේ පරමාර්ථය අවංක වූ මුත් ඔහු පැමිණ සිටියේ නාසි රජයේ හෝ හිට්ලර්ගේ අනුදැනුමින් තොරවය. හෙස් ඉදිරිපත් කළ කොන්දේසිවලට එකඟ වීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව කැමති නොවූ අතර, 'හෙස් සිද්ධියේ' යටි අදහස රුසියාවට විරුද්ධව බ්‍රිතාන්‍ය -

Scanned with CamScanner

ජර්මන් එක්සත් පෙරමුණක් ගොඩනැඟීම විය යුතු යැයි ස්ටාලින් සැක කළේය.

හෙස්ගේ සාම සාකච්ඡා අසාර්ථක වූයෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව ඔහු යුද සිරකරුවකු ලෙසින් සළකා බන්ධනාගාර ගත කළේය. ඔහු හිරකර තබන ලද්දේ ඉංග්‍රීසි රජ පරපුරේ ආරම්භකයා වූ විලියම් ද කොන්ක්වරර් (WILLIAM THE CONQUEROR) නමැති අවජාතක අධිපතියා ගොඩනැගූ ටවර් ඔප් ලන්ඩන් නමැති බලකොටුවෙහිය.

ඔහු ආපසු ජර්මනියට ගියේ නම් හිට්ලර් අතින් ඊට වඩා කටුක ඉරණමකට මුහුණ පාන්නට ඉඩ තිබුණි. ජීවිත පරිත්‍යාගයෙන් ඒක පුද්ගල සාම දූත මෙහෙවරක යෙදුණු මේ අරුම පුදුම ජර්මන් නායකයා පසුව නියුරම්බර්ග් යුද්ධාපරාධ අධිකරණය මගින් ජීවිතාන්ත සිරදඬුවමකට කැපකරනු ලැබීය.

XXXXXX

1941 ජුනි 22 දා අලුයම 3. 30 ට පණස් පන් ලක්ෂයක (55, 00000) යෝධ ජර්මන් හමුදාවක් දේශ සීමාව අසල පිහිටි සියලු ගංගාවන් තරණය කරමින් සෝවියට් රුසියාවට කඩා වැදුණේය. මේ දැවැන්ත හමුදාව සමඟ කාලතුවක්කු 50, 000 ක් හා යුද ටැන්කි 3700 ක් බිමින් ගමන් කළ අතර, අහස්යානා 4950 ක් උඩින් ගමන් කළේය.

ඇඩොල්ෆ් හිට්ලර් ඒ තීරණාත්මක දිනයෙහි සෝවියට් දේශය ආක්‍රමණය කළේ දෙරට අතර කලින් අත්සන් කර තිබුණු අනාක්‍රමණ ගිවිසුම අමු අමුවේ උල්ලංඝණය කරමිනි.

ජර්මන් ජාතියට 'ජීවත්වීමේ ඉඩ කඩ' (LEBENSRAUM) ලබාගනු සඳහා රුසියාව ඇතුළු නැගෙනහිර යුරෝපීය රටවල් යටපත් කර ගත යුතු බව පෙර පටන්ම හිට්ලර්ගේ සහ නාසි පක්ෂයේ දර්ශනය විය.

එදා, 1941 ජුනි 22 දා, හිට්ලර් රුසියාවට කඩා පැන්නේ නැපෝලියන්ට බැරි වූ දේ තමන්ට කළ හැකි යැයි තරයේ අදහමිනි. හිට්ලර් සිය යුද අරගලයේ අග්‍ර ඵලය ලෙසින් සළකාගෙන සිටියේ බෝල්ෂෙවික් කොමියුනිස්ට්වාදයත්, ප්‍රථම සමාජවාදී රාජ්‍යය වූ සෝවියට් දේශයත් අකා මකා දැමීමය.

දෙවන ලෝක මහා යුද්ධයේදී සටන් වැදුණු ජර්මන් සේනාංක 320 න් 239 ක්ම සටනට යොදවන ලද්දේ සෝවියට් දේශය පිහිටි

Scanned with CamScanner

නැගෙනහිර යුද පෙරමුණෙහිය.

රුසියන් දේශසීමාව ඔස්සේ සැතපුම් සිය ගණනාවක් විහිදුණු ජංගම ප්‍රාකාරයක් ලෙසින් ඉදිරියට ගමන්ගත් ජර්මන් හමුදාවල ප්‍රහාරය දරාගත නුහුණු රුසියන් හමුදාවෝ වේගයෙන් පසු බසින්නටත්, දස දහස් ගණනින් යටත් වන්නටත් පටන් ගත්හ.

ප්‍රථම ජර්මන් භටයාගේ පාදයෙන් සෝවියට් දේශය ස්පර්ශ වූ මොහොතේ පටන් යම්තම් තෙසතියක් ඉක්ම ගිය විට නාසි සතුරා ඇගේ හදවතටම සමීප වී තිබුණි.

පාබල සේනාංක තිහකින් සහ යුද ටැංකි සේනාංක හා රථ සේනාංක පහළොවකින් සමන්විත වූ පීල්ඩ් මාර්ෂල් පොන් බොක් (VON BOCK) ගේ හමුදාව සැතපුම් 450 ක් සෝවියට් දේශය තුළට කා වැදී තිබුණි. එහි සිට සෝවියට් අගනුවර වූ මොස්කව් පුරයට තව ඇත්තේ සැතපුම් 200 ක් පමණි.

පාබල සේනාංක විසි එකක් සහ රථ සේනාංක හයක් සමඟ උතුරින් රුසියාවට කඩා වැදුණු පීල්ඩ් මාර්ෂල් පොන් ලීබ් (VON LEEB) ගේ සේනාව සීඝ්‍රයෙන් ලෙනින්ග්‍රාඩය දෙසට ඇදෙන්නට විය.

දකුණින් ප්‍රහාරය ඇරැඹූ පීල්ඩ් මාර්ෂල් පොන් රුන්ඩ්ස්ටෙඩ් (VON RUNDSTEDT) පාබල සේනාංක විසිපහක්, රථ සේනාංක හතරක්, යුද ටැංකි සේනාංක පහක් සහ කඳුකර සටන් ගැන විශේෂ පුහුණුවක් ලත් සේනාංක හතරක් පෙරටු කරගෙන සෝවියට් යුක්රේන් ප්‍රාන්තයේ ප්‍රධාන නගරය වූ කියෙව් කරා වේගයෙන් ගමන් කරමින් සිටියේය.

1941 සැප්තැම්බර් වන විට සෝවියට් අගනුවර වූ මොස්කව් සහ ඊළඟ ප්‍රධාන නගරය වූ ලෙනින්ග්‍රාඩය තෙක් ගමන් කර තිබුණු ජර්මන් හමුදාවෝ ඒ නගර වටලා ගත්හ.

සෝවියට් ආණ්ඩුව මොස්කව් හැරදමා ඊට සැතපුම් 550 ක් ඈතින් පිහිටි කුයිබිෂෙව් නගරයට ගෙන යන ලදී.

මොස්කව් අවට වූ මධ්‍යම යුද පෙරමුණේ සටන් කරමින් සිටි සෝවියට් හමුදාවල හිටපු සේනාධිනායක තිමොශෙන්කෝ (TIMOSHENKO) එම පදවියෙන් ඉවත් කොට සෙන්පති ජෝර්ජි සුකොව් (GEORGI ZHUKOV) ඒ වෙනුවට පත් කෙරිණි. රුසියන් මාතාවගේ හදවත බඳු වූ ඉපැරැණි මොස්කව් පුරවරය ජර්මන්

Scanned with CamScanner

හමුදාවේ මරු කටින් බේරාගනු සඳහා වහාම ක්‍රියාකාරී වූ සෙන්පති සුකොව් 1941 දෙසැම්බර් 6 දා පාබල සේනාංක, කාලතුවක්කු සේනාංක, අශ්වාරෝහක සේනාංක, යුද ටැංකි සේනාංක සහ ගුවන්යානා සේනාංකවලින් සමන්විත දැවැන්ත සෝවියට් හමුදාවක් ප්‍රති ප්‍රහාරයෙහි යෙදැවීය.

එදා වනතුරු අප්‍රකට සෙබළකු වූ සුකොව් සැතපුම් 200 ක් දිගට විහිදුණු සටන් පෙරමුණක් ඔස්සේ එල්ල කළ මේ ක්‍ෂණික ප්‍රහාරය කෙතරම් දරුණු වීද කිවහොත් ඉන් හටගත් චෛතසික ප්‍රකම්පනයෙන් මිදීමට හිට්ලර් සහ ඔහුගේ සෙන්පතියෝ කිසිදාක සමත් නොවූහ.

යුද්ධය පටන්ගත් දා සිට මේ තීරණාත්මක මොහොත දක්වා කළ හැම සටනකින්ම ජයගත් 'අනභිභවනීය' ජර්මන් හමුදාවෝ ඊට හරියටම අවුරුදු 130 කට පෙර 'අනභිභවනීය' නැපෝලියන්ගේ හමුදාවන් එතැනදීම කළාක් මෙන් වීර වික්‍රමාන්විත රුසියන් ප්‍රති ප්‍රහාරයට මුහුණ දී ගත නොහී වැටි වැටී පසු බසින්නට වූහ.

නොනැවතී ඉදිරියට ගැලූ නාසි ආක්‍රමණයේ වඩදිය එතැන් පටන් බාදියකට පෙරළුණි.

ජර්මන් ඒකාධිපතියාගේ දෛවය කරණමක් ගැසීය. කණ කොකා හඬ නගමින් හිට්ලර්ගේ සහ නාසි රජයේ හිස උඩින් පියඹා ගියේය.

මොස්කව් නුවරින් ඇරැඹුණු රුසියන් ප්‍රති ප්‍රහාරයේ කුණාටුව සීග්‍රයෙන් ඉදිරියටම හමා ගිය අතර ඒ කුණාටුව විසින් මොස්කව් නුවරින් පමණක් නොව, කියෙව්, ලෙනින්ග්‍රාඩ්, ස්ටාලින්ග්‍රාඩ් ආදී රුසියන් මහ නගර වෙතින් හා වර්ග සැතපුම් දස දහස් ගණනාවක රුසියන් භූමි තලයෙන් නාසි සේනාවන් පිස දැමෙන්නට විය.

ස්ටාලින්ග්‍රාඩය නාසි හමුදාවල ග්‍රහණයෙන් මුදාගනු සඳහා සෝවියට් සේනාවන් කළ සටන දෙවන මහා ලෝක යුද්ධයේදී සිදු වූ ලොකුම හා බිහිසුණුම සටන ලෙසින් ඉතිහාස ගත වී හමාරය.

කොමියුනිස්ට් වාදය පිටසක්වළ ගසා දමන්නෙමැයි කටමැත දෙඩූ ජර්මන් ආඥාදායකයාට දවල් තරු පෙනුණේ ස්ටාලින්ග්‍රාඩ් සටනේදී ලත් නින්දිත පරාජයෙනි.

දෙමසකට කලින් දෙලක්‍ෂ අසූ පන් දහක (2 85, 000) යෝධ ජර්මන් සේනාවක් සමඟ ස්ටාලින්ග්‍රාඩ් සටන් බිමට අවතීර්ණ වූ

Scanned with CamScanner

ෆීල්ඩ් මාර්ෂල් පවුලස් (PAULUS) ට අන්තිමේදී ඉතිරි වූයේ භටයන් 91, 000 ක් පමණි.

සෝවියට් හමුදාව විසින් පවුලස් සහ ජනරාල්වරුන් 24 ක් ඇතුළු ඒ මුළු ජර්මන් භට සංඛ්‍යාව සිරභාරයට ගෙන සයිබීරියාවට පිටත් කරන ලදී.

දෙවන ලෝක මහා යුද්ධයේදී කිසිම හමුදාවක් මෙසා අන්ත පරාජයක් නොලැබූ අතර එතැන් පටන් හිට්ලර් හැසිරෙන්නට වූයේ වහළයේ උළුකැටයක් බුරුල් වූවකු ලෙසිණි.

ජර්මන් හමුදාවන් සෝවියට් දේශයේදී ලත් නිහීන අන්ත පරාජයෙන් අධික ලෙස කෝපයට පත් හිට්ලර් සන්නද්ධ හමුදා වල ප්‍රධානීන් කීපදෙනකු තනතුරුවලින් නෙරපා දැමීය. නෙරපුණු නැති අය තත්ත්වයෙන් පහත හෙළීය. ප්‍රධාන අණදෙන නිලධරයා වූ ෆීල්ඩ් මාර්ෂල් බ්‍රෝච්ශ (BRAUCHITSCH) ට පවා ඔහුගේ පදවිය අහිමි විය. ඉන්පසු හිට්ලර් ප්‍රධාන අණ දෙන නිලධර පදවිය තමන් වෙතම පවරා ගත්තේය.

XXXXXX

සෝවියට් රජය කිසිසේත් බලාපොරොත්තු නොවූ මොහොතක හෙණ ගසන්නාක් මෙන් කෙරුණු ජර්මන් ආක්‍රමණය සහමුලින් පරාජය කිරීමේ මංගල පියවර තබමින් 1941 දෙසැම්බර් 6 දා මොස්කව් පෙදෙසින් සෝවියට් ප්‍රති ප්‍රහාරය ඇරඹී පැය 24 ක් ඉක්ම ගිය පසු තව ඉතා වැදගත් සිද්ධියක් පෘථිවි ගෝලයෙහි අනෙක් පැත්තෙහි හට ගත්තේය.

ජපානය සහ ඇමරිකාව අතර වූ ශාන්තිකර සාගරය මැද පිහිටි ඇමරිකාව සතු හවායි දූපතේ පර්ල් හාර්බර් (PEARL HARBOUR) නම් වූ වරායට හදිසි ප්‍රහාරයක් එල්ල කළ ජපානය ගුවනින් බෝම්බ හෙළා නැව් ගණනාවක් විනාශ කළේය.

එතෙක් කල් මධ්‍යස්ථව හුන් ඇමරිකා එක්සත් ජනපදය ජපානයට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ අතර ජපානයේ පැත්ත ගත් ජර්මනිය හා ඉතාලිය ඇමරිකාවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළහ.

ජපන් හමුදාව මිත්‍ර පාක්ෂිකයන් සිහිනයකින්වත් නොසිතූ

Scanned with CamScanner

අන්දමේ සාර්ථක ප්‍රහාරයක් එල්ල කළ අතර වැඩිකල් නොගොස් පිලිපීනය, බුරුමය, මලයාව, සිංගප්පූරුව, හොංකොං හා ඉන්දුනීසියාව ඇතුළත් ආසියාවේ විශාල ප්‍රදේශයක් ඔවුනතට පත්විය. (1945 දී ජපනුන් විසින් ලංකාවේ පිහිටි ප්‍රධාන බ්‍රිතාන්‍ය නැව් කඳවුරක් වූ ත්‍රිකුණාමලය වරායට හා කොළඹට බෝම්බ හෙළන ලදී.)

සෝවියට් දේශයට පහර දීමට කලින් ජර්මනිය කීප වතාවක් බ්‍රිතාන්‍යයට ගුවනින් බෝම්බ හෙලීය. මේ ගුවන් ප්‍රහාර වලදී බ්‍රිතාන්‍ය වැසියන් හා භටයන් දහස් ගණනාවක් මිය ගිය අතර ජර්මන් අහස්යානා විශාල සංඛ්‍යාවක් බිම හෙළීමට බ්‍රිතාන්‍යය සමත් විය.

හිට්ලර් බ්‍රිතාන්‍යයට හමුදා ගොඩ බස්වා එරට අල්ලා ගැනීමට අදහස් කරගෙන සිටි මුත් පසුව ඒ අදහස අතහැර දමා ඔහුගේ මුළු මහත් යුද ශක්තිය සෝවියට් රුසියාවට විරුද්ධව එල්ල කළේය.

අනපේක්ෂිත නාසි ප්‍රහාරයෙන් පරිපීඩිත වූ සෝවියට් දේශය තමන් මත පැටවී ඇති යුද බර අඩුකර ගනු සඳහා වහාම පොදු සතුරාට එරෙහිව බටහිරින් දෙවැනි සටන් පෙරමුණක් අරඹන්නැයි බ්‍රිතාන්‍යය ඇතුළු මිත්‍ර පාක්ෂිකයන්ගෙන් ඉල්ලා සිටි මුත් ඔවුනතින් දෙවැනි පෙරමුණ ඇරඹුණේ ඒ ඉල්ලීමෙන් අවුරුදු හතරකට පසුවය. එනම් 1944 දීය. ඒ වනවිට අන් කිසිවකුගේ ආධාරයක් නොමැතිව තනිකර සෝවියට් ජනතාවගේ බල මහිමයෙන්ම නාසි හමුදාව සාර්ථක ලෙස පසු බස්සවා තිබුණි.

හිට්ලර් බලාපොරොත්තු වූයේ රුසියාව ආක්‍රමණය කළ විගස එරට වැසියන් සෝවියට් රජයට විරුද්ධව කැරලි ගසනැයි කියාය.

බ්‍රිතාන්‍යය ආදී රටවල් කල්පනා කළේ හිට්ලර්ගේ ප්‍රහාරයෙන් ලෝකයේ කුළුඳුල් සමාජවාදී රාජ්‍යය පොඩිපට්ටම් වී යාම ඒකාන්ත සිද්ධියක් බවය.

නාසි ජර්මනියේ හෝ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ සිහින සැබෑ නොවූ අතර විවිධ ජාති ගෝත්‍ර සහ ආගම් වලට අයත් සමස්ත සෝවියට් ජනතාව ඉන් පෙර කිසි කලෙක නුදුටු අන්දමේ දෘඪතම දේශප්‍රේමී බැම්මකින් වෙලී ධීර වීර ලෙස සටන් කරමින් ස්වකීය දේශයත්, රාජ්‍යයත් මුදා ගත්හ.

තමාගේ ආධාරයට එන්නැයි බ්‍රිතාන්‍යය ඇමරිකා එක්සත්

ජනපදයට නොයෙක් විට ඇවිටිලි කළ මුත් 1944 වනතුරු ඇමරිකානු හමුදාවන් යුරෝපීය යුද්ධයට පැටලුණේ නැත.

පමා වී බ්‍රිතාන්‍යයේ සහයට පැමිණි ඇමරිකානු හමුදාවෝද, බ්‍රිතාන්‍යයෙහි රැකවරණ ලබා සිටි ඩිගෝල්ගේ ප්‍රංශ සේනාවෝද බෙල්ජියානු භටයෝද, බ්‍රිතාන්‍ය හමුදාවෝද 1944 ජූනි 6 දා දහස් ගණන් යාත්‍රාවල නැගී බ්‍රිතාන්‍ය වෙරළින් පිටත් වී ප්‍රංශයේ නෝර්මන්ඩි වෙරළට ගොඩ බැස දෙවැනි සටන් පෙරමුණ ඇරඹූහ. ඇමරිකානු සෙන්පති ඩග්ලස අයිසන්හවර් (DOUGLAS EISENHOWER) ගේ සේනාධිනායකත්වයෙන් සටන් වැදුණු මිත්‍ර පාක්ෂික හමුදා සමූහය ප්‍රංශයෙන් හා බෙල්ජියමෙන් සාර්ථක ලෙස ජර්මානුන් පළවා හරින්නට පටන් ගත්හ.

මේ තීරණාත්මක ප්‍රති ප්‍රහාරය දිගු කලක සිට සැලසුම් කරන ලද්දක් වන අතර ගොඩ බැසීම කළයුතු දිනය පිළිබඳ අවසාන තීරණයකට එළැඹෙන්නට කලින් බ්‍රිතාන්‍ය රජය දෛවඥයන්ගේ මතයද විමසා බැලූ බව මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය.

# 7

## යුදෙව් සංහාරය උග්‍ර වෙයි

ජර්මන් අගනුවර වූ බර්ලිනය වෙත සතරතින් ඇදී එමින් සිටි විජයග්‍රාහී මිත්‍ර පාක්ෂික හමුදාවලට හා නැගෙනහිර දෙසින් පැමිණි රුසියානු හමුදාවලට එතෙක් ඔවුන් ශ්‍රැති මාත්‍රයෙන් පමණක් දැන සිටි අපූරු දෙයක් සියැසින් දැකගත හැකි විය.

ඒ තමා ''වධ කඳවුරු'' හා ''ඝාතන කඳවුරු'' බුචන්වෝල්ඩ් (BUCHENWALD) බෙල්සන (BELSEN) අවුෂ්විට්ස (AUSCHWITZ) ලුකන්වාල්ඩ් (LUCKENWALDE) ඩාචෝ (DACHAU) ආදී නම් මතක් කෙරෙන විට අදත් බොහෝ යුරෝපීයයෝ භීතියෙන් වෙව්ලති. ශෝකයෙන් සලිත වෙති. ජුගුප්සාවෙන් මිරිකෙති. වියෝ දුකින් හඬා වැළපෙති. නාසි රජය විසින් ජර්මනිය තුළ හා ජර්මනිය යටත් කර ගත් රටවල් තුළ මේ කඳවුරු පිහිටුවන ලද්දේ යුදෙව්වන්, අභිකුංටික ගෝත්‍රයන්, රුසියානුන් වැනි ස්ලාව් ජාතිකයන් ආදී ''හීන'' මනුෂ්‍යයන් (UNTERMENSCHEN) එක්රැස් කොට ඔවුන් ක්‍රමානුකූලව වඳකර දමනු සඳහාය.

මේ අතර ජර්මනිය පුරා ''වහල් කඳවුරු'' කීපයක් ද පිහිටුවන ලදී. යුද්ධ ප්‍රයත්නය අරබයා ආයුධ, ආහාර හා අන්‍ය නිෂ්පාදනයන් දිවා රෑ නොබලා බහුල කළ යුතු විය. මේ සඳහා ජර්මන් ජනගහණය ප්‍රමාණවත් නොවූයෙන් අලුතින් යටත් කරගන්නා ලද රටවල වැසියන් ලක්ෂ ගණනින් ගෙනැවිත් වහල් කඳවුරු තුළ ගාල් කොට ඉතා දුක්ඛදායක තත්ත්වයක් යටතේ ඔවුන්ගෙන් බලහත්කාරයෙන් වැඩ ගන්නා ලදී. නැගෙනහිර යුරෝපයේ සිට ජර්මනිය කරා

Scanned with CamScanner

මෙසේ ඩැහැගෙන එන ලද මුළු ජන සංඛ්‍යාව හැත්තෑපත් ලක්ෂයක් (75,00,000) පමණ වේ. මේ දරුණු අපරාධය සමාන කළ හැක්කේ ඇමරිකාවේ වහල් මෙහෙයට අප්‍රිකානු ජාතිකයන් බලහත්කාරයෙන් ගෙන යෑමේ සිද්ධියට පමණි.

ජර්මන් යුද සිර කඳවුරු මාරයාගේ අඳුරු සෙවනැල්ලෙන් වැසී ගිය ස්ථානයන් විය. ජාත්‍යන්තර නීති රීති උල්ලංඝණය කරමින් යුද සිරකරුවෝ ලක්ෂ ගණන් මරා දමන ලදහ. නැත්නම් වහල් මෙහෙයෙහි යොදවන ලදහ. ජර්මානුන්ට අසු වූ විවිධ රටවලට අයත් යුද සිරකරුවන්ගෙන් හරි අඩකට වැඩි කොටස වූයේ රුසියානුන්ය. පනස් හත් ලක්ෂයක් පමණ වූ රුසියානු යුද සිරකරුවන්ගෙන් ජීවතුන් අතර ඉතිරිව සිටියේ යන්තම් දස ලක්ෂයක් විතරය.

වධ කඳවුරු තුළ හා ඝාතන කඳවුරු තුළ ජීවිතක්ෂයට පත් වූ සංඛ්‍යාව පිළිබඳව නිවැරදි ගණන් හිලව් නැත. මෙය 70,00,000 සහ 1,20,00000 අතර සංඛ්‍යාවකැයි අනුමාන කරනු ලැබේ.

අවුෂ්විට්ස් කඳවුරේ පමණක් දිනකට 6000 ක් පමණ ගෑස් කාමරවල බහා මරණ ලදහ. ප්‍රධාන කඳවුරු තිස් ගණනක් තිබුණු අතර මිහිපිට අපායන් සදිසි වූ ඒ කඳවුරු තුළ ස්ත්‍රීන්, පුරුෂයන් හා ළමා ළපැටියන් වධයට හා මරණයට පත් කිරීම කෙතරම් සූක්ෂම ලෙස, ක්‍රමානුකූල ලෙස, විද්‍යානුකූල ලෙස සිදුකරන ලද්දේද කිවහොත් ඒ මුළු කටයුත්ත රජයේ කර්මාන්තයක් බවට පත් වී තිබුණි.

දෙවන ලෝක යුද්ධය පැවති හය අවුරුද්ද (1939 - 1945) මුළුල්ලේ නාසි කඳවුරු තුළ ලක්ෂ ගණන් අහිංසක මිනිසුන් විඳි අනේක විධ දුක් ගැහැට විස්තර කිරීමට ලෝකයේ දියුණුම භාෂාව වුවද ප්‍රමාණවත් නැතැයි සිතේ.

නාසීන්ගේ මේ බිහිසුණු හා උමතු ක්‍රියා කලාපයෙන් වඩාත්ම දුක් වින්දේ රුසියානුන් හා පෝලන්ත ජනතාවයි. ඉනුත් වැඩි දෙනා යුදෙව්වන්ය. පෝලන්තය හා බටහිර රුසියාව යටත් කර ගැනීමෙන් පසු එහි විවිධ පෙදෙස්වල යෝධ වධ කඳවුරු හා ඝාතන කඳවුරු කිහිපයක් පිහිටුවන ලදී. මේ කඳවුරු තුළ හා ඉන් පිටතදී නාසීන් අතින් මළ රුසියානු, පෝලන්ත හා අන්‍ය දේශිකයන්ගේ සංඛ්‍යාව හැට ලක්ෂයකට අධිකය.

Scanned with CamScanner

මේ බිහිසුණු මිනිස් සංහාරය මෙහෙයැවූ ප්‍රධාන පුද්ගලයා හිට්ලර්ගේ ඉතාම කුළුපග ඇමැතිවරයෙක් වූ හෙයින්රිච් හිම්ලර් (HEINRICH HIMMLER) ය. "ඇස්. ඇස්." නම් වූ මාර සේනාංකවල අධිපතියා වූ ඔහු යටතේ "අලුගෝසු හෙයිඩ්රිච්" ඇතුළු මාර දූතයෝ කීප දෙනෙක් සේවය කළහ.

ගෙස්ටාපෝ රහස් පොලිසියේ ප්‍රධානියා වූ හෙයින්රිච් මුළුලර් (HEINRICH MULLER) ඉන් එකෙකි. ජර්මනිය විසින් අල්ලා ගන්නා ලද නැගෙනහිර යුරෝපීය රටවල් භාර ඇමැති වූ ඇල්ෆ්‍රඩ් රොසන්බර්ග් තවෙකෙකි. යුරෝපයේ යුදෙව්වන් සමූල ඝාතනය කිරීමේ කාර්යය භාරව හුන් ඇඩොල්ෆ් අයික්මාන් (ADOLF EICHMANN), තව අලුගෝසුවෙකි. රාජ්‍ය ආරක්ෂක අංශයේ අධිපති වූ අර්න්ස්ට් කැල්ටන්බ්රූනර් (ERNST KALTENBRUNER), ජාතීන් හා ජනාවාස අංශයේ ප්‍රධානියා වූ රිචඩ් හිල්ඩර්බ්‍රාන්ඩ් (RICHARD HILDERBRAND), "ඇස්. ඇස්." බලකායේ ආර්ථික හා පරිපාලන අංශය බාරව සිටි ඔස්වල්ඩ් පොයෙල් (OSWALD POHEL), අවුෂ්විට්ස් කඳවුරේ නිර්මාණකයා හා අධිපතියා වූ රුඩොල්ෆ් හොයෙස් (RUDOLF HOSS), අවුෂ්විට්ස් කඳවුරේ කාන්තා සිරකරුවන් විද්‍යා පර්යේෂණවලට භාජනය කළ මහාචාර්ය කාර්ල් ක්ලෝබර්ග් (KARL KLAUBERG), අවුෂ්විට්ස් කඳවුරේ කාන්තා අංශය භාරව සිටි මාරි මැන්ඩල් (MARIE MANDEL) මහත්මිය හා පෝලන්තයේ ජර්මන් ගෝලෙයිටර් හෙවත් දිසා ඇමැතිවරයා වූ හැන්ස් ෆ්‍රෑන්ක් (HANS FRANK) ඉතිරි අලුගෝසුවන් අතුරින් මුල් තැන ගනිති.

ජර්මන් සිර කඳවුරුවලින් විශාලතම එක වූයේ පෝලන්තයේ පිහිටි අවුෂ්විට්ස් කඳවුරය. එය වධ කඳවුරක් මෙන්ම ඝාතන කඳවුරක් ද විය. එහි යෝධ ගෑස් කාමර හතරක් තිබුණි. ඊට යාබදව පිහිටියේ මිනී පුළුස්සන දැවැන්ත ආදාහනාගාර කිහිපයකි. මුළු කඳවුර වටා විදුලි සැර කැවූ කටු කම්බි වැටක් ඉදිකර තිබුණි. රුසියානු, පෝලන්ත, යුගෝස්ලාවියානු චෙක් ආදී නා නා විධ ජාතීන්ට හා නොයෙක් රටවල විසූ යුදෙව් වර්ගයාට අයත් ගැහැණු, පිරිමින් හා දරුවන් ලක්ෂ ගණනාවක් දුම්රිය වලින්, බස් වලින් හා ලොරි වලින් ගෙනැවිත් ඝාතන කඳවුරට යවා එතැනදී ගෑස් කාමර තුළ බහා මරා ආදාහනාගාර තුළ දවා අළු කර ඒ මිනී අළු කන්දරාව සෝලා ගංගාවේ ජල ධාරාවන් සමග මහ සයුරට පා කර හරින ලද්දේ අවුෂ්විට්ස් කඳවුර මගිනි.

Scanned with CamScanner

නාසි සිර කඳවුරු තුළ දහ දුක් විඳි ශතසහශ්‍ර සංඛ්‍යාත අවාසනාවන්තයින්ගෙන් වැඩි දෙනා කර තිබුණු එකම පාපය ඔවුන් ජර්මන් ජාතිකයන් සේ මෙලොවට බිහි නොවීම පමණි.

අවුෂ්විට්ස් කඳවුරේ පාලකයෙකු වූ කාර්ල් ෆ්‍රිෂ් (KARL FRISCH) වරෙක සිරකරුවන් අමතා කළ කතාවකින් නාසීන් මිනිස් ජීවිත කෙරෙහි දැක් වූ මෘග ආකල්පය හොඳින් පැහැදිලි වේ.

ෆ්‍රිෂ් මෙසේ කීය.

''ඔබ මේ අවුත් සිටින්නේ සනීප ගන්න විවේකාගාරයකට නොව ජර්මන් වධ කඳවුරකටය. මෙතැනින් පිට වී යා ගත හැකි එකම ක්‍රමයක් තිබේ. ඒ ආදාහනාගාරයේ දුම් කපොල්ල තුළිනි. මීට අකමැති කවුරුවත් සිටිනවා නම් ඔවුන් කළ යුත්තේ විදුලි සැර කැවූ කටු කම්බි වැටේ එල්ලෙන එක පමණි. සිරකරුවන් අතර සිටින යුදෙව්වන්ට ජීවත් වීමට ඉඩ දෙන්නේ දෙසතියක් පමණි. පූජකයන්ට මාසයක් ඉඩදෙනු ලැබේ. අනෙක් අයට දෙන කාලය තුන් මාසයයි.''

දහස් ගණන් එකවර මරා දැමිය හැකි අවුෂ්විට්ස් වැනි දැවැන්ත මරු කඳවුරු පිහිටුවීමට කලින් ඒ කටයුත්ත සඳහා ජර්මන් රජය විසින් විශේෂ උපක්‍රමයක් යොදාගෙන තිබුණි. ඒ තමා ජංගම ගෑස් කාමර.

සතර පැත්තෙන්ම මනා ලෙස වසන ලද විශාල ලොරිවල විෂ ගෑස් නළ සවිකර තිබුණි. වාහනය ගමන් කරන අතරතුර වුවද මේ නළ ඔස්සේ ලොරිය තුළට ගෑස් විදිය හැකි විය. සිරකරුවන් ලොරියට පටවා දොර වැසූ පසු ඇතුලේ සිදුවන දෙය කිසිසේත් පිටතට නොපෙනේ. ඉන්පසු යෝධ මිනී වළක් කැණූ පාළු පෙදෙසක හෝ ආදාහනාගාරයක් පිහිටි ස්ථානයක් කරා රථය පදවාගෙන යනු ලැබේ. රථය ගමන් කරන අතර ගෑස් නළ ක්‍රියාකාරී වෙයි. වාහනයේ අභ්‍යන්තරය මාරක විෂ වායුවෙන් පිරී යයි. මිනිත්තු කිහිපයකදී එහි ඉතිරිව ඇත්තේ ප්‍රාණය නිරුද්ධ වූ මළ කඳන් ගොඩක් පමණි.

මේ ජංගම මාර කුටි තුළ විශේෂයෙන් මරා දමන ලද්දේ ස්ත්‍රීන් හා ළමුන්ය. වාහනවලට නැඟීමට ඔවුන් පොළඹවා ගන්නා ලද්දේ වෙනත් ස්ථානයකට ගෙන යනු සඳහා යයි මුලා කිරීමෙනි.

නාසි හමුදා විසින් යටපත් කර ගන්නා ලද විවිධ රටවලින්

Scanned with CamScanner

සිරකරුවන් ලක්ෂ ගණනාවක් වධ කඳවුරු වෙත ගෙනෙන ලද අතර ඒවායෙහි දොරටුව ළඟදීම වෛද්‍යවරුන් විසින් ඔවුන් පරීක්ෂා කරනු ලැබූහ.

කාය ශක්තිය තිබුණු අය වැඩි කලක් ජීවත් වීමේ වරම් ලැබූ අතර වැඩ කිරීමට හැකියාව නොමැති මහල්ලන්, දුබලයන්, රෝගීන් හා පොඩි දරුවන් නොපමාව ගෑස් කාමර වෙත යවන ලදී.

කාය ශක්තිය තිබුණු ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට වධ කඳවුරු තුළ පැවැත්වුණු නොයෙක් කර්මාන්තවල යෙදෙන්නට සිදුවුණි. වධ කඳවුරු තුළට ගෙනා විගස සිරකරුවන්ගේ ඇඳුම් පැළඳුම් සහ බඩු බාහිරාදිය ඉවත් කෙරුණි. මේ සියල්ල ටොන් ගණනින් ජර්මනියට ගෙන යන ලදී.

නිරුවත් කරන ලද සිරකරුවන්ට කොටස් දෙකකින් යුත් එකම වර්ගයේ ඇඳුම් කට්ටලයක් සැපයුණි. ඔවුන් සියලු දෙනාගේම හිස මුඩුකොට නොම්මරයක් අතෙහි කොටන ලදී. ඉන් පසු සෑම සිරකරුවෙකුම හැඳින්වූයේ මේ නොම්මරයෙන් මිස නියම නමින් නොවේ. ඔවුහු නිර්නාමික භූතයන් පිරිසක් කරනු ලැබීය.

කඳවුර තුළදී ඔවුන්ට ලැබුණේ යන්තම් පණ කෙන්ද ගැට ගසා ගැනීමට ප්‍රමාණවත් ආහාර ස්වල්පයක් පමණි. නිඳා ගන්නට ඇඳන් නොතිබුණි. ඔවුන් සයනය කළේ තට්ටු කිහිපයකින් යුත් ගොරෝසු ලී රාක්කවලය. අටුවට කොට්ට පොල් පැටවූවා සේ මේ රාක්ක මත හිර වී තද වී සිටීමට සිරකරුවන්ට සිදුවිය.

කඳවුර තුළ පැවති සෞඛ්‍ය තත්ත්වය මනුෂ්‍යයන්ට තබා තිරිසනුන්ටවත් ඔරොත්තු නොදෙන සුලු විය. ඒවා මීයන් මකුණන් හා කෘමීන් වැනි සතුන්ගෙන් පිරී පැවතුණි. නිතර වසංගත පැතිර ගොස් සිය දහස් ගණන් එකවර මිය ගියහ. දද, වණ, කුෂ්ට ආදියෙන් බොහෝ සිරකරුවෝ අපමණ දුක් වින්දහ.

ලෙඩ වූ සිරකරුවන් වෙනම කාමරයක දමන ලදී. මේ කාමරයට ගිය අය ආපසු ආවේ නැත. එතැනින් ඔවුන් කෙළින්ම ගෙන යන ලද්දේ ඝාතනාගාරවලටය. පහසුවෙන් සුවකළ හැකි හොරි වැනි රෝගයක් වැළඳී සිටියවුන් පවා මෙසේ මරා දමන ලදී.

මේ වධ කඳවුරු තුළදී දිනපතා සිරකරුවන් ගණන් කර බැලිණි. ගණන් ගැනීම කෙරුණේ අලුයම 3.30ටය. ගණන් ගැනීමට සහභාගි නොවීම බරපතල වරදක් ලෙසය සැලකුණේ. පණ අදිමින් සිටිනවුන් පවා එහි ඇදගෙන යන ලදී.

Scanned with CamScanner

වධ කඳවුරුවල අපා ජීවිතය තවදුරටත් ඉවසා ගත නුහුණු අය සියදිවි නසා ගත්හ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කළේ කඳවුර වටා ඉදිකර තිබුණු විදුලිය කැවූ කටු කම්බි වැටෙහි එල්ලීමය. එය ඔවුන්ට අපරිමිත ශාන්තියක් විය.

වධ කඳවුරට හා ඝාතන කඳවුරට ගෙන යනු සඳහා සිරකරුවන් වෙන් කරන ලද ස්ථානයන්හි හදවත පැළී යන අන්දමේ දුක්ඛිත දර්ශනයන් දක්නට ලැබුණි. දරුවන් ඝාතන කඳවුරු කරා ගෙන යාමට උදුරා ගනිද්දී අම්මලා පොළොවේ හැපි හැපී හඬා වැලපුණහ. මහලු මාපියන් මාර මුඛයට ඇදගෙන යද්දී දූ දරුවෝ සිහි විසඥව ඇද වැටුණාහ. බිරින්දන්ගෙන් සැමියන් වෙන් කෙරෙද්දී ඔවුහු එකිනෙකා සිපගෙන අවසන් වරට සමු ගත්හ.

ඝාතන කඳවුරු බැලූ බැල්මට දැකුම්කලු ස්ථානයන් විය. එහි ලස්සන මල් වවා තිබුණි. වරින්වර විනෝදාත්මක සංගීතයක් ඇසුණි. ඝාතනාගාරවල දොරටුවෙහි "නාන කාමර" යන වචනය සඳහන් විය.

ඝාතනාගාර කරා සිරකරුවන් ගෙනගිය විගස ඔවුන් නිරුවත් කරන ලදී. උකුණන්, ඉනිකුණන් ආදී සතුන් වඳ කරනු වස් හොඳින් නා ගනු සඳහා මෙහි ගෙනා බව කියමින් සිරකරුවෝ මුලා කරනු ලැබූහ.

මෙසේ නග්න කෙරුණු සිරකරුවන් ගෑස් කාමර තුළට ඇතුළු කෙරුණු පසු දොර තදින් වසන ලදී. ඉන්පසු බිත්තියේ වූ විවරයකින් විෂ වායුව ඇතුලු කෙරුණි. මිනිත්තු දහයක් පහළොවක් ගිය පසු දොර හරින ලදී. එවිට දක්නට ලැබුණු දර්ශනය බිහිසුණුය. අත්‍යන්තරයෙන් ශෝක හරිතය. සිරකරුවන් එකට කැටි වී එකිනෙකා බදාගෙන බිම පෙරළී මියගොස් තිබුණි. පොළොව සහ සිරකරුවන්ගේ ශරීර මළ මුත්‍රයෙන් ජරා වී තිබුණි.

අනතුරුව මළ කඳන් ආදාහනාගාර වෙත ගෙන යන ලදී. ඒවා ක්‍රියා කළේ විදුලි බලයෙනි. එකවර එහි මිනී කිහිපයක් දවා අළු කළ හැකි විය.

බිළිඳුන් බොහෝ විට මරන ලද්දේ විශාල වතුර බාල්දි තුළ ගිල්වීමෙනි. ඇතැම් තැන්වල ඔවුන් පණ පිටින්ම විදුලි පෝරණු තුළට විසි කළ බවට සාක්ෂි තිබේ. එසේ කළේ වටිනා විෂ වායුව ඉතිරි කර ගැනීමටය!

Scanned with CamScanner

ඝාතනයට සම්බන්ධ සියලු වැඩ කටයුතු කිරීමට යොදවන ලද්දේ සිරකරුවන්මය.

සිරකරුවන්ගෙන්ම සැදුම් ලත් බැන්ඩ් තූර්ය වාදක කණ්ඩායමක් විය. සිරකරුවන් ගෑස් කාමර කරා ගෙන යද්දී වාදනයේ යෙදමින් ඉදිරියෙන් ගමන් කිරීමට බැන්ඩ් කණ්ඩායමට බල කරනු ලැබීය.

මිය ගියවුන්ගේ රන් හා රිදී දත් කොපු ගලවන ලදී. හිසකෙස් කපා ගන්නා ලදී. ලස්සන චිත්‍ර ඇඟේ පච්ච කොටාගෙන සිටියවුන්ගේ හම ගලවා ගන්නා ලදී. මළ සිරුරු වල තෙල් කොටස් ද ඉවත් කර ගන්නා ලදී. කෙස්වලින් හවරි සහ පුටු කුෂන් තැනුණි. පච්ච කෙටූ සම් වලින් අත් බෑග් සහ පහන් ආවරණ නිමැවුණි. තෙල් වලින් සබන් නිපැයුණි.

මිනිස් තෙලින් සබන් තනනු සඳහා පර්යේෂණ පවත්වන ලද්දේ ඩැන්සිග් නුවර පිහිටි ජර්මන් වෛද්‍ය ආයතනයකය.

වධ කඳවුරු සහ යුද සිර කඳවුරු තුළ සිටි ස්ත්‍රීන් පුරුෂයන් හා දරුවන් නොයෙක් විද්‍යා පර්යේෂණවලට භාජනය කරන ලදී. මේ පර්යේෂණවලදී සිරකරුවන්ට මහත් වද වේදනා විඳීමට සිදුවුණි. සමහරෙක් පර්යේෂණ කෙරෙද්දීම හෝ ඉන් පසු මිය ගියහ.

XXXXXX

යුරෝපය ජර්මන් නාසි පාලනයට යටත්ව පැවති සය වසර තුළ කෙරුණු මේ සා බිහිසුණු හා පිළිකුල් සහගත සාපරාධී ක්‍රියාවන්ට සම කළ හැකි ඛේදවාචකයක් මිනිස් ඉතිහාසයේ මින් පෙර නොවී යයි කීම අතිශයෝක්තියක් නොවේ.

කතෝලිකයෙකු වූ හිට්ලර්ගේ පාලනය යටතේ යුදෙව්වන්ට ඒ සා ඛේදනීය ඉරණමකට මුහුණ පෑමට සිදුවූයේ යුදෙව්වන් විසින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරා දමන ලද නිසා යයි ඇතැම්හු විශ්වාස කරති.

ඒ කෙසේ හෝ වේවා යුදෙව්වන් සහ නැගෙනහිර යුරෝපීය ජාතීන් වඳකර දැමීමට ජර්මානුන් ගත් පියවරට වගකිව යුත්තේ හිට්ලර් පමණක් නොවේ. ඊට හිම්ලර්, මාර්ටින් (MARTIN BORMANN) හෙයිඩ්රිච්, ෆ්‍රැන්ක්, අයික්මාන් ආදී අධමයන් සියලු

Scanned with CamScanner

දෙනාම වගකිව යුතුය. මේ ජාතීන් වඳ කිරීම භාරව සිටි පුද්ගලයා එම කාර්යයේ යුක්ති සහගත භාවය ආගමක් සේ ඇදහූ පුද්ගලයා හිම්ලර්ය. හිම්ලර් යුද්ධාවසානයේදී දිවි නසා ගත්තේය. ෆ්‍රෑන්ක් නියුරම්බර්ග් යුද්ධාපරාධ අධිකරණය විසින් එල්ලුම් ගසට නියම කරන ලදී. අයික්මාන් දකුණු ඇමරිකාවට පළා ගොස් වසර කීපයක් සාර්ථක ලෙස වෙස් වළාගෙන ජීවත් වූ මුත් ඊශ්‍රායලයේ රහස් පරීක්ෂකයන් විසින් ඔහු අල්ලා ගෙන අවුත් ඊශ්‍රායලයේ පැවති නඩු විභාගයකින් පසු මරා දමන ලදී. නාසි විරෝධී චෙක් තරුණයන් දෙදෙනෙකු එල්ල කළ අත් බෝම්බ ප්‍රහාරයකින් ''අලුගෝසු හෙයිඩ්රිච්'' ජීවිතක්ෂයට පත් විය.

මිත්‍ර පාක්ෂික හමුදාවන්ට හසු නොවූ බෝර්මන්ට කුමකින් කුමක් වී දැයි කිසිවෙක් නොදනිති. සමහරවිට ඔහු කොහේ හෝ තවමත් ජීවත් වනවා විය හැකිය.

නාසි පාලනයේ කෲරත්වයට වඩාත්ම ගොදුරු වූ පෝලන්ත දේශයේ ජර්මන් දිසා ඇමැතිවරයා වූ හැන්ස් ෆ්‍රෑන්ක් නියුරම්බර්ග් යුද්ධාපරාධ අධිකරණය විසින් එල්ලුම් ගස නියම කරනු ලැබීමෙන් පසු ඓතිහාසික ප්‍රකාශයක් කළේය.

ඒ මෙසේය.

'මේ මාවත ඔස්සේ තව දුරටත් එක අඩියක්වත් නොයන ලෙස මම අපේ ජනතාවගෙන් අයැද සිටිමි. ඔහුගේ (හිට්ලර්ගේ) මාවත හෘදය සාක්ෂියක් හෝ අවංක භාවයක් නොමැති බිය ජනක හා උමතු ක්‍රියා මාර්ගයක් බවට පත් විය. ඒ බව මට මේ නඩු විභාගය අවසානයේදී ඒත්තු ගියේය.'

'ජර්මන් ජනතාවගේ පාලකයන් වූ අපි මේ මාවත අත හරින්නැයි ඔවුන්ගෙන් උදක්ම ඉල්ලා සිටිමු. මේ මාවත විසින් යුක්තිය හා දේව නීතිය උඩ අපේ ක්‍රමය හා මේ ක්‍රමය අනුගමනය කරනවුන්ද, ලොව ඕනෑම තැනක එය තව දුරටත් අනුගමනය කරනවුන්ද විනාශ මුඛය තුළ බහාලනු ඇත.

මේ නඩු විභාගය මාස කීපයක් මුළුල්ලේ පැවැත්වුණි. එය පැවැත්වුණේ දෙවෙනි ලෝක යුද්ධයේදී ජීවිතක්‍ෂයට පත්වූ ලක්‍ෂ කෝටි සංඛ්‍යාත මනුෂ්‍යයන්ගේ මිනීවල් මතය. නඩු විභාගය පැවැත්වෙද්දී ඔවුන්ගේ ආත්මයන් චෝදනා නගමින් මේ ශාලාව හරහා ගමන් කරන්නට ඇත.'

'මට විරුද්ධව නඟා තිබුණු චෝදනා සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට මට ඉඩ ප්‍රස්තාව සලසා දීම ගැන කෘතඥ වෙමි.'

'මේ සම්බන්ධයෙන් මට සිහිපත් වන්නේ යුද්ධයට අදාළ ප්‍රචණ්ඩ හා භීෂණ සිද්ධි වලට ගොදුරු වූ සියල්ලන් ගැනය. ප්‍රශ්න විරහිතව, ඝෝෂා විරහිතව ලක්ෂ ගණනාවකට මිය යාමට සිදු වුණි. මට නිදහස අහිමි වූ අවස්ථාවේදී මම මගේ යුද දින පොත බාර දුනිමි. මා කිසියම් අවස්ථා දරුණු වී නම් යුද්ධය පැවැති අවධියේ මගේ ක්‍රියාකලාපය ප්‍රසිද්ධියට පත් කෙරෙන මේ මොහොතේ මා අන් සැමට වඩා දරුණු වී ඇත්තේ මටමය.'

'මවිසින් කරන ලද කිසිම වරදක් සම්බන්ධයෙන් සඟවා ගත් වරදකාරී හෘදයශාක්ෂ්‍යයක් මෙලොව ඉතිරි කර යාමට මා කැමති නැත. මා වගකීම භාර ගත යුතු සෑම දෙයකටම මේ සාක්කි කූඩුවේදී වගකීම භාර ගතිමි. ඇඩොල්ෆ් හිට්ලර්ට සහ ඔහුගේ ආණ්ඩුවට සහයෝගය දුන් කෙනෙකු වශයෙන් මට හිමි යිය යුතු වරද ප්‍රමාණයද මවිසින් පිළිගන්නා ලදී.'

Scanned with CamScanner

# 8

## හිට්ලර් බර්ලිනය තුළ කොටුවේ!

1939 සැප්තැම්බර් 1 දා ජර්මනියෙන් ඇරැඹි යුරෝපය සහ ලෝකය සිසාරා පැතිර ගිය දෙවෙනි ජගත් සංග්‍රාමය 1944 දී පාරාවළල්ලක් සේ ආපසු ජර්මනිය තුළටම පිවිසියේය.

1945 අප්‍රේල් 20 දා නාසි ආඥා දායක හිට්ලර් ස්වකීය 56 වෙනි ජන්මෝත්සවය පවත්වන විට ජර්මන් අගනුවර වූ බර්ලිනය අසලට යුද්ධය ළඟා වී තිබුණි.

නැගෙනහිරින් මොස්කව් නගරය දක්වාද, බටහිරින් ප්‍රංශයේ අත්ලන්තික් වෙරළ දක්වාද, උතුරින් ආර්ක්ටික් මුහුද සහ දකුණින් අප්‍රිකාවේ උඩු කොටස දක්වාද, විහිදුණු අති විශාල බිම් පෙදෙසක් අවුරුදු දෙක තුනක කෙටි කාලයක් තුළ යටපත් කර ගනිමින් යුද්ධ ශිල්පය අතින් ලොවැ මින් පෙර නොවූ විරූ ප්‍රාතිහාර්යයක් පෑ හිට්ලර්ට අන්තිමේ ඉතිරි වූයේ බර්ලිනය සහ ජර්මනියේ මුළු බිම් ප්‍රමාණයෙන් සුළු කොටසක් පමණි.

ජර්මනියෙන් පිටත් වී රුසියන් අගනුවර වූ මොස්කව් දක්වා දික්විජයෙහි යෙදුණු 55, 00, 000 ක යෝධ ජර්මන් හමුදාවේ ඒ තාවකාලික ජයග්‍රහණය මැඩලමින් ඉදිරියට ආ සෝවියට් රතු හමුදාව මේ වන විට බර්ලිනයට කාලතුවක්කු වලින් ෂෙල් වෙඩි එල්ල කළ හැකි තරම් කිට්ටුවට එළැඹ සිටියහ. මාර්ග දෙකකින් ගමන් ගත් රතු හමුදාව මාර්ෂල් ජෝර්ජ් සුකොව් සහ මාර්ෂල් අයිවන් කොනියෙව් (IVAN KONIEV) විසින් මෙහෙයවනු ලැබීය. මේ අවසාන ප්‍රහාරය සඳහා විවිධ වර්ගයේ සහ නානා ප්‍රමාණයේ රුසියන් තුවක්කු 20, 000 ක් ජර්මන් අගනුවර දෙසට මානා තිබුණි.

Scanned with CamScanner

මේ අතර සෙන්පති අයිසන් හවර්ගේ නායකත්වයෙන් මෙහෙයවුණු අමෙරිකන් හමුදා ජර්මනියේ බටහිර දෙස පිහිටි එල්බ් ගංගාව දක්වා අවුත් එහි වාඩිලා ගත්හ.

මොන්ට්ගොමරි (MONTGOMERY) සෙන්පතිගේ බ්‍රිතාන්‍ය හමුදාවෝ උතුරේ පිහිටි ප්‍රධාන ජර්මන් නගර දෙකක් වන බ්‍රෙමන් සහ හැම්බර්ග් තෙක් ළඟා වූහ. දකුණේ ප්‍රංස හමුදා ඩැනියුබ් ගඟබඩටද, රුසියන් හමුදා වියානාවටද කඩා වැදී තිබුණි. සෙන්පති ඇලෙක්සැන්ඩර් (ALEXANDER) ගේ හමුදා සීග්‍රයෙන් ඉතාලිය යටත් කරමින් උන්හ. අමෙරිකන් සෙන්පති පැටන් (PATTON) ජර්මනිය මැදින් දකුණු දෙසට ගමන් කළේය.

1945 අප්‍රේල් 20 දා හිට්ලර්ගේ ජන්මෝත්සවය පැවැත්වෙද්දී ඔහුගේ අධිරාජ්‍යය අභාවයට යමින් තිබුණේ ඔය අන්දමිනි.

ජර්මන් අගනුවර වටා සතුරු හමුදා තොන්ඩුව තද වෙමින් තිබියදී හිට්ලර්ගේ ප්‍රචාරක ඇමැති ආචාර්ය ගොබල්ස් ඇස්. ඇස්. බලකායේ අධිපති හිම්ලර්ගේ කාර්යාලයක තිබුණු කේන්දර දෙකක් හා ඊට සම්බන්ධ අනාවැකි ගෙන්වා ගත්තේය. මින් එකක් 1933 ජනවාරි 30 දා මුල් කරගෙන තැනූ හිට්ලර්ගේ කේන්දරයකි. ඒ ඔහු ජර්මනියේ අගමැති වූ දිනයයි. අනෙක 1918 නොවැම්බර් 9 දා මුල් කරගෙන සකස් කළ කේන්දරයකි. ඒ කයිසර්ගේ රාජාණ්ඩුව පෙරළා ජර්මන් ජනරජය පිහිටෙව් දිනයයි.

කේන්දර විස්තරය බොහෝ දුරට නිවැරදි විය. එහි මෙසේ සඳහන් වී තිබුණි.

'1939 දී යුද්ධය ඇරඹෙන බව කේන්දර දෙකින්ම කියැවේ. 1941 දක්වා (ජර්මනියට) ජයග්‍රහණයන් හිමි වන්නේය. ඉන්පසු පරාජයන් ගණනාවකට මුහුණ පෑමට සිදුවනු ඇත.

දරුණුම පරාජයන් ඇති වනුයේ 1945 මුල් මාසවලදීය. විශේෂයෙන් අප්‍රේල් මස මුල් භාගයේය. අප්‍රේල් දෙවන භාගයේදී තාවකාලික ජයක් අත්වන්නේය. එතැන් පටන් අගෝස්තු දක්වා සම තත්ත්වයක් පවතී. ඒ මාසය තුළදීම සාමය උදා වන්නේය. ඊළඟ තුන් අවුරුද්ද තුළ ජර්මනියේ කාලය අසුබය. එහෙත් යළි 1948 පටන් ජර්මනියේ තත්ත්වය ඉහළ නඟිනු ඇත.'

තුවක්කුවලින්, ටොර්පිඩෝවලින් සහ බෝම්බ වලින් තම රටේ සහ සෙසු ලෝකයේ ඉරණම විසඳීමට තැත් කළ ජගතුන් පිරිසක්

Scanned with CamScanner

අන්තිමේ කේන්දරකාරයකුගේ සරණ පැතීම කොතරම් හාස්‍ය ජනක දෛව පෙරළියක්ද?

XXXXXX

සතුරු හමුදා බර්ලිනය වටලන විට හිට්ලර් හුන්නේ පොළව මතු පිට නොව පොළොව යට බිම් ගෙයකය. මේ බිම්ගෙය පිහිටියේ අගමැති කාර්යාලය පාමුළය. එය අඩි පණහක් පොළොව යටින් තැනූ කාමර හා කාර්යාල, සයනාගාර සහ මන්ත්‍රණ ශාලා, කුස්සි හා කක්කුස්සි ආදියෙන් සමන්විත වූ ආරක්ෂක ස්ථානයකි.

නාසි රජයේ සෙසු නායකයෝ මහා ආඥාදායකයා සමග සාකච්ඡා පැවැත්වීමට නිතර බිම්ගෙය තුළට පැමිණියහ.

එදා හිට්ලර්ගේ ජන්මෝත්සව දිනයේදී නොයෙක් පුද්ගලයෝ බිම්ගෙය තුළට අවුත් නායකයාට සුබ පතා ගියහ. සමහරු ඔහු සමග සාකච්ඡා කිරීමට රැඳී සිටියහ.

ඇස්. ඇස්. බලකායේ සහ ගෙස්ටාපෝ රහස් සේවයේ අධිපති හෙයින්රිච් හිම්ලර්, අහස් හමුදාවේ අධිපති හර්මන් ගෝරිං, ප්‍රචාරක ඇමැති ආචාර්ය ගොබල්ස්, නෞකා හමුදාපති කාර්ල් ඩොයෙනිට්ස් (KARL DOENITC), හමුදා මණ්ඩලයේ ප්‍රධාන විල්හෙලම් කෙයිටල් (WLLHELM KEITEL), යුද හමුදා කාර්ය මණ්ඩලාධිපති ඇල්ෆ්‍රඩ් ජොඩ්ල් (ALFRED JODL) උප රාජ්‍ය නායක මාටින් බෝර්මන්, විදේශ අමාත්‍ය ජෝකිම් රිබන් ට්‍රොප් සහ යුද්ධ භාණ්ඩ නිෂ්පාදනය භාර අමාත්‍ය ඇල්බට් ස්පියර් (AIBERT SPEER) එදා හිට්ලර්ගේ බිම් ගෙය තුළ රැස් වූ ප්‍රධාන පෙළේ නාසි නායකයන්ය.

මොවුන් සහ හිට්ලර් අතර පැවැති සාකච්ඡාවේදී මුල් තැන ගත්තේ ආණ්ඩුව වහාම බර්ලිනයෙන් ඉවත් කිරීමේ ඇති යෝග්‍යතාවය පිළිබඳ ප්‍රශ්නයයි. බර්ලිනය සතුරු හමුදා වළල්ලට සීග්‍රයෙන් කොටුවෙමින් තිබෙන නිසා වහාම එතැනින් පැන ගැනීම කරන්නට ඇති එකම ප්‍රඥාගෝචර දෙය බව ඒ සියලු දෙනාම හිට්ලර්ට පැහැදිලි කර සිටියහ. ඔවුන් යෝජනා කළේ තවමත් ජර්මන් හමුදා අතෙහි ඉතිරිව පැවැති දකුණු ජර්මනියේ ඔබර්සැල්ස්බර්ග් කරා ආණ්ඩුව ගෙන යා යුතු බවයි.

Scanned with CamScanner

එහෙත් මකර කටෙහි වැටීමට ඉතා ආසන්නව තිබුණු ස්වකීය අගනුවර අතහැර යෑමට හිට්ලර් කිසිසේත් එකඟ වූයේ නැත. යන අයට ඔහුගෙන් බාධාවක්ද නොවීය.

සාකච්ඡාව හමාර වී පැය කීපයකින් දකුණ බලා යන පෙරහර පිටත් විය. මුලින්ම ගමන් කළේ ලොරි පේළියකි. අහස් යානා පේළියක් අහසින් පිටත් විය. ඒවායෙහි ගියේ අහස් හමුදාපති ගෝරිං, ඔහුගේ ප්‍රධාන නිලධරයන් සහ අත්‍යවශ්‍ය ලිපි ලේඛනය. හිට්ලර්ගේ මූලස්ථානය සමඟ සම්බන්ධකම් පවත්වනු සඳහා ගෝරිං විසින් ජනරාල්වරු දෙදෙනෙක් බර්ලිනයෙහි රඳවනු ලැබූහ. ඒ කොලර් (KOLLER) සහ ක්‍රිස්ටියන් (CHRISTIAN) ය.

එදා රාත්‍රී බර්ලිනයෙන් පිටමං වූ අනෙක් පුද්ගලයා හිම්ලර්ය. හිට්ලර්ගේ ඉතාම ළබැඳි සගයන් දෙදෙනකු වූ ගෝරිං සහ හිම්ලර් එදා ඔහු හැර දා පරෙස්සම් සහගත පළාතකට පලා ගියේ ස්වකීය නායකයා වැඩි කල් ජීවත් නොවන බවත්, ඉන් පසු තමා රාජ්‍ය නායකයා වන බවත් යටි හිතින් අදහාගෙනය.

ඔවුන් දෙදෙනා හෝ ඒ අයුරින්ම පලා ගිය රිබන්ට්‍රොප් හෝ යළි සිය ආදරණීය නායකයාගේ මුහුණ දුටුයේ නැත.

රුසියානු හමුදාවලට විරුද්ධව තීරණාත්මක ප්‍රතිප්‍රහාරයක් එල්ල කරන්නැයි පසු දා (21 දා) හිට්ලර් තම සෙන්පතියකුට නියෝගයක් නිකුත් කළේය. හේ ෆිලික්ස් ස්ටෙයිනර් (FELIX STEINER) සෙන්පතියාය. හිට්ලර් කල්පනා කරගෙන හුන්නේ බර්ලිනයට දකුණින් ස්ටෙයිනර් සහ ඔහුගේ සේනාව ඇතැයි කියාය. එහෙත් එහි හෝ එහි අසලකවත් සිටි ස්ටෙයිනර් කෙනෙක් හෝ සේනාවක් නොවීය. එනිසා හිට්ලර්ගේ නියෝගයද ක්‍රියාත්මක වූයේ නැත. ස්ටෙයිනර්ට ආධාර වශයෙන් බර්ලිනයට උතුරින් වූ සේනා කීපයක් දකුණට කැඳවන ලදී. මේ හේතුවෙන් උතුරු දෙස ජර්මන් සේනා බලය හීන විය. රුසියන් යුද ටැන්කි බර්ලින් නගර සීමාව දක්වා ඉදිරියට ආවේය.

හිට්ලර්ගේ මුළු ජීවිත කාලයේ දීම මෙතරම් කේන්ති ගිය අවස්ථාවක් නැතැයි කියති. එදා ඔහු බිම්ගෙය තුළ සිටි නාසි නායකයන්ට කෙලින්මද, ඈත සිටි අයට ටෙලිෆෝනයෙන්ද, ලුණු ඇඹුල් සහිතව බැණ වැදුණේය. හැම එකකු විසින්ම තමා තනිකර ඇතැයි පාවා දී ඇතැයි, හේ ගුගුළේය. ජර්මන් රාජ්‍යයේ අගනුවර

රැකීමේ සටන මෙහෙයැවීම තමන් අතටම ගන්නා බවත්, ජය ලබනු බැරි නම් එහිදීම අවසන් හුස්ම හෙළීමට සූදානම් බවත් හිට්ලර් තරයේ කියා සිටියේය.

හිට්ලර්ට ඉතාම හිතවත් නාසි නායකයකු වූ ප්‍රචාරක ඇමැති ගොබල්ස්, ඔහුගේ බිරිඳ හා දරුවන් සය දෙනා මෙතෙක් පදිංචිව සිටියේ ඔහුගේ ඇමැති කාර්යාලය යට පිහිටි බිම්ගෙයකය. බෝම්බවලින් එය බොහෝ දුරට අබලන් වී තිබුණු බැවින් හිට්ලර්ගේ බිම්ගෙයි පදිංචි වන්නැයි ඔහු විසින් ගොබල්ස් පවුලට ඇරයුම් කරන ලදි.

තමන්ගේ මේ සුවච කීකරු ගෝලයා සහ හිතවතා ජීවිතාවසානය දක්වා තමන් සමඟ රැඳී සිටීම ගැන හිට්ලර්ට අල්පමාත්‍ර සැකයක් නොතිබුණි.

හිට්ලර් ගොබල්ස් හා ඔහුගේ බිරිඳ අතර පෞද්ගලික සාකච්ඡාවක් පැවැත්වුණි. තමා හිට්ලර් සමග නවතින බවත්, බැරිම තැන දිවිනසා ගන්නා බවත් ගොබල්ස් කීය. එලෙසින්ම තමනුත් දිවි නසා ගන්නා බැව් ගොබල්ස් මැතිණියද තරයේ කියා සිටියාය. ඒ අදහස වෙනස් කර ගෙන දරුවන් සමඟ ජීවත්වන සේ ජර්මන් ආඥාදායකයා ඇයට ඇවිටිලි කළ මුත් ඉන් පලක් වූයේ නැත. ගොබල්ස් යුවළ තම ළපටි දරු සදෙනාද වස දී මරා දැමීමට තීරණය කළහ.

මීළඟට හිට්ලර් සිය ලිය කියැවිලි පරික්සා කොටසක් තෝරා ගෙන ඒවා පුළුස්සා දැමීමට විධාන කෙළේය.

යළි කෙයිටල්, හා බෝර්මන් ළඟට කැඳ වූ ජර්මන් නායකයා තම තීරණය තවත් අවධාරණයෙන් කියා පෑමට මෙන් මෙසේ හඬ නැඟීය.

'මම බර්ලිනය දාල යන්නෙ නෑ - නෑමයි.'

ඊළඟට කෙයිටල් දෙස හැරුණු හිට්ලර් විධානයක් නිකුත් කළේය.

'බෙර්වෙට්ස්ගාඩන් කරා දූත් පිටත් වී යන ලෙස මා ඔබට නියෝග කරනවා!'

ජොඩ්ල් කැඳවූ නාසි නායකයා ඔහුටද කෙයිටල් මෙන් දකුණු ජර්මනියට ගොස් සේනා මෙහෙයවන ලෙස අණ කළේය.

බෝර්මන්ට කාමරයෙන් එළියට යන්නැයි කියන ලදී.

ඉන්පසු හිට්ලර් බර්ලිනය බේරා ගැනීමේ ක්‍රමයක් ගැන කෙයිටල් සමඟ සාකච්ඡාවක් පටන් ගත්තේය. එල්බ් ගඟබඩ අමෙරිකානුවන්ට මුහුණ ලා සිටින සෙන්පති වෙන්ක් (WENCK) ගේ සේනාව බර්ලිනය රැක්මේ සටනට ආධාර පිණිස එහි ගෙන්විය යුතු යයි නාසි නායකයා යෝජනා කළේය. කෙයිටල් එම පණිවිඩය රැ ගෙන වහාම වෙන්ක් හමු වීමට යන්න කැමැත්ත පළ කළේය.

එහෙත් ඒ වන විට රාත්‍රී අට වී තිබුණෙන් කෑම කා යන්නැයි හිට්ලර් සිය සෙන්පතියාට කීය.

කෙයිටල් මේසයට වාඩි විය. ඔහු අහර කිස නිමවන තුරු හිට්ලර්ද එතැන වාඩිගෙන සිටියේය. කවදත් කරුණා භරිතව හා ත්‍යාගශීලීව අමුත්තන්ට සැලකුවකු වන නාසි ආඥාදායකයාගෙන් කෙයිටල්ගේ ගමනට සැන්ඩ්විච්, චොක්ලට්, කොඥැක් බෝතල් බාගයක් සහ තව නොයෙක් දේ ලැබුණි.

මෙසේ කෙයිටල්, වෙන්ක් හමුවීමට පිටත් වූ අතර ජොඩ්ල් දකුණු ජර්මනියේ හමු දා මූලස්ථානය කරා ගමන් ගත්තේය.

හිට්ලර්ගේ යුද උපදේශක වශයෙන් බර්ලින් බිම්ගෙයි රැඳී සිටින්නැයි සෙන්පති ක්‍රෙබ්ස් (KREBS) ට අණ ලැබුණි.

මේ වන විට හිම්ලර් හුන්නේ බර්ලිනයට වයඹ දිගින් පිහිටි ස්ථානයකට පලා ගොස්ය. බර්ලිනයේ රැඳී හුන් නාසීන් පිළිබඳ ඒ අවස්ථාවේ නියම තත්ත්වය සගයකු දුන් ටෙලිෆෝන් පණිවුඩයක් මඟින් දැන ගන්නට ලැබුණි.

'බර්ලිනයේ ඉන්න හැමෝටම පිස්සු. මම මොනවා කරන්නද?' යි හිම්ලර් සිය නිලධරයන් අමතා කීය.

'ඔබ තුමා කළ යුත්තේ කෙලින්ම බර්ලිනයට යාමය' යි ඇස්. ඇස්. බළකායේ ප්‍රධාන කාර්යාලයේ අධිපති ගොට්ලොබ් බර්ගර් ඒ අවස්ථාවේ යෝජනා කළේය.

හිම්ලර් ඊට එකඟ වූයේ නැත. බර්ගර් තනියමයි බර්ලිනයට ගියේ.

මේ නිර්ව්‍යාජ ජර්මානුවා ජාතික සමාජවාදය කෙරෙහි ප්‍රශ්න විරහිතව විශ්වාසය තැබූවෙකි.

ඒ අතිශය අන්තරායදායක ගමනෙහි යෙදීමට ඔහු පෙළඹුණේ එනිසාය.

බර්ගර් සිය නායකයාගේ බිම්ගෙය තුළට පිවිසෙන විට ඒ උඩින් වූ අගමැති කාර්යාලයට සහ ඒ අවට පෙදෙසට රුසියානුන්ගේ ෂෙල් වෙඩි වැටෙමින් තිබුණි.

XXXXXX

බර්ලිනයෙහි රැඳී සිටීමට හිට්ලර් ගත් තීරණය බර්ගර් ගේ පැසසුමට ලක්විය. 'මෙච්චර හිතවත්ව සිටින මහජනතාව අත ඇරල යන්න බෑ' යි හිට්ලර් කීය.

ටික වේලාවක් නිහඬව සිටි හිට්ලර් යළි ගිරියෙන් කෑ ගැසීය.

'හැම එකාම මාව රැවැට්ටුවා, එකෙක්වත් මට ඇත්ත කීවේ නෑ, යුද හමුදාවත් මට බොරු කෙරුවා!'

මෙසේ ඔහු දිගටම බැණගෙන - බැණගෙන ගියේය. ඔහුගේ මුහුණ තිල් පැහැයක් ගති. ඔහු සිහි විසංඥව ඇද වැටිය හැකි යයි බර්ගර්ට බියක් උපණි.

මඳ වේලාවකට පසු ජර්මන් ආඥාදායකයා යළි සන්සුන් විය. ඊළඟට ඔහු වැදගත් සිරකරුවන් කණ්ඩායමක් ගැන බර්ගර් සමඟ සාකච්ඡා කළේය. යුද සිරකරුවන්ගේ පරිපාලනය භාරව සිටි පුද්ගලයා වූයේද බර්ගර්ය. ඒ සාකච්ඡාවට බඳුන් වූයේ බ්‍රිතාන්‍ය, ප්‍රංශ හා ඇමෙරිකානු සිරකරුවන් පිරිසකගේ ඉරණමත්, හිට්ලර් බලයෙන් නෙරපීමේ කුමන්ත්‍රණයක යෙදුණු සෙන්පති හැල්ඩර් (HALDER) සහ යුද ආර්ථික ඇමැතිව හුන් ආචාර්ය ශාච් වැනි ප්‍රමුඛ පෙළේ ජර්මන් ජාතික සිරකරුවන්ගේ ඉරණමත්, ඔස්ත්‍රියානු අගමැතිව සිටි ශුෂ්නිග් (SCHUSCHNIGG) ගේ ඉරණමත්ය. ජර්මනිය ඔස්සේ ඉදිරියට එමින් සිටි ඇමරිකානු හමුදාව අතට පත් නොවන සේ මොවුන් දකුණු ජර්මනියට ගෙන යාමට එහිදී තීරණය විය. බැවේරියාවේ හා ඔස්ත්‍රියාවේ කැරළිකාර තත්ත්වයක් පවතී යයි හිට්ලර්ට ලැබුණු වාර්තාවන් ගැන මීළඟට ඒ දෙදෙන සාකච්ඡා කළහ.

මේ ප්‍රශ්නය මතක් වූ විගස හිට්ලර් යළි කෝපයෙන් ගුගුරන්නට විය.

ඔහුගේ අත වෙව්ලුවේය. කකුල වෙව්ලුවේය. හිස වෙව්ලුවේය.

'උන් සේරටම වෙඩි තියාපල්ලා..........! උන් සේරටම වෙඩි තියාපල්ලා!' යි ඔහු ගෝරණාඩු කරන්නට පටන් ගත්තායයි මේ සිද්ධිය ගැන සඳහන් කරමින් බර්ගර් පසුව හෙළි කර තිබේ.

මෙසේ වෙඩි තියන්නැයි කීවේ පෙර සඳහන් ප්‍රමුඛ පෙළේ සිරකරු පිරිසටද, එසේ නැත්නම් බැවේරියාවේ සහ ඔස්ත්‍රියාවේ කැරළි කරුවන්ටද යන වග හෝ මේ දෙගොල්ලන්ටමද යන වග හෝ පැහැදිලි වූයේ නැත. සමහර විට මේ දෙගොල්ලන්ටම වෙඩි තැබිය යුතු යයි බර්ගර් කල්පනා කළා විය හැකිය.

සෙන්පති කොලර් අප්‍රේල් 22 දා පැවැති හිට්ලර්ගේ යුද සාකච්ඡාවට සහභාගී වූයේ නැත. 'මුළු දවස පුරා බැණුම් ඇසීම ඉවසා සිටින්නට මට කොහොමටවත් බැරිය'යි කොලර් සිය දින පොතේ සඳහන් කර තිබුණි.

හිට්ලර්ගේ බිම්ගෙයි සිටි කොලර්ගේ සම්බන්ධතා නිලධරයා වූ සෙන්පති ක්‍රිස්ටියන් සවස් භාගයේ ඔහුට ටෙලිෆෝනයෙන් කතා කොට මෙසේ කීය.

'යුද්ධයේ ඉතාම තීරණාත්මක සිද්ධීන්, ඓතිහාසික සිද්ධීන් මෙහි දැන් සිදුවෙමින් තියෙනවා.'

පැය දෙක තුනකට පසු ක්‍රිස්ටියන් බර්ලිනය අසල පිහිටි ගුවන් හමුදා මධ්‍යස්ථානයට ගියේය. ඔහු එහි ගියේ සෙන්පති කොලර් පෞද්ගලිකවම මුණගැසී කරුණු සැළ කිරීමටය. බිය පත්ව සිටි ක්‍රිස්ටියන් කියූ දේ කොතරම් අපැහැදිලි වීද යත් නියම තත්ත්වය දැන ගනු සඳහා සෙන්පති ජොඩ්ල් මුණගැසීමට කොලර් පිටත් විය. බර්ලිනය සහ පොට්ස්ඩෑම් නගර අතර පිහිටා තිබුණු හමුදා මණ්ඩලයේ තාවකාලික මූලස්ථානයේදී කොලර්ට වෙනත් තොරතුරු මෙන්ම ඉතා වැදගත් කරුණක් ද ජොඩ්ල් ගෙන් දැනගත හැකි විය.

'යුද සමාදානයක් ගැන සාකච්ඡා කරන විට එය මට වඩා හොඳින් ගෝරිංට කළ හැකිය. ඒ වාගේ වැඩ වලට ගෝරිං හරි දක්ෂයි.' යනුවෙන් ජොඩ්ල් සහ කොයිටල් සමඟ හිට්ලර් පවසා තිබේ.

වහාම ගොස් ගෝරිං හමුවීම තමන්ගේ යුතුකම යයි සෙන්පති කොලර්ට හැඟී ගියේය. මේ තත්ත්වය ගැන ගුවන් විදුලි පණිවුඩයක් මගින් ගෝරිංට දැනුම් දීමට වඩා ඔහු පෞද්ගලිකව මුණ ගැසීම

ප්‍රවේසම් දායක යයි කොලර් කල්පනා කළේය. ජර්මනියේ රාජ්‍ය නායකත්වයට තමාගෙන් පසු පත්විය යුතු පුද්ගලයා ගෝරිං යයි අවුරුදු ගණනාවකට කලින් හිට්ලර් විසින් තීරණය කර තිබුණි. හිට්ලර් යෝජනා කළ පරිදි සාම සාකච්ඡාවල යෙදිය යුතු පුද්ගලයා ගෝරිං නම් නොපමාව සාකච්ඡා පටන් ගත යුතු යයි කොලර් තේරුම් ගත්තේය. අප්‍රේල් 23 දා අලුයම 3. 30 ට යුද අහස් යානයකට නැඟුණු සෙන්පති කොලර්, ගෝරිං මුණ ගැසෙනු පිණිස මියුනිච් නගරය බලා පිටත් විය.

එහි දී කොලර් හිට්ලර් ගේ අදහස ගැන ගෝරිංට සැළ කර සිටියේය. එහෙත් එක පාරටම එය විශ්වාස කිරීමට ගෝරිං මැළි විය. මෙය ඔහුගේ පරම හතුරා වූ බෝර්මන් ගේ උපක්‍රමයක් වන්නට බැරි නැතැයි ගෝරිං සැක කළේය. මේ දිනවල බොර්මන් හුන්නේ හිට්ලර් සමඟය.

'මා දැන් පියවරක් ගතහොත් මා ද්‍රෝහියෙකැයි චෝදනාවක් එල්ල වන්නට බැරි නැත, පියවරක් නොගතහොත් මේ භයානක මොහොතේ රාජකාරිය පැහැර හැරී යයි මට දොස් පැවරෙනු ඇතැ'යි ගෝරිං සිය උපදේශකයන් අමතා කීය.

1941 ජූනි 29 දා හිට්ලර් නිකුත් කළ නියෝගයේ පිටපතක් ගෝරිංගේ සේප්පුවෙහි සුරැකිව තිබුණි. එය අතට ගත් ඔහු නාසි නායකයාගේ නියෝගය පරෙස්සමින් කියවා බැලීය. යම් හෙයකින් හිට්ලර් මියගියහොත් රාජ්‍ය නායක ධුරය ගෝරිංට හිමි විය යුතු බැවිද, යම් හෙයකින් හිට්ලර්ට රාජකාරිවල යෙදීමේ හැකියාව නැතිවුවහොත් ඔහු වෙනුවට කටයුතු කළ යුත්තේ ගෝරිං බැවිද, ඒ නියෝගයෙහි ඉතා පැහැදිලිව සඳහන් වී තිබුණි.

මේ අවස්ථාවේ හිට්ලර් හුන් තත්ත්වය අනුව ඔහු රාජකාරි ඉටුකළ නොහැකි අවධියකට පත් වී ඇති බැව් ගෝරිංගේ කාර්යාලයේ සිටි සියල්ලන්ගේ ඒකමතික අදහස විය.

ඒ කෙසේ වුවද තත්ත්වය වඩා පැහැදිලි කරගනු සඳහා හිට්ලර්ට විදුලි පුවතක් යැවීම ප්‍රඥාගෝචර යයි ගෝරිං කල්පනා කළේය. ඉතා පරෙස්සමින් වචන ගලපා ලියන ලද ඒ විදුලි පුවත මෙසේය.

මගේ නායක තුමනි,

බර්ලින් බලකොටුව තුළ රැඳී සිටීමට ඔබතුමා තීරණය කර ඇති බැවින් 1941 ජූනි 29 දා ඔබතුමා නිකුත් කළ නියෝගය ප්‍රකාර රට

තුළ මෙන්ම ඉන් පිටතද රාජකාරී කිරීමේ සම්පූර්ණ ස්වාධීනත්වය ඇතිව රාජ්‍ය නායකත්වය මා වෙත සහමුලින් පවරා ගැනීම ගැන ඔබ තුමා එකඟ වේද? 'අද රාත්‍රී 10 ට පෙර මීට පිළිතුරක් නොලැබුණහොත් නිදහසේ ක්‍රියා කිරීමේ ඉඩකඩ ඔබ තුමාට අහිමි වී ඇති ලෙසිනුත්, ඔබ තුමාගේ නියෝගයේ කොන්දේසි ඉෂ්ට වී ඇති ලෙසිනුත් සළකා අප රටේ හා අප ජනතාවගේ උපරිම යහපත අරබයා ක්‍රියා කරන්නෙමි. මගේ ජීවිතයේ මේ බිහිසුණුම අවස්ථාවේ ඔබතුමා වෙනුවෙන් මා තුළ කවර හැඟීම් පහළ වේදැයි ඔබ තුමා දන්නවා ඇත. මගේ හැඟීම් පළ කිරීමට වචන ප්‍රමාණවත් නොවේ. දෙවියන් වහන්සේ ඔබතුමා රැක දෙත්වා! සියලු බාධක මැඩ ගෙන ඉක්මනින් මෙහි එන්නට ඔබතුමාට ඉඩ ප්‍රස්ථාව ලැබේවා!'

XXXXXX

එදිනම සවස සැතපුම් සිය ගණනාවක් ඈත ස්ථානයක තව වැදගත් සිද්ධියක් විකසිත වෙමින් තිබුණි. ඒ තමා හෙයින්රිච් හිම්ලර් සහ ස්විඩනයේ රතු කුරුස සේවයේ අධිපති බර්නඩට් (BERNADOTTE) ආදිපාදයා අතර පැවැත්වුණු රහස් සාකච්ඡාව. හිම්ලර් රාජ්‍ය නායකත්වය තමන්ට 0ආයාචනා නිකුත් කළේ නැත. ඔහු දැන් ක්‍රියා කරන්නේ රාජ්‍ය නායකයා තමන් යයි සලකාගෙනය.

නායකතුමාගේ ශ්‍රේෂ්ඨ ජීවිතයේ අවසාන භාගය එළඹ ඇති බවත් තව දින කීපයකින් ඔහු මිය යන බවත් හිම්ලර් විසින් බර්නඩට්ට සැළ කරන ලදී. ජර්මනිය බටහිර රටවල හමුදාවලට යටත් වීමට සූදානම් බව වහාම ඇමෙරිකානු සෙන්පති අයිසන්හවර්ට දන්වන්නැයි හිම්ලර් බර්නඩට්ගෙන් අයැද සිටියේය. රුසියාව ඇතුළු නැගෙනහිර රටවල් සමඟ කෙරෙන යුද්ධය නොනවත්වා කෙරෙන බවත් බටහිර රටවල් රුසියාව සමඟ යුද වදිනතුරු එසේ සටන් කෙරෙන බවත් හිම්ලර් කියා සිටියේය.

ජර්මනිය යටත් වීමට සූදානම් බව ලියැවිල්ලකින් පවසා සිටින්නැයි බර්නඩට් හිම්ලර්ගෙන් ඉල්ලා සිටියේය. වහාම ඒ ඉල්ලීම ඉටු කෙරුණි. හිම්ලර් සිය ලිපිය ලීවේ ඉටිපන්දම් ආලෝකයෙනි. එදා බ්‍රිතාන්‍ය ගුවන් යානා විසින් බෝම්බ හෙළීම නිසා මේ දෙදෙනා මුණ ගැසුණු ලුබෙක් නම් වූ බෝල්ටික් නගරයේ විදුලි යන්ත්‍රාගාරය විනාශ වී තිබුණි.

Scanned with CamScanner

ගෝරිං මෙන්ම හිම්ලර්ද ඉක්මන් වූවා වැඩි බව දෙදෙනාටම නොපමාව අවබෝධ විය. රුසියානු හමුදාවලින් කොටු වූ බර්ලිනය තුළ හිට්ලර් හිර වී සිටි බව සැබෑ මුත් රාජ්‍ය නායකත්වය අතහැර දැමීමේ අදහසක් ඔහු තුළ වූයේ නැත, බිම්ගෙය ඉස්මත්තෙහි බැලුමකින් රඳවා තිබුණු ගුවන් විදුලි යන්ත්‍රයේ මාර්ගයෙන් ඕනෑම ද්‍රෝහියකු මෙල්ල කිරීමේ නියෝගයන් නිකුත් කිරීමේ හැකියාව තමන්ට ඇති බව හිට්ලර් දැන සිටියේය.

ගෝරිංගේ විදුලි පුවත මුලින්ම ලැබුණේ බෝර්මන්ගේ අතටය. තම පරම හතුරාගෙන් පලිගැනීමට මෙය කදිම අවස්ථාවක් බව දත් බෝර්මන් විදුලි පුවත හිට්ලර් අතට දෙමින් මෙය නායකතුමාගේ බලය පැහැර ගැනීමට ගත් ද්‍රෝහී පියවරක් ලෙසින් හැඳින්විය.

කෝපයෙන් වෙව්ලන්නට වූ හිට්ලර් ඒ ක්ෂණයෙන් ගෝරිංට විදුලි පණිවිඩයක් යැව්වේය.

රාජ්‍ය ද්‍රෝහී අපරාධයකට දඬුවම මරණය බවත් එසේ වුවද ගෝරිංගෙන් රජයට ඉටුවී ඇති දීර්ඝ සේවාව ගැන සලකා අභයදානය දෙන බවත්, එහෙත් එවිට දැරූ සියලු පදවි වලින් වහාම ඔහු ඉල්ලා අස්විය යුතු බවත් හිට්ලර්ගේ විදුලි පුවතින් කියැවුණි.

බෝර්මන් හිට්ලර්ටත් වඩා ඔබ්බට ගියේය. බර්චෙට්ස් ගාඩන්හි පිහිටි ඇස්. ඇස්. බළකායේ මධ්‍යස්ථානයට ටෙලිෆෝන් කළ බෝර්මන් වහාම ගෝරිං සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සිර භාරයට ගන්නැයි නියෝග කළේය.

පසු දා උදාවීමත් සමඟ නාසි රජයේ දෙවෙනි මහ බලවතා ඇස්. ඇස්. භටයන්ගේ සිරකරුවෙකි.

මේ අතරතුරේ තව වැදගත් අමුත්තෝ දෙදෙනෙක් හිට්ලර්ගේ බිම්ගෙය කරා ළඟා වූහ. දක්ෂ ගුවන් නියමුවකු වශයෙන් ලෝක ප්‍රකටව සිටි හැනා රෙයිෂ් (HANNA REITSCH) නමැති ජර්මන් කාන්තාව මින් එක් අයෙකි. අනෙක් තැනැත්තා සෙන්පති රිටර් ග්‍රෙයිම් (RITTER GREIM) ය. ග්‍රෙයිම් එහි කැඳවන ලද්දේ මියුනිච් නුවර සිටය. ග්‍රෙයිම් ගමන් ගත් අහස් නැවට රුසියන් කාල තුවක්කුවකින් එල්ල වූ පහරින් ඔහුගේ කකුලක් බරපතළ ලෙස තුවාල වී තිබුණි.

බිම්ගෙය තුළ වූ ශල්‍යාගාරයේ දී ග්‍රෙයිම්ට පිළියම් කෙරෙද්දී හිට්ලර් එහි ඇතුළු විය.

හිට්ලර් :- 'ඔබ කැඳවූයේ කුමකට දැයි දන්නවද?'

ග්‍රෙයිම් :- 'නැහැ, නායක තුමනි.'

හිට්ලර් :- 'හර්මන් ගෝරිං මා සහ මව් බිම පාවා දීලා තියෙනවා. ඔහු මට හොරෙන් සතුරා සමඟ සම්බන්ධකම් ඇති කරගෙන තිබෙනවා. ඔහු කළේ බියගුළු වැඩක්. ඔහු මගේ අණ නොතකා පණ බේරා ගැනීමට බර්චෙට්ස්ගාඩනයට ගිහින්. එහෙ ඉඳන් මට අපහාසාත්මක විදුලි පුවතක් එවල තියෙනවා. ඒක අන්තිම නිවේදනයක්. දැන් මොකුත් ඉතුරු නෑ. මට වෙන්න ඕනෑ හරිය ඔක්කොම වෙලා ඉවරයි. මුන් මට හිතවත් නෑ. නම්බුකාර විධියට ක්‍රියා කරන්නේ නෑ. මගේ බලාපොරොත්තු සේරම සුන්. හැම පාවාදීමකටම මං ගොදුරු වෙලා ඉවරයි. දැන් සේරම හමාරයි. හැම වරදක්ම මට සිද්දවෙලා ඉවරයි. මම ගෝරිංව ඒ ක්ෂණයෙන් අත්අඩංගුවට ගත්තා. ඔහුව හැම තිලයකින්ම පහ කළා. මා ඔබට එන්න කීවේ ඔන්න ඔය නිසයි.'

ගෝරිං ගෙන් හිස් වූ අහස් හමුදාපති ධුරයට ග්‍රෙයිම් එවේලේම පත් කරල ලදී. මෙය රේඩියෝ පණිවුඩයකින් වුවද කළ හැකිව තිබුණි. එසේ කළා නම් අලුත් ගුවන් හමුදාපතිගේ කකුල ආරක්ෂා වන්නට තිබුණා නොවැ!

ග්‍රෙයිම් සහ හැනා රෙයිෂ් බිම්ගෙය තුළට පැමිණියේ අප්‍රේල් 26 වෙනි දාය. එදා රැ අගමැති කාර්යාලය මත රුසියන් ෂෙල් වෙඩි පතිත විය. ඉන් නැගුණු මහ හඬ නිසා බිම්ගෙය තුළ ජීවිතය වඩාත් නොසන්සුන් විය.

රුසියානු ෂෙල් වෙඩි වලින් මහ පොළව දෙදරද්දී හා අගමැති කාර්යාලයේ බිත්ති පුපුරා වැටෙද්දී හිට්ලර් හැනා කැඳවාගෙන පැත්තකට ගියේය.

Scanned with CamScanner

# 9

## රතු මුහුද ගොඩ ගලයි

ජර්මන් යුද යන්ත්‍රයේ කෑලි හැලෙන්නට පටන් ගත්තේ 1945 වසන්ත සමයේ පටන්ය. පෙබරවාරි මාසය වනවිට ගල් අඟුරු බහුල රූර් මිටියාවතෙන් වැඩි කොටස සුන්බුන් ගොඩක් වී හමාරය. අනෙක් අතට සයිලේසියා ප්‍රාන්තය ද ජර්මනියට අහිමි වී තිබුණි.

මේ හේතුවෙන් ගල් අඟුරු නිෂ්පාදනය කලින් වසරේ ප්‍රමාණයෙන් පහෙන් පංගුවකට පහත බැස්සේය. ඉංග්‍රීසි - ඇමරිකන් බෝම්බ ප්‍රහාර වලින් ප්‍රවාහන මාර්ග විනාශ වී තිබුණු හෙයින් නිපදවන ගල් අඟුරු ටික පවා කම්හල් කරා ගෙන යාම ලොකු ගැටළුවක් විය.

එකල හිට්ලර්ගේ සාකච්ඡාවලදී නිතර මතු වූ ප්‍රශ්නය නම් ජර්මනිය මුහුණ පෑ මේ උග්‍ර ගල් අඟුරු හිඟයයි.

අඟුරු හිඟය නිසා තමන් යටතේ ඇති නැව් වලින් විශාල කොටසක් අක්‍රියව පවත්නා බැව් නෞකා හමුදාපති ඩොයෙනිට්ස් මැසිවිලි කියන්නට විය. යුද අවි නිපදවන කම්හල් හා විදුලි බලාගාර (ගල් අඟුරු ප්‍රශ්නය නිසාම) අඩපණ වී ඇති බැව් ස්පියර් පෙන්වා දුන්නේය.

කලින් ජර්මනිය විසින් අල්ලා ගන්නා ලද රුමේනියාව සහ හන්ගේරියාව දැන් නැවත සෝවියට් හමුදාවන් අතට පත් වී ඇති නිසා ඒ දෙරටින් ජර්මනිය ලබාගත් තෙල් තව දුරටත් නොලැබෙන හෙයින්ද, සතුරු බෝම්බ ප්‍රහාරවලින් ජර්මනිය තුළ පිහිටි කෘත්‍රිම

Scanned with CamScanner

තෙල් කම්හල් විනාශ වී තිබුණු හෙයින්ද, දරුණු පෙට්‍රල් හිඟයක් ඇති විය. පෙට්‍රල් නොමැතිකමින් ජර්මන් ප්‍රහාරක අහස්යානා බිම නවතා තැබීමට සිදු වූ අතර ඒවා මිත්‍ර පාක්ෂික ගුවන් ප්‍රහාර වලින් සුනු විසුනු වී ගියේය. පෙට්‍රල් නැතිකම නිසා බොහෝ යුද රථ සේනාංක යුද ටැංකි සේනාංකද එකතැන රැඳී තිබුණි.

තමන් "ප්‍රතිහාර්යජනක යුද අවි" වර්ග නිපදවා ගෙන යන බැවින් බියවීමට හේතුවක් නැතැයි නාසි රජය ගෙනගිය ප්‍රචාරයෙන් ජර්මන් ජනතාව සහ සොල්දාදුවන් මුලා වී සිටි මුත් එබඳු යුද අවි එළියට ආවේ නැත.

මේ යුද්ධයේ මුල් වකවානුවේදී ප්‍රාතිහාර්යජනක ආයුධ දෙවර්ගයකින් බ්‍රිතාන්‍යයට පහර දුන් බව සැබෑය. ඒ V-1 නමැති පියාඹන බෝම්බයත්, V-2 රොකට්වුවත්ය. V-1 වූ කලී බෝම්බ රැගෙන ස්වයංක්‍රියව ගමන් කළ නියමුවකු රහිත ගුවන් යානා විශේෂයකි. එහෙත් අයිසින් හවර්ගේ හමුදාවන්, ප්‍රංශයේ හා ජර්මනියේ වෙරළබඩ ප්‍රදේශ අල්ලා ගත් පසු ඒ අරුම පුදුම ආයුධවලින් ද ඵලක් වූයේ නැත. මේ ආයුධ ගුවනට නිකුත් කරන මධ්‍යස්ථාන වලින් වැඩි කොටස පිහිටුවා තිබුණේ ඒ ප්‍රදේශවල හෙයිනි.

මිත්‍ර පාක්ෂික ප්‍රහාරක යානා ජර්මන් අහසින් පළවා හරිනු සඳහා ජර්මනියේ නව නිපැයුමක් වූ ජෙට් අහස් යානා සමත් වේ යැයි හිට්ලර් සහ ගෝරිං තරයේ විශ්වාස කළ මුත් ඉන්ද එතරම් ඵලක් වූයේ නැත. මේ වනවිට ජර්මනිය ජෙට් අහස් යානා දහසකට අධික සංඛ්‍යාවක් නිපදවා තිබුණි. එහෙත් මේ යානා සඳහා අවශ්‍ය විශේෂ තෙල් වර්ගය නිපද වූ කම්හල් මිත්‍ර පාක්ෂික බෝම්බ ප්‍රහාරවලට ලක් වී තිබුණු හෙයින් ඉන් වැඩි කොටස ගුවන් ගත වූයේ නැත.

ජර්මනිය පරමාණු බෝම්බය නිපදවාගෙන යන බවට බ්‍රිතාන්‍යට හා ඇමරිකාවට ඔත්තු ලැබුණු මුත් එක අතකින් හිට්ලර් ඒ ගැන උනන්දුවක් දැක්වූයේ නැත. අනෙක් අතින් හිම්ලර් පරමාණු විද්‍යාඥයන්ගේ වැඩ පිළිවෙලට බාධා කළේය. මේ යුද්ධයේදී ජර්මනිය පරමාණු බෝම්බය පාවිච්චි කිරීමට අපොහොසත් වන බැව් ඇමරිකානු හා බ්‍රිතාන්‍ය ආණ්ඩු වලට 1944 අවසාන භාගයේදී ස්ථිර වශයෙන්ම දැනගන්නට ලැබුණි.

Scanned with CamScanner

ජර්මනිය සීග්‍රයෙන් සතුරු හමුදා අතට පත්වෙමින් තිබෙන බැව් වටහා ගත් හිට්ලර් එරට පිහිටි සියලුම කර්මාන්තශාලා, විදුලි බලාගාර, ජලනල මාර්ග, ගෑස් කර්මාන්තශාලා, ආහාර ගබඩාවල්, ඇඳුම් ගබඩාවල්, පාලම්, බෝක්කු, දුම්රිය මාර්ග, පණිවුඩ හුවමාරු මධ්‍යස්ථාන, නෞකාවන්, දුම්රිය එන්ජින් සහ බඩු ගෙන යන දුම්රිය පෙට්ටි සහමුලින් විනාශ කර දැමිය යුතු බවට නියෝගයක් කළේය. මේවා සතුරා අතට පත්වීමට වඩා විනාශ වී යාම යෙහෙකැයි ආඥාදායකයා කල්පනා කළේය.

එහෙත් මේ පියවර ගනු ලැබී නම් සමස්ත ජර්මනිය කාන්තාරයක් බවට පත් වී යුද්ධයෙන් නොනැසී ශේෂව හුන් ජර්මානු ජනතාවට සිදුවන්නට තිබුණේ මූලික අවශ්‍යතාවනට අහිමිව සාගින්නේ මිය යෑමටය.

හිට්ලර් ඒ බව හොඳාකාරවම දැන සිටියේය. එහෙත් ජර්මන් ජනතාව කෙරෙහි ඔහු තුළ වූ අනල්ප ආදරය මේ වනවිට කෙතරම් දුරට සිඳී ගොස් තිබුණේද කිවහොත් ජාතියක් වශයෙන් ජර්මානුන් වඳ වී ගියත් ඔහුට කම් නොවීය. යුද්ධය දිනා ගැනීමට අපොහොසත් වීමෙන් ජර්මානුන් දුබල ගෝත්‍රයක් බව ඔප්පු කර ඇතැයිද, අනාගතය හිමි විය යුත්තේ වඩා ප්‍රබල ගෝත්‍රය වී සිටින රුසියානුවන්ට යැයි ද හිට්ලර්ගේ නිගමනය විය.

යුද පරාජය ඉවසා ගත නොහී ජර්මන් ආර්ථිකයේ ඉතිරි ටික පවා වනසා දැමීමට හිට්ලර් ගත් තීරණය ක්‍රියාත්මක වීම වලක්වන ලද්දේ ස්පියර් සහ හමුදා නිලධාරීන් පිරිසක් විසිනි. ස්වකීය ජීවිතයේ පළමු වරට නායකතුමාගේ නියෝග ප්‍රතික්ෂේප කළ ඔවුහු රට පුරා දුවමින් කර්මාන්තශාලා, බඩු ගබඩා, ප්‍රවාහන මාර්ග ආදිය විනාශ නොකරන ලෙස මහජනයාට හා නිලධරයන්ට උපදෙස් දුන්හ.

1945 අප්‍රේල් මස 12 දා ඇමරිකානු ජනාධිපති රූස්වල්ට් අභාවප්‍රාප්ත විය. ඔහුගේ අභාවයෙන් පසු ඇමරිකාවේ යුද පිළිවෙත වෙනස් වෙතැයි නාසි රජය කල්පනා කළ මුත් එබන්දක් සිදුවූයේ නැත.

XXXXXX

රුසියාවට කඩා වැදුණු නාසි හමුදාවන් ලුහු බැඳගෙන ආ සෝවියට් රතු හමුදාව, 1945 අප්‍රේල් 16 දා වනවිට ජර්මනියේ ඕඩර් (ODER) නදීබඩට ළඟා වී සිටියහ.

හිට්ලර් කොටු වී සිටි ජර්මන් අගනුවර වන බර්ලිනය සමතලා කිරීමේ සටන් ඇරඹීමට රුසියානුන් ලක ලැහැස්ති වූයේ මේ නදී තීරයේ හිඳගෙනය.

රුසියානුවන්ගෙන් බර්ලිනය රැක ගැනීමේ සටන මෙහෙයවීම බාරව තිබුණේ කර්නල් ජනරාල් හෙයින්රිකි (HEINRICI) ටය. ස්වකීය ජර්මන් සේනාවන්ට මුහුණ පෑමට ඇත්තේ ඉතා භාරදූර කාර්යයකට බව හෙයින්රිකී නොදැන සිටියේ නොවේ.

"අද රෑ දැනට ඉන්න තැනින් පසුබැස දෙවෙනි ප්‍රතිහාරක පෙරමුණක් සැදියල්ලා"යි හේ සිය සේනාවන්ට අණ කළේය. මෙසේ අණ කරන ලද්දේ 1945 අප්‍රේල් 15 දාය. හරියටම පසුවදා (16) පාන්දර හතරට රුසියන් ප්‍රහාරය ඇරඹුණි. දැන් මේ කෙරෙන්නේ නාසි ජර්මනියට විරුද්ධව කෙරෙන අන්තිම සටනය.

ඕඩර් ගඟ අද්දර වූ රුසියන් සර්ච් ලයිට්වල ප්‍රබල ආලෝක ධාරාවන් බර්ලින් නගරය දෙසට එල්ල වී තිබුණි. විවිධ වර්ගයේ කාල තුවක්කු හා වෙනත් තුවක්කු විසි දහසක්ද, යුද්ධ ටැන්කි සිය දහස් ගණනාවන්ද, රුසියන් පෙරමුණේ පෙළ ගසා තිබුණි. සෝවියට් දේශයේ නානා ජාතීන්ට අයත් නානා නිල ඇඳුම් ඇඳගත් භටයෝ ලක්ෂ ගණනාවක් අන්තිම සටන සඳහා එහි රැස් කකා උන්හ.

රුසියන් කාලතුවක්කු බළකාය බාරව සිටියේ බොහෝ සටන්වල යෙදී පළපුරුදු නිකොලායි ස්විස්චෙව්ය. ඔහු කල් තබාම සිය සෙබළුනට අනතුරු ඇඟවීමක් කළේය. තුවක්කු පත්තුවීමට පටන් ගත් විගස හැකි තරම් මහ හඬින් කෑ නොගැසුවොත් කන් අඩි පිපිරී යන බව ඒ අනතුරු ඇඟවීමයි.

රුසියන් හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරියා වූ මාර්ෂල් ජෝර්ජි සුකොව් එදා 16 දා රාත්‍රියේ ස්වකීය තාවකාලික කාර්යාලය තුළ ඔබ මොබ සක්මන් කරමින් සිටියේය.

කල්පනාවේ නිමග්නව සිටි මේ මහා රණදෙටුවා දෙවෙනි ප්‍රධාන නිලධාරියා වූ කර්නල් ජනරාල් වැසිලි චූයිකොව් (VASILI CHULKOV) ඇමතීය. චූයිකොව් වූ කලී ස්ටාලින්ග්‍රාඩ් සටන අතිශය

දක්ෂ අන්දමින් මෙහෙයවා එම නගරය ජර්මන් හමුදා අතින් මුදාගත් පුද්ගලයාය.

'සහෝදරයා ඔබේ සියලුම සේනාංක දැන් සූදානමින් සිටිනවාද'යි සුකොව් චූයිකොව්ගෙන් විමසීය.

'ඔව් සහෝදරයා, ඔබ නියෝග කළ සියලු දේ දැන් කරල හමාරයි' යනු චූයිකොව්ගේ පිළිතුර විය.

ගත වූයේ තව මිනිත්තු කීපයකි. ස්වකීය දුරදක්නය ඇසට යොදා බර්ලිනය දෙස ටිකක් නෙත් යොමාගෙන හුන් සුකොව් එක වරම විධානයක් නිකුත් කළේය.

'දැන් හරි සහෝදරයිනි! දැන් පටන් ගන්න!'

ඒ අවස්ථාවේ දැල්වෙන්නට පටන් ගත් සර්ච් ලයිට්වලින් වාහනවල පහන්වලින් හා යුද ටැන්කිවල පහන්වලින් නැඟුණු අප්‍රමාණ ආලෝකය සූර්යයන් දහසක් පෑයූ සේ විය.

රතු එළි තුනක් අහසට නැංගේය. ඒ සංඥාවකි. ඒ ක්ෂණයෙන් ජර්මන් මහ නගරය සමතලා කරන රතු හමුදාවේ දැවැන්ත සටනට මුල පිරුණි. සත්'රත විහිදුණු ආලෝක ධාරාවන්ගෙන් වට පිටාව මහ දවල් මෙන් ඒකාලෝක විය. දස දහස් ගණනින් පත්තු වූ තුවක්කු හඬින් මහපොළොව දෙදරන්නට විය.

පස්ද, ගස්ද, ගෙවල්ද, මුළුමණින් ඉදිරී අහසට විසි වුණි. සැම තැනක්ම ගිනිගෙන දැවෙන්නට විය.

මුලින් එල්ල කරන ලද ෂෙල් වෙඩි ප්‍රහාරයෙන් පසු රතු හමුදාව මූද ගොඩ ගැලූ කලෙක සේ ඉදිරියට ඇදෙන්නට විය. ලෙනින්ග්‍රාඩය, ස්මොලෙන්ස්කිය, ස්ටාලින්ග්‍රාඩය සහ මොස්කව් වැනි ප්‍රධාන සෝවියට් නගර ජර්මන් ආක්‍රමණයෙන් මුදා ගනු සඳහා සටන් වැදුණු වීර සෝවියට් භටයෝ එහි වූහ. ස්වකීය ගම් නියම්ගම් ජර්මානු හමුදා විසින් ගිනිබත් කෙරෙනු දුටු, ස්වකීය බිරිඳන් සහ දූන් ඔවුන් විසින් දූෂණය කෙරෙනු දුටු රුසියානුවෝ එහි වූහ. ජර්මනියේ සිරකර තබන ලද දහස් ගණන් සෝවියට් යුද සිර කරුවෝද මේ පිරිසට එක් වූහ. සෝවියට් හමුදා විසින් මුදා ගන්නා ලද මොවුහු ඉතා අබල දුබල තත්ත්වයක සිටියේ වී මුත් ජර්මානුන්ගෙන් අවසාන පලිය ගනු සඳහා අතට අසු වූ මොකක් හෝ ආයුධයක් අමෝරාගෙන ප්‍රධාන රුසියන් හමුදාවට එක් වූහ.

Scanned with CamScanner

මේ වන විට සෝවියට් රතු හමුදාව සිටියේ බර්ලිනයට සැතපුම් 32 ක් තරම් කිට්ටුවෙනි. එය අතිශයින් පුදුමාකාර හමුදාවක් විය. එහි නා නා විධ සෝවියට් ජාතීන් වන යුක්රේනියානුවෝ සහ කැරෙලියානුවෝ වූහ. ජෝර්ජියානුවෝ සහ කසාකයෝ වූහ. ආර්මීනියානුවෝ අසර්බයිජානුවෝ බාස්කිරයෝ, ටාටාරයෝ හා මොන්ගෝලියානුවෝ වූහ.

නානාප්‍රකාර ජාතීන්ගෙන් සැදුම් ලත් සෝවියට් දේශයෙන් පැමිණි මේ විවිධ විචිත්‍ර හමුදාවට අයත් වූ සමහරුන් ඇඳගෙන සිටියේ තද දුඹුරු පැහැති නිල ඇඳුම්ය. තව සමහරුන් ඇඳ සිටියේ කොළ පැහැති නිල ඇඳුම්ය. ඔවුන්ගේ හිස් වැසුම් ද විවිධාකාර විය. ඔවුන්ගෙන් සමහරකු අවුත් සිටියේ වාහන වලිනි. තව සමහරුන් අසුන් පිටය. තවත් සමහරුන් ආයේ පා ගමනින්ය. මේ මුළු රතු හමුදාව දැන් සූදානම් වන්නේ කොටියකු ගොදුරක් මත කඩා පනින්නා සේ නාසි ජර්මනියේ මූලස්ථානය වූ බර්ලින් නගරය මත කඩා පනින්නටය.

සුකොව්ගේ හා කොනියෙව්ගේ නායකත්වයෙන් මෙහෙයැවුණු යෝධ රතු හමුදා යුගල ආත්මාරක්ෂාව සඳහා පිස්සු බල්ලන් මෙන් සටන් කළ ජර්මන් සේනාවන්ගේ ප්‍රතිප්‍රහාර මැඩලමින් බර්ලිනයට කඩා වැදුනහ.

යුද ටැංකිවලට වාහන වලට සහ කාලතුවක්කු වලට මුවා වී බර්ලිනයේ මහා මාර්ග හා අතුරු මාර්ග ඔස්සේ රතු හටයෝ ඉදිරියට ඇදුනහ.

බර්ලිනය පොඩි පට්ටම් කරමින් පෙරට ගමන් ගත් රතු හමුදාවේ මුලින්ම සිටියේ සුකොව්ගේ සහ කොනියෙව්ගේ මුර හටයන්ය. ඊළඟට ගමන් කළේ දැවැන්ත යුද ටැංකි බළකායන් හතරකට අයත් හම් හිස් වැසුම් පැළඳගත් සෙබළ පිරිස්ය. ඉන්පසු රැල්ලෙන් රැල්ල ගලා ආයේ පාබළ සේනාවන්ය. එය ඉතා දැකුම්කළු දර්ශනයක් විය. සෝවියට් දේශයේ විවිධ ප්‍රාන්තවලට, විවිධ ජාති වලට, විවිධ ආගම්වලට, විවිධ ගෝත්‍රවලට විවිධ වර්ණ වලට අයත් ඒ මහා සේනාවට අණ දීම පවා රුසියන් සේනාපතියනට බලගතු ප්‍රශ්නයක් විය. ඒ මන්දයත් ඔවුන් සියලු දෙනාම රුසියන් බස කතා කළේ නැත. ඔවුන් විවිධ භාෂාවන් හා අතුරු භාෂාවන් කථා කළ පිරිසකි.

Scanned with CamScanner

රුසියන් හමුදාව උමතුවෙන් මෙන් සටන් කරමින් පෙරට ඇදෙද්දී ඔවුන්ගේ ෂෙල් වෙඩිවලින් බර්ලින් නගරය ගිනි ගෙන දැවෙන්නට විය.

සෙන්පති බුසේ (BUSSE) ගේ නමවෙනි සේනාංකය පස්සට ගැනීමට සෙන්පති හෙයින්රිකි හිට්ලර්ගෙන් අවසර පැතීය. එහෙත් ඔහු ඊට තරයේ විරුද්ධ විය. ඒ හේතුවෙන් නමවෙනි හමුදාව රුසියන් හමුදාවලට කොටුවී විනාශ වන්නට පටන් ගත්හ. බුසේගේ සේනාංකයද අයත් වූයේ ප්‍රධාන ජර්මන් හමුදාව වූ 'විස්තුලා' හමුදාවටය. සේනාංක කිහිපයකින් සමන්විත වූ විස්තුලා හමුදාවෙන් දැන් ඉතිරිව ඇත්තේ සෙන්පති හැසෝ මැන්ටුෆල් (HASSO MANTEUFEL) ගේ තුන් වැනි යුද ටැන්කි බළකාය පමණි. ඒ බළකාය ද වැඩි වේලා නොගොස් රුසියන් සේනාවනට කොටුවන බව හෙයින්රිකිට අවබෝධ විය.

අප්‍රේල් 25 දා හෙයින්රිකිගේ මූලස්ථානයේ ටෙලිෆෝනයෙන් හදිසි පණිවුඩයක් ලැබුණි. ඒ කතා කළේ සෙන්පති මැන්ටුපල්ය.

'මගේ සේනාවට පසු බැසීමට අවසර ඕනෑ. තව මොහොතක් අල්ලන් ඉන්න බෑ'යි හේ කෑ ගැසීය.

හෙයින්රිකි මොහොතක් කල්පනා කළේය. හිට්ලර් ගේ අවසරය නොමැතිව කිසිම සේනාංකයකට පසු බැසිය නොහැකි බව ඔහුට මතක් විය. එහෙත් ඒ අවස්ථාවේ ඔහු හදිසි තීරණයක් ගත්තේය.

'පසු බහින්න. මම කියාපු එක ඇහුවද? පසු බහින්න' යි හෙයින්රිකි මැන්ටුෆල්ට අණ කළේය.

# 10

## මාරයාට කලින් අනංගයා ළඟා වේ

එදා 1945 අප්‍රේල් 26 දා රාත්‍රී හැනා රෙයිෂ් සිය කුටියට කැඳ වූ හිට්ලර් දුන් අවසානය ළඟා වී ඇති බව තමාට හැඟේයයි ද රුසියානුවන් බර්ලිනය යටපත් කර ගතහොත් තමා සහ ඊවා බ්‍රෝන් (හිට්ලර්ගේ පෙම්වතිය) සිය දිවි නසා ගැනීමට සියලු විධි විධාන යොදා ගෙන තිබෙන බැව්ද හැනාට සැළ කළේය.

ඒ එක්කම ඔහු හැනා අතට වස කුප්පි දෙකක් දී ඉන් එකක් ඇය සඳහා බවත්, අනෙක ග්‍රෙයිම් සඳහා බවත් දැනුම් දුන්නේය. එය ඉතා අනුවේදනීය අවස්ථාවක් විය. හැනා සහ ග්‍රෙයිම් අතර දැඩි කුළුපගකමක් තිබුණි.

එදා රෑ අගමැති කාර්යාලය උඩටම රුසියානු ෂෙල් වෙඩි පතිත වුණි. යෝධ අගමැති කාර්යාල ගොඩනැඟිල්ල කොටසින් කොටස බිමට කඩා වැටෙද්දී ඊට අඩි පණහක් යටින් පිහිටි හිට්ලර්ගේ බිම්ගෙයි නිවැසියෝ ව්‍යාජ නිර්භීත භාවයක් මුහුණුවලින් පළ කරමින් අවදිව උන්හ.

හැනා රෙයිෂ් එදා රාත්‍රියෙන් වැඩි කොටස ගත කළේ තුවාල ලත් සෙන්පති ග්‍රෙයිම්ගේ ඇඳ ළඟය. ඒ දෙදෙනා කතා කළේ එකට දිවි නසා ගන්නා ආකාරය ගැනය.

හිට්ලර් දුන් වස කුප්පි විකා ගිල දමා ඒ මදිවාට දෝ අත් බෝම්බ දෙකක් ඇඟට තබා පුපුරවා ගැනීමට ඔවුහු තීන්දු කර ගත්හ. එසේ කරනුයේ හඳුනා ගැනීමට බැරි වන සේ සිරුරු දෙක සුනු විසුනු වනු සඳහාය.

බිම්ගෙය තුළ විසූවන් මේ වන විට වියරුව සිටියත් එක් පුද්ගලයෙක් පමණක් හොඳ සිහියෙන් සිටියේය. ඒ හිට්ලර්ගේ සම්බන්ධතා නිලධාරියා වූ ෆෙගෙලෙයින් (FEGELEIN) ය. හේ ඉතා පහත් තත්ත්වයක සිට ඉහළ පෙත්තට නැගී මිනිසෙකි. ෆෙගෙලෙයින් ඊවා බ්‍රෝන්ගේ මස්සිනාය. හිට්ලර්ගේ තද විශ්වාස වන්තයකු වූ ෆෙගෙලෙයින් ඔහු අතහැර දමා හිට්ලර්ගේ දැඩි අනුගාමිකයකු බව පෙන්වීමට පටන් ගත්තේ මේ නොබෝ දා සිටය. ඇත්ත වශයෙන් ඔහු හිට්ලර්ට විරුද්ධව හිට්ලර් සමඟ ගතු කියන්නට ද විය. එහෙත් හිට්ලර්ට වශී වූ බිම්ගෙයි සෙසු නිවැසියන් ඔහු වටකර ගෙන සිටිය දී ෆෙගෙලෙයින් කාටවත් නොපෙනී හෙමින් සීරුවේ බිම් ගෙයින් ලිස්සා ගියේය.

මේ ශූර පුද්ගලයා බිම් ගෙයින් අතුරුදහන් වූ විගස කා තුළත් ඔහු ගැන ලොකු සැකයක් පහළ විය. තවමත් ඔහු බර්ලිනයේ කොහි හෝ සිටිතැයි නිගමනය කළ හැකි වූයෙන් වහාම ඔහු සොයා අල්ලාගෙන එන්නැයි භට පිරිසක් පිටත් කරන ලදහ. ඒ පිරිසේ නායකයා වූයේ ජර්මනියේ හුත් දක්ෂතම පරීක්ෂකයෙක් වූ හොයෙග්ල්ය.

චාල්ටන්බර්ග් පෙදෙසෙහි පිහිටි සිය නිවසෙහි ඇඳක් මත සාමාන්‍ය ඇඳුමින් සැරසී වැතිර සිටි ෆෙගෙලෙයින් හොයෙග්ල්ට හසු විය. ඒ ක්ෂණයෙන් ඔහු මුරකාවල් මධ්‍යයේ හිට්ලර් අබිමුවට ඇදගෙන එන ලදී.

''අනේ අසරණ ඇඩොල්ෆ්! එයාව අතහැරලා හැම එකෙක්ම පැනලා ගිහිල්ලා! හැම එකෙක්ම එයාව පාවා දීලා! අනේ එයාව ජර්මනියට නැති වෙනවාට වඩා වෙන අය දහ දහක් නැති වෙන එක හොඳයි.'' යනුවෙන් මස්සිනා දුටු ඊවා බ්‍රෝන්ට ඉබේම කියැවුණි.

එදා රාත්‍රියේ - එනම් 27 දා රාත්‍රියේ අන් කවර අවස්ථාවකටත් වඩා වැඩියෙන් රුසියන් ෂෙල් වෙඩි අගමැති මන්දිරය මත වැටෙන්නට විය. මේ ෂෙල් වෙඩි ප්‍රහාරය කොතරම් නිවැරදි ලෙස එම ගොඩනැගිල්ලට එල්ල වීද කිවහොත් රුසියන් හමුදා ඉතා කිට්ටුවට පැමිණ ඇති බවත්, ඔවුන් කොයි මොහොතේ හෝ බිම්ගෙය තුළට කඩා වදින්නට බැරි නැති බවත් එහි පදිංචිකරුවෝ නිගමනය කළහ. එතැන් පටන් කවුරුත් කල්පනා කළේ තම ජීවිත අවසන් කර ගත යුත්තේ කෙසේද යන්න ගැනය.

හිට්ලර් එහි වූ සියල්ලන් තමන් වෙත කැඳවා සාකච්ඡා කරන්නට පටන් ගත්තේය. රුසියානුන් ඇස ගැසුණු විගස ජීවිතක්ෂයට පත්විය යුතු යයි කවුරුත් තීරණය කළහ. අනතුරුව එක් එක් පුද්ගලයා කෙටි කතාවක් කළේය. ඒ හැම කතාවකින් පැවසුණේ ඔවුන් තුළ නායකතුමා (හිට්ලර්) සහ ජර්මනිය කෙරෙහි වූ අචල භක්තිය සහ අමිල ආදරයයි.

මේ අවසාන මොහොතේ වුවද වෙන්ක් සෙන්පතියාගේ සේනාංකය බර්ලිනය හා තමන් මුදා හැරීමට ආ හැකි යයි හිට්ලර් තරයේ විශ්වාස කළේය. වෙන්ක්ගේ හමුදාව එනතුරු බර්ලිනයේ ජර්මස්ථාන රැකගෙන හුන්නේ හිට්ලර් තරුණ බලකායට අයත් ළාබාල තරුණ භටයන් හා වයස දහතරේ පහළොවේ කොල්ලන්ය.

එහෙත් මේ වනවිට වෙන්ක්ගේ සේනාංක රුසියානුන් අතින් හොඳටම බැට කා තිබුණි. ඒ බලකාය හිට්ලර් ගලවා ගැනීමට එනු තබා තමන්ගේ ගැලවීම සලසා ගැනීමටත් අපොහොසත් තත්ත්වයක සිටියේ.

අප්‍රේල් 28 දා වනවිට රුසියානුන් බර්ලිනයේ මැද භාගයට පිවිස තිබුණි. දැඩි ජර්මන් ප්‍රතිප්‍රහාර මධ්‍යයේ සටන් කරමින් ඉතා සෙමින් අඩියෙන් අඩිය පියවරින් පියවර ඉදිරියට යාමට ඔවුන්ට සිදුවුණි. හිට්ලර් ඔතරම් බලාපොරොත්තු රැඳූ වෙන්ක්ගේ සේනාව තවම දක්නටවත් නැත.

"බර්ලිනය මුදා ගනී යයි මා බලාපොරොත්තු වෙනවා. හෙයින්රිකිගේ හමුදාව මොකද කරන්නේ? වෙන්ක් කොහිද? නම වෙනි හමුදාවයි, වෙන්ක්ගේ හමුදාවයි සම්බන්ධ වෙන්නේ කොයි වෙලාවේද?'' ආදී වශයෙන් මහ සෙන්පති කෙයිටල් වෙත හිට්ලර්ගෙන් විදුලි පුවත් ගලා එන්නට විය.

මේ එකකටවත් නිසි පිළිතුරු නොලැබෙන විට හිට්ලර් සහ බිම්ගෙයි සිටි සෙස්සන් කල්පනා කළේ තවදුරටත් කෙළවරක් නැතිව පාවාදීම් හා ද්‍රෝහිකම් සිදු වෙමින් තිබෙන බවය.

එදා රෑ අටට බෝර්මන් විසින් ඩොයෙනිට්ස් වෙත යවන ලද විදුලි පුවතකින් එදා බිම්ගෙය තුළ පැවති මානසික තත්ත්වය කෙසේදැයි මනාව පැහැදිලි වේ.

"විධාන කිරීමෙන් හා ආයාචනා කිරීමෙන් හමුදාවන් අප ගලවා ගනු සඳහා ඉදිරියට මෙහෙයවනු වෙනුවට බලධරයෝ

නිසොල්මන්ව සිටිති. විශ්වාසදායකත්වය වෙනුවට දක්නට ලැබෙන්නේ ද්‍රෝහිකම්ය. අපි මෙහි රැඳී සිටිමු. අගමැති මන්දිරය සුන්බුන් ගොඩකි.'' යනුවෙන් බෝර්මන්ගේ විදුලි පුවතේ සඳහන් විය.

මීට පැයකට පසු ඇදහිය නොහැකි තරමේ ආරංචියක් බිම්ගෙය කරා ළඟා විය. ඒ ආරංචිය ගෙනෙන ලද්දේ වැදගත් විදෙස් පුවත් ජර්මන් බසට පරිවර්තනය කිරීම භාරව හුන් ප්‍රචාරක අමාත්‍යාංශයේ නිලධරයෙකු විසිනි.

ඒ ආරංචියෙන් පැවසුණේ කුමක්ද?

හිට්ලර්ගේ ඉතාම කුළුපග සගයා හා අමාත්‍යවරයා වූ ද ''විශ්වාසදායක හෙයින්රිච්'' යනුවෙන් හිට්ලර් විසින් අමතනු ලැබුවා වූද, හෙයින්රිච් හිම්ලර් ස්විඩන් රතුකුරුස සේවයේ අධිපති බර්නඩට් ආදිපාදයා සමග සාම සාකච්ඡා පවත්වන බවය.

මෙම සාකච්ඡා රහසේ කෙරුණු නමුදු ඒ බව විදෙස් පුවත් වලට සැළ වී තිබුණි.

XXXXXX

නාසි රජයේ දෙවන ප්‍රධාන නායකයා වූ හර්මන් ගෝරිං කළ පාවාදීම මදිවට මෙන් හිට්ලර්ගේ ඉතාම විශ්වාසදායක සගයා වූ හිම්ලර් පවා ඔහුට ද්‍රෝහි වී ඇතැයි සැළ වූ මොහොතේ පටන් හිට්ලර් පෙරට වඩා වෙනස් මිනිසෙකු බවට පත් විය. මේ පාවාදීමත් සමඟ අවසන් මොහොත නියතයෙන්ම ළඟා වී ඇති බව ඔහු නිගමනය කළේය.

පයට පෑගුණු නයකු සේ කෝපයෙන් පිඹින්නට වූ හිට්ලර් සිය ''විශ්වාසදායක හෙයින්රිච්'' (හිම්ලර්) සියලු නිලතල වලින් පහ කරන නියෝගයක් නිකුත් කළේය.

ඊවාගේ මස්සිනා වූ පෙගෙලෙයින්ගේ ඉරණම එදා (28 දා) විසඳන ලදී. ළඟ එන අන්තරාය දැක හිට්ලර්ගේ සමාගමයෙන් පලාගිය පසු අල්ලාගෙන අවුත් බිම්ගෙය තුළ සිර කරන ලද පෙගෙලෙයින් (ඔහු හිම්ලර්ගේ සම්බන්ධතා නිලධරයාය) තමා වෙත ගෙනෙන්නැයි 28 දා රෑ හිට්ලර් නියෝග කළේය. බොහෝ සූක්ෂම ලෙස ඔහුගෙන් ප්‍රශ්න කරන ලදී. හිම්ලර් බර්නඩට් ආදිපාදයා සමග යුද සමාදානයක් ගැන රහස් සාකච්ඡා පැවැත් වූ තමා දැන සිටියේ යයි පෙගෙලෙයින් විසින් පිළිගන්නා ලදී.

මිත්‍ර පාක්ෂික රටවල නියෝජිතයකු සමග රහස් සාකච්ඡා පැවැත්වීමෙන් හිම්ලර් කළේ දුෂ්ඨතම, ද්‍රෝහිකමක් බවත් බිම්ගෙයින් පළා යාමෙන් පෙගෙලෙයින් කළේද බලගතු ද්‍රෝහිකමක් බවත් පවසමින් හිට්ලර් ගුගුළේය.

මොහොතකට පසු පෙගෙලෙයින් අගමැති කාර්යාලය පිහිටි බිමට ගෙන යන ලදී. එහිදී තබන ලද වෙඩි කිහිපයකින් පෙගෙලෙයින්ගේ ආත්මය පරලොවට පලා ගියේය. ඔහුගේ ජීවිතය බේරා ගැනීමට ඊවා නැනා උත්සාහ කෙළේ නැත.

ඊළඟට හිට්ලර් කළේ ලොකු යුතුකමක් ඉටු කිරීමයි. මෙතෙක් කල් තමන් සමඟ බිරිඳ ලෙසින් ජීවත් වූ ඊවා බ්‍රෞන්ගේ නමට කැළලක් නොවන පරිදි ඇය මේ අන්තිම මොහොතේදී හෝ නීත්‍යානුකූලව විවාහ කරගත යුතු යයි මේ මෘග ආඥාදායකයා තීරණය කළේය. මිනිස් සිත කෙතරම් විවිධදැයි විචිත්‍රදැයි මේ සිද්ධියෙන් පැහැදිලි වේ.

එය ඉතා අනුවේදනීය විවාහ මංගල්‍යයක් විය. අනංගයාගේ පසු ගමනට ආවේ මාරයාය!

හිට්ලර් - ඊවා සරණ බන්ධනය සඳහා කෙටි උත්සවයක් පැවැත්වුණි. විවාහ ලේකම් වශයෙන් රාජකාරි කිරීමට ගොබල්ස් විසින් වෝල්ටර් වැග්නර් නම් නගර සභා නිලධරයෙක් කැඳවන ලදී. ඔහු සැරසී සිටියේ නාසි නිල ඇඳුමකිනි.

විවාහය ලියාපදිංචි කිරීම සිදු වූයේ බිම්ගෙයි පෞද්ගලික අංශයේ පිහිටි "සිතියම් කාමරය" නම් වූ කුඩා කුටිය තුළය. මනාලයා වූ හිට්ලර් සහ මනාලිය වූ ඊවා බ්‍රෞන් හැරුණු විට තව එහි හුන්නේ තිදෙනෙකු පමණි. ඒ ගොබල්ස්, බෝර්මන් සහ වෝල්ටර් වැග්නර්ය. (WALTER WAGNER)ගොබල්ස් සහ බෝර්මන් සිටියේ සාක්ෂිකරුවන් ලෙස අත්සන් කිරීමටය.

දෙදෙනාම පිරිසිදු ආර්ය පෙළපතකින් පැවත එන බවත් පාරම්පරික රෝගයකින් නොපෙළෙන බවත් මනාලයා සහ මනාලිය දිවුරා කියා සිටියහ.

ඊ ළඟට විවාහ පාත්‍රවීමේ වාක්‍යය කියවන ලදී. අනතුරුව වැග්නර් විවාහය ලියාපදිංචි කළේය. බෝර්මන් සහ ගොබල්ස් සාක්ෂියට අත්සන් කළහ. තව පැය කිහිපයකින් නව යුවළගේ මරණ සහතිකයට මාරයා අත්සන් කරනු ඇත.

Scanned with CamScanner

මනාලිය නම අත්සන් කරන විට ''ඊවා බ්‍රෝන්'' යයි ලියාගෙන ආ මුත් ජර්මන් ''B'' අකුර පමණක් ලියූ විගස පැන නවතා මඳක් කල්පනා කළාය. ඊළඟට ''B'' අකුර කපා දැමූ ඇය ඊවා හිට්ලර් - උපතින් බ්‍රෝන් යයි අත්සන් කළාය. මාරයා පෙනි පෙනී වුවද ගැහැණු සිත රඟන රඟ බලව්!

විවාහය ලියාපදිංචි කිරීමේ නිල උත්සවය මෙතෙකින් සමාප්ත විය. යුවතිපති දෙදෙනා කුටියෙන් එළියට බටහ. එතැන වූයේ නව යුවලට සුබ පැතීමට පැමිණි සෙන්පතියන් හා ලේකම්වරියන් කිහිප දෙනෙකි. ඔවුහු අතට අත දී හිට්ලර් - ඊවා යුවලට ආසිරි පැතුහ.

ඊට ටික වේලාවකට පසු බෝර්මන් ගොබල්ස්, මැතිනිය සහ හිට්ලර්ගේ ලේකම්වරියන් දෙදෙනා වූ ක්‍රිස්ටියන් (CHRIS´N) මහත්මිය සහ ජුංගේ (JUNGE) මහත්මිය හිට්ලර්ගේ පෞද්ගලික කාමරයට කැඳවනු ලැබූහ.

ඔවුන්ගේ කතා බහට බඳුන් වූයේ අතීත සමය අතීත මිත්‍රයන්ය. ගොබල්ස්ගේ විවාහය ගැනත් හිට්ලර් එහිදී සාක්ෂිකරුවකු ලෙස අත්සන් කළ අයුරුත් සිහිපත් කරන ලදී. අනතුරුව හිට්ලර් කතා කළේ දිවි නසා ගැනීමට යොදා ඇති සැලැස්ම ගැනය.

ජාතික සමාජවාදයේ මළ බෙරය වැයී හමාර බවත් තමන්ගේ හොඳම සගයන් විසින් තමන්ට හතුරුකම් කර තිබියදී ජීවත්වීමෙන් ඵලක් නැති බවත් හිට්ලර් ප්‍රකාශ කළේය.

සාදයට සහභාගි වූ අය එතැන නතරව සිටියදී ක්‍රිස්ටියන් මහත්මිය කැඳවාගෙන වෙනත් කාමරයකට ගිය හිට්ලර් එහිදී සිය අන්තිම කැමති පත්‍රය සකස් කරන්නට විය. හිට්ලර් කියූ දෙය ක්‍රිස්ටියන් මහත්මිය විසින් ලියා ගන්නා ලදී.

අන්තිම කැමති පත්‍රය මෙසේ සකස් වෙමින් තිබියදී පවා මනාලිය හෙවත් හිට්ලර් මහත්මිය ඇය වටා හුන් මිතුරු මිතුරියන් සමග පිළිසඳරේ යෙදී සිටියාය. මරුවා පෙනි පෙනී වුවද හිට්ලර්ගේ නිත්‍යානුකූල බිරිඳ වීමට හැකිවීම ගැන - හිට්ලර් මැතිනිය වීමට හැකිවීම ගැන - මේ අහිංසක හා භක්තිමත් හදවතක් ඇති තරුණියගේ ළැම උද්දාමයෙන් හා ආඩම්බරයෙන් ස්පන්දනය වන්නට ඇත.

හිට්ලර් පොඩිත්තන්ට ඉතා ඇලුම් කළ කෙනෙකු වුවද ඔහුගේ

අත පතා සිය දහස් ගණන් විවිධ වයස්වල කාන්තාවන් ඉදිරිපත් වුවද ජර්මනියේ සිටි පියකරුම ලලනාව සිය බිරිඳ කරගැනීමට හැකි තරම් බලයක් ඔහුට තිබුණේ වුවද ඔහු ස්වකීය දේශයේ හා ජාතියේ අභිවෘද්ධිය වෙනුවෙන් විවාහ ජීවිතය හා දරු සුරතලය බිලිදුන් කෙනෙකි. රට ජාතිය වෙනුවෙන් මුළු වෙර යොදා මුළු කාලය යොදා සේවය කිරීමට දරු පවුලක බර බාධාවක් වෙතැයි හේ කල්පනා කළේය. හිට්ලර් කාමුකයෙක් නොවූවත් පංචස්කන්ධයකින් හා පංචේන්ද්‍රියකින් සැදුම් ලත් සෙසු සියලු ජීවමාන මනුෂ්‍යයන්ගේ කායික අවශ්‍යතාවයන්ගෙන් යුක්ත විය. ඒවා බ්රෝන් සමග ඔහු ඇසුරු කළේ ඒ සීමිත කායික අවශ්‍යතාවයන් සපුරා ගනු සඳහාය. විධාපත් අවස්ථාවලදී මානසික සුවයක් ලැබීමටද ඇගේ ඇසුර ඔහුට මහෝපකාරී විය.

යුද තත්ත්වය නරක අතට හැරීගෙන එනවිට හිට්ලර් ඒවා මියුනිච් නුවරට පිටත් කර හැරියේය. එහෙත් තත්ත්වය වඩ වඩා නරක අතට හැරෙමින් හිට්ලර්ගේ ජීවිතය අනතුරට පත්වීම නියත බව වැටුහුණු ඒවා ඔහුගේ අවවාදය ද නොතකා බර්ලිනයට අවුත් සිය පෙම්වතා සමග දුක සැප බෙදා ගනිමින් බිම්ගෙය තුළ වාසය කළාය. ඇය බර්ලිනයට පැමිණියේ අප්‍රේල් 15 දාය.

ඒවා තුළ සිය පෙම්වතා කෙරෙහි පැවති අචල භක්තිය හා අමන්ද ආදරය කොතරම්දැයි මේ පියවරින් පැහැදිලි වේ. නියම ආදරය නම් සැපේදී මෙන්ම දුකේදී ද එකාවන්ව සිටීම බව ඒවාගේ අදූෂිත හදවතට හා අපණ්ඩිත මොළයට වැටහුණි.

හිට්ලර්ගේ ඉතාම කුලුපග මිතුරන් හා ඉතාම භක්තිවන්ත සගයන් ඒ අන්තරාදායක අවස්ථාවේ ඔහු හැරපියා යද්දී ගසක එතුණු වැලක් සේ ඒවා හිට්ලර්ගෙන් ඈත් නොවී සිටියාය.

හිට්ලර්ගේ අවවාදය නොතකා එදා අප්‍රේල් 15 දා ඇය බර්ලිනයට ආවේ සිය පෙම්වතාට අත්වන කුමන ඉරණමක් හෝ බෙදා ගැනීමට සූදානම්වය.

කවුරුත් තමා හැරදමා ගියත් අන්තිමට ඒවා ඉතිරිවනු ඇතැයි හිට්ලර් නිතර පැවසූ දෙයකි. මේ අහිංසක ජර්මන් තරුණිය මහා ආඥාදායකයාගේ අපේක්ෂාව එලෙසින්ම ඉටු කළෙන් ඉතිහාසය ඇයට කෘතඥ විය යුතුය.

Scanned with CamScanner

# 11

## රුසියානුවෝ බර්ලිනය දෙවනත් කරති.

1945 අප්‍රේල් 28 දා වනවිට සුකොව්ගේ රුසියන් සේනාවෝ හැම දිසාවකින්ම ඉදිරියට ඇදී එනු දක්නට ලදහ. බර්ලින් මහා නගරය කොටසින් කොටස ඔවුන්ට අත්විය.

නගරය ආරක්ෂා කිරීමට හුන් ජර්මන් හමුදා පස්සට තල්ලු වන්නට පටන් ගත්හ. වීදි හරහා ගොඩ නඟා තිබුණු මාර්ග බාධක සුනු විසුනු කරමින් දැවැන්ත රුසියන් යුද ටැංකි පෙරට ගියේය. මඟ දෙපස වූ ගොඩනැඟිලි තුළ සැඟවී ගත් ජර්මන් භටයෝ රුසියානුවන්ට වෙඩි තබන්නට වූහ.

ඔවුන් සෙවීමට සෙබළුන් යවනු වෙනුවට රුසියන් හමුදාව කළේ ඔවුන් සමග ඒ ගොඩනැඟිලි ද විනාශ කර දැමීමය. එය වඩා පහසු ක්‍රමයක් විය. පාර හරස් කරනු සඳහා යොදවා තිබුණු ට්‍රෑම් රථ සහ ගල් පිරවූ වාහන කාලතුවක්කු විසින් විනාශ කර දමනලදී.

රුසියානුවන්ගේ ඉදිරි ගමන වළකනු සඳහා හෝ ප්‍රමාද කරනු සඳහා බර්ලිනයේ පිහිටි පාලම් 248 න් 120 ක් ම ජර්මානුවන් විසින් බිඳ හෙලා තිබුණි. එහෙත් දැන් මේ රුසියානුවන් ඒ සියලු බාධක මැඩගෙන ඔවුන් ඇවිත් ඉන්නේ බර්ලිනයේ කේන්ද්‍රස්ථානය වූ මැද කොටසටය.

රුසියන් ප්‍රහාරය නිසා සුප්‍රකට බර්ලින් සත්වෝද්‍යානයද පාළු භූමියක් බවට පත් වුණි. දහස් ගණන් සත්තු මිය ගියහ. වාසනාවන්තයෝ පළා ගියහ. තමන් මෙතෙක් කල් පදිංචිව සිටි

තිවහන හැරපියා පලා යන්නට වැඩිම අකමැත්තක් දැක්වූයේ පහසුවෙන්ම පළා හැකි පක්ෂි වර්ගයන්ය. ඔවුහු සත්තු වත්තේ ගස්වල අතු පතර රැඳී සිටියහ. රුසියන් ෂෙල් වෙඩිල්ලක් වැටුණු සෑම විටම වෛවර්ණ පියාපත් සලමින් විසිර ගිය කුරුලු කැළ ටික වේලාවකින් යළි සත්තු වත්තටම පියාඹා ආහ.

සත්තුවත්තේ භාරකරුවන් විසින් ව්‍යාඝ්‍රයන්, සිංහයන් වැනි භයානක සතුන් කල්තබා මරා දමා තිබුණි. ''රෝසා'' නම් හිපපොටේමස් ධේනුව ඇගේ දිය කඩිත්ත තුළ මැරී සිටියාය. ඒ රුසියන් ෂෙල් වෙඩිල්ලක් වැදීමෙනි.

පක්ෂීන් භාරව සිටි ශ්වාර්ස් නමැත්තා එදා මහත් කණගාටුවෙන් ළත වූයේ බර්ලිනය විනාශ වී යාම ගැන නොවේ. ඔහුගේ අඹ යාළුවා අතුරුදන් වී සිටීම ගැනය. ඒ තමා ඉතා දුර්ලභ වර්ගයේ කොකෙකු වූ ''අබු මාර්කුබ්.''

තවත් භයානක සතෙකු වූ බැබුන්ගේ කූඩුව අබලන්ව තිබූ හෙයින් ඌට වෙඩි තබා දමන ලෙස සත්තුවත්තේ අධ්‍යක්ෂ ලුට්ස්නෙක් ට අණ ලැබුණි.

හේ රයිපලයක් අතැතිව වානර කූඩුව සමීපයට සෙමින් සෙමින් පිය නැඟී.

ලුට්ස්නෙක්ගේ පැරණි මිතුරෙකු වූ බැබුන් කූඩුවේ ගරාදි ළඟ වාඩි වී සිටියේය. රයිපලය ඉස්සූ හේ තුවක්කු කට වානරයාගේ හිසට ළං කළේය. අතක් එස වූ බබුනයා තුවක්කු කඳ සෙමින් ඉවතට තල්ලු කළේය. දුකට හා පුදුමයට පත් ලුට්ස්නෙක් යළි තුවක්කු කඳ උගේ හිසට ළං කළ අතර යළිදු ඌ විසින් පැත්තකට හරවන ලදී. ඔහුගේ හදවත වේගයෙන් සැලෙන්නට විය. ඔහු අඩපණ වූ දෑතින් රයිපලය යළි ඉස්සුවේය. මිතුරා කරන්නට තැත් කරන්නේ කුමක්දැයි කල්පනා කරමින් බැබුනයා නිසොල්මන් විය. වෙව්ලන දඹරැඟිල්ලකින් රයිපලයේ කොකා ගැස්සිණි.

ජයොන්මාදයෙන් පෙළුණු රුසියන් භටයෝ බර්ලිනය දෙවනත් කරන්නට වූහ. රුසියන් හමුදාවේ පෙර ගමන්ගත් පළපුරුදු විනය ගරුක රතු භටයන් ශීලාචාර ලෙස හැසුරුණු නමුත් පසුව ආ අලුත් රුසියන් භටයන් බොහෝ දෙනෙකුට පරාජය වූ සතුරාට හොඳින් සැලකීමට තරම් විනයක් නොතිබුණි. මත්පැන් හල්වලට කඩා වැදුණු ඔවුහු හොඳටම වෙරි වනතුරු බී ගත්හ. එවිට ඔවුනට

සිහිවූයේ ජර්මන් හටයන් රුසියාවේදී කළ බිහිසුණු අපරාධ සහ වනචරකම්ය.

සාප්පු තුළට කඩා වැදුණු රුසියන් හටයෝ ඒවායෙහි තිබුණු නොයෙක් මාදිලියේ රෙදි පිළි ඩැහැගත්හ. යුද ඇඳුමට උඩින් ඒවා ඇඳ ගත්හ. ඉන් සමහරක් ගැණු ඇඳුම්ය. මේ ඇඳුම් ඇඳගත් රුසියානුවන් බර්ලිනයේ වීදි සරනා විට පෙනුණේ ඔවුන් විකට ඇඳුම් ප්‍රදර්ශනයක් පවත්වන්නා සේය.

රුසියානුවෝ තූර්ය භාණ්ඩ වාදනය කරමින් මහ පාරේ නටන්නට වූහ. ඒ අතර විනෝදයට මෙන් අහසට වෙඩි තැබූහ.

රුසියන් හටයන්ගෙන් වැඩිදෙනා නොදියුණු ගම්බද පෙදෙස්වලින් ආ ගොවීන් හා කම්කරුවන්ය. ජර්මන් අගනුවර ඔවුන්ට දිස්වූයේ ආලකමන්දාවක් මෙනි. සුඛෝපභෝගී භාණ්ඩ කොල්ල කෑමට ඔවුන් පෙළඹුණේ ඒ නිසාය.

මේ අතරතුරේ යුද සටන නොකඩවා කෙරීගෙන ගියේය. ජර්මන් සේනා සහ රුසියන් සේනා අත බර්ලිනය පුරා මාරක සටන් ඇවිළුණි. එක පැයට දහස් ගණනක් මිය ගියහ. දස දහස් ගණනක් තුවාල ලැබූහ. පරාජය පෙනි පෙනී ස්වකීය මාතෘ භූමියේ අන්තිම අඟල දක්වා ජීවිත පරිත්‍යාගයෙන් සටන් කරන ජර්මානුවන් දුටු රුසියානුවෝ මවිතයට පත් වූහ.

යුද ප්‍රහාරය මෙසේ නොනැවතී කෙරෙද්දී තව ප්‍රහාරයක් ඇතැම් පෙදෙස්වල ආරම්භ විය. ඒ ස්ත්‍රී දූෂණයයි. ජර්මානුන් රුසියානු ස්ත්‍රීන්ට කළ හිම අපරාධ මතක් වූ රුසියානුවෝ ජර්මන් කාන්තාවන්ටද ඒ හැන්දෙන්ම බෙදන්නට පටන් ගත්හ.

රුසියන් හමුදාවන්ට බියේ පලායන ලක්ෂ සංඛ්‍යාත ජර්මානුන්ගෙන් මහා මාර්ග අවහිර විය. ඔවුන් ජර්මන් යුද ප්‍රයත්නයටද බාධාවක් වුණි. බර්ලින් වාසීන් ගෙවල් දොරවල් අතහැර පලා යන්නට පටන් ගත්තේ සතියකට දෙකකට කලින් සිටය.

වාහන වලින්ද, සතුන් පිටින්ද, පා ගමනින්ද මේ පලා යෑම කෙරුණි. බඩු පොදි හිස උඩ තබාගත් පියවරුන්ය. ළපැටියන් ඇකයෙන් ගත් මව්වරුන්ය. පෙම්වතියන් අතින් ගත් තරුණයන්ය. හැරමිටි වාරුවෙන් හෙමිහිට ගාටන මහල්ලන්ය. තෙරපෙන මහ සෙනඟ මැද්දේ මඟ හැරුණු දරුවන්ට හඬ ගසමින් වැළපෙන දෙමාපියන්ය. වෙන්වුණු දෙමාපියන් සොය සොයා ඒ මේ අත

දුවන දූ පුතුන්ය. එය හදවත දැදුරු කරවන දර්ශනයක් විය. බර්ලිනය බොහෝ දුරට ජන ශූන්‍ය වී යාමට වැඩි වෙලා ගියේ නැත.

XXXXXX

රුසියන් ප්‍රහාරය දරාගත නුහුණු ජර්මන් සේනාංකවලට පසු බැසීමට අවසර දීමෙන් තමන් කළේ බලවත් අකීකරු කමක් බව බර්ලිනය රැකීම භාරව සිටි ජර්මන් සෙන්පති හෙයින්රික් තේරුම් ගෙන සිටියේය. හිට්ලර්ගේ අවසර නොමැතිව කිසිම සේනාවකට පසු බැසීම තහනම්ව තිබුණි.

සෙන්පති හෙයින්රික් වසර හතළිහක් ජර්මන් හමුදාවේ සේවය කොට ඇති දක්ෂ රණ ශූරයකු ලෙසින් කීර්තිමත් වූ පුද්ගලයෙකි. සේනාංකවලට පසුබෑමට අවසර දීමේ වරදට එක්කෝ වෙඩි කා මිය යාමට සිදුවන බවත් නැත්නම් සියලු නිලතල වලින් තමන් පහ කෙරෙන බවත් හෙයින්රික් මනාව දත්තේය.

මහ සෙන්පති කෙයිටල්ට, හෙයින්රික් කළ දේ ගැන දැනගන්නට ලැබුණේ අප්‍රේල් 28 දා පාන්දරය. වහාම හෙයින්රික් හා මැන්ටුපල් තමන් වෙත කැඳ වූ කෙයිටල් ඔවුන් සමඟ සාකච්ඡාවක් පැවැත්විය.

හෙයින්රික් හුන්නේ බෝම්බයක් මෙන් කෝපයෙන් පිපිරෙමිනි. පහර දෙමින් බර්ලිනය දෙසට යන ලෙස කෙයිටල් ප්‍රමුඛ හමුදා මණ්ඩලයෙන් ලැබුණු අණක් සඳහන් පත්‍රිකාව ඔහුගේ මුහුණ ඉදිරිපිට වැනූ හෙයින්රික් මේ විධියේ අණ නිකුත් කරන්නේ මොන ඉලච්චකට ද?' යි ප්‍රශ්න කළේය.

'මට හැම අතින්ම පෙනෙන්නේ පසුබසින සේනාවන්'යයි කෙයිටල් පිළිතුරු දුන්නේය.

සටන් බිමේ තත්ත්වය සන්සුන්ව පැහැදිළි කළ හෙයින්රික් අතිරේක සේනාංක සැපයුවේ නැති නම් තවත් පසු බැසීමට සිදුවන බව තරයේ කියා සිටියේය.

පසෙකින් යුද සටන ඇවිලෙද්දී කෙයිටල් සහ හෙයින්රික් අතර මේ වාග් සටන තව ටික වේලාවක් කෙරීගෙන ගියේය.

ඉන්පසු එතැනින් පිටත් වූ හෙයින්රික් ස්වකීය මූලස්ථානය කරා ගමන් ගත්තේය. සාමාන්‍යයෙන් මිනිත්තු විස්සක් ගතවන මේ ගමනට එදා පැය පහක් ගත විය. එසේ වූයේ පසු බසින

ජර්මන් සේනාවන්ගෙන් හා පලායන මහජනයාගෙන් සෑම මාර්ගයක්ම අවහිර වී තිබුණු හෙයිනි.

මූලස්ථානයට ළඟා වූ පසු හෙයින්රිකිට සැළවුයේ ආයුධ විරහිත පහළොස් දහසක් නාවික භටයන් රැඳී හුන් ස්වයින්මූන්ඩ් වරාය රුසියානුන් විසින් වටලනු ලබන බවය.

නිරායුධ පහළොස් දහසගේ ජීවිත බේරා ගැනීම තමන්ගේ යුතුකම යයි ඒත්තු ගත් සෙන්පති හෙයින්රිකි ඒ බව මහ සෙන්පති කෙයිටල්ට දැනුම් දුන්නේය.

'ඔබ සතු කාර්යය යුතුකම් ගැන කල්පනා කිරීම නොව නියෝග පිළිපැදීමයි. මේක ඔබට පැහැදිලි නැත්නම් මා ඔබ හමුදා අධිකරණයක් ඉදිරියට පමුණුවනවා.' යනු කෙයිටල් ගෙන් ලැබුණු ගොරෝසු පිළිතුරය.

තමා සුන් බව ඒ මොහොතේ හෙයින්රිකි තේරුම් ගත්තේය.

'එහෙම නම් මම මේ අණදෙන නිලධාරී කමින් ඉල්ලා අස්වෙන්නම්, කරුණාකර, ඔබේ නියෝග පිළිපදින්න සූදානම් වෙන මිනිහෙකු සොයා ගන්න!' යනු හෙයින්රිකිගේ මුවින් එල්ල වූ වෙඩි මුරයයි.

ඊ ළඟට ටෙලිෆෝන් රිසීවරය වැරෙන් ගසා 'මට ෂැම්පේන් බෝතලයක් ගෙනෙන්' යයි හෙයින්රිකි ඔහුගේ සේවකයකුට අණ කළේය.

හමුදා මූලස්ථානයට එන්නැයි පසුදා පාන්දරම හෙයින්රිකිට අණක් ලැබුණි. එහි යාමට සූදානම් වෙද්දී ළඟට පැමිණි තරුණ කපිතන්වරයෙක් වූ හෙල්මුග් ලෑං මෙසේ කීය.

'හමුදා මූලස්ථානයට යන්න ඉක්මන් වෙන්න එපා, පින්සිද්දවෙයි එහෙ යන්න එපා!'

'මොනවද තමුසේ මේ කියන්නෙ?' යි හෙයින්රිකි කුතුහලයෙන් විමසීය.

'ෆීල්ඩ් මාර්ෂල් අර්වින් රොමෙල (ERWIN ROMMEL) ට අත්වූ ඉරණම තමුන්නාන්සේටත් අත් වෙනවාට මම කැමති නෑ' යි ලෑං පිළිතුරු දුන්නේය.

උතුරු අප්‍රිකාවේ කාන්තාරවල ජර්මන් යුද සටන් මෙහෙය වූ සෙන්පති රොමෙල් ජර්මන් හමුදාවේ සිටි විශිෂ්ටතම රණ ශූරයෙකි.

කාන්තාරවල කෙරෙන යුද සටන් පිළිබඳ විශේෂඥයෙකු වූ ඔහු සතුරු හමුදා විසින් හඳුන්වන ලද්දේ 'කාන්තාරයේ හිවලා' (DESERT FOX) යනුවෙනි. රොමෙල් ජර්මන් හමුදාවේ සිටි ළා බාලම ෆීල්ඩ් මාෂල්වරයාය. 1944 ජුලි 20 දා **ක්ලාවුස් පොන් ස්ටෝෆන්බර්ග්** (KLAUS VON STAUFFENBERG) නම් තරුණ හමුදා කර්නල්වරයා හිට්ලර් මැරීමට කළ කුමන්ත්‍රණයට ඔහුද සම්බන්ධ යයි සැක කරන ලද මුත් ජර්මන් ජනතාවගේ යුද වීරයා වූ ඔහු කෙලින්ම වෙඩි තබා මරනු වෙනුවට සියතින් වෙඩි තබාගෙන දිවි නසා ගැනීමට ඔහුට බල කරන ලදී.

'මොනවා. රොමෙල් මළේ තුවාල වලින් නොවේද?' යි හෙයින්රිකි පිළිවිසීය.

'නෑ සර්, එයාට දිවි නසා ගන්න බල කළා!'' යයි කපිතන් ලෑං හෙළි කළේය.

'තමුසෙ මේක දන්නේ කොහොමද?'

'එකල රොමෙල්ගේ සහායක නිලධරයා වූයේ මමයි. තමුන්නාන්සේ වාහනය සෙමින් පදවාගෙන යන්න. එතකොට එහාට ළඟාවෙන්න කලින් යුද්ධය හමාර වී තියේවි.' යනු භක්තිමත් ලෑංගේ අවවාදය විය.

කපිතන් ලෑං කියූ දේ හරියටම හරි ගියේය. හෙමින් රිය පදවා ගෙන ගිය නිසා සෙන්පති හෙයින්රිකිගේ ජීවිතය ජර්මන් වෙඩි උණ්ඩයකට ගොදුරු නොවී බේරුණේ අනූනවයෙනි.

# 12

## පුංචි බූදලය මහා ජනයාට පූජා වේ

බිම්ගෙයි කාමරයක් තුළ හිට්ලර් - ඊවා යුවළේ අශුභ සරණ බන්ධනය පිළිබඳ කෙටි චාම් උත්සවය එසේ පැවැත්වෙද්දී හිට්ලර්ගේ හිත ගියේ ඊට වඩා ලෞකික දේවල් කෙරෙහිය.

සිය ලේඛිකාව වූ ජුංගේ මහත්මියට හිට්ලර් සිය අවසන් කැමැති පත්‍ර දෙක කියවමින් සිටියේය. ඇය එක කඩිනමින් ලියා ගත්තාය.

ඉන් එකක් දේශපාලන අන්තිම කැමැති පත්‍රයකි. අනෙක පෞද්ගලික අන්තිම කැමැති පත්‍රයකි.

දේශපාලන අන්තිම කැමැත්ත කොටස් දෙකකින් යුක්ත විය. එක කොටසක් පොදුය. අනෙක විශේෂය.

ජර්මනිය අල්ල මත නටවා මුළු මහත් යුරෝපය හය වසරක් පයට පාගාගෙන සිටි ලෝක ඉතිහාසයේ අද්භූතම ආඥාදායකයා සිය දේශපාලන අන්තිම කැමැත්තෙහි මෙසේ පළ කළේය:

'වර්ෂ 1939 දී මට හෝ ජර්මනියේ අන් කිසිවකුට යුද්ධයක් කිරීමට වුවමනාව තිබිණියි කීම බොරුවකි. ඒ යුද්ධය වුවමනා කරන ලද්දේ හා අවුලන ලද්දේ යුදෙව්වන්ගෙන් පැවතෙන හෝ යුදෙව් වුවමනා එපාකම් ඉටු කිරීමට ලොල් වූ ජාත්‍යන්තර දේශපාලනඥයන් විසිනි. නිරායුධ වීම සඳහා මා ගත් වෙහෙස ගැන කල්පනා කරන විට අනාගත පරම්පරාවනට යුද්ධයේ වගකීම මගේ කර උඩ පැටවිය නොහැකිය.'

'කෙතරම් පසුබෑම් සිදු වුවත් ජීවත්වීමට ජනතාවක් තුළ ජනනය

Scanned with CamScanner

වූ අධිෂ්ඨානය පිළිබිඹු කළා වූ ඉතාම වීරෝදාර සහ ජෝතිමත් සිද්ධිය වශයෙන් ඉතිහාස ගත වන්නා වූ ඒ හය අවුරුදු සංග්‍රාමයෙහි යෙදීමෙන් පසු රාජ්‍යයේ අගනුවර හැර පියා යාමට මට පුළුවන් කමක් නැත. මෙහිදී සතුරාගේ ප්‍රහාරයට තව දුරටත් මුහුණ දීමට තරම් ප්‍රබල හමුදා ශක්තියක් අපට නැති හෙයින්ද, අපගේ ප්‍රතිප්‍රහාරය අන්ධ ස්වයංක්‍රීය පුද්ගලයන් විසින් ක්‍රම ක්‍රමයෙන් මැඩලනු ලබන හෙයින්ද, තව ලක්ෂ ගණනාවක් විසින් පිළිගෙන ඇති ඉරණම මම ද පිළිගෙන මේ නගරය තුළ රැඳී සිටින්නෙමි.'

'තවද යුදෙව්වන් විසින් පෙන්වාදී ඇති අන්දමින් සතුරා අලුත් දර්ශනයක් මවා පෑමට තැත් කරතත් සතුරාට අයත් උමතු ජනයාගේ සිත් සතන් වෙනතක යවනු පහසු වනු සඳහා ඔවුන්ගේ අතට හසුවීමට මා සූදානම් නැත. එම නිසා මම බර්ලිනයෙහිම රැඳී සිටීමට තීරණය කර සිටිමි. අගමැති නායක තුමාගේ නිවහන තවදුරටත් රැකගත නොහැකි බව ඇසුණු විගස ස්වෙච්ඡාවෙන්ම දිවි තොර කර ගැනීමට මම ඉටාගෙන සිටිමි.'

'දැනටම අපගේ නාවික හමුදාව හැසිරී තිබෙන්නේ යම් සේද අපේ යුද හමුදා නිලධරයන් ද එලෙසින්ම හැසිරෙමින් අනාගතයේදී හෝ භූමි ප්‍රදේශයන් හා නගරයන් (සතුරාට) යටත් කර දීමෙන් වැළකිය යුතුය. හැම දෙයකටම වැඩියෙන් මතක තබාගත යුතු දෙයක් නම් අණදෙන නිලධරයන් ජීවිතාවසානය දක්වා භක්තිමත්ව රාජකාරි ඉටු කළ යුතු බවයි.'

ඇඩොල්ෆ් හිට්ලර්ගේ දේශපාලන අන්තිම කැමැත්තේ විශේෂ කොටසෙහි මෙසේ සඳහන් විය

> *'හිටපු රාජ්‍ය මාෂල් ධුරන්ධර හර්මන් ගෝරින් මගේ අභාවයට කලින් පක්ෂයෙන් නෙරපා දමමි.'*
>
> *'1941 ජූනි 29 දා මා නිකුත් කළ නියෝගයෙන් සහ 1939 සැප්තැම්බර් 1 දා මැති සබයේදී මා කළ ප්‍රකාශයෙන් ඔහු වෙත පවරණ ලද සියලු අයිතිවාසිකම් මින් අවලංගු කෙරේ. ඔහු වෙනුවට රාජ්‍යයේ ජනාධිපති හා සකල හමුදා අධිපති වශයෙන් උපරිම අද්මිරාල් ඩොයෙනිට්ස් මවිසින් පත් කරනු ලැබේ.'*

මෙතෙක් වේලා හිට්ලර්ගේ බිම්ගෙය තුළ සිදු වූ කතිකාවෙහි අරමුණ හා ප්‍රතිඵලය කුමක් වීදැයි ඉහත සඳහන් වැකියෙන් තේරුම් ගත හැකිය.

යුද හමුදාව විසින් හිට්ලර් පාවා දී තිබුණි. ගෝරිංගේ ගුවන් හමුදාව මෙන්ම හිම්ලර්ගේ බිහිසුණු ඇස්. ඇස්. බලකායද ඔහු පාවා දී තිබුණි. නාවික හමුදාපති වූ ඩොයෙනිට්ස් හිට්ලර්ගෙන් පසු 'සිහසුනට' නම් කරන ලද්දේ ඒ නිසාය. හිට්ලර්ටත් නාසිවාදයටත් අවසන් මොහොත එන තුරු අචල භක්තියක් දැක් වූ එකම හමුදාංශය නාවික හමුදාංශයයි.

'දැනටමත් අපගේ නාවික හමුදාව හැසිරෙන ගෞරවාන්විත ආකාරය අනාගතයේදී අපේ ජර්මන් හමුදා නිලධරයන්ට ආදර්ශයක් වේවා.'යි හිට්ලර් සිය අන්තිම කැමති පත්‍රයෙන් නාවික හමුදාවට මල් මිටක් පිදීමට අමතක නොකළේ ඒ නිසාය.

ඇස්.ඇස්. බළකායේ අධිපති වූද, ස්වදේශාමාත්‍ය වූද, හෙයින්රිච් හිම්ලර් මගේ මරණයට කලින් පක්ෂයෙන් හා සෙසු සියලු නිලතල වලින් පහකර දමමි. ඔහු වෙනුවට ඇස්.ඇස්. බලකායේ අධිපති වශයෙන් කාර්ල් හැන්කෝ (KARL HANKE) ද, ස්වදේශාමාත්‍ය වශයෙන් පෝල් ගියෙස්ලර් (PAUL GLESLER) ද පත් කෙරේ.

''ගෝරිං සහ හිම්ලර් මගේ අනු දැනුමින් හෝ අනුමැතියෙන් තොරව සතුරා සමග සාකච්ඡා පැවැත්වීමෙන්ද, රාජ්‍ය බලය නීති විරෝධී ලෙස අල්ලා ගැනීමට උත්සාහ දැරීමෙන්ද මගේ ජීවිතයට විරුද්ධව ඔවුන් කළ ද්‍රෝහිකම් පසෙක තිබියේවා - මාතෘභූමිය සහ සමස්ත ජනතාව අපමණ අපහාසයට ලක්කර තිබේ.''

ඉන්පසු හිට්ලර් යෝජනා කළේ ඔහුගේ අභාවයෙන් පසුව පිහිටුවිය යුතු නව ජර්මන් ආණ්ඩුව සකස් විය යුතු ආකාරයයි.

ජර්මන් ජනතාවට නම්බුකාර මිනිසුන්ගෙන් සමන්විත වූද සෑම අයුරකින්ම යුද්ධය දිගටම කරගෙන යන්නා වූ මිනිසුන්ගෙන් සමන්විත වූද ආණ්ඩුවක් ලැබිය යුතු යැයි පැවසූ හිට්ලර් දහ නව දෙනෙකුගෙන් යුත් ඇමැති මණ්ඩලයක් පත් කළේය.

හිට්ලර්ගේ රාජ්‍ය නායක පදවිය කාර්ල් ඩොයෙනිට්ස්ටය. සියලු හමුදාවල උපරිම අණදෙන නිලධාරියාත් ඔහුය. යුද ඇමැති ධුරය හා නාවික හමුදාපති ධුරයද ඩොයෙනිට්ස්ට හිමිවිය. ගොබල්ස් රාජ්‍ය චාන්ස්ලර් (ජනාධිපති) වශයෙන්ද, බෝර්මන් නාසි පක්ෂයේ නායකයා වශයෙන්ද පත් වූහ. ඕලන්දයේ ජර්මන් පාලකයා වූ ඔස්ට්‍රියානු ජාතික **සෙයිස ඉන්ක්මාර්ක්** (SEYSS INQUART) විදේශාමාත්‍ය ධූරයට පත් විය.

හිට්ලර් විසින්ම 'දෙවෙනි බිස්මාර්ක්' කෙනෙකු ලෙසින්

Scanned with CamScanner

හඳුන්වන ලද රිබන්ට්‍රොප් කලින් සිටි විදේශාමාත්‍යයා වුවද ඔහු අදක්ෂයෙක් විය. ඔහුට ඇමැතිකම අහිමි වුණි. නව ඇමැති මණ්ඩලයෙන් අතහරින ලද නව කෙනෙක් නම් හිට්ලර් ගේ දක්ෂතම ඇමැතියෙකු වූ ඇල්බට් ස්පියර්ය. ඔහු වෙනුවට යුද අවි නිෂ්පාදන ඇමැති වශයෙන් ඔහුගේ දෙවෙනියා වූ කර්ල් සවුර් (KARL SAUR) පත්විය. ස්පියර් බොහෝ විට හිට්ලර්ගේ මත වලට විරුද්ධව එළිපිටම කැරලි ගැසූ නමුත් කවදත් ඔහු කෙරෙහි ආඥාදායකයා තුළ අමුතු අමතර ඇල්මක් තිබුණි. ඒ දෙදෙනාම ගෘහනිර්මාණ ශිල්පීන් වූ නිසා විය හැකිය. ස්පියර්ට ඇමැතිකම අහිමි කරන ලද්දේ ශෝකයෙන් යුතුව විනා කෝපයෙන් යුතුව නොවේ. යුද හමුදාවේ අණදෙන නිලධරයා වශයෙන් පත්කරන ලද්දේ පීල්ඩ් මාෂල් පර්ඩිනන්ඩ් ශොයර්නර් (FERDINAND SCHORNER) ය.

මේ සියලු වෙනස්කම් සිදු වුවද එක් පුද්ගලයකුගේ පමණක් ඇති ධුරය වෙනස් නොවිය. ඒ මුදල් ඇමැති ශ්වෙරින් පොන් ක්‍රොසික් (SCHWERIN VON KROSIGK) ආදිපාද තුමාය.

මෙසේ අලුත් පත් කළ ඇමැති මණ්ඩලයට විධාන කීපයක් නිකුත් කිරීමටත් ඒ විධානයන් අන්තිම කැමති පත්‍රයේ සඳහන් කිරීමටත්, හිට්ලර් අමතක නොකළේය.

බෝර්මන් සහ ගොබල්ස් හිට්ලර් සමඟ මියයාමට සූදානම් ව බර්ලින් බිම්ගෙය තුළට පැමිණ එහි වාසය කළ නමුත් ඔවුන් ජීවතුන් අතර හිඳ නාසි පාලන ධර්මය හා නාසි ජාතිවාදී පිළිවෙත නොකඩවා ක්‍රියාත්මක කළ යුතු යයි හිට්ලර් අපේක්ෂා කළේය.

'අන් සියල්ලටම වඩා මානව ගෝත්‍ර පිළිබඳ නීති තදින් ක්‍රියාත්මක කළ යුතු අතර සකල ලෝක ජාතීන් දූෂණය කරන යුදෙව්වන්ට විරුද්ධව නිරානුකම්පික අරගලයක් කළ යුතු' බවද අන්තිම කැමති පත්‍රයෙන් ඔවුනට නියෝග කෙරුණි.

XXXXXX

හිට්ලර්ගේ පෞද්ගලික අන්තිම කැමති පත්‍රය දේශපාලන අන්තිම කැමති පත්‍රයට වඩා කෙටි එකක් විය. ඇත්ත වශයෙන් අන්තිම කැමති පත්‍රයකින් තෑ හිතවතුන් අතර බෙදා දීමට තරම් විශාල මුදලයක් ඔහු හම්බකරගෙන තිබුණේ නැත. ඔහු සතුව පැවැති අගනාම වස්තුව කාලාන්තරයක් මුළුල්ලේ එකතු කළ කලා කෘතීන්ය. විශේෂයෙන් චිත්‍රයන්ය. 'දේපළක්' යයි කිව හැකි යම් වටිනා දෙයක්

හිට්ලර් සතුව තිබුණි නම්, එය ඔහු පක්ෂය හා රජය මගින් මහජනයාට පූජා කිරීමට තරම් ත්‍යාගශීලී විය.

හිට්ලර්ගේ පෞද්ගලික අන්තිම කැමැති පත්‍රයෙහි ඔහුගේ විවාහය පිළිබඳවද, දේපල බෙදා දිය යුතු ආකාරය පිළිබඳවද, අත ළඟ එළඹෙන මරණය පිළිබඳවද සඳහන් විය.

'අරගලයෙහි යෙදී සිටි වර්ෂ ගණනාව තුළ මට විවාහ ජීවිතයක වගකීම් භාරය ඉසිලීමට ඉඩකඩ නොතිබුණ නමුත්, සත්‍ය මිත්‍රත්වයකින් මා සමඟ වෙළී සිටියා වූද (සතුරා විසින්) වටලා ඇති මේ නගරයට සිය කැමැත්තෙන් අවුදින් සිටින්නා වූද, මට අත්වන ඉරණම බෙදා හදා ගැනීමට එසේ අවුත් සිටින්නා වූද, කාන්තාව මගේ බිරිඳ කර ගැනීමට මම තීරණය කර සිටිමි. මගේ බිරිඳ වශයෙන් ඇය සිය කැමැත්තෙන්ම මා සමඟ මරු වැළඳ ගනු ඇත. මගේ ජනතාවට සේවය කරනු සඳහා වෙහෙසී අප දෙදෙනාටම අහිමි වූ දේට මෙය සැහෙන වන්දියක් වනු ඇත.'

'මගේ දේපල- ඒවායෙහි යම් වටිනාකමක් තිබේනම්, පක්ෂයට අයිති විය යුතුය. පක්ෂය තව දුරටත් නො පවතී නම් එය අයිති රජයටය. රාජ්‍යයත් අහෝසි වී යේ නම් ඒ පිළිබඳ මගේ උපදෙස් තව වුවමනා නැත.'

'වසර ගණනාවක් මුළුල්ලේ මවිසින් මිලදී ගන්නා ලද චිත්‍ර මගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගත් ඒවා නොවේ. ඒවා ලබා ගත්තේ ඩැනියුබ් ගඟබඩ පිහිටි මගේ උපන්ගම වන ලින්ස්හි චිත්‍රාගාරයක් තනා එහි තැන්පත් කිරීමටය.'

'මගේ මේ අන්තිම කැමැති පත්‍රය එලෙසින්ම ඉටු කරනු ඇතැයි මම උදක්ම බලාපොරොත්තු වෙමි.'

'මගේ අන්තිම කැමැති පත්‍රයේ සඳහන් අභිමතයන් ක්‍රියාත්මක කිරීමේ හා ඒ පිළිබඳ තීරණ ගැනීමේ පූර්ණ නීත්‍යනුකූල බලතල මගේ ලෙන්ගතුම (නාසි) පාක්ෂික සහෝදරයා වන මාර්ටින් බෝර්මන්ට පවරමි. පෞද්ගලික ස්මරණ භාණ්ඩයක් වශයෙන් තබා ගත හැකි යමක් තිබේ නම් හෝ පහළ මධ්‍යම පන්තික ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය යමක් තිබේ නම් හෝ ඒවා මගේ ඥාතීන්ට භාර දීමට ඔහුට බලය පැවරේ. මේ සම්බන්ධයෙන් විශේෂයෙන් මතක තබා ගත යුතු අය නම් මගේ බිරිඳගේ මවත්, මා වෙනුවෙන් ඉතා භක්තිමත්ව සේවය කළා වූද, ඔහු (බෝර්මන්) හොඳින් හඳුනන්නාවූද, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අයත් මගේ සේවකයන්ය.

Scanned with CamScanner

මින් ප්‍රධාන තැනක් ගත යුත්තේ වසර ගණනාවක් මුළුල්ලේ මගේ ලේකම්වරියන් වශයෙන් සේවය කළ වින්ටර් මහත්මිය ආදීන්ය.'

'බලයෙන් නෙරපා දැමීමේ හෝ යටත් වීමට සිදුවීමේ ලජ්ජාවෙන් මිදෙනු සඳහා සිය දිවි නසා ගැනීමට මා සහ මගේ බිරිඳ තීරණය කර තිබේ. මගේ ජනතාව වෙනුවෙන් දොළොස් වසරක් සේවය කරද්දී ඒ දෛනික වැඩ කටයුතු වලින් වැඩි කොටසක් කෙරුණු ස්ථානයේ අපේ මළ සිරුරු බහා දවාලිය යුතු යයි මම අපේක්ෂා කරමි.'

පසුදා (එනම් අප්‍රේල් 29 දා) පාන්දර 4 ට අසහාය ජර්මන් නායකයාගේ අන්තිම කැමැති පත්‍ර දෙක අත්සන් කරනු සඳහා සූදානම් තිබුණි. ඉන් පිටපත් තුන බැගින් සකස් කරන ලදී. එසේ කරන ලද්දේ බර්ලිනය වටලාගන හුන් රුසියානුන්ගෙන් බේරීමේ ලියවිලි අවශ්‍ය පුද්ගලයනට නිසැකව බාරදිය හැකිද යන්න සැක සහිත වූ නිසාය.

දේශපාලන අන්තිම කැමැති පත්‍රයට හිට්ලර් අත්සන් තැබීමෙන් පසු සාක්ෂිකරුවන් වශයෙන් ගොබල්ස්, බෝර්මන්, ක්‍රෙබ්ස් සහ බුර්ග්ඩෝර්ෆ් (BURGDORF) අත්සන් කළහ.

පෞද්ගලික අන්තිම කැමැති පත්‍රයට සාක්ෂිකරුවන් වශයෙන් අත්සන් කළේ ගොබල්ස්, බෝර්මන් හා කර්නල් නිකොලෝස් පොන් බෙලෝය. පොන් බෙලෝ මේ කාර්යය සඳහා විශේෂයෙන් කැඳවන ලද්දේ ඒ දක්වා පුරා අට වසරක් මුළුල්ලේ, ඔහු හිට්ලර්ගේ පෞද්ගලික සහායක නිලධාරියා වශයෙන් සේවය කර තිබුණු හෙයිනි.

අන්තිම කැමති පත්‍රය අන්තිම වැඩ කොටසත් හමාර කළ ඇඩොල්ෆ් හිට්ලර් හතර වටින් සතුරු සේනාවල ෂෙල් වෙඩි වැටෙද්දී සුවසේ නින්දට ගියේය.

ජර්මන් ජනතාවගේ ප්‍රෞඪ ඉතිහාසය උජ්වලිත කළ ඔවුන්ගේ අසහාය වීරයා එදා බිම්ගෙය තුළ ගත කළේ මිහිරි මධු සමයක්ද නැත්නම් අමිහිරි සිහිනවලින් යුත් හුදකලා සයනයක්ද යනු කිසිවෙක් නොදනිති.

XXXXXX

බර්ලිනයට කඩා වැදී සිටි රුසියන් හමුදාවන්ට හසු නොවී හිට්ලර්ගේ අන්තිම කැමැති පත්‍රයේ පිටපත් ඩොයෙනිට්ස් සහ

සෙසු ප්‍රධානයන් අතට පත් කිරීම බලගතු ප්‍රශ්නයක් විය.

මේ අගනා ලියවිල්ල බර්ලිනයෙන් පිටතට ගෙන යනු සඳහා පුද්ගලයෝ තිදෙනෙක් තෝරා ගන්නා ලදහ. විලී ජොහාන්මෙයියර් (WILLI JOHANNMEIER) නමැති හමුදා මේජර් වරයා, ඇස්. ඇස්. බලකායේ නිලධරයකු වූ විල්හෙල්ම් සැන්ඩර් (WILHEL M ZANDER) සහ හිම්ලර්ගේ ද්‍රෝහි ක්‍රියාව ගැන මුලින්ම ආරංචිය ගෙනා ප්‍රචාරක අමාත්‍යාංශයේ නිලධරයකු වන හෙයින්ස් ලෝරන්ස (HEINZ LORENZ) ඒ බාරදූර කටයුත්ත සඳහා තෝරා ගන්නා ලද තිදෙනාය. රතු හමුදා වළල්ලෙන් බේරී රිංගා යා යුතු මේ තිදෙනාගේ නායකත්වය පවරන ලද්දේ බොහෝ සම්මාන ලත් නිලධරයකු වන ජොහාන්මෙයියර්ටය. ඔහුට බාරව තිබුණේ තවමත් ජර්මන් හමුදා අතෙහි තිබුණු බොහිමියානු කඳුකරයේ හුන් ෆීල්ඩ් මාර්ෂල් ධුරන්ධර පර්ඩිනන්ඩ් ශොයර්නර් (FERDINAND SCHOERNER) ට අන්තිම කැමැත්තේ එක් පිටපතක් බාරදීමය. හිට්ලර් විසින් නව අණදෙන නිලධරයා ලෙසින් පත්කර තිබුණු පුද්ගලයා ශොයර්නර්ය.

සැන්ඩර් සහ ලෝරන්ස් අත තිබුණු පිටපත් බාරදිය යුතු වූයේ ඩොයෙනිට්ස්ටය.

දූතයෝ තිදෙන අප්‍රේල් 29 දා මධ්‍යාහ්නයේ මේ භයානක ගමන සඳහා පිටත් වූහ. ඔවුන් ගමන් කළේ හැවල් වැවේ ඉස්මත්ත ඔස්සේය.

බර්ලිනය රැකීමට කිසිදාක නො ආ වෙන්ක්ගේ සේනාව බලාපොරොත්තුවෙන් හිට්ලර්ගේ තරුණ බලකායේ සේනාංකයක් එහි පාලමක් මුර කරමින් උන්හ. එතැනට ළඟාවනු සඳහා අන්තිමට ඒ තිදෙනාට රුසියන් සේනා තුනක් අස්සෙන් රිංගා යාමට සිදු විය. තව තවත් රුසියන් සේනා වලින් බේරී යාමට ඔවුනට සිදුවුණි. ඒවායින්ද ගැල වී යාමට මේ තිදෙනා සමත්වූ මුත් අන්තිමේ ඔවුන්ගේ ප්‍රයත්නය නිෂ්ඵල එකක් බවට පත් විය. හිට්ලර්ගේ අන්තිම කැමැති පත්‍රය ඩොයෙනිට්ස් සහ ශොයර්නර් අතට පත්වූයේ නැත. අඩු ගණනේ ඔවුනට එකිනෙකා දැක ගැනීමට පවා නොහැකි විය.

එදා හිට්ලර්ගේ බිම්ගෙයින් පිටමං වූ එකම පුද්ගලයෝ මේ තිදෙනා පමණක් නොවෙති. අප්‍රේල් 29 දා මධ්‍යාහ්නය වන විට ඇඩොල්ෆ් හිට්ලර් යළි සන්සුන් මිනිසකු බවට පත් වී තිබුණි. පුරා හය අවුරුද්දක් නොකඩවා සිරිත් පරිදි පවත්වාගෙන ආ යුද

සම්මන්ත්‍රණය එදිනද පවත්වන ලදී. පෙරදා රාත්‍රියේ සහ එදින පෙරවරුයෙහි රුසියානුන් තව තවත් අගමැති කාර්යාලය කරා ළඟා වී ඇති බැව් සෙන්පති ක්‍රෙබ්ස් දැනුම් දුන්නේය. බර්ලිනය රකිමින් සිටි ජර්මන් හමුදාවනට අවශ්‍ය ප්‍රමාණයට යුද බඩු නො සැපයෙන බවද එහිදී සැළවිය. බර්ලිනය මුදා ගැනීමට කොයි මොහොතේ හෝ එහි ළඟා වෙතැයි අපේක්ෂා කළ වෙන්ක්ගේ හමුදාංකය ගැන තවම ආරංචියක් නොමැත. හිට්ලර් මෙන් බිම්ගෙය තුළ දිවි නසා ගැනීමට උවමනා නො කළ හමුදා නිලධරයෝ තිදෙනෙක් වෙන්ක්ගේ හමුදාංකය සොයනු සඳහා ඉන් පිට වී යාමට අවසර පැතූහ. ඒ නිලධරයනට පිටත්වී යාමට ඉඩ හළ හිට්ලර් වෙන්ක්ගේ සේනාවත් කෙසේ හෝ බර්ලිනය වෙත මෙහෙය වන ලෙස ඔහුට කියා සිටින්නැයි ඔවුනට අණ කළේය. අවසර ලත් වහාම ඔවුහු බිම්ගෙයින් චුත වී ගියහ.

ඉක්මනින් තවෙකෙක් ද ඔවුනට එක්විය. ඒ හිට්ලර්ගේ ගුවන් හමුදා නිලධරයෙක් වූ කර්නල් නිකොලෝස් පොන් බෙලෝය. බෙලෝද සියදිවි නසා ගැනීම ප්‍රිය කළ කෙනෙක් නොවේ. තව දුරටත් බිම්ගෙය තුළ රැඳී සිටීමේ අර්ථයක් නැති බව ඔහු වටහා ගෙන තිබුණි. බිම්ගෙයින් පිට වී යාමට හිට්ලර්ගෙන් ඔහුට අවසර ලැබුණි. ජර්මන් ආඥාදායකයා මෙදා හැසිරුණේ ඉතා සාධාරණ මිනිසකු සේය.

කර්නල් බෙලෝ විසින් එක් අන්තිම පණිවිඩයක් රැගෙන යා හැකිබව හිට්ලර්ට මතක් විණි. මේ පණිවිඩය යැවෙන්නේ මහා සේනාධිනායක කෙයිටල්ටය. ඔහුත් ද්‍රෝහියකු වීමට පටන් ගෙන ඇතැයි බෝර්මන් සැක කළේය. මුළු යුද හමුදාව තමන්ට ද්‍රෝහී ලෙස කටයුතු කර තිබෙන බව හිට්ලර්ගේ විශ්වාසය විය. ඉතා නිර්භීත ලෙස හා පරම ආත්ම පරිත්‍යාගයකින් සටන් කළ වයසක පුද්ගලයන්ගෙන් සැදුම්ලත් සේනාවක්ද, හිට්ලර් තරුණ බළකායද මෙහෙය වූ ජනරාල් වෙයිඩ්ලින (WEIDLING) නායක තුමාගේ ආයුෂ දින කීපයකින් දික් කරනු සඳහා තම භටයන්ගේ ජීවිත නිකරුණේ බිලිදීම පිළිකුල් කෙළේය. දැන් රුසියන් හමුදා අගමැති කාර්යාලයට හූ සද්දයක දුරින් සිටින බව ඔහු විසින් හිට්ලර්ට දන්වන ලදී. වැඩිම වුනහොත් මැයි 1 දා වන විට එනම් තව දිනකින් හෝ දෙකකින් අගමැති කාර්යාලය අල්ලා ගන්නා බවට ඔහු අනාවැකියක් පළ කළේය.

Scanned with CamScanner

# 13

## හිට්ලර් දිවි නසා ගනී

මේ තමා අවසානය! මෙතෙක් අහසේ මාළිගා තනමින් හුන් හිට්ලර්ට හරි සිහිය ලැබුණේ මේ අවස්ථාවේය. ප්‍රලය වූ යකැදුරන් අදෘශ්‍යමාන භූතයන්ට හඬ ගසන්නාසේ, බර්ලිනය රකින්නට වරෙල්ලායි කොහේවත් නැති සේනාංකවලට බිම්ගෙයි හිඳ අණ දෙමින් සිටි මහා ආඥාදායකයාටද දූන් එළඹ ඇත්තේ තීරණාත්මක අවසන් මොහොත බව ප්‍රත්‍යක්ෂ විය.

හිට්ලර් සිය අවසන් නිවේදනය ලිව්වේය. එය ලියන ලද්දේ සේනානායක කෙයිටල්ටය. ඒ ලියැවිල්ල ගෙන ගොස් ඔහුට බාර දෙන්නැයි බෙලෝට අණ කරන ලදී. බර්ලිනය රැකීමේ සටන පරාජය වීමට ඉතා ආසන්න බවත් ගෝරිං සහ හිම්ලර් තමා පාවාදී ඇති බවත් තමාගෙන් පසු රාජ්‍ය නායකත්වයට ඩොයොනිට්ස් පත් කර ඇති බවත් හිට්ලර් සිය අවසන් ලියවිල්ල මඟින් කෙයිටල්ට දැනුම් දී සිටියේය. යුද හමුදාවේ සාමාන්‍ය භටයන් හොඳින් සටන් කළ මුත් සෙන්පති වරුන් හරියාකාර සිය රාජකාරිය ඉටු නොකළ බවත් ගුවන් හමුදාව (ගෝරිං හැරෙන්නට) මනා ලෙස ක්‍රියා කර ඇති බවත් පැවසූ හිට්ලර් ඉතාම දක්ෂ ලෙස සටන් කළේ නාවික හමුදාව බව පැවසුවේය. හිට්ලර් මෙසේ ද ඒ ලිපියෙහි සඳහන් කළේය.

''මහජනයා සහ යුද හමුදාවත් මේ දීර්ඝ සහ අසීරු අරගලයේදී ඉතා හොඳින් ක්‍රියා කර තිබේ. ඔවුන් විසින් කරන ලද පරිත්‍යාගය අතිමහත්ය. එහෙත් මගේ විශ්වාසදායකත්වය බොහෝ පුද්ගලයන්

Scanned with CamScanner

විසින් අනිසි ලෙස ප්‍රයෝජනයට ගන්නා ලදී. ද්‍රෝහිකම හා පාවාදීම හේතු කොට ගෙන යුද්ධය කෙරුණු මුළු කාලය තුළ දීම සටන අඩපණ විය. එනිසා ජනතාව ජය ස්ථම්භය කරා මෙහෙයවීමට මට හැකියාවක් නොතිබිණි. යුද හමුදා මහ නිලධර මණ්ඩලය පළමු වෙනි ලෝක යුද්ධයේ මහ නිලධර මණ්ඩලය සමඟ සැසඳිය නොහැකිය. එහි ක්‍රියා කලාපය සටන් වැදුණු සාමාන්‍ය භටයන්ගේ ක්‍රියාකලාපයට වඩා බෙහෙවින් පහත් විය.''

ජර්මන් ආඥාදායකයා කෙයිටල්ට යැවූ ලිපියේ අවසානයෙහි මෙසේ සඳහන් වී තිබුණි. ''මේ සංග්‍රාමයේදී ජර්මන් ජනතාව දැරූ ප්‍රයත්නය හා කළා වූ පරිත්‍යාගය කෙතරම් විශාල ද කිව හොත් ඉන් පලක් නොවිය යි කීමට මා සූදානම් නැත. තවමත් අපේ අරමුණ විය යුත්තේ ජර්මන් ජනතාව සඳහා නැගෙනහිර දෙසින් බිම් පෙදෙස් අල්ලා ගැනීමය.''

හිට්ලර් විසින් ජීවතුන් අතර සිටියදී ලියන ලද අන්තිම වාක්‍යය ඉහත සඳහන් පාඨය යයි කියනු ලැබේ. ඒ පාඨය කෙළින්ම ''මෙයින්කාම්ප්'' (මගේ සටන) නම් වූ ඔහුගේ පොතින් උපුටා ගත්තකි.

කෝටි ගණන් ජර්මානුන්ගේ ජීවිත වැනසී ගිය නමුත් ලක්ෂ ගණන් ජර්මන් ගෙවල් දොරවල් පොළවට සමතලා වූ නමුත්, දහස් ගණන් ජර්මන් නගර හා ගම්මාන දැවී අළු වී ගිය නමුත්, නැගෙනහිර යුරෝපයේ විසූ ස්ලැව් ජාතිකයන්ගේ නිජබිම් ජර්මනියට ඈඳා ගැනීමේ ප්‍රයත්නය හුදෙක් ජර්මන් සිහිනයක් බව මේ ප්‍රතාපවත් ජර්මන් සිංහයාගේ මොළයට අන්තිම මොහොතේදීවත් ප්‍රත්‍යක්ෂ වූ බවක් නොපෙනේ.

අප්‍රේල් 29 දා සවස පිටස්තර ලෝකයෙන් හිට්ලර්ගේ බිම්ගෙය තුළට ලැබුණු අන්තිම ආරංචි කිහිපයෙන් එකක් හිට්ලර් සහ එහි සිටි ඔහුගේ සගයන් කම්පනයෙන් ප්‍රකම්පනයට පත් කිරීමට සමත් විය. හිට්ලර්ගේ සගයා වූ ඉතාලි ආඥාදායක බෙනිටෝ මුසෝලිනී මරා දමලා! බිම්ගෙය කම්පා කළ පුවත ඒකයි! මේ විසිවෙනි සියවසට නූතන ආඥාදායක පාලන ක්‍රමය හඳුන්වාදුන් පුද්ගලයා බෙනිටෝ මුසෝලිනිය. සාමාන්‍ය පවුලකින් පැවත ආ ඉතාලි හමුදාවේ සාමාන්‍ය යුධ භටයෙකු වූ මුසෝලිනී ඉතාලියේ ආඥාදායක පාලකයා වූයේ හිට්ලර් ජර්මනියේ ආඥාදායකයා වීමට

වසර ගණනාවකට පෙරය.

''පැසිස්ට් වාදය'' යන ජුගුප්සා ජනක වචනය ලොවට හඳුන්වා දුන් මිනිසා ඔහුය. ඔහුගේ පක්ෂය හැඳින්වූයේ පැසිස්ට් පක්ෂය යනුවෙනි.

මුලදී සමාජවාදී සටන් පාඨ හඬ ගාගෙන බලයට ආ මුසෝලිනී අන්තිමේ මෘග ආඥාදායක රජයක් පිහිටුවා ධනේශ්වර ක්‍රමයේ ප්‍රධාන ආරක්ෂකයෙකු බවට පත්විය. එහෙත් ඔහු තුළ හිට්ලර්ගේ බුද්ධි මහිමය හෝ අභීත භාවය හෝ විචක්ෂණ ශක්තිය හෝ නොතිබුණි.

බ්‍රිතාන්‍යය හා ප්‍රංශය ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කළ පසු ටික කලක් දෙපැත්තට වැනෙමින් සිටි ඉතාලි ආඥාදායකයා යුද්ධයේ මුල් හරියේදී ජර්මනිය ජයෙන් ජය ලබමින් ඉදිරියට යනු දැක හිට්ලර්ගේ පැත්ත ගත්තේය. එයම ඔහුගේ විනාශයට මුල්විය.

හිතේ දෙගිඩියාවෙන් සටන් කළ ඉතාලි හමුදා සහ ඔවුන් ගේ සහායට පැමිණි ජර්මන් හමුදා මිත්‍ර පාක්ෂික සේනා විසින් පරාජය කරන ලද අතර මුසෝලිනී අන්තිමේ සිය පෙම්වතිය වූ ක්ලාරා පෙටාචි කැටුව රටින් පැන ගියේය. මුසෝලිනී විරෝධී ඉතාලි ජාතික කොමියුනිස්ට් කැරලි භටයන් විසින් ස්විසර්ලන්තයේදී මුසෝලිනී යුවල අල්ලා ගන්නා ලදහ. මුසෝලිනි කොමියුනිස්ට් කැරලිකරුවනට හසු වූයේ 1945 අප්‍රේල් 26 දාය. ඊට දින දෙකකට පසු මුසෝලිනී හා ඔහුගේ පෙම්වතිය වූ පෙටාචි බිත්තියකට හේත්තු කර වෙඩි තබා මරණ ලදහ.

මුසෝලිනී ගේ අවසන් වචන වූයේ ''එපා! එපා! එපා!'' යන්න පමණි. අප්‍රේල් 28 වන දා ලොරියක පටවා ගෙන ඉතාලියේ මිලාන් නුවරට ගෙන ආ මළ කුණු දෙක පාරේ පැත්තක හෙළන ලදී. ඉතාලි ජාතිකයෝ මළගිය ආඥාදායකයාට බැණ වදිමින් හා කෙළ ගසමින් නැහැය මිරිකාගෙන එතැන පසුකර ගියහ. පසුදා මේ මළ සිරුරු ලයිට් කණුවක දෙකකුලෙන් එල්ලා තබන ලදී. එය ඉරිදා දිනයක් විය. පැය කිහිපයකට පසු යළි බැමි කපා මළ සිරුරු පහන් කණුවෙන් පහතට ගෙන පාර අයිනේ කාණුවකට විසි කෙරිණි. මැයි දිනයේදී (මැයි 1 දා) ඉතාලි ආඥාදායකයා සහ ඔහුගේ පෙම්වතිය මිලානයේ සුසාන භූමියක යාචකයන්ට හිමි බිම්

Scanned with CamScanner

කොටසෙහි වළලා දමන ලදහ.

බලය ලත් දා සිට ඔළුවෙන් සිටගෙන සිටි ආඥාදායකයකු අන්තිමේදී දෙකකුලින් එල්ලී පොළොවට පස්වූ අයුරුය ඒ.

XXXXXX

දෙවෙනි ලෝක යුද්ධයේ හවුල්කාරයකු වශයෙනුත් දේශපාලන දර්ශනය අතින් සමාන මතධාරියකු වශයෙනුත් හුන් ඉතාලි ආඥාදායක බෙනිටෝ මුසෝලිනීට හා ඔහුගේ පෙම්වතියට අත් වූ ඛේදනීය ඉරණම සැළවූ වහාම හිට්ලර්ද තමන්ගේ හා තම පෙම්වතියගේ ජීවිතාවසානයට සූදානම් වූයේය.

බිම්ගෙය තුළ හිට්ලර් සමඟ විසූ "බ්ලොන්ඩි" නමැති ඔහුගේ සුරතල් ඇල්සේශන් බැල්ල පළමුවෙන්ම වස දී මරණ ලදී. ඌට වස දෙන ලද්දේ බිම් ගෙයි සිටි සමහරුන් පාවිච්චි කිරීමට බලාපොරොත්තු වූ වස වර්ගය, කෙතරම් සාර්ථක ප්‍රතිඵල ගෙන දේ දැයි පිරික්සීමටත් සමඟය. බිම්ගෙයි හුන් තව ඇල්සේශන් බල්ලන් හය දෙනෙක් වෙඩි තබා මරා දමන ලදහ.

ඊළඟට ඔහු කළේ ලේකම් වරියන් දෙදෙනා තමන් වෙත කැඳවීමය. "ම්ලේච්ඡ රුසියානුන්" බිම්ගෙය තුළට යම් හෙයකින් කඩා වැදුනහොත් ක්ෂණයෙන් දිවි නසා ගත හැකි හලාහල විෂ වර්ගයක් හිට්ලර් විසින් ඔවුනට බෙදා දෙන ලදී. එකිනෙකා ගෙන් අවසන් වශයෙන් සමුගන්නා විට මීට වඩා හොඳ තෑග්ගක් පිරිනැමීමට නොහැකිවීම ගැන හිට්ලර් ඔවුන් කෙරෙහි කණගාටුව පළ කළේය. දිගු කලක් මුළුල්ලේ භක්තිමත්ව තමන් හට සේවය කිරීම ගැනද ඒ කාන්තාවන් දෙදෙනාට ජර්මන් ආඥාදායකයාගෙන් මල් මිටක් පිදුණි.

සැඳෑ අඳුරින් බර්ලිනය වැසීයන්නට පටන් ගත්තේය. මේ හිට්ලර්ගේ ප්‍රභාමත් ජීවිතයේ අන්තිම ආලෝක ධාරාව වැසී වැනසී යන 1945 අප්‍රේල් 29 දා අහස් කුසින් ගලා ආ සැඳෑ අඳුරයි.

බිම්ගෙයි තිබුණු සෙසු සියලු ලියවිලිද විනාශකර දමූ හිට්ලර් තමන්ගේ අවසරයක් නැතිව නින්දට නොයන ලෙස සියල්ලනට නියෝග කළේය. හිට්ලර් තමන්ගෙන් අන්තිම වරට සමුගැනීමට සැරසෙන බව ඒ නියෝගයෙන් බිම්ගෙය තුළ වූ සියල්ලනට ඒත්තු ගියේය. එහෙත් ඇත්ත වශයෙන් හිට්ලර් ස්වකීය කුටියෙන්

Scanned with CamScanner

එළියට ආයේ පසුදා (30 දා) අලුයම 2. 30 ට පමණය. එසේ එළියට ආ විට එතැන රැස් වී හුන් විසි දෙනෙකු පමණ ඔහුට මුණ ගැසුණි. ඉන් වැඩි දෙනා බිම්ගෙයි විසූ කාන්තාවන්ය. හිට්ලර් ඒ හැම දෙනාටම අතට අත දී ආචාර කොට නො ඇසෙන සිහින් හඬකින් මොනවාදෝ කොඳුළේය. ඔහුගේ දෑස තෙත්වී තිබුණේය. හිට්ලර්ගේ දෑසින් දිස්වූයේ බිම් ගෙයින් ඈත එපිට තැනකට ඔහුගේ බැල්ම යොමු වී ඇති බවෙකි.

හිට්ලර් කළ මේ සමුගැනීමෙන් පසු අපූරු දෙයක් සිදු විය. දින ගණනාවක් මුළුල්ලේ සන්ත්‍රාසයෙන් ඇළලී දුක් මුසුව හුන් බිම්ගෙයි පදිංචි කරුවෝ ක්ෂණික ප්‍රහර්ෂයකට පත්වූවා සේ භෝජනාගාරයට ගොස් එහිදී ගී ගයන්නට හා නටන්නට පටන් ගත්හ. ඔවුන්ගෙන් නැගුණු හඬ කොතරම් ඝෝෂාකාරී වීද යත් නිහඬවන ලෙස නායක තුමාගෙන් අණක් නිකුත් විය. හිට්ලර්ගේ ග්‍රහණයෙන් මිදීම හා රුසියානුන් අතට අසු නොවී පලා යාම යන දෙකරුණම ඉටුකර ගත හැකි බව දත් ඔවුහු මුළු රෑ මුළුල්ලේ නටන්නට වූහ.

එක් පුද්ගලයෙක් පමණක් මේ ප්‍රමෝද ජනක හැසිරීමෙන් වැළකී සිටියේය. ඒ මාර්ටින් බෝර්මන්ය. තව වැඩ කිහිපයක් කිරීමට මේ මිනිසාට ඉතිරි වී තිබුණි. ජීවිතය බේරා ගෙන මේ මරු කපොල්ලෙන් පැන ගැනීම ඔහුගේ ප්‍රධාන අභිප්‍රාය විය. තමන්ගේ පරම සතුරා වූ ගෝරිංගෙන් පළි ගැනීම අනෙක් අභිප්‍රාය විය. බර්ලිනය බේරා ගැනීම සඳහා වහා පියවර ගන්නැයි හේ ඩොයෙනිට්ස් දැන්වීය.

එහෙත් මේ වන විට මුළු මහත් බර්ලින් නගරය සෝවියට් රතු හමුදාව අතට පත්වී තිබුණි. අල්ලා ගැනීම සඳහා රුසියානුන්ට ඉතිරිව තිබුණේ අගමැති කාර්යාල ගොඩනැඟිල්ල සහ හිට්ලර්ගේ බිම් ගෙය පමණි.

හෝරා යන්ත්‍රයේ තත්පර කටුවේ වේගවත් ධාවනය සමඟ හිට්ලර්ගේ සහ නාසි රජයේ ජීවිත කාලය වේගයෙන් ක්ෂය වී යන ලකුණු පැහැදිලිව පෙනුණි. එදා - හිට්ලර්ගේ ජීවිතයේ අවසාන දිනයේ - ඔහු සිය ලේඛිකාවන් දෙදෙනා සහ නිර්මාංශ ආහාරය පිසූ හිට්ලර්ගේ කෝකියා වූ මැන්සියාලි (MANZIALY) සමඟ දිවා භෝජනය ගත්තේය. මේ දිවා භෝජනයට සහභාගිවීමට තරම් හිට්ලර්ගේ නවක බිරිඳට (ඒවා බ්‍රෝන්ට) කුස ගිනි දැනුණේ නැත.

කිසිදාක මස් මාංශ නොකෑ, දුම් පානය නොකළ, මත් පැන් තොල නොගෑ ස්වකීය ආදරණීය නායකයා වෙනුවෙන් තමන් මේ පිළියෙල කළේ ඔහුගේ අවසන් ආහාර වේල බව මැන්සියාලි දැන සිටියේ නැත.

හිට්ලර් ඇතුළු පිරිස මෙසේ අන්තිම භෝජනය ගනිද්දී ඔහුගේ රියැදුරු එරික් කෙම්ප්කාට නියෝගයක් ලැබුණි. ඒ පැට්‍රල් ලීටර 200 ක් බිම් ගෙය තුළට වහාම ගෙනෙන සේ නිකුත් කෙරුණු නියෝගයකි. මේ වන විට ඒ මාරක දිනයේ හෝරාව හවස 2. 30 පමණ විය. එතරම් විශාල පැට්‍රෝල් තොගයක් සොයා ගැනීම කෙම්ප්කාට අපහසු වූ මුත් අතනින් මෙතනින් ලීටර 180 ක් ඒකරාශී කර ගැනීමට හේ සමත් විය.

අනතුරුව හිට්ලර් කළේ ඊවා බ්‍රෝන් සහ ඔහුගේ ඉතාම කුළුපග සගයන් අවසන් සමුගැනීම සඳහා කැඳවීමය. ආචාර්ය ගොබෙල්ස්, සෙන්පති ක්‍රෙබ්ස්, බූර්ගෝඩෝර්ෆ්, ලේකම්වරියන් දෙදෙනා සහ කෝකියා ආදීහු මෙසේ වෙසෙස් ඇරයුම් ලද්දෝ වූහ. ගොබල්ස් මැතිණිය මේ පිරිසට අයත් වූයේ නැත. නායක තුමා වෙනුවෙන් සිය සැමියා සමඟ දිවි තොර කර ගැනීම මේ සුන්දර ලලනාවට කම් නොවීය.

එහෙත් ඇගේ සුරතල් දරු හය දෙනා? පසු ගිය කෙටි කාලය තුළ බිම් ගෙයි අතන මෙතන දුව පනිමින් සෙල්ලම් කරමින් සිටි සුරතල් දූ පුතුන් සදෙනා මවක විසින් කෙසේ මරා දමන්නද?

මේ ප්‍රශ්නය නිසා ගොබල්ස් මැතිණියගේ සිහි විකල්වන්නට ඇත. මීට දින දෙක තුනකට උඩදී ගොබල්ස් මැතිණිය ගුවන් නියමු හැනා රෙයිෂ් මෙනෙවිය අමතා මෙසේ පවසා තිබුණි.

"අනේ මගෙ ආදර හැනා, අවසන් මොහොත ළඟාවූ විට දරු පැටවුන් මරා දැමීමට මට ආත්ම ශක්තිය නොතිබුණොත් ඔයා මට උදව් වෙන්න ඕනෑ. ඔවුන් අයිති රජයට හා නායක තුමාටය. රජයත් නායක තුමාත් නැතිදාට ඔවුනට ඇති තැනක් නැත. මට තිබෙන ලොකුම බය අන්තිම මොහොතේදී මට ඒ වැඩේ කරන්නට තරම් ශක්තියක් නොතිබේවිද යන්නයි."

ස්වකීය කුඩා කුටිය තුළට වී දරු සදෙනාට තව මොහොතකින් මුහුණ පෑමට සිදුවන අනපේක්ෂිත ඉරණම ගැන ගොබල්ස් මැතිණිය කඳුළු සලන්නට වූවාය. ගොබල්ස් පවුලේ දරු සදෙනාගෙන්

වැඩිමලාගේ වයස අවුරුදු 12 ක් අතර බඩ පිස්සා අවුරුදු 3 ක සිඟිත්තෙක් විය. හිට්ලර්ට හා ඊවාට මෙබඳු උභතෝකෝටික ප්‍රශ්නයක් තිබුණේ නැත. ඒ ඔවුන්ට දරුවන් නොසිටි හෙයිනි.

XXXXXX

හිතවතුන් ගෙන් සමුගැනීම හමාර කළ හිට්ලර් සහ ඔහු ගේ නවක මනාලිය සිය කුටිය තුළට ඇදී ගියහ. ඒ කුටිය කරා විහිදුණු කොරිඩෝරයේ ආචාර්ය ගොබල්ස්, බෝර්මන් සහ තව ස්වල්ප දෙනෙක් රැඳී සිටියහ. ටික වේලාවකින් ඔවුන්ට වෙඩි හඬක් ඇසුණි. ඒ හිට්ලර්ගේ කාමරය තුළිනි. තව වෙඩි හඬක් ඇසේ යයි ඔවුහු බලාපොරොත්තුවෙන් සිටියහ. එහෙත් ඒ වෙනුවට පැවැතියේ දැඩි නිහඬතාවයක් පමණි.

සෑහෙන තරම් කාලයක් ගෙවී ගිය පසු ඔවුහු නායක තුමාගේ කාමරය තුළට සෙමින් සෙමින් පිය නැගුහ. එහිදී ඔවුන් නෙත ගැටුණේ සෝපාවක දිගා වී තිබුණු ඇඩොල්ෆ් හිට්ලර්ගේ ලේ ගලන මළ කඳයි. හිට්ලර් මුව තුළට වෙඩි තබා ගෙන තිබුණි. ඔහු පසෙකින් වූයේ කවදත් ඔහුගේ සෙවනැල්ල මෙන් සිටි ඊවා බ්‍රෝන්ගේ අප්‍රාණික සිරුරය. දිවි තොර කරගෙන තිබුණේ වස වර්ගයක් පානය කිරීමෙනි. රිවෝල්වර දෙකක් බිම වැටී තිබෙනු දක්නා ලදී.

**දැන් වේලාව 1945 මැයි 30 දා පස්වරු 3. 30 යි යුරෝපයේ අසහාය ආඥාදායකයා හා ජර්මන් ජනතාව ගේ අනුපමේය වීරයා වූ ඇඩොල්ෆ් හිට්ලර්ගේ 56 වෙනි ජන්ම දිනය ඉක්ම ගොස් දින දහයයි! ජර්මන් දෙරණ මත හිට්ලර්ගේ ජාතික සමාජවාදී රජය පිහිටුවා හරියටම 12 වසරකුත් මාස 3 යි.**

''හිට්ලර් තරුණ බළකායේ'' නායකයා වූ ආතර් ආක්ස්මාන් බිම්ගෙය තුළට ළඟා වන විට ස්වකීය පරමාදරණීය, නායක තුමාගේ අවසන් සුසුම අවට වාතය සමඟ මුසුවී හමාරය. එහෙත් කාමරයට ඇතුළු වූ හේ හිට්ලර් - ඊවා යුවළ ගේ මළ කඳන් දෙස නෙත් යොමා ගෙන බර කල්පනාවක නිමග්න විය.

ඔහු මෙසේ මළ සිරුරු අසල නිසලව සිටියදී ඇස්. ඇස්. බලකායේ භටයෝ දෙදෙනෙක් එතැනට ආහ. ඔවුහු හිට්ලර්ගේ සුනු විසුනු ව සහ ලේ ගලමින් තිබුණු හිස වැසීයන පරිදි මළ

Scanned with CamScanner

සිරුර රෙදි කඩකින් එතූහ. ඉන් පසු මළ සිරුර එළියට ඔසවාගෙන යන ලදී. සුපුරුදු කළු කලිසම දුටු අය ඒ යන්නේ අප්‍රාණික හිට්ලර් බව අවබෝධ කර ගත්හ. එයින් පසු කාමරයට පිවිසි මාටින් බෝර්මන්, ඊවා බ්‍රෝන්ගේ මළකඳ දෑතින් ඔසවා ගත්තේය. ඇගේ මළ සිරුර කැත විදියට තුවාල වී නොතිබුණ හෙයින් එය රෙදි කඩකින් වසාලීම අනවශ්‍ය වීය. මඟක් දුරදී ඇගේ මළ සිරුර බාරගත් ඇස්. ඇස්. භටයෝ එයද අගමැති මන්දිරයේ ආලිංගනයට ගෙන ගියහ. එහිදී හිට්ලර්ගේ සහ ඊවා බ්‍රෝන්ගේ මළ සිරුරු පැට්‍රෝල් දමා පුළුස්සන ලදී. මිනී මස් පිළිස්සෙන පුළුටු ගඳ ඉවසාගත නුහුණු ඇතැම්හු එතැනින් ඉවතට ඇදී ගියහ.

ජගත් ඉතිහාසයේ සහ මානව වංශයේ ඉරණම සහ ගමන් මඟ සහමුලින් හා සාකල්‍යයෙන් වෙනස් කළ ආර්ය වංශික මහා පුරුෂයාට අන්තිමේ අත්වුණ ඉරණම හා ගමන් මඟයි ඒ.

Scanned with CamScanner

# 14

## සතුරු සේනාවෝ බිම් ගෙට කඩා වදිති

පුරා දොළොස් වසරක් ජර්මනියේ ඇවිලුණු නාසි වාදයේ මහා අග්නි ජාලාව ක්‍රම ක්‍රමයෙන් නිවී ගොස් අන්තිම ගිනි පුලුඟ පමණක් ඉතිරි වී තිබෙන විට ගෝරිං, හිම්ලර් වැනි හිට්ලර්ගේ ප්‍රධාන පෙළේ සගයන් සතුරා (මිත්‍ර පාක්ෂික රටවල් වන බ්‍රිතාන්‍යය, ඇමරිකාව, ප්‍රංශය ආදිය) සමඟ කුමන්ත්‍රණය කරමින් එතෙක් කල් ඔවුන් කෙරෙහි අචල විශ්වාසය තැබූ ජර්මන් ජනතාව සහ එතෙක් කල් දෙවියකු ලෙසින් අදහන ලද ස්වකීය නායකයාවූ හිට්ලර් පාවාදී තම තමන්ගේ ජීවිත බේරා ගැනීමටත් අධම ද්‍රෝහීකම් වල යෙදී සිටියදී එක් පුද්ගලයෙක් පමණක් තමන් අනුගමනය කළ නායකයා සහ නිවැරදි යයි තමන් ඇදහූ දේශපාලන දර්ශනය (නාසිවාදය) වෙනුවෙන් උපරිම පරිත්‍යාගය කිරීමට සූදානමින් සිටියේය.

ඒ තමා ජෝසප් ගොබල්ස්!

නාසි පක්ෂයේ ආත්මය හිට්ලර් වීනම් එහි මොළය වූයේ ආචාර්ය ගොබල්ස්ය. පක්ෂය තුළ වුන් ශ්‍රේෂ්ඨ බුද්ධිමතා වශයෙන් ඔහුට නාසි පක්ෂය හා රජය තුළ සුවිශේෂ තැනක් හිමි වී තිබුණි.

නාසි රජයේ ප්‍රචාරක ඇමැති වරයා වූ ගොබල්ස් ''ටොන් පචයකු'' ලෙසින් බටහිර රටවල් විසින් හඳුන්වන ලද්දේය. වෙනෙකක් තබා පචයා යන අරුත ගෙන දෙනු සඳහා ඔහුගේ නම ඉංග්‍රීසි භාෂා සම්ප්‍රදායට ද ඇතුළු කර ගෙන තිබේ.

හිට්ලර් සම්බන්ධයෙන් මෙන්ම ගොබල්ස් සම්බන්ධයෙන් ද

Scanned with CamScanner

බටහිර රටවල් සහ රුසියාව පතුරා ඇති වැරදි මත අපමණය. ඒවා ඉතිහාස ග්‍රන්ථ වලට පවා ඇතුළත් කර තිබීම කණගාටුවට කරුණකි.

එකල බ්‍රිතාන්‍ය පාලනය යටතට පත්ව සිටි අයට හා බටහිර රටවල හා රුසියාවේ අණසක තුළ හුන් අනෙක් රටවලට දිවා රෑ අසන්නට ලැබුණේ පැත්තකට බරවූ ආරංචිය. අපට පෙන්වන ලද්දේ කාසියේ එක පැත්තක් පමණි. ජර්මන් නාසි නායකයන් හා නාසි රජය ගැන තවමත් ලෝකයා ඒ දුර්මත අදහන්නේ ඒ නිසාය. පරාජය වූ මිනිසකුට විරුද්ධව අපවාද හා අවලාද නැඟීම් ඉතා පහසු කරුණකි. හිට්ලර්ලා, ගොබල්ස්ලා, ගෝරිංලා, හිම්ලර්ලා, රොමෙල්ලා, කෙයිටල්ලා, රිබන්ට්‍රොප්ලා, හෙස්ලා, යම පල්ලන් පිරිසක් ලෙසින් හැඳින් වීම දූන් ඉතා පහසු කරුණකි.

යම් හෙයකින් දෙවන ලෝක යුද්ධයෙන් ජර්මනිය ජයග්‍රහණය කළේ නම් මේ තත්ත්වය නොපිට පෙරළෙනු නිසැකය. එසේ වී නම් අද ඒ ජර්මන් නායකයන් තරම් ධීර වීර පුරුෂෝත්තමයන් තව කොහෙන් සොයන්නද?

ඉතිහාසය නිතරම පරාජය වූ පුද්ගලයා හෙළා දුටුයේය. ජයග්‍රහකයා අහස උසට නංවාලීය.

ඇලෙක්සැන්ඩර් ''මහා ඇලෙක්සැන්ඩර්'' වීරයා විය. ඔහු සමඟ මාරාන්තික සටනක යෙදුණු ඩේරියස් රජ ''නිවටයෙක්'' වූ.

රෝමයේ සීසර්ලා මහා වීරයන්ය. එහෙත් අති ප්‍රබල රෝම අධිරාජ්‍යය සමඟ සටන් කොට එම මහ බලගතු අධිරාජ්‍යය දෙදරවා වූ හැනිබල් ''දුෂ්ඨයෙකි.''

ඇමෙරිකානු යටත් විජිත වාසීන් බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව කළ ආයුධ සන්නද්ධ අරගලය අසාර්ථක වී නම් නිදහස් ඇමෙරිකාවේ ප්‍රථම ජනාධිපතිවූ ජෝර්ජ් වොෂින්ටන් ඉතිහාසයට ඇතුළුවනු ඇත්තේ ගසක අත්තක එල්ලා මරණ ලද රාජ ද්‍රෝහියකු ලෙසිනි. එහෙත් අරගලය ජයග්‍රහණය කළ නිසා අද අපට ජෝර්ජ් වොෂින්ටන් නමින් දේශ ප්‍රේමියකු ගැනත් අමරිකානු විමුක්ති යුද්ධයක් ගැනත් අසන්නට ලැබේ.

රුසියන් විප්ලවය පරාජය වී නම් ලෙනින් 'ට්‍රොට්ස්කි, ස්ටාලින්' ආදීන් ''ත්‍රස්තවාදීන්ය'' එය ජයගත් නිසා දූන් ඔවුන්ගේ සොහොන් කොත් අභියස ලංකාව වැනි ඈත එපිට රටවලින් පවා මල් වඩම් පිදේ.

ලොවැ මෙතෙක් පහළ වූ ශ්‍රේෂ්ඨතම රාෂ්ට පාලකයෙක් හා සමාජ ශෝධකයෙක් මෙන්ම අග්‍ර ගණ්‍ය රණ ශූරයෙක්වූ නැපෝලියන් ''යුද්ධ කාමියෙකි.'' ඔහු පරාජය කළ ඉංග්‍රීසි ජාතික වෙලින්ටන් සාමී ශ්‍රේෂ්ඨ මානව ප්‍රේමියෙක්ලු.

සිංහල රාජ්‍යය ද්‍රවිඩ රජ පරපුරෙන් මුදා ගැනීමට ජීවිත පරිත්‍යාගයෙන් සටන් වැදුණු පිලිමතලව්වලා ඇහැලේපොළලා, කේලම්කාරයන්ලු, ද්‍රෝහියන්ලු, ඔවුන්ගේ දුනු හී සමඟ කාල තුවක්කු වලින් සටන් වැදුණු බ්‍රිතාන්‍යයන් හා සිංහල බෞද්ධ ඉතිහාසය කෙළෙසූ ශ්‍රී වික්‍රම රාජසිංහ නීති ගරුක උත්තමයන්ලු, 1818 දී, 1848 දී හා 1915 දී සිංහල ජාතියේ නාමයෙන් දිවි පිදූ කැප්පෙටිපොළලා, ගොන්ගාලෙ බණ්ඩලා, පේදිරිස්ලා, ''කැරලි කරුවන්ය.'' ඔවුන්ගේ හිස අසිපතින් වෙන්කළ හෝ පපුව වෙඩි උණ්ඩවලින් සිදුරු කළ අධිරාජ්‍යවාදී මංකොල්ලකාරයන් සහ ඔවුන්ගේ දෙපා ලෙව කෑ නිවට ස්වදේශිකයන් යුක්ති ගරුක මිනිසුන්ය!

ඉතිහාසය විසින් පරාජිතයා වළලා දමා ජයග්‍රාහකයා කර උඩට ගනු ලබන්නේ ඔය අන්දමිනි.

හිට්ලර්, ගොබල්ස්, මුසෝලිනී, ටෝජෝ ආදී ජර්මන් ඉතාලි හා ජපන් නායකයන් සම්බන්ධයෙන් ඔවුන්ගේ පරම සතුරන් වූ බටහිර රටවල් කර තිබෙන ප්‍රචාරයන් පරෙස්සමෙන් හා විමංශනයෙන් යුතුව විශ්වාස කිරීම ශාස්ත්‍රාභිලාෂීන් සතු කාර්යයකි.

යුධ සමයේදී ගුවන් විදුලිය හා පුවත් පත් මගින් ගොබල්ස් අමූලික බොරු ප්‍රචාර කළේ යැයි චෝදනා කරන පුද්ගලයන්ම ඊට නොදෙවෙනි බොරු ස්වකීය ප්‍රචාරක මාධ්‍යයන් ඔස්සේ පතුරා හළ බව නොරහසකි.

නාසි වාදයේ හෙවත් ජාතික සමාජ වාදයේ වක්තෘවරයා වූයේ ආචාර්ය ගොබල්ස්ය. ඔහු වඩාත් අගයකොට සැලකුවේ නාසි වාදයේ චිර ජීවනය විනා තමන්ගේ ජීවනය නොවේ.

අන් හැම නායකයකුම හිට්ලර් පාවාදී සිටියදී, බර්ලිනයෙන් පලා ගොස් සිටියදී ගොබල්ස්ගේ උදාර චරිතය එබඳු පියවරක් ගැනීමට ඔහුගේ සිතට ඉඩ නුදුන්නේය. අන්තිම මොහොතේ බෝර්මන් පවා දිවි ගලවාගෙන පලා යාමට යෝජනා කළේය. එහෙත් ගොබල්ස් ඒ යෝජනාව එකහෙලා ප්‍රතික්ෂේප කළේය. අන්තිම දවස් කීපය තුළ චතුර ගොබල්ස් ගේ උද්වේග ජනක

කතාවලින් බිම්ගෙය රැව් පිළිරැව් දුන්නේය. ඔහු ගෝරිං, හිම්ලර් ආදි සියලු ද්‍රෝහීන් නරයේ හෙළා දුටුයේය. නාසි ජර්මනියේ හොඳ පැත්තට මෙන්ම නරක පැත්තටද හිට්ලර් සේම තමන්ද සැහෙන දුරට වගකිව යුතු යයි පසක්කරගෙන සිටි ගොබල්ස් හිට්ලර්ගේ අන්තිම කැමති පත්‍රයට අත්සන් තැබීමෙන් පසු සිය කාමරයට පිවිසියේය. එහිදී ඔහු ''නායකතුමාගේ දේශපාලන අන්තිම කැමති පත්‍රයට අතිරේක ලේඛනයක්'' යන හිසින් ලියවිල්ලක් සටහන් කිරීමට පටන් ගත්තේය. ඒ මෙසේය.

XXXXXX

''රාජ්‍යය ආරක්ෂා කිරීමේ කාර්ය අසාර්ථක වුවහොත් බර්ලිනයෙන් පිටමංවී ඔහු විසින් පත් කරන ලද ආණ්ඩුවේ ප්‍රමුඛයෙකු වශයෙන් කටයුතු කරන්නැයි නායකතුමා මට විධානය කර තිබේ.

''මගේ ජීවිතයේ ප්‍රථම අවස්ථාවට මගේ නායක තුමාගේ අණක් පිළි නොපැද සිටීමට මට බල කෙරී තිබේ. මගේ බිරිඳ හා දරුවන් ද මේ පියවරට එකඟය. එසේ නොකළහොත් එක අතකින් නායකතුමාගේ ඉතාම බරපතළ අවස්ථාවේ මානුෂිකත්වය හා භක්තිවන්ත භාවය උඩ ඔහු හැර දමා යාම නොහොබිනා දෙයක් වන්නාසේම, මාගේ සෙසු ජීවිතකාලය තුළදී මා අධම හා පවිටු පුද්ගලයකු වශයෙන් හැඳින්වෙනු නියතයි. එවිට මගේ හා සහෝදර රටවැසියන්ගේ ආත්ම ගෞරවය කෙළෙසී යන්නේය. ජර්මානු ජාතියේ හා රාජ්‍යයේ අනාගතය හැඩ ගැස්වීමේ කාර්යෙහි නිරතවීමට තව දුරටත් සිදුවුවහොත් මට ඒ ආත්ම ගෞරවය අවශ්‍ය වන්නේය.

''නායකතුමාට එරෙහිව සතර විටින් ද්‍රෝහිකම් සිදුවන මේ අවස්ථාවේ මිය යන මොහොත දක්වා කොන්දේසි විරහිතව ඔහු සමඟ රැඳෙන එක පුද්ගලයෙකු හෝ සිටිය යුතුය. නායකතුමා සිය අන්තිම කැමති පත්‍රය මගින් කර ඇති සාධාරණ විධානයන්ට මේ පියවර පටහැනි වුවද එය කළ යුතු දෙයක්ම වේ. ''මේ පියවර ගැනීමෙන් මා ජර්මන් ජනතාවට කළ හැකි විශිෂ්ටතම සේවය කරන බව මගේ හැඟීමය.'' ඉදිරියට ඇති කරදරකාරී කටුක සමය තුළ පුද්ගලයන්ට වඩා වැදගත් වනුයේ ආදර්ශයන්ය.

විමුක්තිය කරා ජාතිය මෙහෙයවනු සඳහා ඕනෑ තරම් පුද්ගලයන් සොයා ගත හැකි වන්නේය. එහෙත් පැහැදිලි ආදර්ශයන් පදනම් නොකරගෙන අපගේ ජාතික ජීවිතය ප්‍රතිසංස්කරණය කළ හැකි නොවන්නේය.

"මෙන්න මේ හේතු නිසා මගේ බිරිඳත්, මගේ දරුවනුත් (ඔවුන් තාම සිය අදහස් පළ කිරීමට කුඩා වැඩිමුත් ඔවුන්ට නිසි වයස ලබා තිබුණි නම් මේ තීරණයට එකඟ වනු ඇත.) වෙනුවෙන් මා කියා සිටින්නේ රාජ්‍යයේ අගනුවර ඇද වැටුනත් එය හැර දමා නොයෑමට අප තදින් අදිටන් කරගෙන තිබෙන බවය. මගේ නායකතුමාට තව දුරටත් මෙහෙ කිරීමට නොහැකි මේ ජීවිතයෙන් නිසි ඵලක් නැති නිසා ඔහු පසෙකින් මාද අවසන් සුසුම් හෙළනු ඇත."

ඉහත සදහන් ලේඛනය ගොබල්ස් විසින් අත්සන් කරන ලද්දේ අප්‍රේල් 29 දා පාන්දර 5 ටය. මේ අසහාය බුද්ධිමතාගේ විචක්ෂණ භාවය ඒ බියජනක හා තීරණාත්මක මොහොතේ පවා ඔහු කෙරෙන පලා ගොස් නොතිබුණු බව ඔහුගේ අන්තිම කැමති පත්‍රයේ වචන හා අදහස් වලින් ප්‍රකට වේ.

සුරතල් දරු පැටවුන් සය දෙනා සහ ආදරණීය බිරිඳ පවා නායකයා හා රට ජාතිය කෙරෙහි වූ භක්තිවන්ත භාවයේ අල්තාරය මත පිදීමට තරම් ගොබල්ස් කෙතරම් ඍජු පුද්ගලයෙකු වන්නට ඇත්ද? හිට්ලර් කොතරම් වශීකරණශීලි පෞරුෂත්වයකින් යුත් පුද්ගලයෙකු වන්නට ඇත්ද? හිට්ලර් වෙනුවෙන් දිවි පිදීමට සිදු වූ ගොබ්ස්ගේ දරු සය දෙනාම වයස 13 න් අඩු අය වූහ. හේලා (වයස 12යි.) හිල්ඩා (11), හෙල්මට් (9), ගෝල්ඩ් (7), හෙඩා (5), හයිඩ් (3) යන සදෙනා ඒ අකල් මාරක ඉරණමට ගොදුරු වූ දරුවන්ය.

XXXXXX

ඇඩොල්ෆ් හිට්ලර්ගේ සහ ඊවා බ්‍රෝන්ගේ මෘත දේහයන් පෙට්‍රල් දමා පුළුස්සන ලද්දේ ඒවා රුසියන් ෂෙල් වෙඩි වලින් හැරුණු වලක් තුළ තැන්පත් කිරීමෙන් පසුවය. වක් ලෙසින් හෝ රුසියානුවන් හිට්ලර්ගේ අවසන් කෘත්‍යය සඳහා වළක් හාරා දී තිබීම කෙතරම් අපූරු දෛවයෝගයක්ද?

එය ඉතා නිහඬ ආදාහනෝත්සවයක් විය. ශෝක ප්‍රකාශිත

ලියවිලි නොකියවුණි. ශෝක ප්‍රකාශිත කතාවක් නොපැවැත්වුණි. ශෝක ප්‍රකාශිත මල් වඩම් නොතැනිණි. එහෙත් එතැන් හුන් කාගේත් මුහුණු ශෝකයෙන් අඳුරු වලාවෙන් වැසී පැවති බවට සැකයක් නැත. ඒසා ප්‍රකට හා ප්‍රබල ජන නායකයකු වෙනුවෙන් මෙසා නිසල නිහඬ හා සරළ අවමංගලෝත්සවයක් ලෝක ඉතිහාසයේ කිසි කලෙක පැවැත්වී නැත.

ස්වල්ප දෙනෙකුගෙන් සමන්විත අවමඟුල් පෙරහැරේ පෙරමුණෙහි වූයේ ආචාර්ය ගොබල්ස් සහ මාර්ටින් බෝර්මන්ය. නායකතුමාගේ හා ඔහුගේ බිරිඳගේ සිරුරු දවාලන ගිනිදැල් අහසට නගිත්ම ගොබල්ස්, බොර්මන් සහ සෙසු අය සීරුවෙන් සිටගෙන දකුණත පපුව කෙලින් පෙරට ඔසවා නාසි ආචාරයෙන් නායකයාට අවසන් ගෞරවය පිදූහ.

හිට්ලර්ගේ බිම් ගෙය තුළ මෙතෙක් ජීවතුන් අතර හුන් ප්‍රධාන නාසි නායකයන් දෙදෙනා වූ ගොබල්ස්ගේ හා බෝර්මන්ගේ කරපිට මේ මොහොතේ පටන් විශාල වගකීම් සම්භාරයක් පැටවුණි.

ජර්මනියේ රාජ්‍ය නායකයා වශයෙන් කාර්ල් ඩොයෙනිට්ස් පත්කරමින් හිට්ලර් ලියූ අන්තිම කැමති පත්‍රය දූතයන් අත යවන ලද මුත් එය ඔහු අතට පත්වීමට තව කල් මදිය. ඒ නිසා වහාම ඔහුට රේඩියෝ පණිවුඩයක් යැවිය යුතු යැයි බෝර්මන් තීරණය කළේය.

"අධි අද්මිරාල් ඩොයෙනිට්ස්තුමනි,

කලින් රාජ්‍ය මාර්ෂල් ධූරය දැරූ ගෝරිං වෙනුවට නායකතුමා විසින් ඔබ රාජ්‍යාධිපති වශයෙන් පත්කර තිබේ. මේ පිළිබඳ ලිඛිත උපදෙස් මඟ එයි. ප්‍රස්ථානෝචිතව සියලු පියවර ගැනීම මෙතැන් පටන් ඔබට භාරය."

බෝර්මන් විසින් ඩොයෙනිට්ස් වෙත යවන ලද මේ විදුලි පුවතෙහි හිට්ලර්ගේ මරණය ගැන වචනයකුදු සඳහන් නොවීය.

හිට්ලර් වෙනුවට තමන් රාජ්‍යාධිපති වේ යයි හීනෙන්වත් නොසිතූ මේ නාවික නිලධාරියා නායකතුමාගේ අණසකට කිසිසේත් පිටුපෑමට අකමැති වූයෙන් හිට්ලර් තවම ජීවතුන් අතර ඇතැයි සිතා ඊට එකඟත්වය පළ කරමින් පිළිතුරු පණිවුඩයක් යැවීය.

එදා (30) දා රාත්‍රියෙහි ගොබල්ස්ගේ හා බෝර්මන්ගේ හිස් තුළ

Scanned with CamScanner

කදිම අදහස් පහළ විය. ඒ රුසියානුන් සමඟ සාම සාකච්ඡා පැවැත්වීමටය. මේ අසීරු කාර්යය සඳහා ඔවුන් තෝරාගත් පුද්ගලයා සෙන්පති ක්‍රේබ්ස්ය. ඔහු කලක් ජර්මන් තානාපති නිලධාරියෙකු වශයෙන් රුසියාවේ සිටි කෙනෙකි. රුසියන් බස කතා කිරීමේ හැකියාවද ඔහුට තිබුණි. වෙනෙකක් තබා රුසියන් ආඥාදායක ජෝසප් ස්ටාලින් විසින් දුම්රිය පලකදී ඔහු සිප වැළඳගෙන ආචාර කරනු ලැබුවෙකි.

ගොබෙල්ස්ට හා බෝර්මන්ට නව ජර්මන් ආණ්ඩුවේ නිලතල භාර ගනු සඳහා නිරුපද්‍රිතව බර්ලිනයෙන් පිට වී යාමට ඉඩ සලසන්නේ නම් බර්ලිනය රුසියානුවන්ට යටත් කරදීමට ඔවුහු කැමැත්ත පළ කළහ. අප්‍රියෙල් 30 දා මැදියම් රැයෙහි බර්ලිනයේ සටන් කළ රුසියන් සේනාංකවල අග්‍ර සේනාධිපති චුයිකොව් මුණ ගැසෙනු සඳහා ක්‍රේබ්ස් සෙන්පතියා පිටත් විය. දෙදෙනා අතර වූ සාකච්ඡාව එහි ගිය වෙනත් ජර්මන් නිලධාරියෙකු විසින් වාර්තා කරන ලද්දේ මෙසේය.

''ක්‍රේබ්ස් - අද මැයි පළමු වැනි දා. අද අපි ජාතීන් දෙකටම වැදගත් උත්සව දිනයක්.''

''චුයිකොව් - අපට නම් අද උත්සව දිනයක් තමයි. ඔබට කොහොමදැයි මා දන්නේ නෑ.''

හිට්ලර්ගේ බිම්ගෙය තුළ සිටින සියල්ලන් සහ බර්ලිනය තුළ තවමත් සටන් කරන සියලු ජර්මන් සේනාංකයන් කොන්දේසි විරහිතව රුසියන් හමුදාවට යටත් විය යුතු යැයි ජනරාල් චුයිකොව් තරයේ කියා සිටියේය.

ක්‍රේබ්ස්ගේ හදවත පහළට කිඳා බැස්සේය. හිස් අතින් ගිය ක්‍රේබ්ස් හිස් අතින්ම ආපසු ආවේය. අලුත් රාජ්‍යාධිපති ඩොයෙනිට්ස්ට හිට්ලර්ගේ අභාවය ගැන දැන්ම සැලකිරීම නුවනට හුරු නැතැයි බෝර්මන් කල්පනා කළේ ඔහුගේම ආත්මාර්ථකාමී අරමුණ නිසාය. ගොබල්ස්ට එබඳු ගුප්ත අරමුණු තිබුණේ නැත. කොහොමත් ඔහු දිවි නසා ගැනීමට සූදානම්ව සිටි භක්තිමත් හිට්ලර්වාදියෙකි.

ගොබල්ස් බිම්ගෙයි හිඳගෙන ඩොයොනිට්ස්ගේ කාර්යාලයට ගුවන් විදුලි පණිවුඩයක් යැව්වේ ඒ නිසාය. මේ ඓතිහාසික පණිවිඩය සතුරන් වටලද ලද බිම්ගෙයින් බාහිර ලෝකයට නිකුත්

වූ අන්තිම පණිවුඩයයි.

ගොබල්ස් යැවූ පණිවුඩය මෙසේය.

*ඉතා රහසිගතයි.*

*නායකතුමා ඊයේ සවස 3.30 ට අභාවප්‍රාප්ත විය. අප්‍රේල් 29 දා අන්තිම කැමති පත්‍රයෙන් ඔබ රාජ්‍ය ජනාධිපති බවට පත් කෙරී ඇත..... නායකතුමාගේ අණ උඩ එම අන්තිම කැමති පත්‍රය ඔබ වෙත බර්ලිනයෙන් පිටත් කර හමාරය..... අද බෝර්මන් ඔබ හමුවීමට අවුත් තත්ත්වය ගැන දැනුම් දීමට බලාපොරොත්තුවෙන් සිටී. පුවත්පත්වලට හා හමුදා භටයන්ට මේ පුවත කවර විටක කවර විදියකින් සැළකළ යුතුද යනු ඔබට භාර වැඩකි. මෙය ලැබුණු බව සහතික කරන්න.*

තමන් හා තම දරු පවුල තව නොබෝ වේලාවකින් මෙලොවින් තුරන් වී යාමට සූදානම්ව සිටින බැව් නව ජනාධිපතිවරයාට දැනුම් දිය යුතුයැයි ගොබල්ස් කල්පනා නොකළේය.

මැයි 1 දා සන්ධ්‍යාවේ ඔහු ඒ අරමුණ ඉටුකර ගත්තේය. සෙල්ලම් කරමින් සිටි දරු සය දෙනාගේ සෙල්ලම් නවත්වන ලදී. ඉන්පසු ඔවුන්ගේ ශරීරයට විෂ වර්ගයක් එන්නත් කරන ලදී. මේ බිහිසුණු කාර්යයට අත ගැසූ පුද්ගලයා හිට්ලර්ගේ සුරතල් බල්ලාට විෂ එන්නත් කළ වෛද්‍යවරයාම යයි කියනු ලැබේ. දරු සදෙනාම මොහොතකින් කුඩා මළ කඳන් හයක් බවට පත් විය.

ඊළඟට ගොබල්ස් පෙට්‍රල් තොගයක් ගෙන්වා ගත්තේය. තමාගේ බිරිඳගේ හා දරු සදෙනාගේ මළ සිරුරු පුළුස්සා දමන්නැයි හේ නිලධරයෙකුට අණ කළේය.

නාසි ව්‍යාපාරයේ "රත්තරන් මොළය" වූ ආචාර්ය ජෝසප් ගොබල්ස් සහ ඔහුගේ පෙම්බර සුන්දර බිරිඳ බිම්ගෙයින් එළියට අවුත් අගමැති මන්දිරයේ ආලිංගනයෙහි සිට ගත්හ. ගොබල්ස්ගේ අණ පරිදි ඇස්.ඇස්. බලකායේ භටයෝ දෙදෙනෙක් අඹු සැමි යුවළගේ හිසට තැබූ වෙඩි පහර කිහිපයකින් ඔවුන් එලොව යැවූහ. පෙට්‍රල් දමා පුළුස්සන ලද මුත් ගොබල්ස් යුවළගේ මළ කඳන් සහමුලින් දැවී අළු වූයේ නැත.

සෙස්සන් පණ බේරාගෙන බිම් ගෙයින් පළා යාමට කඩිමුඩියේ සැරසුණු හෙයින් ගොබල්ස් යුවළ හඳුනාගත නොහැකි සේ

පුළුස්සාලීමට ඔවුනට ඉස්පාසුවක් තිබුණේ නැත. පසුව අගමැති මැඳුරේ ආලිංගනයට කඩා වැදුණු රුසියානුවන්ට ගොබල්ස්ගේ මළ කඳ පහසුවෙන් හඳුනාගත හැකි වූයේ ඒ නිසාය.

බිම්ගෙය තුළ ඒ අවස්ථාවේ විසූ බෝර්මන් සහ තම ලොකු කඩා නිලධරයන් හා සේවක සේවිකාවන් 500 ක් පමණ රුසියන් ෂෙල් වෙඩි වැදී ගිනි ගනිමින් තිබුණු බිම් ගෙයින් මැයි 01 දා රාත්‍රී 9 ට පමණ පළා යන්නට වූහ. එසේ පළා යද්දී නාසි පක්ෂයේ ලේකම් මාර්ටින් බෝර්මන් එක්කෝ දිවි නසා ගත්තේ යයි, නැත්නම් රුසියන් ප්‍රහාරයකින් මිය ගියේ යැයි සැක කරනු ලැබේ. එහෙත් තවම ඔහු වෙස් වලාගෙන විදෙස් රටක වෙසෙතැයි ද සමහරු කල්පනා කරති.

සෙන්පති ක්‍රෙබ්ස් සහ බර්ගෝඩෝර්ෆ් පලායන්නවුන්ට එකතු වූයේ නැත. ඔවුහු බිම්ගෙය තුළදීම වෙඩි තබාගෙන මිය ගියහ.

XXXXXX

''තෙවන රාජ්‍යය'' යනුවෙන් හැඳින්වුණු හිට්ලර්ගේ නාසි රාජ්‍යය ඔහුගේ අභාවයෙන් පසු තව දින හතක් කල් අල්ලා සිටීමට සමත් විය.

එදා රෑ 10.20 ට ගුවන් විදුලිය මගින් ජර්මන් ජාතිය ඇමතූ නව රාජ්‍ය නායක කර්ල් ඩොයෙනිට්ස්, නායකතුමා ''වීරයෙකු සේ'' අවසන් හුස්ම හෙළූ බවත් මෙතරම් දුක් වේදනා හා පරිත්‍යාගයන් විඳ දැරීමෙන් පසු දෙවියන් වහන්සේ ජර්මන් ජනතාව අතරමං නොකරන බවත් කියා සිටියේය.

ඩොයෙනිට්ස් කටින් මොනවා කීවත් දැන් මේ එළඹ ඇත්තේ නාසි රාජ්‍යයේ ප්‍රාණය නිරුද්ධ වන අවාසනාවන්ත මොහොත බව ඔහු සිතින් දැන සිටියේය.

බර්ලිනයේ හුන් රතු හමුදාංකයක මූලස්ථානයට මැයි 2 දා රේඩියෝ පණිවුඩයක් ලැබුණි.

''හලෝ, හලෝ, මේ 56 වෙනි පැන්සර් සේනාංකයයි. අපි අවි ගැටුම් නතර කිරීම සූදානම්. බර්ලින් වේලාවෙන් රාත්‍රී 12.50 ට අපි සාම දූත පිරිසක් පොට්ස්ඩාම් පාලම ළඟට එවන්නෙමු. ඔවුන් හඳුනා ගැනීමේ සලකුණ සුදු කොඩියකි. පිළිතුරු බලාපොරොත්තු වෙමු.''

මෙ පණිවුඩය ලත් විගස සටන් නවත්වන්නැයි රුසියන් ජනරාල් වැසිලි චුයිකොව් නියෝගයක් නිකුත් කළේය. අතනින් මෙතනින් නැඟුණු වෙඩි හඬක් දෙකක් හැරෙන්නට ජර්මන් අගනුවර සොහොන් බිමක සිරිය හා නිහැඬියාව ඉසිලීය. එදා පාන්දර ජර්මානුන් අවදි වී වටපිට බලන විට ඔවුන් නෙත ගැටුණේ ස්වස්තික ධජය වෙනුවට දෑකැති මිටි ලාංඡනයෙන් යුත් විශාල රතු ධජයක් ජර්මන් පාර්ලිමේන්තු ගොඩනැගිල්ල මත්තෙහි ලෙළදෙන අයුරුය.

රුසියානුන් හිට්ලර්ගේ බිම්ගෙය තුළට කඩා වැදුණු විගස පළමුවෙන්ම දක්නට ලැබුණේ විලියම් බුර්ගෝ ඩොර්ජ් සහ ක්‍රෙබ්ස් යන සෙන්පතියන් ගේ මළකඳන්ය. ඉන් පසු ගොබල්ස්ගේ හා ඔහුගේ දරු පවුලේ අඩක් දැවී ගිය මළ සිරුරු හමුවිණි.

ඒ එක්කම වාගේ රුසියන් විශේෂඥයන් පිරිසකට හිට්ලර්ගේ දැවී ගිය මෘත දේහයත් සොයා ගත හැකි විය. එය සිහින් පස් තට්ටුවකින් වසා දමා තිබුණි.

# 15

## මාරක නාටකයේ තිරය වැටේ

මැයි 04 දා ජර්මන් යුධ හමුදා මහා මණ්ඩලය විසින් වයඹ දිග ජර්මනියේ, ඩෙන්මාර්කයේ සහ ඕලන්දයේ හුන් සියලු ජර්මන් සේනාවන් බ්‍රිතාන්‍ය සේනාධිනායක ෆීල්ඩ් මාර්ෂල් මොන්ට්ගොමරිට යටත් කරන දෙන ලදී. ඇල්ප්ස් කඳුකරයට උතුරින් වූ සියලු ජර්මන් සේනාවෝ පසුදා යටත් වූහ.

ඉතාලියේ හුන් ජර්මන් සේනාංක මිත්‍ර පාක්ෂිකයන්ට යටත් වූයේ හිට්ලර් මිය ගිය දාට පෙරදා (29) දාය.

ජර්මන් නාවික හමුදාවේ අලුත් අණදෙන නිලධාරියා වූ අද්මිරාල් හැන්ස් ෆ්‍රියෙඩ් බර්ග් (HANS FRIEDE BURG) මැයි 5 දා ජර්මනියේ රෙයිම්ස් නුවර පිහිටි ඇමරිකන් සෙනාපති අයිසන් හවර්ගේ මූලස්ථානයට පැමිණ යටත්වීම සඳහා සාකච්ඡා පැවැත්වීමට යෝජනා කළේය. පසුව ජොඩ්ල් සෙන්පතියාද ඔහුට එක් විය.

ඉතිරි වී සිටි ජර්මන් නායකයන්ට ඒ අවස්ථාවේ උවමනා කළේ රුසියානුන් අතට හසුවීමෙන් වැළැකී බටහිර ජාතීන්ට යත්වීමටය. සාකච්ඡා පැවැත්වීමට යෝජනා කරන ලද්දේ කල් ඇල්ලීමට බව අයිසන් හවර් ඒත්තු ගත්තේය.

එනිසා ජර්මන් යෝජනාව අයිසන් හවර් විසින් කෙලින්ම ප්‍රතික්ෂේප කරන ලදී.

අයිසන් හවර්ගේ අදහස ජොඩ්ලි මගින් සැළ වූ වහාම රාජ්‍ය නායක ඩොයෙනිට්ස් කළේ කොන්දේසි විරහිතව යටත් වීමට

ජර්මනිය සූදානම් බව මැයි 7 දා පෙරවරු 1.30 ට දන්වා සිටීමය.

රෙයිම්ස් නුවර රතු හුණු ගෑ කුඩා පාසල් ගොඩනැඟිල්ලක් විය. යුරෝපයේ සියලු මිත්‍ර පාක්ෂික (ඇමරිකන්, ප්‍රංශ, බ්‍රිතාන්‍ය) හමුදාවල අග්‍ර සේනාධිනායක වූ සෙන්පති අයිසන් හවර් ගේ ප්‍රධාන කාර්යාලය පිහිටියේ ඒ ගොඩනැඟිල්ල තුළය.

ඒ කුඩා ගොඩනැඟිල්ල තුළදී මහා බලගතු ජර්මනිය 1945 මැයි 7 දා පෙරවරු 2.41 ට යටත්වීමේ ගිවිසුමට අත්සන් තැබීය. මේ ඓතිහාසික ගිවිසුමට මිත්‍ර පාක්ෂිකයන් වෙනුවෙන් අත්සන් තැබුවේ ජනරාල් වෝල්ටර් බෙඩල් ස්මිත් (BEDELL SMITH)ය. ජනරාල් අයිවන් සුස්ලෝ පැරොව් (IVAN SUSLO PAROV) රුසියාව වෙනුවෙන් සාක්ෂියට අත්සන් තැබීය. ප්‍රංශය වෙනුවෙන් අත්සන් තැබූ සාක්ෂිකරුවා සෙන්පති ප්‍රාන්ස්වා සේවේ (FRANSWA SEVEZ) ය. ජර්මනිය වෙනුවෙන් අත්සන් කළේ ජනරාල් ජොඩ්ල් හා අද්මිරාල් ෆ්‍රියෙඩබර්ග්ය.

1945 වර්ෂයේ මැයි මාසයේ 8 දා මැදියම් රැයේ යුරෝපය සිසාරා වෙඩි හඬ හා බෝම්බ පුපුරන හඬ මැකී ගියේය. එදා මුළු මහත් යුරෝපය වසර හයකට පසු සුවසේ නින්දට ගිය බව කියනුයේ කුමටද?

XXXXXX

දහස් වසරක් පවතී යයි ජර්මන් නායකයන් විසින් අපේක්ෂා කරන ලද "තුන් වෙනි රාජ්‍යය" හෙවත් නාසි පාලනය දොළොස් වසරකුත් මාස හතරක් හා දින අටක කෙටි ආයුෂ වළඳා 1945 මැයි 7 දා අභාවප්‍රාප්ත විය.

පරාජිත ජර්මන් ජාතිය ජීවිත ලක්ෂ ගණනාවකින් හා කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත දේපොල විනාශයකින් හිට්ලර්ගේ හා ජාතික සමාජ වාදයේ (නාසිවාදයේ) නාමයෙන් වන්දි ගෙවා තිබුණ මුත් යුද්ධයේ අනිටු විපාක එතෙකින් හමාර වූයේ නැත.

ජර්මනිය නාසි පාලනයට යටත්ව පැවති සමයේ ඒ ශ්‍රේෂ්ට ජාතියේ රාෂ්ට්‍ර නායකයනට විජයග්‍රාහී මිත්‍ර පාක්ෂික රටවල හා සෝවියට රුසියාවේ දණ්ඩනයට සිය ජීවිත කැප කිරීමට සිදු විය.

1945 මැයි 7 දා ඩොයෙනිට්ස්ගේ නව ජර්මන් ආණ්ඩුව කොන්දේසි විරහිතව සතුරාට යටත් වන විට හිට්ලර් හා ගොබල්ස්

යන නායකයන් දෙදෙනා සහ ප්‍රධාන පෙළේ සෙන්පති කීප දෙනෙක් සියදිවි නසා ගෙන සිටියහ. උතුරු අප්‍රිකා සටන්වලදී මිත්‍ර පාක්ෂික හමුදාවලට දිගට හරහට බැට දුන් ෆීල්ඩ් මාර්ෂල් රොමෙල් හෙවත් ''කාන්තාරයේ හිවලා'' දිවි නසාගෙන තිබුණේ ඊටත් කලිනි.

අවසාන යුගයේ හිට්ලර්ට ද්‍රෝහි වූ ''මගේ විශ්වාසදායක හෙයින්රිච්'' හෙවත් හෙයින්රිච් හිම්ලර් මිත්‍ර පාර්ශ්වික රටවල් සමග රහසේ සාකච්ඡා කොට තමන්ගේ නායකත්වයෙන් යුත් ජර්මන් රජයක් පිහිටුවා ගැනීමට නොකළ උත්සාහයක් නැති මුත් ඉන් ඵලක් නොවීය.

බලාපොරොත්තු සුන් වූ හිම්ලර් වෙස් වලාගෙන යාමට තැත් කළද බ්‍රිතාන්‍ය මුර පොළකදී ඔහු හඳුනා ගනු ලැබීය. එතැනදී ඔහුගේ සර්වාංගය සෝදිසි කරන ලදී. අන්තිමේදී වෛද්‍යවරයෙකු විසින් ද ඔහුගේ ඇඟපත සෝදිසි කරනු ලැබීය. එහෙත් හිම්ලර්ගේ මුව තුළට වෛද්‍යවරයාගේ ඇඟිලි පිවිසෙත්ම ඔහු යමක් විකුවේය. ඒ දත් පිටුපස රහසේ තැන්පත් කරගෙන තිබුණු වස පිරවූ ඉතා කුඩා බඳුනකි. තත්පර කිහිපයකින් හිම්ලර්ද මෙලෝ හැරපියා ගිය නාසි නායකයන්ට එකතු විය.

එක්කෝ බියගුලුකම නිසා, නැත්නම් ආත්ම ශක්තියක් නැතිකම නිසා, ඒත් නැත්නම් පණ පිටින්ම සතුරාට මුහුණ දීමට තරම් නිර්භීතකමක් තිබුණු නිසා ශේෂ වී සිටි නාසි නායකයෝ මිත්‍ර පාක්ෂිකයන් හා රුසියානුවන් අතට පත් වූහ.

එසේ සතුරා අතට පත් නොවූ එකම නාසි නායකයා පක්ෂයේ ලේකම් ධූරය දැරූ මාර්ටින් බෝර්මන්ය. ඔහු සතුරු ප්‍රහාරයකින් මිය ගියේද නැතිනම් තවමත් වෙස් මාරු කරගෙන ජීවතුන් අතර සිටීද යනු මේ දක්වාම පිළිතුරු ලැබී නැති උභතෝකෝටික ප්‍රශ්නයකි.

මිත්‍ර පාර්ශ්වික හා රුසියන් හමුදාවන් අතට පත් වූ සෙසු ජර්මන් නායකයෝ යුද්ධාපරාධ කාරයන් සේ සලකා 1945 නොවැම්බර් 20 දා යුද්ධාපරාධ අධිකරණයක් හමුවට පත් කරනු ලැබූහ.

යුද්ධයකදී පරාජය වූ පාර්ශ්වයේ අධිපතියන් යුද්ධාපරාධ කරුවන් ලෙසින් හංවඩු ගසා අධිකරණයක් ඉදිරියට පමුණුවා දඬුවම් දෙන ලද ඉතිහාසයේ ප්‍රථම අවස්ථාව මෙය වේ.

යුද්ධාපරාධිකරණය පිහිටුවන ලද්දේ නාසි හෙවත් ජාතික

සමාජවාදී පක්ෂයේ මූලස්ථානය ලෙසින් සැලකුණු ජර්මනියේ නියුරම්බර්ග් නගරයෙහිය.

බ්‍රිතාන්‍ය, ඇමෙරිකානු, රුසියානු හා ප්‍රංශ විනිශ්චය කරුවන්ගෙන් මේ අධිකරණය සැදුම් ලද්දේය. දෙපැත්තටම අයත් නොවූ හා යුද්ධයේදී අපක්ෂපාතව සිටි ස්විට්සර්ලන්තය වැනි රටවලින් විනිශ්චය කරුවන් තෝරා නො ගෙන ජර්මනියේ පරම සතුරන් වූ රටවලින්ම විනිශ්චයකරුවන් පත් කිරීම ඇතැමුන්ගේ දෝෂ දර්ශනයට ලක්වූ කරුණකි.

නියුරම්බර්ග් යුද්ධාපරාධිකරණයේ සභාපති වශයෙන් පත් කරන ලද්දේ බ්‍රිතාන්‍ය නීතිවේදියෙකු වූ ලෝරන්ස් සාමි වරයාය. අතිරේක බ්‍රිතාන්‍ය විනිශ්චයකරු වශයෙන් බිර්කට් තුමා පත් කරන ලදී. රුසියාව වෙනුවෙන් මේජර් ජෙනරාල් අයි. ටී. නිකී චෙන්කෝ මහතා පත් කෙරුණු අතර අතිරේක විනිසුරුකරු වූයේ ලෙප්ටිනන්ට් කර්නල් ඒ. එෆ්. වොල්ච්කොව්ය.

ඇමෙරිකානු විනිශ්චයකරු වූයේ ෆ්‍රැන්සිස් බිඩ්ල මහතාය. අතිරේක ඇමෙරිකානු විනිශ්චයකරු වශයෙන් පත් කෙරුණේ ජෝන් ජේ. පාර්කර් මහතාය.

විනිසකරු මහාචාර්ය ඩොන්ඩියු වාබ්රේ මහතා ප්‍රංශය වෙනුවෙන් ඉදිරිපත් කෙරුණු විනිසකරුය. අතිරේක ප්‍රංශ විනිසකරු වූයේ රොබට් පැල්කො මහතාය. ලෝක ඉතිහාසයේ මෙතෙක් පවත්වන ලද ලොකුම නඩු විභාගය හා වැඩිම ආන්දෝලනයක් ඇති කළ නඩු විභාගය වශයෙන් ගිණිය හැකි නියුරම්බර්ග් නඩුවේදී ජර්මන් නායකයෝ 24 ක් චෝදිතයන් ලෙසින් නම් කරනු ලැබූහ.

ඒ ජර්මන් නායකයන් විසි හතර දෙනා පහත සඳහන් අය වෙති.

1. රාජ්‍ය මාර්ෂල් තනතුර හා ජර්මන් ගුවන් නායක පදවිය දැරූ හර්මන් ගෝරිං මහතා (වයස 52)
2. 1941 වන තුරු උප අගමැති ධූරය දැරූ රුඩොල්ෆ් හෙස් මහතා (52)
3. විදේශාමාත්‍යව සිටි ජෝකිම් රිබන්ට්‍රොප් මහතා (53)
4. ජර්මන් පාලනය යටතෙහි පැවති නැඟෙනහිර යුරෝපීය රටවල් පිළිබඳ අමාත්‍ය ඇල්ප්‍රඩ් රොසන්බර්ග් මහතා (53)
5. හමුදාපති මණ්ඩලයේ නායකයා වූ ෆීල්ඩ් මාර්ෂල් විල්හෙල්ම් කෙයිටල් මහතා (63)

Scanned with CamScanner

6. ගෙස්ටාපෝ රහස් පොලිසියේ අධිපති අර්නස්ට් කැල්ටන්බ්‍රැනර් මහතා (43)
7. පෝලන්තයේ නාසි දිසා ඇමැති වරයා වූ හැන්ස් ෆ්‍රැන්ක් මහතා (46)
8. හිටපු ස්වදේශාමාත්‍ය වූ විල්හෙල්ම් ෆ්‍රික් මහතා (69)
9. යුදෙව් සංහාරයට වගකිව යුත්තෙකු වූ ජූලියස් ස්ට්‍රෙයිචර් මහතා (61)
10. 1933 - 34 අතර ආර්ථික අමාත්‍යව සිටි 1939 වනතුරු රාජ්‍ය බැංකුවේ අධිපති වූ එච්. ශාච් මහතා (69)
11. 1939 න් පසු රාජ්‍ය බැංකුවේ ප්‍රධානතමයා වූ වොල්ටර් ෆුන්ක් මහතා (56)
12. 1945 දී ජර්මන් ජනාධිපති පදවිය දැරූ නාවික හමුදාපති කාල් ඩොයෙනිට්ස් මහතා (55)
13. 1928 - 43 අතර නාවික හමුදාවේ ප්‍රධාන අණ දෙන නිලධාරියා වූ එරික් රයිඩර් මහතා (70)
14. හිට්ලර් තරුණ සංවිධානයේ නායකයා වූ බාල්ඩුර් ශිරාච් මහතා (39)
15. මිනිස් බලය පිළිබඳ පූර්ණ බලැති නිලධරයා වූ ෆ්‍රිට්ස් සෝකල් මහතා (48)
16. හමුදාපති මණ්ඩලයේ කාර්ය විධායක අංශයේ අධිපති ඇල්ෆ්‍රඩ් ජෝඩ්ල් මහතා (56)
17. හිටපු අගමැති සහ වියනාවේ හුන් විශේෂ නියෝජිත ෆ්‍රාන්ස් පැපන් මහතා (66)
18. ඔස්ට්‍රියාවේ හා ඕලන්දයේ නාසි දිසා ඇමැතිවරයා වූ ආතර් සෙයිස් - ඉන්ක්වාර්ත් මහතා (54)
19. යුද්ධායුධ හා යුද්ධ කාලීන භාණ්ඩ නිෂ්පාදනය භාරව සිටි අමාත්‍යවරයා වූ ඇල්බට් ස්පියර් මහතා (90)
20. 1932 - 33 අතර විදේශාමාත්‍යව හුන්, බොහිමියාවේ හා මොරේවියාවේ නාසි දිසා ඇමැතිවරයා වූ කොන්ස්ටන්ටයින් නියුරාත් මහතා (72)

Scanned with CamScanner

21. ප්‍රචාරක අමාත්‍යාංශයේ ගුවන් විදුලි අංශය භාරව සිටි හැන්ස් ප්‍රිච් මහතා (46)

22. හෙස් ගෙන් පසු උප අගමැති ධුරය දැරූ මාර්ටින් බෝර්මන් මහතා (45) (අල්ලාගත නොහැකිවූ නිසා උසාවියට පැමිණියේ නැත.)

23. යුද්ධායුධ නිෂ්පාදනයේ යෙදුණු ප්‍රධානතම කර්මාන්ත හිමියා වූ ඇල්ප්‍රඩ් කරුප් මහතා (මහලු වැඩි නිසා උසාවියට ගෙනෙනු නොහැකි විය.)

24. ජර්මන් කම්කරු සමිති නායකයා වූ රොබර්ට් ලෙ මහතා (හිරගෙදර සිටියදී එල්ලී මළේය.)

මෙයින් ඇත්තවශයෙන් නියුරම්බර්ග් නඩු විභාගයට මුහුණ පෑයේ විත්තිකරුවන් 21 ක් පමණි.

විත්තිකරුවනට විරුද්ධව ප්‍රධාන චෝදනා හතරක් ඉදිරිපත් කර තිබිණි.

1. පොදු සැලැස්ම හෙවත් කුමන්ත්‍රණය, 2. සාමයට සතුරුව කළ අපරාධ, 3. යුද්ධාපරාධ, 4. මනුෂ්‍ය වර්ගයාට සතුරුව කළ අපරාධ.

මේ ප්‍රධාන චෝදනා හතර යටතේ සිය ගණන් අතුරු චෝදනා ඉදිරිපත් කෙරිණි. මුළු චෝදනා පත්‍රය 24, 000 කින් යුක්ත විය.

නියුරම්බර්ග් නඩු විභාගය අවසානයේදී තිදෙනෙකු හැර සෙසු සියලු විත්තිකරුවෝ වරද කරුවෝ වෙතියි විනිශ්චය මණ්ඩලයෙන් ප්‍රකාශ වුණි.

නිදහස් කරන ලද තිදෙනා හාච්, පැපන් සහ ප්‍රීචේය.

හෙස්ට, පුන්ක්ට, රයිඩර්ට ජීවිතාන්ත සිර දඬුවම් ලැබිණ.

ශිරාච්ට හා ස්පියර්ට විසි අවුරුදු සිර දඬුවම් නියම විය.

නියුරාත්ට ලැබුණේ පහළොස් වසරක සිර දඬුවමකි.

හිට්ලර්ගෙන් පසු සුමානයක් පමණ ජර්මනියේ අධිපතිකම දැරූ කාර්ල්, ඩෙයොනිට්ස් දස අවුරුදු සිර දඬුවමක් ලබා ජීවිතය බේරා ගත්තේය.

විත්තිකරුවන් අතරින් ප්‍රධානතම පුද්ගලයා වූ හර්මන් ගෝරිං ඇතුළු සෙස්සන් එල්ලා මැරීමට නියම විය.

Scanned with CamScanner

1946 ඔක්තෝබර් 16 දා මධ්‍යම රාත්‍රියෙහි නියුරම්බර්ග් බන්ධනාගාරයේ හෝරා යන්ත්‍රය වේලාව පාන්දර එක බව හඬ ගා කියද්දී රිබන්ට්‍රොප් පෝරකයට නැංග්ගේය. ඉන්පසු කෙයිටල්, කැල්ටන්බ්‍රෑනර්, රොසන්බර්ග්, ෆ්‍රෑන්ක් ෆ්‍රික්, ස්ට්‍රෙයිචර්, ඉන්ක්වාර්ත්, සෝකල් සහ ජොඩ්ල් පෝරකය වෙත ගෙනයනු ලැබූහ.

සතුරන් අතින් නොමැරී තමන් අතින්ම මියයාමේ භාග්‍යය ලද්දේ හර්මන් ගෝරිං පමණි.

හේ එල්ලුම් ගස වෙත ගෙන යෑමට ස්වල්ප වේලාවකට උඩදී සිර මැදිරිය තුළදීම දිවි නසා ගත්තේය. ඔහු මුව තුළ මාරක වස බඳුනක් සඟවාගෙන තිබුණි. සතුරාගේ මළ පුඩුව බෙල්ලට වැටෙන්නට කලින් ඒ කුඩා වස බඳුන ගෝරිං ජීවිතක්ෂයට පත් කිරීමට සමත් විය.

මාර්ටින් බෝර්මන් අදවන තුරුත් ආගිය අතක් නැත.

ඒකාධිපතියකු ගේ සහ ඔහුගේ පරිවාර ජන සමූහයාගේ නැඟීම හා වැටීම පිළිබඳ වෘත්තාන්තයේ ශෝකාන්තයයි ඒ!

Scanned with CamScanner

# 16

## හිට්ලර් චින්තනය

මානව වංශයේ ඉතිහාසය ප්‍රචණ්ඩ හා විප්ලවකාරි කුණාටු වලින් වරින් වර පිස දැමී ගොස් තිබේ. විසිවන ශත වර්ෂයේ ඉතිහාසය දෙස බලන විට මැනැවින් කැපී පෙනෙන එබඳු විප්ලවකාරී ව්‍යාපාර දෙකක් ඇත. ඉන් එකක් 1917 දී රුසියාවේ ඇරැඹුණු කොමියුනිස්ට්වාදී විපර්යාසයයි. අනෙක 1933 දී ජර්මනියෙන් ඇරැඹුණු නාසිවාදී විපර්යාසයයි.

නාසිවාදී විප්ලවය දොළොස් වසරකදී අකල් මරණයකට ගොදුරු වූ මුත් මාක්ස්වාදී විප්ලවය තවමත් ඉතා ප්‍රාණවත් ලෙස මානව සංහතිය කෙරෙහි බලපාමින් පවතී.

මාක්ස්වාදයේ ප්‍රධාන ශාස්තෘවරයන් වූයේ කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස්ය. නාසිවාදයේ ප්‍රධාන ශාස්තෘවරයන් වූයේ ෆෙඩ්රික් නීශේ සහ ඔස්වල්ඩ් ස්පෙන්ග්ලර්ය. මේ හතර දෙනාම ජර්මන් ජාතිකයන් වීම විශේෂ ලක්ෂණයකි.

ජාතික සමාජවාදී ජර්මන් කම්කරු පක්ෂයේ අසාහය නායකයා වූ ඇඩොල්ෆ් හිට්ලර් කෙරෙහි, නීශේ සහ ස්පෙන්ග්ලර් හැරුණු විට හේගල්, ට්රෙයිශ්කේ, පික්ටේ සහ රිචඩ් වැග්නර් යන ජර්මන් චින්තකයන්ගේ සිතුම් පැතුම් ද ඉංග්‍රීසි ජාතික චාල්ස් ඩාර්වින් ගේ ජීව විද්‍යානුකූල නිගමනයන්ද බොහෝ දුරට බලපා ඇති බව පෙනේ.

හිට්ලර්ගේ සහ නාසි පක්ෂයේ ප්‍රතිපත්ති හා ක්‍රියා මාර්ගයන් සියල්ල පදනම් වූයේ එකී චින්තකයන්ගේ හා ඒ චින්තකයන් විසින් බලපාන ලද හිට්ලර්ගේ දර්ශනය මතය.

Scanned with CamScanner

නාසි රජය පැවති සමය තුළ මේ දර්ශනය උගත් නූගත් දුප්පත් පොහොසත් තරුණ මහලු ජර්මානුන් බහුතර සංඛ්‍යාව විසින් ආගමක් සේ අදහන ලද අතර හිට්ලර්ගේ සිතුම් පැතුම් ඇතුළත් මගේ සටන නමැති ඔහුගේ ග්‍රන්ථය ඔවුන්ගේ බයිබලය බවට පත් විය.

වෙනෙකක් තබා හිට්ලර්ගේ නිර්මාණයක් වන ස්වස්තික ධජයද නාසි දර්ශනය පිළිබිඹු කරනු සඳහා ඔහු විසින්ම සිතා මතා සකස් කරන ලද මනස්කාන්ත සංකේතයකි.

හිට්ලර්ගේ වචන වලින් කියතොත් නාසි ධජයේ ''රතු පසුබිමින් ව්‍යාපාරයේ සමාජමය අර්ථයත් මැද සුදු පැහැති කවයෙන් ජාතිවාදී අර්ථයත් ඒ තුළ පිහිටි කළු ස්වස්තික ලකුණින් ආර්ය වර්ගයාගේ විජයග්‍රහණය සඳහා ගෙනයන අරගලයත් මූර්තිමත් වන්නේය.''

හිට්ලර්ගේ දර්ශනය බෙහෙවින් ගැබ් වී ඇත්තේ මගේ සටන MEIN KAMPF සහ HITLER'S TABLE TALK නම් ග්‍රන්ථ වලත් වරින් වර ඔහු විසින් පවත්වන ලද ප්‍රසිද්ධ කතාවල සහ ලියන ලද ලිපි වලත්ය.

විවිධ විෂයයන් පිළිබඳව ඔහු දැරූ අදහස් සමහරක් පහත පළ වේ.

### ගුරුවරුන්

මගේ ගුරුවරුන් වී සිටි පුද්ගලයන් ගැන කල්පනා කරන විට ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු තරමක් සිහි විකල් වූ අය බවට මට වැටහේ. හොඳ ගුරුවරුන් වශයෙන් සැලකිය හැකි අය සිටියේ ස්වල්ප දෙනෙකු පමණි. අර විධියේ පුද්ගලයන් සතුව තරුණයෙකුගේ ගමන් මග හරස් කිරීමේ බලය තිබීම ඛේදජනක කරුණකි. (1942 මාර්තු 03 දා)

අපේ ගුරුවරු අත්තනෝමතික ආඥාදායකයෝ වූහ. තරුණ පරපුර කෙරෙහි ඔවුන් තුළ දයාවක් තිබුණේ නැත. ඔවුන්ගේ එකම අරමුණ වූයේ අපගේ ඔලු ගෙඩි මොන මොනවායින් හෝ අහුරා දමා ඔවුන් හා සමාන බක පණ්ඩිත වානරයන් පිරිසක් කිරීමටය. යන්තමින් හෝ නිර්මාණ ශක්තියක් ඇති ශිෂ්‍යයෙකු හසු වූ විට ඔවුහු එම ශිෂ්‍යයාට දස වද දුන්හ. මට හමු වූ සෑම ආදර්ශමත් ශිෂ්‍යයෙක්ම පසු කලෙකදී ජීවිතය අසාර්ථක කර ගත්තේය. (1942 සැප්තැම්බර් 07 දා)

Scanned with CamScanner

### වියානා සමය

මේ නගරය (වියානාව) මට සිහිපත් කරනුයේ දුප්පත්කමින් හා කම්කටොලු වලින් පිරී ගිය මගේ ජීවිතයේ පස් වසරක්ය. මේ පස් වසර තුළ මුල දී කම්කරුවෙකු වශයෙන්ද, අනතුරුව තරමක සිත්තරෙකු වශයෙන්ද, වැඩකර ජීවනෝපාය සලසා ගැනීමට සිදුවිය. ඉන්පසු ලැබුණු ආදායම කිසිදාක කුස ගිනි නිවා ගැනීමට ප්‍රමාණවත් නොවීය. එකල මගේ හිතවත් ආරක්ෂක හටයා වූයේ බඩගින්නයි. මේ ආරක්ෂක හටයා මොහොතකටවත් මා හැර ගියේ නැත. ඔහු මා සතු සියලු දේ භුක්ති වින්දේය. මගේ ජීවිතය වූ කලී මේ අනුකම්පා විරහිත මිත්‍රයාට විරුද්ධව කෙරුණු අඛණ්ඩ අරගලයකි. (මගේ සටන)

### කියවන කලාව

කියවීම යනුවෙන් මා අදහස් කරන්නේ අපගේ සමහර ඊනියා උගතුන් අදහස් කරන දේට වෙනස් දෙයකි. බහුල වශයෙන් කියවන පුද්ගලයන් ගැන මම දනිමි. එහෙත් ඔවුන් හොඳින් කියැ වූ පුද්ගලයන් ලෙස මා සලකන්නේ නැත. ඔවුන් සතුව විශාල දැනුම් සම්භාරයක් තිබෙන්නට පුළුවන. එහෙත් උකහා ගත් දැනුම සංවිධානය කර ගැනීමට හා ධාරණය කර ගැනීමට ඔවුන්ගේ මොළය අපොහොසත්ය. නියම කියවීමේ කලාව කුමක්දැයි දන්නා පුද්ගලයා එක්කෝ තමන්ගේ කාර්යයට ගැලපෙන නිසා, නැත්නම් පොදුවේ බලන විට දැනගත යුතු දෙයක් නිසා ස්ථිරව මතකයේ රඳවා ගත යුතු දේවල් ඉබේම හා ඒ මොහොතේම අවබෝධ කර ගනී. අවශ්‍ය දේ මතකයට ගැනීමත් අනවශ්‍ය දේ අමතක කර දැමීමත් ඉගෙන ගැනීමේ කලාව මෙන්ම කියවීමේ කලාව ද වේ. (මගේ සටන)

### දේශපාලන පක්ෂ හා ආගම

ආගමික සංස්ථාවල දොස් දැක්විය යුතු කෙතරම් දේවල් තිබුණත් දේශපාලන පක්ෂයක් එක් කරුණක් මොහොතකට හෝ අමතක නොකළ යුතුය. එනම් ඉතිහාසයේ කිසිමදාක හුදු දේශපාලන පක්ෂයක් ආගමික ප්‍රතිසංස්කරණයක් සාර්ථක ලෙස දියත් කිරීමට අපොහොසත් වී ඇති බවයි. (මගේ සටන)

### ජීවිත සටන

අරගලය පිළිබඳ සංකල්පය ජීවය තරම්ම පැරණි දෙයකි. ජීවය ආරක්ෂා වනුයේ ඒ අරගලයේදී සෙසු ජීවීන් විනාශ වී යන හෙයිනි.

Scanned with CamScanner

මේ අරගලයේදී වඩා ප්‍රබල ජීවියා වඩා දක්ෂ ජීවියා, ජය අත්කර ගනී. මේ අතර අදක්ෂ හා දුර්වල ජීවියා පරාජයට පත් වේ. සියලු දේවල පියා අරගලයයි. මිනිසා ජීවත්ව සිටින්නේ හෝ සත්ව ලෝකයට ඉහළින් ආරක්ෂා වී සිටින්නේ ඉතාම කෲර අරගලයක මාර්ගයෙන් විනා මානුෂික ප්‍රතිපත්තිවල මාර්ගයෙන් නොවේ. ඔබ ජීවිතය සඳහා සටන් කරන්නේ නැත්නම් ජීවිතය කිසිදාක යහපත් වන්නේ නැත. (1928 පෙබරවාරි 5 දා)

### ජය කණුව

මිනිසා විසින් අත්කර ගෙන ඇති සෑම ජයග්‍රහණයක්ම ඔහුගේ නිර්මාණ ශක්තිය සහ මෘගත්වය යන දෙකේ එකතුවේ ප්‍රතිඵලයකි. (1928 අප්‍රේල් 02දා)

### පහළ මධ්‍යම පන්තිය

මගේ බාල කාලය වැය වූයේ පහළ මධ්‍යම පන්තියට අයත් පුද්ගලයන් සමඟය. එම පන්තිය ආර්ථික අතින් කම්කරු පන්තියට වඩා බෙහෙවින් ඉහළ තත්ත්වයක නොසිටියද මේ දෙපන්තිය වෙන් කෙරෙන පරතරය බොහෝ අය සිතනවාට වඩා ගැඹුරුය. මෙබඳු බේදයක් හෙවත් හතුරු බවක් තිබීමට හේතුව, කම්කරු පන්තියේ මට්ටමින් මෑතකදී ඉහළට නැගගත් සමාජ කොට්ඨාශයක් තුළ හටගන්නා වූ භීතියයි. එය ආපසු පරණ තත්ත්වයටම වැටේය කියා හෝ කම්කරුවන් සමග එක ගණයේ ලා සැලකෙතැයි කියා හෝ තිබෙන භීතියයි. (මගේ සටන)

### මාක්ස්වාදය

මාක්ස්වාදය නමැති යුදෙව් දර්ශනය ස්වභාව ධර්මයේ ප්‍රභුවාදී නියමය ප්‍රතික්ෂේප කොට ඒ වෙනුවටත් බලය හා ශක්තිය සතු සදාකාලික වරප්‍රසාද සහගත තත්ත්වය වෙනුවටත් සංඛ්‍යාත්මක බහුතරය හා එහි අප්‍රාණික බර ආදේශ කරයි. මෙසේ එම දර්ශනය මනුෂ්‍ය පෞරුෂත්වය ඇති පුද්ගලයා ප්‍රතික්ෂේප කරයි. ජාතිකත්වයේ හා ගෝත්‍රයේ මූලික වැදගත්කමක් තිබේය යන ඉගැන්වීම අවලංගු කර දමයි. එසේ කොට මනුෂ්‍ය පැවැත්ම හා මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ පදනම ගලවා දමයි. (මගේ සටන)

### වචනයේ බලය

අනාදිමත් කාලයක පටන් ඉතිහාසයේ සියලුම දැවැන්ත ආගමික හා දේශපාලන විපර්යාසයන් පටන් ගෙන තිබෙන්නේ කතා කරන

Scanned with CamScanner

වචනයෙහි තිබෙන්නා වූ මැජික් බලය විසිනි. පුළුල් පොදු ජනතාව අවදි කළ හැක්කේ කථික බසින් පමණි. සෑම යෝධ ව්‍යාපාරයක්ම ජනතා ව්‍යාපාරයකි. මනුෂ්‍ය ආවේගයන් හා හැඟීම් ගිනි කන්දක් ලෙසින් පිපිර යාමකි. (මගේ සටන)

**වයස**

පොදුවේ කල්පනා කර බලන විට මිනිසෙක් අවුරුදු තිහට කලින් දේශපාලනයට නොබැසිය යුතුය. (මගේ සටන)

**නායකයා**

නායකයෙක් යැයි කිව හැක්කේ පොදු ජනතාව ක්‍රියාකාරී කළ හැකි පුද්ගලයාටය. (මගේ සටන)

**පොදු ජනතාව**

පොදු ජනතාව කෙරෙහි ව්‍යාපාරය පාන්නා වූ බලය හීන වන සියලු දෙයකින් ව්‍යාපාර වැළැක්විය යුතුය. ඒ මන්ද කිවහොත් පොදු ජනතාව තුළ ගැබ් වී තිබෙන ක්‍රියාකාරී බලය නොමැතිව කිසිම ශ්‍රේෂ්ට අදහසක් ක්‍රියාවට පෙරළිය නොහැකි හෙයිනි. පොදු ජනතාව තුළ න්‍යාය ධර්ම පිළිබඳ වැඩි අවබෝධයක් නැත. ඔවුන් ක්‍රියා කරන්නේ හැඟීම්වලට අනුකූලවය. බුද්ධියට විරුද්ධව සටන් කරනවාට වඩා භක්තියට විරුද්ධව සටන් කිරීම දුෂ්කරය. පොදු ජනතාව තමන්ගේ පැත්තට දිනාගනු කැමති පුද්ගලයා ඔවුන්ගේ හදවත විවෘත කරන යතුර කුමක්දැයි හඳුනාගත යුතුය. (මගේ සටන)

**මුසාවාදය**

පොදු ජනයාගේ බොළඳ මනැස පොඩි බොරුවට වඩා ලොකු බොරුවට පහසුවෙන් ගොදුරු වේ. ඊට හේතුව ඔවුන්ද සුළු දෙයකට පවා නිතර පොඩි බොරු කීමත්, විශාල බොරුවල පිහිට සෙවීමට ලැජ්ජාවීමත්ය. අති විශාල බොරු නිපදවීමට ඔවුනට කිසිදාක සිතෙන්නේ නැත. එනිසාම වෙනත් අයට අති විශාල බොරු නිපදවිය හැකැයිද ඔවුන් විශ්වාස ගන්නේ නැත. අති විශාල බොරුවක් මළාට පසුත් එහි තරමක ප්‍රාණයක් ඉතුරු වී තිබේ. (මගේ සටන)

**ආරක්ෂාව**

ආරක්ෂා වීමට ඇති හොඳම මාර්ගය පහරදීමය. අපේ රැස්වීම් ආරක්ෂා කිරීමට පත් කරන ලද භටයන් ඒ අතින් කෙතරම් දක්ෂ

වී ද යත් අපේ පක්ෂය දේශපාලන සටන් බලකායක් විනා සම්මන්ත්‍රණ සංගමයක් නොවන බව කාටත් ඒත්තු ගියේය. (මගේ සටන)

**සමාජවාදියා**

ජාතියේ යහපතට වඩා උතුම් අරමුණක් ගැන නොදන්නා තරමට ජාතියේ යහපත සඳහා කරන සටන තමන්ගේම සටනක් ලෙසින් සලකන යම් කිසිවෙක් වෙත්ද මේ ජර්මනියට වඩා මේ භූමියට හා ජනතාවටත් මේ ජනතාවට හා භූමියටත් වඩා උතුම් දෙයක් සමස්ත භූතලය මත නැතැයි සිතන තරමට අපේ ශ්‍රේෂ්ට ජාතික ගීය තේරුම් ගෙන ඇති යම් කිසිවෙක් වෙත්ද, අන්න ඒ පුද්ගලයා සමාජවාදියෙකි. (1934)

**සහෝදරයා හා ජර්මානුවා**

"නුඹ අපේ සහෝදරයෙකු වන්නේ නැත්නම් නුඹේ ඔලුව කුඩුකර දමනවා" යනුවෙන් මාක්ස්වාදියෝ දේශනා කරති. අපේ සටන් පාඨය වී ඇත්තේ "නුඹ ජර්මානුවෙකු වන්නේ නැත්නම් නුඹේ ඔලුව කුඩු කරනවා" යනුය. '1922 නොවැම්බර්'

**ඇමැතිකම්**

පුංචි මිනිසුන්ගේ සිතිවිලි කෙතරම් බොළඳද? ඇමැති ධූරයක් ලබා ගැනීම මහන්සි ගත යුතු තරමේ දෙයක් යයි මා සලකන්නේ නැත. හුදෙක් ඇමැතිවරයෙකු වීමෙන් පමණක් ඉතිහාස ගතවීමට උත්සාහ කිරීම ශ්‍රේෂ්ට මිනිසකුට තරම් නොවේ. එසේ වුවහොත් සෙසු ඇමැතියන් අසළින්ම භූමදාන වීමේ අන්තරායට මුහුණ පෑමට සිදුවනු ඇත. මුල පටන්ම මගේ අභිප්‍රාය වූයේ ඇමැතිවරයෙකුට වඩා දහස් වරකින් උතුම් වූ අභිප්‍රායකි. මට උවමනා කළේ මාක්ස්වාදය සමූලෝත්පාඨනය කරන්නා වීමය. මම ඒ අරමුණ ඉටුකර ගන්නෙමි. (1924)

**ආඥාදායකයා**

ආඥාදායකයකු වීමට උපන් පුද්ගලයාට කිසිවකුගේ බලකිරීමක් උවමනා නැත. ඔහුම ආඥාදායකයා වීමට අධිෂ්ටාන කරයි. ඔහු කිසිවකු විසින් ඉදිරියට තල්ලු කෙරෙන්නේ නැත. ඔහුම ඉදිරියට තල්ලු වී යයි. (1924)

ව්‍යාපාරය මෙහෙයවන එකම පුද්ගලයා මාය. මා පෞද්ගලිකව සියලු දෙයකට වගකීම බාරගන්නා තුරු මට කොන්දේසි ඉදිරිපත්

Scanned with CamScanner

කිරීමට කිසිවෙකුට නොහැක. අප ගෙන යන මේ අරගලය හමුවේ ඇත්තේ ප්‍රධාන ප්‍රශ්න දෙකක් පමණි. එක්කෝ සතුරා අපේ මළ කඳන් උඩින් යා යුතුය. නැත්නම් අප සතුරාගේ මළ කඳන් උඩින් යා යුතුය. මේ අරගලයේදී යම් විදියකින් මගේ ජීවිතය විනාශ වුවහොත් මගේ මළකුණ ඔතන රෙදිකඩ ස්වස්තික ධජය වේවා. (1925 පෙබරවාරි 27)

රුසියාව

භූමිය අවශ්‍ය වන්නේ යුරෝපයෙන් නම් ඒ භූමිය ලබා ගත හැක්කේ රුසියාවෙන් පමණි. මේ කාර්යය ඉටු කර ගනු සඳහා නව රජය පුරාණ ජර්මන් රණදෙටුවන් ගිය මාර්ගයේ ගමන් කළ යුතුය. එසේ ගමන් කොට ජර්මන් නගුලට පස් පිඩක්, ජාතියට එදිනෙදා ආහාර වේලක්, ජර්මන් කඩුවේ මහිමයෙන් අත්කර ගත යුතුය. (මගේ සටන)

ජීවත්වීමේ ඉඩකඩ

ජාතියක ස්වාධීන පැවැත්ම තහවුරු වන්නේ ඒ සඳහා මේ පෘථිවිය මත අවශ්‍ය තරම් විශාල භූමි ප්‍රමාණයක් තිබේ නම් පමණි. අපේ ජනතාවට වර්තමානයෙහි ජීවත් වීමට සිදු වී ඇති සීමිත බිම් ප්‍රමාණයේ සිට අලුත් බිම් හා අලුත් පස සොයා යෑමට ඔවුන් යොමු කරනු සඳහා ඔවුන් සහ ඔවුන්ගේ ශක්තිය ඒකරාශි කිරීමට අපට ධෛර්යය තිබිය යුතු අතර සම්මතයන් හා මතිමතාන්තර ගැන තැකීමක් නොකළ යුතුය. අපේ ජනගහණය සහ අපේ බිම් ප්‍රමාණය අතර ඇති පරතරය අහෝසි කිරීමට ජාතික සමාජවාදී ව්‍යාපාරය උත්සාහ ගත යුතුය. (මගේ සටන)

නායකත්වය

අවසානයේදී ජයගනු ඇත්තේ ස්වයං රක්ෂණය සඳහා ඇති ආශාවයි. මනුෂ්‍ය වර්ගයා ශ්‍රේෂ්ටත්වයට පත් වී ඇත්තේ සනාතනික අරගලයෙහි යෙදී සිටියදී පමණි. මනුෂ්‍ය වර්ගයා විනාශ වනුයේ සනාතනික සාමයේදී පමණි. මේ පෘථිවි ගෝලය මත ජීවින් බිහි කරන ස්වභාව ධර්මයා විවිධ බලවේගවල නිදහස් ක්‍රියාකාරීත්වය නරඹමින් සිටී. එතැනදී ස්වභාව ධර්මයා ඇගේ ප්‍රියතම දරුවාට - එනම් ධෛර්යය හා කාර්ය ශූරත්වය අතින් ප්‍රබලතම දරුවාට - ස්වාමිත්වයේ අයිතිවාසිකම් පිරි නමයි. වඩා ප්‍රබලයා අධිපතියා විය යුතුය. වඩා ප්‍රබලයා වඩා දුබලයා සමග ඒකාබද්ධ වුවහොත්

ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයද මැකී යන්නේය. මෙය කෲර දෙයක් ලෙසින් දකිනු ඇත්තේ ජන්ම දුබලයා පමණි. ජීවත්වීමට කැමැත්තෝ සටන් කරත්වා. නිරන්තර අරගලයක් පවත්නා මේ ලෝකයෙහි සටන් කිරීමට කැමැත්තා ජීවත් වීමට ද නුසුදුස්සෙකි. මෙය කටුක දෙයක් විය හැක. එහෙත් සත්‍යය මේකයි. (මගේ සටන)

**ධර්මිෂ්ටතාවය**

පළමුව අපේ ජනතාව ජාත්‍යන්තර මති මතාන්තර නමැති පඹ ගාලෙන් මුදවාගෙන ක්‍රමානුකූලව ඔවුන් තුළ උග්‍ර ජාතිවාදය වගා කළ යුතුය. දෙවනුව අපේ ජනතාව ප්‍රජාතන්ත්‍රය නමැති උමතුවට විරුද්ධව සටන් කරනු සඳහාත් බලධාරීත්වයේ ආධිපත්‍යයේ ඇති අවශ්‍යතාව ඔවුනට ඒත්තු ගන්වනු සඳහාත් පාර්ලිමේන්තුවාදය නමැති බහුබූත විකාරයෙන් ඔවුන් මුදා ගත යුතුය. තුන්වෙනුව ස්වශක්තියේ සීමාවන්ගෙන් ඔබ්බෙහි ඇති හැකියාවන් කෙරෙහි රඳවා තිබෙන කණගාටුදායක විශ්වාසයෙන් - සාමදානය, සම්මුතිය, ලෝක සාමය, ජාතීන්ගේ සංගමය සහ ජාත්‍යන්තර සහෝදරත්වය ආදී දේවල් කෙරෙහි ඇති විශ්වාසයෙන් ජනතාව මුදවා ගනු සඳහා ඒ සංකල්පයන් විනාශ කර දැමිය යුතුය. ලෝකයේ තිබෙන්නේ එකම ධර්මිෂ්ටතාවක් පමණි. ඒ තමා තමන්ගේ බල මහිමය. (1928 සැප්තැම්බර් 28)

**ජනතා හතුරා**

ස්වකීය ජනතාවගේ නායකත්වය යම්කිසි අවස්ථාවක බාර ගත යුතු යැයි යම් පුද්ගලයෙකුට හැඟී ගිය විට ඔහු පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට හෝ යම්කිසි ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයකට බැඳී සිටිය යුතු නැත. ඔහු සතු කාර්යය වනුයේ ඔහු මත පැවරී ඇති වගකීම ඉටු කිරීම පමණි. මේ කාර්යයේදී ඔහුට හරස් වන ඕනෑම කෙනෙක් ජනතා හතුරෙකි. (1938 පෙබරවාරි 20)

**මගේ ජය**

මගේ සාර්ථකත්වයට හේතුව යම්කිසි ගුප්ත බලයක් හෙවත් වාසනාව යයි සමහරු කියති. එහෙත් මා මේ තත්ත්වයට පත්වූයේ කෙසේද යන්න ගැන ඇත්තම කියන්නම්. අපේ දේශපාලන ගැටළු තිබුණේ සංකීර්ණ තත්ත්වයකය. ජර්මන් ජනතාවට ඒ ගැටලු අණ්ඩර දෙමළයක් විය. මේ තත්ත්වය යටතේ පාරම්පරික දේශපාලනඥයන්ට ප්‍රශ්නය බාර දී නිකම් ඉඳීමට ඔවුහු කැමති

Scanned with CamScanner

වූහ. අනෙක් අතට මා කළේ එම ගැටලු විග්‍රහ කොට ඉතාම සරල අන්දමින් ජනතාවට ඉදිරිපත් කිරීමයි. එම නිසා ජනතාව ඒවා අවබෝධ කරගෙන මා පසුපස ආහ. (1936 පෙබරවාරි 21)

**මාංශ භක්ෂණය**

මස් කන අයට එක් අනාවැකියක් පළ කිරීමට මට පුළුවන. එනම් අනාගත ලෝකය එළවලු කන ලෝකයක් වන බවයි. (1941 නොවැම්බර් 11)

**ක්‍රිස්තු ධර්මය :**

විද්‍යාවේ ප්‍රගතියත් සමග ක්‍රිස්තු ධර්මයේ සිද්ධාන්ත දිය වී යයි. බොරු බේගල් සිඳී බිඳී යයි. ස්වභාව ධර්මයට එකඟව ජීවත් වන මිනිසාට නිතරම පල්ලිය සමග හැපෙන්නට සිදු වේ. පල්ලිය විනාශය කරා ගමන් ගන්නේ ඒ නිසාය. විද්‍යාව නියත වශයෙන්ම ජයගනු ඇත. (HITLER'S TABLE TALK)

**දුර දක්නය**

ටොලමි කල්පනා කළේ පෘථිවිය විශ්වයේ මධ්‍යස්ථානය බවයි. කොපර්නිකස් ගෙන් ඒ මතය බිඳ වැටුණි. අපේ සෞරග්‍රහ මණ්ඩලය තව සෞරග්‍රහ මණ්ඩල රාශියකින් එකක් බව දැන් අපි දන්නෙමු. මේ විශ්මයානුකූල දේවල් ගැන අප වැනි මිනිසුන් හැකිතාක් විශාල සංඛ්‍යාවකට කරුණු අවබෝධ කර ගැනීමට ඉඩ සැලසීමට දුර දක්නට වඩා හොඳ දෙයක් තවත් තිබේද? ගමක් ගමක් පාසා පුංචි දුර දක්නයක් සවි කරන්න. එවිට මිථ්‍යාවන් කන්දරාවක් විනාශ වී යනු ඇත. (HITLER'S TABLE TALK)

**පුනරුත්පත්තිය**

මනුෂ්‍යයාට ස්වභාවයෙන්ම (ජීවයේ) සදාකාලිකත්වය ගැන හැඟීමක් තිබේ. ආත්මය සහ චින්තනය සංක්‍රමණය වෙයි. ශරීරය ආපසු ස්වභාව ධර්මයට එකතු වෙයි. මෙසේ ජීවිතය සදාකාලිකව නැවත - නැවත උපදී. මීට හේතුව කුමක්ද යන්න ගැන සොයන්නට ගොස් මගේ ඔලුව අවුල් කර ගැනීමට උවමනා නැත. ආත්මය වූ කලී ගැඹුරට සොයා බැලිය නොහැකි දෙයකි. (HITLER'S TABLE TALK)

**නිර්ධන පන්තියේ ආඥාදායකත්වය**

ධනපති පන්තියේ ආඥාදායකත්වය වෙනුවට නිර්ධන පන්තියේ

Scanned with CamScanner

ආඥාදායකත්වය පිහිටුවිය යුතුය යන සටන් පාඨයේ තේරුම එක් පන්තියක ආඥාදායකත්වය වෙනුවට වෙනත් පන්තියක ආඥාදායකත්වයක් පිහිටුවීමයි. එහෙත් අප බලාපොරොත්තු වන්නේ ජාතියේ එනම් මුළු මහත් සමාජයේ ආඥාදායකත්වයක් පිහිටුවාලීමය. (1933 මැයි 10)

**බුදුන්වහන්සේ**

අපගේ ව්‍යාපාරය ආගමික ස්වරූපයක් ආරූඪ කර ගැනීම හා වන්දනා ක්‍රමයක් ඇති කර ගැනීම ගැන මා තරයේ විරුද්ධය. බුදු කෙනෙකුට මෙන් මට සැළකීම මා ඉතා අප්‍රිය කරන දෙයක් වනු ඇත. (HITLER'S TABLE TALK)

- නිමි -

Scanned with CamScanner

# ඒකාධිපති

# හිට්ලර්

Scanned with CamScanner